

# කර්ම විභාගය

# කර්ම විභාගය

ශෝධකවරු

මැදඋයන්ගොඩ විමලකීර්ති ස්ථවිර

නැහින්නේ සෝමින්ද ස්ථවිර

# ශුද්ධි පත්‍රය

| පිට | පෙළ | වරද | නිවරද |
|---|---|---|---|
| 1 | 4 | තරකවයෙහි | – තරකයෙහි |
| 2 | 9 | සිටියි | – සිටී |
| 3 | 28 | තවනුව | – තවනුයෙන් |
| 8 | 23 | යපො-පොළොව | – යපොළොව |
| 11 | 30 | බැඳ | – බඳ |
| 15 | 16 | හිදීකටුවැති | – හිදිකටුවැති |
| 16 | 20 | බීභක්ස්‍ය | – බීභත්ස්‍ය |
| 17 | 20 | මුවහම | – මුවහව |
| 22 | 21 | හුතවූ | – භාවිවූ |
| 23 | 9 | සත්මැඩිලි | – සක්මැඩිලි |
| 23 | 29 | දරුණු | – දරුණු |
| 24 | 2 | ඉපද | – උපද |
| 24 | 4 | වල | – වලවල |
| 24 | 6 | අකුසල්කොට දහම් හැඳින ගත නොහී | – කුසල් දහම් නො හැඳින |
| 24 | 26 | වතවරාදිභාවයට | – වතවරාදිභාවයට |
| 27 | 18 | පුරාණ | – පුරාණ |
| 27 | 22 | පරා අයත් ද | – පරා අයත් ද 31—24 |
| 27 | 24 | පුරුෂයන් | – ස්ත්‍රීන් |
| 31 | 3 | දුම්වණිව | – දුම්ණිව |
| 36 | 8 | පක්බත් | – පත්බත් |
| 38 | 8 | ශාස්ත්‍රව | – සාර්ථව |

| පිට | පෙළ | වරද | නිවරද |
|---|---|---|---|
| 40 | 8 | විමටඨාදි | – විම්ට්ටාදි |
| 48 | 4 | සමනන් සරයෙන් | – සමනන්තරයෙන් |
| 50 | 29 | සම්‍යග්ඥදටික | – සමග්දෘෂ්ටික |
| 52 | 22 | කළම්නාවූනා | – කළම්නාතට |
| 54 | 15 | අකිඤ්චිකර | – අකිඤ්චිත්කර |
| 54 | 24 | පෙරෙකළවෙයි | – පෙරළවෙ |
| 55 | 5 | පුත්‍රධාරාදීන් | – පුත්‍රදාරාදීන් |
| 58 | 21 | කරකයෙහි | – තරකයෙහි |
| 67 | අධොලිපි | – රත්පිඩුවිලලක් | – රත්පිඩුවල්ලක් |
| 68 | 24 | සොති | – යොති |
| 73 | 21 | සඹාතතී | – සඹාතව |
| 76 | 17 | නොවටෙයි | – නොවැටෙයි |
| 76 | 29 | දීමෙනදු | – දීමෙනුදු |
| 29 | 15 | පිහිටි | – පිහිට් |
| 81 | 4 | පෙරෙවිය මිසැ | – පෙරෙවියහොත් මිස |
| 81 | 5 | අඟ | – සඟ |
| 94 | 10 | පයශීාවසාන | – පයශීවසාන |
| 98 | 26 | තිසායි | – තියායි |
| 101 | 23 | කාලාතික්‍රාන්ත ව්‍රණවූමුව | – කාලාතික්‍රාන්ත වූ මුව ව්‍රණ වන බැවින් |
| 101 | 24 | ජුගුප්සනීස | – ජුගුප්සනීය |
| 115 | 13 | සත්ප්‍රාස | – සත්ප්‍රාය |
| 115 | 28 | වදනව | – වඳනට |
| 116 | 7 | පාත්‍රාදියදු | – පාත්‍රාදියැදු |
| 117 | 8 | වක්‍රවර්ත්ති | – වක්‍රවර්ති |

| පිට | පෙළ | වරද | නිවරද |
|---|---|---|---|
| 120 | 27 | විපාකවාර | – විපාකවාර |
| 134 | 20 | එසේ කළ | – එසේ කළ කල |
| 140 | 6 | සත | – සිත |
| 140 | 27 | ක්ත | – මුක්ත |
| 141 | 19 | යමර | – යමරජු |
| 141 | 23 | කම් කටු | – කම්කටුල් |
| 142 | 20 | මිත්‍රයන්කෙළේශ | – මිත්‍රයන් |
| 142 | 21 | තොද | – තොදකෙළේශ |
| 144 | 7 | මාතර පිළුදු පහාලුව | – මොතර පිළුදු බහාලුව |
| 170 | 20 | ඔභීාසො | – ඔභාසෙ |
| 173 | 2 | අටුවා කිහ සෙල සූත්‍රයෙහි | – කිහ සෙල සූත්‍ර අටුවායෙහි |
| 176 | 18 | තිම්ත | – තම්ත |

# පටුන


| | | |
|---|---|---|
| | මේ පොත සහ අපේ ධර්ම ප්‍රචාරක විධි | xi – xxix |
| | සංවර්ණිත පද | xxxi-xxxii |
| 1 | අවීමහ නරකය | 1 – 2 |
| 2 | චතුර්විධ අපාය ස්වරූප | 2 – 22 |
| 3 | චතුර්විධ මනුෂ්‍යයෝ | 22 – 30 |
| 4 | මනුෂ්‍යයෝ සතරදෙන | 30 – 32 |
| 5 | අකුශල කර්ම | 33 – 44 |
| 6 | කුශල කර්ම | 44 – 69 |
| 7 | ධර්මෝපදේශ | 69 – 80 |
| 8 | අවඥ කොකළ යුත්තෝ | 80 – |
| 9 | දන් දීමෙහි අනුසස් | 80 – 84 |
| 10 | මැහැලිවත | 84 – 85 |
| 11 | අනාථ උපාසකවත | 85 – 88 |
| 12 | කොරණක දහරවත | 88 – 91 |
| 13 | යශස් ලැබෙන පරිදි | 91 – 92 |
| 14 | අෂ්ටලෝක ධර්මයෝ | 92 – |
| 15 | දශධර්මයක් | 92 – 93 |
| 16 | අෂ්ටබල | 93 – |
| 17 | ප්‍රකීර්ණක ධර්ම | 93 – 105 |
| 18 | චතුර්විධ ධර්ම සමාදන | 105 – 107 |
| 19 | දෙතිස් කථා | 107 – 113 |
| 20 | භාර්යාවෝ සත්දෙන | 113 – |
| 21 | මනුෂ්‍යයන් ගේ ආයුප්‍රභේද | 114 – 115 |
| 22 | බුදුන් කෙරෙහි අනාදර | 115 – 116 |
| 23 | ධර්මයෙහි අනාදර | 116 – |
| 24 | සංඝයා කෙරෙහි අනාදර | 116 – |
| 25 | කුල විනාශ හේතු | 117 – |
| 26 | කුශල විභාග | 117 – 119 |
| 27 | කර්ම ප්‍රභේද | 119 – 143 |
| 28 | ලෝක විස්තර | 143 – 153 |

| | | |
|---|---|---|
| 29 | චතුර්විධයොනි | 153 – |
| 30 | පඤ්ච ගති | 153 – |
| 31 | සප්ත විඥාන ස්ථිති | 154 – 155 |
| 32 | එක් තිස් තලය | 155 – 165 |
| 33 | අධි කුශල ධර්ම | 165 – 171 |
| 34 | කල්ප විභාග | 171 – 174 |
| 35 | බුද්ධකාරක ධර්ම | 174 – 187 |
| 36 | කර්ම විභාග පිටපත | 189 – 205 |
| 37 | අකාරාදිය | 207 – 215 |

# මේ පොත සහ අපේ ධර්මප්‍රචාරක විධි

ඉස්සර ධර්මප්‍රචාරක ක්‍රම කීපයක් පැවැති බවත්, ධර්ම දෙශනය ධර්ම අධ්‍යාපනය ධර්ම ලෙඛනය යන මේවා එකී ධර්මප්‍රචාරක ක්‍රම අතුරෙහි ප්‍රමුඛස්ථානය ගත් බවත්, අපි දනිමු. කටයුතු බාහුල්‍යය ආදී නොයෙක් හේතූන් නිසා බණ අසන්නට නොහැකි ධර්මකාමීන්ගේ ප්‍රයෝජනය සඳහා පැරණි උගතකු විසින් මේ පොත ලියන ලද්දේය. කුශලාකුශලාදී කර්මයනුත් ඒවා විපාකදෙන සැටිය සහ විපාක දෙන ස්ථානයනුත් සවිස්තරව පෙන්වා ධර්මකාමීන්ට දෙලෝ වැඩදායක නියම මාර්ගය පැහැදිලිකර දීම මේ පොත ලියූ ආචාර්යවරයාගේ ප්‍රධාන අදහස වූ සේ පෙනේ. ධර්මව්‍යාඛ්‍යාන ග්‍රන්ථ නිපදවීමෙන් ලෝ වැඩ අටක් සිදුවන බවද විශෙෂයෙන් සැලැකියැ යුතුය. ඒවා පිළිබඳ විස්තර පූජාවලියෙහි දෙවන පරිච්ඡෙදයෙන් දත හැකිය. පෙර පැවැති ධර්මදෙශනා ක්‍රම මෙන්ම ධර්ම ලෙඛන ක්‍රමත් ක්‍රමයෙන් අභාවයට යන මේ කාලයෙහි ඒවා සම්බන්ධ කෙටි හැඳින්වීමක් වුවත් සාමාන්‍ය ජනතාවට සේම ආධුනික ශිෂ්‍යයන්ටත් ප්‍රයෝජනවත් වන්නේය. එහෙයින් පෙර පැවැති ධර්මදෙශනාදී ක්‍රම පිළිබඳවැ ඉතා සුළු විස්තරයක් මෙතැන් සිට දක්වනු ලැබේ.

සරභාණය පදභාණය ධර්මභාණය යන නම්වලින් හැඳින්වුණු ප්‍රධාන ධර්මදෙශනා ක්‍රම තුනක් පූර්වයෙහි පැවැති බැව් පෙනේ. ධර්මදෙශනය සඳහා තබනු ලබන මාතෘකා පාළිය තාලානුකූලවැ නාද යොදා කීම සරභාණය නම් වෙයි. එහි සර ශබ්දය තාලාර්ථයෙහි වැටේ. උදත්තස්වරයෙන් යොදා කරණ අජ්ඣායන (හඬ විහිදුවා ව්‍යක්ත කොට කියන බණ) යනු ධම්පියා අටුවා ගැටපද පාඨයි. (54-19) ජා: ගැටපද 144 යත් බලනු. තරඞ්ගවත්ත තරඞ්ගභෙදක. වත්ත ගලිත වත්තා දී

වශයෙන් සරභඤ්ඤයෙහි තාල දෙතිසක් තිබුණේය. ජාතක කියූ තාලය ජාතක වත්තනම් විය. (චුල්ලවග්ගයෙහි ඛුද්දකවත්ථුක්ඛන්ධක අටුවාව බලනු.) පදභාණය සම්බන්ධයෙන් ඒකමතික නිරණයක් තිබුණු බවට නිදසුන් නොලැබේ. 1. අථ ආගමිත-වසෙන පාළියාභණනං (වි. ම. ස. 941) 2. පදභාණකත්ථෙරෙ උසිතෙ දීඝභාණකමහාථෙරො චතුපච්චය සන්තොස භාවනාරාම මහාඅරියවංසං ආරභි (ම. පූරණී 418) 3. පදභාණං පෙළපිරවීම් උසුරුවන බණ. (ජා. ගැටපද 139) 4. පදභාණ-කොසතරංනාම සුත්තංභණි (සංයුත් අටුවා 3-57) 5. පදභාණ පෙදෙහිම නැවැති සවර ඇතියේයි. (ධම්පියා අටුවා, ගැටපද 54) 6. පද විසිත් පිරිසිඳ පෙළකිම් (එම 232) 7. මෙ පෙදෙන් කියන බණ (එම 263) මේ තැන්වෙත පරීක්ෂාකාරීව විමසුම් නුවන හෙලන විට පෙනෙන්නේ සරභාණයෙහිදී මෙන් පොතේ තිබෙන විධියෙන්ම මාතෘකා පාළිය නොකියා තැනින් තැන තිබෙන පද අර්ථානුකූලව යොදා වාක්‍ය ස්වරූපයෙන් (සූත්‍ර පද වශයෙන් වි. ම. ස. සද්ධානිස්සය 3·1251 බලනු) නවත්ව නවත්වා කීම පදභාණය බවය. නමුත් දම්පියා අටුවා කාරයන් පදභාණය තේරුම් ගෙන තිබෙන්නේ මෙයට වඩා වෙනස් ක්‍රමයකිනැයි කිය යුතුය. වනවාසික තිස්ස තෙරුන්වහන්සේගේ කථාව කියවීමෙන් ඒ කාරණය අවබෝධ කළ හැකිය. "සුඛිතා-හොථ දුක්ඛාමුඤ්චථ" යන ධර්මපාඨය මාතෘකා වශයෙන් තබා ත්‍රිපිටකයේ නොයෙක් තැනින් හේතුදාහරණයනුත් උපමා ආදියත් ගෙනහැර පාමින් එදා තුන්යම් රාත්‍රියෙහි උන්වහන්සේ විසින් පවත්වන ලද විශිෂ්ට මාතෘකා ධර්මදේශනාව පදභාණ නමින් ඒ ග්‍රන්ථයෙහි හැඳින්වුණු හෙයිනි. ඉහතකී සරභාණ පදභාණ දෙකම හෝ එයින් එකක් ධම්මඹිසාරණ නාමයෙනුත් හඳුන්වන ලදී. ධම්පියා අටුවාහි එකුද්දන සථවිරයන්වහන්සේගේ කථායෙහි එන "තෙසු ඒකො තෙපිටකත්ථෙරො ධම්මංඝොසාරෙසි, එකොකපෙසි" යන වාක්‍යයත් එයට නිදසුන් කළ හැකිය.

ධර්මාඛ්‍යාව සිංහලයට නැගී විසිතුරුව පැවසෙන්නේ සරභාණයටත් පදභාණයටත් පසුව වේ. "පදභාණ ධම්මකථා සරභඤ්ඤ.........කත්තුකාමො හොති" (වි. මග්ග ඉද්ධිවිධනිද්දෙස) යන වාක්‍යයෙහි පෙනෙන ධම්ම කථා යන්න ටීකා සන්න දෙක්හිම තෝරන ලද්දේ "පරිකථාදි වසෙන ධම්මස්ස කථනං ධම්මකථා" කියාය. එකුද්දන තෙරුන්ගේ කථායෙහි ධම්මං කථෙසි යන්නෙන් කියැවෙන්නේත් මෙම අර්ථය මැයි.

## ආසන දෙකේ බණ

මේ කාලයෙහි බොහෝ දෙනා නිරර්ථක කාර්යකැයි සලකා අභාවයට යන්නට ඉඩදී තිබෙන නමුත් ආසන-දෙකේ බණටත් විශිෂ්ට ඉතිහාසයක් ඇත්තේය. එය අරඹණ ලද්දේ ධර්මසඞ්ගායනා ක්‍රමය ගුරුකම්ට ගැනීමෙනැයි සිතේ. ධර්මසඞ්ගායනාවේදී මහකසුප් මහතෙරණුවන් වෙනුවෙන් පැණවුණු ආසනය ධර්මාසනය නමුත් ආනන්ද මහ තෙරණුවන් වෙනුවෙන් පැණවුණු ආසනය අර්ථාසනය නමුත් විය. ත්‍රිපිටක අටුවාවත් ධර්මසඞ්ගායනා වලදී සංගීත වුණු බව කියැවෙන හෙයින් ආනන්දස්ථවිරයන් වහන්සේ විසින්ම තමන්වහන්සේ ප්‍රකාශකළ ධර්මයේ අර්ථයත් ප්‍රකාශ කරන්නට ඇතැයි කරුණු අනුව සිතාගත හැකිය. එකී දෙ ආසනය ප්‍රශ්නාසන පිළිතුරු ආසන යන නම් වලින් හැඳින්වීමත් නිවැරදිය. ඒ කෙසේ වෙතත් ආසන දෙකේ ධර්ම දෙශනාව සඳහා පිළියෙළ වන දෙ ආසනයත් ධර්මාසන අර්ථාසන යන නම් වලින් හැඳින් වෙන්නේ එකී පැරැණි නාමයන් අනුගමනයෙනැයි හැඟේ. එකුද්දන ස්ථවිරයන් වහන්සේ ගේ කථාව කියැවීම මේ කාරණය සම්බන්ධයෙනුත් ප්‍රයෝජනවත්ය. සමයකීම නමිනුත් පැරැණි ධර්මදෙශනායෙහි එක්තරා අවස්ථාවක් තිබුනේය. ඇතැම් සූත්‍ර සන්න-වල මූලට මේ ක්‍රමය යෙදී තිබෙන හෙයින් පැරැණි සූත්‍ර සන්න කියවීමත් මැනවි. අභාවයට යමින් පවත්නා ආසන දෙකේ ධර්ම දෙශනාවට නවජීවනයක් දෙන්නටත් වර්තමාන

ධර්ම දේශනා ක්‍රමය සකස් කරන්නටත් කාලය එළඹැ තිබෙන බැව් මතක් කරනු කැමැත්තෙමු. කුලමල ආදී පක්ෂ බලයත් මුදල් බලයත් නිසා ගුවන් විදුලියට කාවැදී සිටින, බණ සම්බන්ධයෙන් හාං කවසියක්වත් නොදන්නා ඇතැම් මෝඩයන් නිසා ගුවන් විදුලි බණටත් ආපුෂ තැන්තේයයි ඒ සම්බන්ධයෙන් හැඟීමක් ඇති මහාජනයා කියයි. දහම් දෙසීම, විශේෂයෙන් ලඞ්කාවේ පැවැති ක්‍රමවත් වාඩාධ්‍යාපන සේවාවකැයි කිය යුතුය.

සිංහල බෞද්ධයා ධර්ම දේශනයෙහි මෙන්ම ධර්ම ලේඛනයෙහිත් දක්ෂයෙකි. ගිහි පැවිදි උගතුන් විසින් ලියන ලද බණ පොත් සමූහයක් අදත් ජාතිය සතුව තිබෙන්නේ ඒ නිසාය. භික්ෂූන්වහන්සේලා වැඩි වශයෙන් උත්සාහ ගත්තේ පෙළ බසින් තිබුණු ත්‍රිපිටක ධර්මය හෙළ බසින් විවරණය කරණු සඳහාය. අටුවා, ටීකා, අනු ටීකා, චූර්ණිය ග්‍රන්ථ, සන්න, ගැටපද, පිටපත්, සිලිසන්න, සන්නි, සංග්‍රහ පොත්, කාව්‍ය ග්‍රන්ථ, වර්ණනා ග්‍රන්ථ, දීපනී ග්‍රන්ථ, අත්ථ යෝජනා යනාදී පොත් පත් නිපදුනේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. වංශග්‍රන්ථයන් සම්බන්ධයෙනුත් එසේම කිය යුතුය. සිංහල භික්ෂූන්වහන්සේලා මේ සව්‍යාපාරයෙහි නොසෙදෙන්නට ලෝකයෙහි මේ තාක් පහළවුණු විශිෂ්ටම ඉගැන්වීම වාත්මාතිකයන්ට නො ලැබෙන්ට හොඳටම ඉඩ තිබුනේය. මුල දී සද්ධර්මය කටපාඩමෙන් ගෙණ ආ භික්ෂූන්ට බැමිණිතියා මහාසායෙන් පසුව එය ග්‍රන්ථාරූඪ කිරීමෙහි අනුසස් හොඳින් අවබෝධ විය. උන්වහන්සේලා විසින් ඒ සඳහා පුස්කොළය තෝරාගන්නා ලදී. පත්හිඳත් ක්‍රමයෙන් සකස් විය. බුද්ධ ධර්මය මෙන්ම ජාතික හිතුම් පැතුම් සහ සිංහල නිපැදවීමුත් ආරක්ෂා කෙරෙමින් පරපුරෙන් පරපුරට ගෙන ඊම සඳහා පුස්කොළයෙන් සහ පත්හිඳෙන් ලැබුණු පිටුවහල අතිශයින් විශාලය. එසේම ඒවා පිළිබඳ කථාවත් විසිතුරුය. එබැවින් මෙතැන් සිට පුස්කොළයත් පත්හිඳත් සම්බන්ධයෙන් තොරතුරු ස්වල්පයක් ආධුනිකයන් ඉදිරියෙහි තබන්නට වෑයම් කරමු.

ලිවීම සඳහා කර්මණ්‍ය කර ගනු ලැබූ තල්කොළයම පුස්කොළ නාමයෙන් හැඳින්වේ. පුස්කොළ ශබ්දයාගේ නිෂ්පත්තිය නො පැහැදිලි නමුත් පොත් ලියන කොළය පොත් කොළ බවට පෙරළී එයම පුස්කොළ ස්වරූපය ගත්තේදැයි සොයා බැලිය යුතුය. ප්‍රමාණවත්වැ එළියට ඇදුණු තල්ගොබයකට බැමි කීපයක් දමා පසළොස් දිනක් පමණ තිබෙන්නට හැර එය කපා තම්බා ගැනීම ප්‍රථමයෙන්ම කළ යුතුය. තම්බන විට පැපොල් කොළ හෝ කැප්පිටියා කොළ දමනුත් සිරිති. තල්කොළ සුදුවනු සඳහාය. සුවඳ හමනතුරු තැම්බුණු පසු ලිපෙන් බා තෙදිනක් පමණ ගොඩින් වියලා ඉක්බිති තුන් හතර දිනක් පින්නේ දැමිය යුතුය. කොළය ඝණවනු සඳහාය. පින්නේ දමන විට කළයුතු තවත් කාර්‍යයක් නම් හවස තෙමීමත් උදේ සෝදා වට්ටු ගැසීමත්ය. වට්ටු ගැසීමෙන් පුස්කොළයේ උස් පහත් තැන් සමවී ඇදකුදත් නැතිවැ යයි. තම්බා වියලා පින්නේ දැමූ පුස්කොළය ලේඛනය සඳහා සුදුසු වන්නේ මැදගැනීමෙනි. ශුද්ධ කර ගත් පුවක් ගසක හෝ මෝල්ගස් ආදියක දමා තදින් ඇදීමෙන් ඒ කාර්‍යයත් ඉටුවේ. සමහර පළාත්වල ගලකිනුත් ඒ කාර්‍යය කෙරෙති. පඩිගල යනු එයට නමි. පුස්කොළ මදින පුවක් ගස හෝ මෝල්ගස හේමකඳ නමින් හැඳින්වේ. එයින් පුස්කොළය හේම වන හෙයින් නාමය අනුරූප්‍ය. මෙසේ මූලික වශයෙන් පුස්කොළ සකස් කර ගත් ඉක්බිති ඒවා පොත් කැත්තෙන් සුදුසු පරිදි කපා සුලි විද පොත්ගෙඩි සකස් කර ගනු ලැබේ. සුලි විදීමත් එක්තරා නියමයක් අනුව සිදුවන්නකි. පොතේ ප්‍රමාණයට කපාගත් පුස්කොළය පළමුවෙන් තෙකොටසකටත් දෙවනුව සිව් කොටසකටත් බෙදා ලකුණු තබාගත යුතුය. එසේ තබාගත් ලකුණු අතරෙහි පුස්කොළේ මැදට වන්නට සුලිකටුවෙන් සුලි කැපීම කෙරෙති. ඉක්බිති පොත් කම්බා යොදා යතුගා කොඳු නැතිවනු සඳහා රත්කළ යකඩයකිනුත් පුච්චා හුයේ අමුණා ගනිති. සුලි කැපීම්

ආදියෙහිදී ප්‍රමාණය ගනු සඳහා පොත් රූලකුත් වුවමනාය. පොත් හුයේ අග තිබෙන බොත්තමක් වැනි අවයවය පොත්සකිය නමුත් පුලි කැපීමේදී ඉවත්ව යන රවුම් කැබෙලි කරන් නමුත් වන්නේය. අකුරු නොලියූ පොත් ගෙඩිය පුස්ගෙඩි යන නමිනුත් හැඳින්වේ. එය සම්පූර්ණ පොතක් වන්නේ අකුරු ලිවීමෙන් පසුවය. කරකොළයේ ලියනු සඳහා උල් කටුවත් පුස්කොළයේ පන්හිඳත් භාවිත කෙරෙති. පන්හිඳවූකලී පත්‍ර ජත්‍ර නලගණ්ඩ ලේඛනී යන පස් කොටසින් යුක්තය. පන්හිඳ් කඳ යනුත් ලේඛනියටම නම්. එහි අවසානයෙහි ඇති සියුම් තුඩ ලේඛිත්තාය. එය ලේඛිත්තකු වැන්නේමය. පුස්කොළයේ අකුරු කැපෙන්නේ එයිනි. එය පන්හිඳ් ගලේ ඇතිල්ලීමෙන් මුවහත් තැබිය හැකිය. පන්හිදේ දිග ප්‍රමාණය අනුව පත්‍ර ජත්‍රාදියෙහි ප්‍රමාණයත් නියම කරනු ලැබේ. ඉදින් පන්හිඳ අඟල් විස්සක් දිගනම් ජත්‍රය අඟල් 4 කුත් පත්‍රය අඟල් 2 කුත් නලය අඟල් 2 කුත් ගණ්ඩය අඟල් 1 කුත් ලෙඛනිය අඟල් 10 කුත් දික්වනසේ සාදනු ලැබේ. හැම පන්හිඳක්ම තත්වයෙන් එක හා සමාන නොවන බවද විශෙෂයෙන් සැලැකියැ යුතුය.

සමානි සම්පාදනි – සමාංශානි සමාශිරාඃ
අක්ෂරා නිප්‍රතිෂ්ඨව්‍යාඃ – මෘදූනි ලලිතානිච

සි කී හෙයින් සමවූත් සමපාද ඇත්තාවූත් සමහිස් ඇත්තාවූත් මෘදුවූත් ලලිතවූත් අකුරු පුස්කොළයෙහි ලියැයුත්තේය. ඒ අකුරුත් ගජ, සිංහ, හංස, යන තෙකොටසකට බෙදේ. පරිපූර්ණ රවුම් අකුරු ගජාක්ෂර නමුත් දිගටි හැඩය ගත් අකුරු සිංහ අකුරු නමුත් කෙට්ටු තුනීම්හින් ලියැවුණු අකුරු හංසාක්ෂර නමුත් වන්නේය. සංයෝග බයන්න (සබ්බ බ යන්න) ඞකාර ස්වරූපයත් සංයොග ච යන්න ඞකාර ස්වරූපයත් ගනී. සබ්බ යන්න "සඬෙ" කියාත් පච්චයා යන්න "පඞයා" කියාත් පුස්කොළ පොත්වල පෙනෙන්නේ එහෙයිනි. "ඡ" කාරයත් "ඉ" ස්වරූපය ගත්

තැනුත් බෙහෙවි. ඉලක්කත් වෙනුවට අකුරු සෙදුණු අතර නක්ෂත්‍ර පොත් වල ලීත් ලකුණු නම් ලකුණු විශෙෂයක් සෙදී ඇත්තේය. නිශ්ශඞ්ක ශිලාලිපි වලදී අන්නාසි ගෙඩියක හැඩහුරුව ගත් කුණ්ඩලිය පසු කාලයකදී කරකැවූ රවුලක පෙනීම විදහා පෑ බැව් පෙනේ. මුල් යුගවලදී ඒ වෙනුවට හරස් ඉරිකැබෙල්ලකුත් යෙදුනේය. පුස්කොළ ලිවීමේදී වම් අතේ මාපටැඟිල්ලේ නියපොත්ත රවුමට කපාගනුත් සිංහල ලෙඛකයන්ගේ සිරිති. පන්හිඳ රඳවා ගනු සඳහාය. හෙට්ටිරාළලා ඔවුන්ගේ පන්හිඳ අල්ලන්නේ අහින ආයුධයක් අල්ලන්නාක් මෙන් මිටමෙල විමෙනි. පොත් කට්ටුව (පොතේ කොටසක්) තබාගෙණ ලියනු සඳහා පාවිච්චි කරන කුඩා මේසය දණ්ඩාසනය නම්. එය බූරුඇඳක ආකාරය ඇතිව කුඩා ලිපතුරු ආදියෙනුත් සාදනු ලැබේ. ශරණඞ්කර සඞ්ඝරාජයන් වහන්සේගේ දණ්ඩාසනය දැකීමෙන් කාරණය තේරුම් ගත හැකිය. පොත් තැන්පත්කොට දණ්ඩාසනය වසා තබන්නේ බණවස්තෙනි. එනම් රෙදි කැබෙල්ලකිනි. පොත් තැන්පත් කොට තබන දික් හැඩය ගත් කොට්ට උර වැනි පසුම්බි විශෙෂය පොත් පයි නමුත් පොත්ඔතන ලේන්සුව පොත් ලේන්සුව නමුත් වන්නේය. පොත්පයි කිතුල් කිරි වැනි ද්‍රව විශෙෂයන්ගෙනුත් සාදති. දරුපෙල ලිවීම වරද හරිගැස්සීම අඩුපාඩු පිරවීම වැඩිතැන් අත්කිරීම අකුරු කටුගැම කුණ්ඩලි ගැසීම ලියන්නට බැරිතැන් ලකුණු කිරීම පොත් බැඳීම යනාදිය සම්බන්ධයෙනුත් පාරම්පරික නම නියම තිබුනේය.

ලියුම් ලිවීම සම්බන්ධයෙනුත් එසේම කියැයුතුය. ලියුම ලබන පුද්ගලයා අනුව ලියමනේ පිටුගණන අඩුවැඩි වන බව ද සැලැකිය යුතුය. ලියමන ලියන්නේ රජකෙන කුට නම් පත් ඉරු හතකින් ද ගුරුවරයකුට නම් පත් ඉරු හයකින් ද මව් පිය සහෝදර යන මොවුන්ට නම් පත් ඉරු පසකින් ද නෑයකුට නම් පත් ඉරු හතරකින් ද මිත්‍රයකුට

නම් පත් ඉරු දෙකකින් ද සතුරකුට නම් එක පත් ඉරුව කින් ද යුක්ත වන සේ ලියමන සකස් කළ යුතුය. "ශ්‍රී" යනාදී තැන්වල පෙනෙන අකුරක පහළට එකතු කරන රකාර ලකුණ ගාත්‍රාංශය නමිනුත් (") කොමා ලකුණු දෙක කාක පදය නමිනුත් ලියමන ඔනන හුය වාරිකෙන්ද නම්නුත් හැඳින්වෙන අතර ශිලාලිපිවල අකුරට උඩින් ලියනු ලබන (වීරා◡කුර යනු නිදසුනි) අභි චන්ද්‍රිකා ලක්ෂණය පුස්කොළ පොතේ පෙළට ලියා තිබෙනුත් දක්නා ලැබේ. (ස ◡කාර යනු නිදසුනි) උල් කටුවෙන් සටහන් කැපිම පුස්කොළ ලිවීමේ මුල් අවස්ථාව බවද සැලැකිය යුතුය.

ලියා කළු මදිනු ලැබූ පොත් අන්තිමට යන්නේ පොත් ගුල් වල අල්මිරිකරාය. පොළොන්නරුවේ පොත්ගුල් විහාරය දෙලොස්වන සියවසේ පැවැති පොත්ගුලක ස්වරූපයත් අනුරාධපුර ගෙඩිගේ මූකලානේ තිබෙන ගෙඩිගෙය (වහලත් ගඩොලින් සැදූ ගෘහය) පැරණි ධම්ම සංගිනී ගෘහය නම් මධ්‍යකාලීන පොත් ගුලක සාමාන්‍ය සැලැස්මක් එයින් තේරුම් ගත හැකිය. මේ පොත් ගුල් වල තැන් පත්වැ තිබුණේ ධර්ම ශාස්ත්‍රිය ග්‍රන්ථ පමණක් නොවේ. සාමාන්‍ය ලියුමුත් එහි තිබුනු හෙයිනි. අපේ සිංහල ආණ්ඩුවේ ඒ ලියුම් සම්බන්ධයෙන් හැඳින්වීමක් කෙළෙමු. **වංසපින්නය, දරදිපත්පැන, බලිපත** යන මේ ලියුම් වර්ග ගැනත් පසුව දැනගන්නට ලැබිණි. කෙනකුගේ පාරම්පරික වංස නාමයන් දූ දරු ආදී කෙනකුට අයිතිවන සේ දන්වා ලියා තබන ලියුම් විශේෂය වංසපින්න නමුත් ණයක් ගැනීම සම්බන්ධයෙන් ගනුදෙනු කාරයන් විසින් ලියාගන්නා ලියුම් දරදීපත්පැන නමුත් බලි අරිම්මිදි කියන දේව ස්තොත්‍රාදිය ලියූ පත්‍ර බලිපත් නමුත් වින්නේය. ඉහත කී පොත් පතුත් මේ ලියුම් වර්ගත් සියල්ල හොඳට කියවන්නට නම් තිසි පරිදි කළු මැද ගත යුතුය. එහිත් නොයෙක් ක්‍රම තිබෙන්නට ඇත. අප කුඩා කාලයේදී නම් පුස්කොළ පොත් කළු මැද්දේ දුම්මල තෙලෙනි. දුම්මල

චලට පුලුන් කොළ ආදී කොළ වර්ගයක් පුලුස්සා එහි කුඩුත් කැකුන මුල් හෝ දිඹුල් මුලුත් ගැඩුඹ අඟුරු කුඩුත් මිශ්‍රකොට ගින්නෙන් කකාරා වෙන්කොට ගන්නා වාෂ්පය දුම්මල තෙල් නම්.

ඒ දුම්මල තෙල්, කපුපුලුන් ආදී යමකින් තනාගනු ලැබූ පොට්ටනියක මාර්ගයෙන් පුස් කොළයේ අතුල්ලා වීකුඩු වලින් හෝ දහයියාවලින් මදිනු ලැබේ. මෙසේ මැදීමෙන් තෙල්ගතිය සම්පූර්ණයෙන්ම පුස්කොළයෙන් ඉවත්වේ. පුස් කොළ ලිවීම සහ කලුමැදීමාදිය සිදුකළ තවතවත් ක්‍රම ඉස් සර තිබෙන්නට ඇත. පැරණි පුස්කොළ පොත් පරීක්ෂා පූර්වකව කියවා බැලීමත් ඒවා දැන ගැනීමෙහි එක්තරා මාර්ගී යෙකි. පැරණිම පුස්කොළ පොත් හැටියට දැනට සොයා ගෙන තිබෙන්නේ චුල්ලවග්ගපාළියත් පූජාවලියත් මත්තෙහි වැඩිදුරටත් හැඳින්වෙන මේ කර්මවිභාගයත් පමණකැයි කියැ යුතුය. එයින් චුල්ලවග්ගපාළිය දෙළොස්වන හෝ තෙළෙස්වන සියවසටත් පූජාවලිය තෙළෙස්වන සියවසට හෝ එයින් මෑත යුගයකටත් අයත්වියැ යුතුය. කර්මවිභාග යේ ඉතා පැරණි පිටපතක් ටිබැටයේ පොත්ගුලක තිබී සාංකෘත්‍යායන පඬිතුමා විසින් සොයා ගන්නා ලදුව දැනට විද්‍යාලංකාර විශ්ව විද්‍යාලීය පොත්ගුලේ තැන්පත්වැ ඇත් තේය. එහි කාල නිර්ණය කළ හැක්කේ අක්ෂර විද්‍යාව පිළිබඳ විශෙෂඥයන් විසිනි. ඒ පොත සම්බන්ධයෙන් එවැනි පරී ක්ෂණයක් තවමත් නොකැරුනේය. පොත කියවා බැලීමේ බලාපොරොත්තුවෙන් නොව පොතේ අකුරු දැක ගැනීමේ රිසියෙන් පසුගියදා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට ගියෙමු. ඡායාරූපයට නගකලද පිටපත් දෙකක්ම එහි තිබෙන නමුත් ඒවා කියවාගත නොහැකිවිය. පුස්තකාලයාධිපති ත්‍රිපිටකාචාර්‍ය නාත්තන්ඩියේ ගරු ප්‍රඥාසාර ස්ථවිරයන්වහන්සේගේ ප්‍රකාශය වූයේ ඒ පිටපතේ පෙනෙන අකුරු පසළොස්වන සියවසට හෙවත් කෝට්ටේ කාලයට අයත් සේ සමහරුන් කල්පනා කරන බවත් ඒ සම්බන්ධයෙන් තවමත් කිසිම විනිශ්චයක් නොමැති බවත් එහෙයින්ම මුද්‍රිතවැ පවත්නා

කර්මවිභාගයත් ටිබැට් කර්මවිභාගයත් දෙක එකම පොතක් දැයි නිශ්චයවශයෙන්ම නොකියහැකි බවත් ඇතැම්විට දෙපොතේම සමාන තැන් තම් දක්නා ලැබෙන බවත්ය. කෙසේ වෙතත් උන්වහන්සේගේ කරුණාගුණය නිසා ඉතා කුඩා අකුරුවලින් යුත් මූල් පිටපත අපට ලැබුනේය. පේළි 7 බැගින් ලියූ පිටු 158 ක ඡායාරූප එහි දක්නා ලැබේ. පත්ඉරු අංශවශයෙන් මෙන්ම කැබෙලි වශයෙනුත් කැඩී බිදී ගොස් තිබෙන හෙයින්ද ඇතැම් තැන්වල පැල්ලම් ඇතිවී තිබෙන හෙයින්ද ඡායාරූපගත් පිළිවෙළ අවුල්වී තිබෙන හෙයින්ද ඡායාරූප ගැනීම සඳහා ලෑල්ලක තබා කටු ගැසීමේදී ඒ කටුවල කුඩිම්බිවලින් ඇතැම් අකුරු වැසී ගොස් තිබෙන හෙයින්ද ඇතැම් අකුරුවල ඡායාව කඩදාසිවල සටහන් නොවන හෙයින්ද විශෙෂයෙන් අකුරු කුඩා හෙයින්ද පොත් දෙක සසඳ බැලීම ඉතා දුෂ්කර කාර්යයක් විය.

අපේ පොතේ දෙවන පිටේ එන "චතුරශ්‍රය" යන තැන සිට හුඟක් දුරටම අපි පොත කියවා බැලීමු, පත් ඉරුවල සම්බන්ධය දැන ගැනීම සඳහා ඉලක්කන් වෙනුවට යොදන අකුරු පත්ඉරුවල එක පැත්තක පමණක් යොද නුත් සිරිත හෙයින් ක්‍රමානුකූල පිළිවෙළක් නොයෙදුවොත් එක පත් ඉරුවක දෙපැත්ත එකිනෙකට සම්බන්ධවනසේ ඡායාරූපගත කරනු සිදුනොකළ හැකි දෙයකි, මේ කාරණයත් පොත කියවීමේදී හරස්ව සිටී. අපේ පරීක්‍ෂණය අනුව කියතොත් ටිබැට්පොතේ බෙහෙවින් යෙදීතිබෙන්නේ මුද්‍රිත පොතේ පෙනෙන ඇතැම් වචන පිළිබඳ පැරණි රූපයතැයි කියැ යුතුය. අප එසේ කියන්නේ මුද්‍රිත පොතේ එන පිසඹුරු ගැඹුරු ඇමඳු කකුසඳ දත යුතු. වැළැඳි බඳනා හිඳිනා, පවින්, කෘත්‍ය යනාදී වචන වෙනුවට ඒ වචන වලම පැරණි රූපයන්වන පිසම්බුරු ගැම්බුරු ඇමුඳු කකුසඳ දතැසිතු වැළැඤ බඤනා හිඤනා පැවින් යනාදී රූපයන් බලාගෙනය. මුද්‍රිත පොතේ එන – ය – ඒ, සිටියි, කෘත, දෘෂ්ටි, කර්මවිභාගය නිමි, අපරගෝයානය, ඉක්බිති, මිතිස්යමපල්හු, වෙති, වෙයි, යනාදිය ටිබැට් පිට

පතේ එන්නේ-යැ, එ, සිව්, ක්‍රිත, දිෂ්ටි කම්විභාගනිම්, අපර ගෝදනය, එක්බිති, මිතිස්සමපල්හු නම්හු, වෙ යනාදී වශයෙනි. මුද්‍රිත පොතේ අවසානයෙහි සිඞ්රස්තු යන්නක් ඇතත් ඒ වෙනුවට ටිබැට් පොතේ පෙනෙන්නේ.

මහොසධොච කුණ්ණන-ජොතිසෙසිව් හොගිනා
වෙසසන්තරොවදනෙන-ගොතුමය්හං භවෙ භවෙ

යන ගාථාවය. ජ. ද. දෙදෙනාගේ සාම්‍යයත් ටිබැට් පොතේ බහුල වශයෙන් ලැබේ. දියෙහිඔදසේ (138 පිට) යන පාඨයත් දිහිසෙහි ඔදසේ කියා ටිබැට් පොතේ පෙනේ. ශුඩපාඨයත් එය මැයි. සෑම පුස්කොළ පොතකම පෙනෙන කුණ්ඩලිය වෙනුවට ඉරි කැබෙල්ලක් යොදනුත් ටිබැට් පොත ගත් මාර්ගය වේ. එවැනි ඉරි කැබෙලි එකක් හෝ දෙකක් හෝ තුනක් හෝ පමණක් දක්නා ලැබෙන බවත් කියැ යුතුය. හිසකෙහෙදු හටගනී (139) යන්න කෙහෙදු හටගනී කියාත් පරිපූර්ණසතුන් වනු (139) යන්න පරිපූර්ණ යනනවනු කියාත් නානාකෘමිකුලාකුලව පෙණ නැගී පැසෙන (139) යන්න නානාක්‍රිමි කුලාදින් විසින් ආකුලව පැසෙන කියාත් ටිබැට් පිටපතේ යෙදුනේය. හොඳින් පරීක්ෂාකර බැලුවොත් මෙවැනි තැන් සමූහයක් සොයාගත හැකිය. කම්විභාගය පිළිබඳ නියම සංශෝධනයක් කරතොත් ටිබැට් පිට පත නොකියවා ඒ කාර්‍ය්‍යය නොකළ හැකි බවද කියනු කැමැත්තෙමු. ටිබැට් පිටපතේ අකුරු කෝට්ටේ කාලයේ අකුරුසේ බැලූ බැල්මට පෙනෙතත් එය එසේ නොවන බව අපේ හැඟීමය.

කෝට්ටේ කාලයේදී සකස්වී ඉවරවුණු අකුරු රාශියක් පිළිබඳ අසම්පූර්ණ අක්ෂර රූපයත් ඒ පිටපතේ පෙනෙන හෙයිනි. කොණ්ඩපාවන සුමෙධ ස්ථවිරයන්වහන්සේ ලියූ චුල්ලවග්ගපාළියේ අකුරු වලටත් වඩා වැඩිමල් ගතියකුත් ඒ අකුරුවල දක්ක හැකිය. එහෙයින් ටිබැට් පිටපත දෙළොස්වන සියවසේදී හෝ එයටත් ඉස්සර ලියූවක්සේ දනව අපි කල්පනා කරමු. පොතේකාලය කුමක් වුවත්

එය විබැවයට ගිය සැටිය සොයා බැලුවොත් අපේ ඉතිහාසයේ අමුතුම පරිච්ඡේදයක් පෙරළෙන්නට පුළුවනැයි සිතේ. පේරාදෙණියේ විශ්වවිද්‍යාලයෙන් පිටකළ පුස්කොළ පොත් නාමාවලිය අනුව නම් කර්මවිභාගයෙහි පාළිපරිවර්තනයක් මෙන්ම එයට ලියැවුණු සන්නයකුත් ඇත්තේය. ගාල්ලේ මිනුවන්ගොඩ පරමානන්ද විහාරයත් පාළිකර්මවිභාගය ඇතැයි කියූ තැන් අතුරෙන් එකකි. අපි එය බලන්නට එහි ගියෙමු. නමුත් එහි පාළිකර්මවිභාගයක් නැත. තිබෙන්නේ සිංහල කර්මවිභාගය පමණකි. එහි තිබුණු වෙනස නම් පොතේ මුලට "සඤ්ජීවඃ කාලසූත්‍රශ්ච" යනාදී ශ්ලෝකය සඳහන් වීමය. ඒ ශ්ලෝකය ධර්මප්‍රදීපිකාවෙහිත් දක්නා ලැබේ. කැකිරාවේ කොරසගල්ල පන්සලේ උම්මග්ග ජාතක සන්නයක් තිබෙන බවකුත් ඒ පුස්තක නාමාවලියෙහිම සඳහන් වේ. සමහරවිට පැරණි උමංද ගැටපදය සමග ඒ සන්නයෙහි සම්බන්ධයක් ඇද්දෝහෝයි සිතූ අපි එහිත් ගියෙමු අවාසනාවකට මෙන් ඒ පොතත් එහි නැත. අප හොඳින් පරීක්ෂාකර බැලූ හෙයින් උමංදව සම්බන්ධයෙන් ලියැවුණු පැරණි සන්නයක් තබා අලුත් සන්නයක්වත් එහි නැතැයි කිය හැකිය. පේරාදෙණි නාමාවලියෙහි මෙන්ම කටුගෙයි පුස්තක නාමාවලියෙහිත් නොදක්නා ලැබෙන "විජම්පිටපත" නැමැති පොතක් එහිදී අප විසින් දක්නා ලදී. එය ඇරඹෙන්නේ පඤ්චස්කන්ධවිභාගයකිනැයි මතකය අනුව කිය යුතුය. කපුදුව කන්දෙවත්තෙ පන්සලේ ඇතැයි කියූ මහාවංස සන්නයත් මනඃකල්පිතයක් විනා විද්‍යමාන වූවක් නොවේ. නාමාවලී කාරයන් මහාවංස සන්නය කැයි කියේ දීපවංස සන්නයට වේ. කාරුණු මෙසේ හෙයින් පේරාදෙණි නාමාවලිය ආරංචියෙන් සැපයුනක් විනා ප්‍රත්‍යක්ෂයෙන් සොයාබලා සපයන ලද්දකැයි නොකිය හැකිය. ලංකාවේ පොත් ගුල්වල තිබෙන පොත් සම්බන්ධයෙන් නාමාවලියක් සැපයීම වූකලී ආණ්ඩුවේ සම්බන්ධයත් ඇතිව ලොකු වියදමකින් සහ මහත්සියකින් සිදුකළත් සම්පූර්ණ නොවන දුෂ්කර කාර්‍යයකි. පැරණි

පොත්ගුල්වලට ආධිගාහීතවැ සිටින වැසිදෙනෙක් එහි මොනවා ඇද්දැයි නොදනිති. කරුණු මෙසේ තිබියදී වියදම කුත් නොකොට තැන්තැන්වලත් නො ඇවිද ආණ්ඩුවේ සම්බන්ධයකුත් නොමැතිවැ පුටුවපිට සිටගෙනම මෙවැනි කාර්‍ය්‍යයක් සිදුකරන්නට කල්පනා කළ පින්වතුන්ට අපේ පුදුමයත් කනගාටුවත් ප්‍රකාශ කරමු. නොයෙක් හේතූන් නිසා කාලයක් තිස්සේ අභාවිතවැ පැවැති කර්මවිභාගය පළමුවෙන්ම මුද්‍රණය කරවන ලද්දේ ආචාර්‍ය්‍ය ඉස්වැල්ලේ ඉන්ද්‍රරතන ස්ථවිරයන්වහන්සේ විසිනි. උන්වහන්සේගේ සද්ව්‍යායාමයට ප්‍රශංසා කරන අතරම එහි ශුද්ධිය ප්‍රශස්ත නොවන බවත් කියනු කැමැත්තෙමු. පොත මුද්‍රණයවී දැනට අවුරුදු තිස් ගණනක් ගතවී තිබෙන හෙයින් පොතක් සොයා ගැනීමත් අමාරුය. එහෙයින් මේ පොත ප්‍රාචීන විභාගයට නියම කිරීමෙන් ප්‍රාචීන කාරක සභාවේ අනුකාරක සභාව විසින් කරන ලද්දේ වැදගත් ශාස්ත්‍රීය ප්‍රතිෂ්ඨාවකැයි කියමු.

ත්‍රිපිටකයට අයත් පෙළ පොත්වල සහ තදට්ඨකථාවන්හි තැනින් තැන විසිරී තිබෙන කර්මයනුත් කර්මවිපාකයනුත් පිළිබඳ තොරතුරු පමණක් නොවැ කර්මවිපාක දෙන තැන් සහ ඒවා විපාක දෙන සැටිත් මෙහි සවිස්තරවත් විචිත්‍රවත් දක්වා ඇත්තේය. එබැවින් එකී කරුණු දැන ගැනීමට මේ පොත තරම් ප්‍රයෝජනවත් වන අනෙකක් සිංහල පොතක් නැත. සප්තකාමස්වර්ගයෙහි ඇතිතාක් සියලු සැපත් විඳ අවසානයෙහි නිවන්පුරටත් පැමිණියැහැකි මෝක්ෂමාර්ගයත් මෙහි මැනවින් විස්තර වන්නේය. එහෙයින්ම මේ පොත හැම බෞද්ධ ගෙදරකම තිබියැ යුතු බෞද්ධයන්ගේ අත්පොත කැයි කියැ යුතුය. නමුත් මේ පොතේ කාලය හෝ කර්තෘවරයා සම්බන්ධයෙන් නිගමනයක් කරන්නට නොහැකිවීම බලවත් පාඩුවක්සේ පෙනේ. ඇතැම් භාෂාරීතින් ශබ්ද බිඳීමුත් සමහර වචනයනුත් සම්බන්ධයෙන් සලකනවිට හැඟෙන්නේ පොතේ රචනා කාලය දෙළොස්වන හෝ එකොළොස් වන සියවස විය යුතු බවය.

භාෂාව අතින් සලකතොත් මේ පොත හොඳින් ගැළපෙන්නේ ධර්මප්‍රදීපිකා අමාවතුරු යන දෙපොත සමගය. විශෙෂයෙන් ධර්මප්‍රදීපිකාව අනුවහිය වාක්‍ය ඝටනාවනුත් මෙහි සුලභව දක්ක හැකිය. එවමාදි ධ්‍යන් ඝණ ප්‍රතිපන්න එසේවූවනුදුගේ තිර සැම්වැම්ලි ගෙකක් දහ ගාථා යනාදී වචනයන් මෙන්ම "ජාති ජරාමරණාදි අනෙක දුක්ඛයෙන් සම්භග්න විභග්නවූ භවාභව විපරි-වර්තමාන ලෝකය දකූ" යනාදී ප්‍රාස බාහුල්‍යයෙන් බැබැලෙන වාක්‍යයනුත් විශෙෂයෙන් සලකා බැලියැ යුතුය. කාරල ගෙවර පූණි පැණියක නියබඩු යනාදී යෙදුම් මේ පොතට පමණක් සීමාවුණුසේත් සැලැකියැ හැකිය. නියබඩු යනු නියකැත් යන්න වෙනුවට වැරැදී වැටුණක් දැයි පරීක්ෂා කළ යුතුය. සෙමුව සෙ ළිහිණි යන වචන වෙනුවට සෙබඩමුව සෙබඩ ළිහිණි යන වචන අපට ලැබුණු බොහෝ පිටපත්වල ආයේය. අනෙක් සිංහල පොත් පත්වල සොයා ගන්නට නොමැති පැරැණි සිංහල වචන කීපයකුත් මේ පොතේ ඇත්තේය. මෙහි එන එවැනි වචන සියල්ලම සෝරතනායක සථවිරයන් වහන්සේගේ ශ්‍රී සුමඞ්ගල ශබ්ද කොෂයෙනුත් ගිලිහී තිබේ. දෙවන මුද්‍රණයෙහිදිවත් මේ පොත බලන හැටියට අපි උන්වහන්සේට ආරාධනා කරමු.

ග්‍රන්ථාන්තරයෙහි තවමත් අවිනිශ්චිතව පවත්නා ඇතැම් වචනවල අර්ථාවබොධය සඳහාත් මේ පොත ප්‍රයෝජනවත් වන්නේය.

ධම්පියාඅටුවා ගැටපදයෙහි විසොධයී (12-8) යන පාළි වචනයට අර්ථවශයෙන් යොදා තිබෙන "සේබැලීය", යන වචනයත් එවැන්නකි. සෝරතනායක සථවිරයන්වහන්සේ සිරිසුමඞ්ගල ශබ්දකොෂයෙහිදී මේ වචනය ශුද්ධකරන්නේ "සේඩි, බැලී" කියාය. අපට මුලදී පෙනුනේ සෝධාලීය යන්න ශුද්ධපාඨයසේය. නමුත් එහි ශුද්ධපාඨය සේබැලීය යන්නමැයි. සේ, ක්‍රමානුකූලව-විධිපරිදි; බැලීය, බැලුවේය

යනු අර්ථයි. සිබවලද විනිසෙහි මිච්ඡා යන්නට නොසේවූ, යි අර්ථ කියු සැටින් ;සලකනු. දිබබංවකචුං යනුව දිබබවකචුනා, සිගෙන විසොධයි ශබ්දයත් සමග ගැලපූවිට දිබබවක්බුනා විසෝධයි යන පාඨය ලැබේ. එයින් කියැවෙත්නේත් දිව්‍ය සිත්නිවැරැදිසේ ක්‍රමානුකූලව බැලීය යන අර්ථය වේ. දිව ඇසින්;නිවැරැදිව බැලීමත් දිව්‍ය පිරිසිදු කිරීමකි.

පූජාවලියෙහි (308 කුණුවීමල) එන "කඹුරුබොරුවෙහි ඉදිකටුවික්කාසේ" යනුත් එසේ අර්ථය අවිනිශ්චිතවූ පවත්නා තවත් තැනකි. එයින් කියැවෙත්නේ සූචි ජාතකයෙහි සම්පිණ්ඩනයකි. (6-2) මේ බොරු ශබ්දය බුහුරු හෝ බොහොරු ශබ්දය ප්‍රභවකොට ඇත්තේ නම් ගස් ආදියෙහි සිදුර, වළ යනාදී, අර්ථයත් එයින් ගත හැකිය. මහාබොධි වංශයෙහි පෙනෙන "කුම්භකාරාවාටකං" (ම. ව. කුම්බලවාට) යන්නෙහි සිංහල නාමය කුඹල්වළ යනුවේ. එය මහාබොධිවංස ගැටපදයෙහි පෙනෙන්නේ කුඹල් බොහොරුව කියාය. බොහොරු ශබ්දය ආවාටාර්ථයෙහි වැටුණු බවට එය නිදසුන් කළ හැකිය. පූජාවලියෙහි එන බොරු ශබ්දය මේ දෙඅර්ථ යම තොදෙයි. මේ පොතේ දෙතැනකම (20-124 පිටු) බුවරි බුවරු යන ශබ්දයෝ පැනෙති. මෙහි එන සකුර් හල් බුවරි යන්න වෙනුවට සකුලුද යි සූත්‍ර අටුවාහි කොවට්ටවිජ ශබ්දය යෙදුනේය. ඉදිකටුව විකුණන්නට කම්මාර ග්‍රාමයට ගිය අපේ බොධිසත්ත්වයන්වහන්සේ සිය ඉදිකටුව අන්‍යයන්ට ප්‍රදර්ශනය කරන ලද්දේත් කම්මාර වීථියෙහිදීය. ඉහත දක්වූ කඹුරු බොරුවෙහි යනාදි පාඨය දහම්සරණෙහි තිබෙන්නේ "කඹුරු පෝරුවෙහෙහි ඉදිකටු විකොටූ" කියාය. බුවරු බුවරි යන දෙශබ්දයම මේ පෝරු (පුවරු) ශබ්දය සමග හොඳින් ගළපන්නටත් පුළුවන. පූජාවලී පාඨයෙහි එන වෙහි යන්න වෙනුවට දහම් සරණ පාඨයෙහි වෙයෙහි, යි යෙදුණු සැටිද සැලැකිය යුතුය. බොරුවෙහි යන රූපය බොරු ශබ්දය සත්වන විබත් ගැනීමෙන් තොවූ බොරු (පෝරු) වෙය යන දෙශබ්දය එකතුවීමෙන් සැදුණු බැවද එසේම සැලකිය යුතුය.

කාරුණු මෙසේ හෙයින් දහම් සරණ පාඨය ශුද්ධපාඨය සේ සලකන්නට ඉඩ ඇති බව අපට පෙනේ.

දැනට තිබෙන පුස්කොළ පොත් අනුව සලකතොත් පිටපත්වල එන පාඨයක්ම පොතේ යොදන්නට යැමත් අවදානම් බව පෙනේ. නොකටහෙන යන්න "නොකොටහෙන" කියා විබැව් පිටපත ආදී පිටපත් කීපයක තිබුණු නමුත් අපි ඒ පාඨය අත් හළෙමු. උපය දසින් තිපත් උපයු ආදී අතීතකෘදන්තයන් ඉපැයූ ඈ විසින් වෙනස් කරන්නටත් අපි කල්පනා නොකෙළෙමු. පිට පත් මැඩි ගණනක දක්නා ලැබිමත් පාඨයක් හෝ වාක්‍යයක් නිවැරැදි වීමට හේතුවක් නොවේ. අපි මේ කාරණය සඳහා බුත් සරණ නිදසුනක් වශයෙන් ගනිමු. බුත්සරණ කීප දෙනකුන් විසින් කීපවරක්ම සංශෝධනය කළ පොතකි. ලබුගම ලඞකානන්ද පණ්ඩිත ස්ථවිරයන් වහන්සේගේ කල්පනාවේ හැටියට නම් එය ශුද්ධකොට මුද්‍රණය කරවන ලද්දේ වැලිවිටියේ සෝරතනායක ස්ථවිරතේ වහන්සේ විසින් පමණකි. පණ්ඩිත මාද්‍රෝවිට ස්ථවිරයන් වහන්සේගේ පොත ශුද්ධකොට මුද්‍රණය කරවන ලද්දක් නොවේ, සෝරතනායක ස්ථවිරයන් වහන්සේගේ බුත් සරණෙහි මුල්ම වාක්‍යය ඇරැගෙන බලමු. "සුවයෙහි මිහිරි දන්නා" යන්නෙන් ඇරැඹෙන ඒ වාක්‍යය.........බුත්සරණයාපුතුයන්නෙන් අවසන්වේ. මේ වැකියෙහි සත්පුරුෂයන් විසින් යන්න වෙසෙසු පද සුවිස්සක් පමණ ඇත්තේය. එයින් එකක් නම් "තමන් වැඳපිදුවන් අමාමහනිවන්හි ඇරැසිටුවනු කැමැති" යනුයි. නැතේ හැටියට මේ විශෙෂණය වඩාත් යොග්‍යවන්නේ සත්පුරුෂයන් විසින් යන්නට නොව බුදුන් යන්නටය. මේ ප්‍රථම වාක්‍යය හැර අනෙක් සෑම වාක්‍යයකම බුදුන් යන්නටත් විශෙෂණයක් යෙදී තිබේ. පොතේ තිබෙන සැටියෙන් මේ වාක්‍යය අනුව නම් බුදුන් සරණ යාපුතු බව විනා කෙබඳු බුදු කෙනකුන් සරණයාපුතුද යන්නක් ගැන නොකියැ වෙන බව හැඟී යයි. බුත්සරණයේ ක්‍රමය එය නොවේ. බුත්සරණේ හැම වාක්‍යයක්ම ඉවරවන්නේ බුදුන්වහන්සේගේ සරණයෙමියි බුත්

සරණ යායුතු, බුදුන් සරණ යායුතු යනාදී පදයකිති. නමුත් ඒ කිසිම තැනෙක බුදුන් යනුව විශෙෂණ විරහිතව හුදකලාව නොයෙදුනේය. දෙවන තෙවන ආදී සියලු වාක්‍යයන්හි විශෙෂණ සහිතව බුදුන් යන්න යෙදී තිබියදී ආරම්භ වාක්‍යයෙහි පමණක් විශෙෂණ රහිතවළුය යෙදෙන්නට කාරණයක් නැත. එහෙයින් බුත්සරණේ මුල්ම වාක්‍යය...... "මිහිරි වන්නා කැමැති සත්පුරුෂයන් විසින් තමන් වැඳ පිදුවන් අමාමහ නිවන්හි ඇර සිටුවනු කැමැති බුදුන් සරණයෙම්යි බුත්සරණයායුතු" කියා සකස් විය යුතුසේ අපට හැගේ. ලංකානන්ද පණ්ඩිත ස්ථවිරයන් වහන්සේගේ පොතෙත් ඒ වාක්‍යය සෝරත නායක ස්ථවිරයන්වහන්සේගේ පොතේ පෙනෙන ආකාරයෙන්ම පෙනේ. ෂට් ශාස්තෘවරයන්ගේ නම් සම්බන්ධයෙනුත් එසේම කියැ යුතුය. අවෙල කාශ්‍යප මක්ඛලිගෝසාල අජිතකෙසකම්බල නිගණ්ඨනාථපුත්‍ර කකුධකාත්‍යායන පූරණකාශ්‍යප යනු සෝරතනායක ස්ථවිරයන් වහන්සේගේ සංශොධිත බුත්සරණේ එන ෂට් ශාස්තෘවරයෝය. (91 පිට) මොවුන්ගේ නම් පෙළ අටුවා පොත්වල මෙන්ම පූජාවලී ආදී සිංහල පොත්වලත් අතිශයින් ප්‍රසිද්ධය. එකී පොත්වල පෙනෙන ෂට් ශාස්තෘවරයන්ගේ නාමමාලාවට අවෙලකාශ්‍යප නාමය ඇතුලත් නොවේ. ඒ හැම පොතකම පෙනෙන්නේ සඤ්ජය බෙල්ලට්ඨිපුත්ත නාමයමැයි. බුඩකාලයෙහි අවෙල කාශ්‍යප නාමයෙන් ශාස්තෘවරයකු නොසිටි අතර ඔහු ඇති කළ වාදයකුත් ග්‍රන්ථාන්තරයෙහි සඳහන් නොවේ. සඤ්ජය. බෙල්ලට්ඨි පුත්‍රයා බුදුන් දවසත් සම්භාවිතවැ විසූ දර්ශනවාදියෙකි. ඔහු ඇති කළ දර්ශනයත් අවිනිශ්චිතතා වාදය නමින් ප්‍රසිද්ධය. සැරියුත් මුගලන් දෙනමුත් ඔහු ළඟ කලක් විසූහ. මෙසේ බැලූ බැල්මට හැම තැනම හමුවණ මේ කාරණය විද්‍යාචක්‍රවර්තීන් විසින් වරද්දණ ලද්දේයයි අපි මොහොතකටවත් නොසිතමු. එතුමා දක්වූ ෂට් ශාස්තෘ වරයන්ගේ නම් බුත්සරණේ (සෝරත) 161 –162යන පිටුවල දක්නා ලැබේ. එහි සඤ්ජය බෙල්ලට්ඨිපුත්‍රනාමය මිසැ අවෛල කාශ්‍යප නාමයක් නොපෙනේ. එක

කතෘක පොතක මෙවැනි ප්‍රසිද්ධ කාරණයක් සම්බන්ධයෙන් දෙපලක දෙවිධියක් ඇති වන්නට බැරිය. ලංකානන්ද සංස්කරණයෙහිත් ඒ පැටලිල්ල එසේමය. නමුත් උන්වහන්සේගේ පොත සෝරත නායක ස්ථවිරයන්වහන්සේගේ පොතට වඩා බෙහෙවින් ප්‍රශස්ත බව කියමනාමය. ජයතිලක මහත්මයාගේ සද්ධර්මරත්නාවලි ශුද්ධියත් පරීක්ෂා නොකළ යුතු තරමටම පිරිසිදු සේ සමහරු දකිති. පොත අරඹන මුල්ම වාක්‍යය දෙස විමසුම් ඇස හෙලා බැලුවොත් එහි අර්ථානුකූල සම්බන්ධයක් නොමැති බව] වැටහී යා යුතුය. කිරිඇල්ලේ පණ්ඩිත ඤාණවිමල ස්ථවිරයන් වහන්සේගේ සද්ධර්මරත්නාවලී ශුද්ධියකුත් ළඟදී නිකුත්වී තිබේ. ජයතිලක මහත්මයාගේ පොතට වඩා අමුත්තක් ඒ ශුද්ධියෙහි ඇති බවකුත් අපට නොපෙනේ. අර්ථානුකූල මුල් වාක්‍යය මෙන්ම සුලුහෙයි (160) ඇඟහිසනසා (අගහිගනසා) (129) යනාදී තැන් දෙපොතේම එකසේ යෙදී ඇති හෙයිනි.

පක්ෂයටත් මුදලටත් තැනටත් නොව, භාෂා ශාස්ත්‍රාදියට ගරු කෙරෙමින් මේ පොත් විමසුවොත් මෙයටත් වඩා හාස්‍ය ජනක දේ හමුවන්නට පුළුවන. මූහුණ පාන්නට සිදුවන විපත් ගැන නොසලකා මේ කරුණු කිහිපය කියන ලද්දේ මධ්‍යස්ථ උගතුන්ගේ බුද්ධියත් මේ පොත් වෙත යොමු කරවන අභිලාෂයෙනි. කම්මවිභාගය පිළිබඳ මේ ශුද්ධියත් නොයෙක් අඩුපාඩුවලින් සහ වැරදි වලින් යුක්තවන්නට පුළුවන. ඒවා අපට දන්වීමෙන් හෝ වෙන මංවලින් ප්‍රසිද්ධ කරනමෙන් සිංහල උගතුනට ගෞරවයෙන් ආරාධනා කරමු. සවකීය විහාරස්ථානයෙහි තිබුණු කම්මවිභාගය පුස්කොළපොත දීමෙන් උදව් කළ ගාල්ලේ මිනුවන්ගොඩ සිරිපරමානන්ද විහාරාධිපති ගෞරවාර්හ ධම්මානන්ද ස්ථවිරපාදයන්වහන්සේට සහ මේ කාර්‍යය සඳහා මට උදව් කළ පණ්ඩිත හිණ.පැතිල්ලේ ඉන්දවංශ ස්ථවිර මගේ පිරිවෙනේ උපප්‍රධානාචාර්‍ය මුරුතැන්ගේ පේමාලංකාර ස්ථවිර, ගැටමාන්නේ පියසිරි ස්ථවිර කඩවැද්දුව සුමඞ්ගල භික්ෂු යන සිව්නමත් සාදරයෙන් සිහිපත් කෙරෙමි. කුඩාවුවත් මේ බණ පොත බෞද්ධයන්

අතට දීමෙන් ජනිත පුණ්‍යඵලය මැද උයන්ගොඩ සිරිසුමනාරාමාධිපතිවූ වැඩ වෙසෙන මගේ ආචාර්‍ය්‍ය පදප්‍රාප්ත සිරිපඤ්ඤානන්ද වංසාලඞ්කාර ගෝදවේ විමලධම්මාභිධාන ගෞරවාර්හ ස්වාමීන්ද්‍රයන් වහන්සේටද මගේ දයාබර මව්පිය දෙදෙනාටද මගේ ඉගෙනීම් ආදියට උපකාර කළ සරික්කාමුල්ලේ සිරිනන්දන පිරිවෙනේ දායක පිරිසටද කෙසෙල්වත්තේ පේම නිවසෙහි පදිංචි ඕ. එච්. ඇෆ්. පීරිස් මහත්මයා සහ ජයනානි නිවසෙහි පදිංචි ටී. වෛ. ආර්. පීරිස් මහත්මයා ප්‍රධාන පිරිසටද හොරේතුඩුවේ දෙල්ගහවත්තේ අභිනවාරාමයෙහි ප්‍රධාන දායක තැන්පත් ඒ. ඇම්. අල්විස් හිටපු රාළහාමිටද මේ පොතේ මුද්‍රණ කටයුතු කාල වේලාවටත් කරදුන් වැල්ලම්පිටියේ සුභද්‍ර යන්ත්‍රාලයාධිපති ජේ. කේ. ජී. ජයවර්ධන මහතාටද ඉතා සතුටින් අනුමෝදන් කරවන අතර සියලු සත්වයෝත් සුවපත් වෙත්වායි ප්‍රාර්ථනා කෙරෙමි.

සසරවසනාතුරු–කම්සැප කෙරෙන් විරතවූ
හෙළබසද සම්බුදු–සසුන රකිනට සමත් වෙම්වා

මීට,

සරික්කාමුල්ලේ සිරිනන්දන පිරිවෙන් විහාරස්ථාන යෙහි ආවාසික භික්ෂුව වන මැදඋයන්ගොඩ විමල කීර්ති ස්ථවිර.

2505. පොසොන් පුණු පොහෝ දින
සරික්කාමුල්ලේ සිරිනන්දන පිරිවෙනේ දීය.

# සංවර්ණිත පද


අජටාකාශ 143, 149,
අණ්ඩජ 153,
අවේෂ 61,
අඳුරෙන් අඳුරට යන්නා 31,
අඳුරෙන් පහනට යන්න 32,
අනන්ත කල්පය 2,
අනන්ත කථා 109,
අනෝතත්තපප 44,
අපායසහාය 73,
අභ්‍යස්තකර්ම 122,
අමෝහ 62,
අලෝභ 61,
අෂ්ට ධර්ම සමාධාන 179,
අසුරයෝනිය 21,
අහිරික 44,
ආඥක්ෂේත්‍ර 172,
ආපස්සංවති 164,
ආසන්න කර්ම 121, 122,
ඊර්ෂ්‍යා 43,
උච්ඡේද දෘෂ්ටි කථා 112,
උපඝාතක කර්ම 120,
උපපාදුක 153,
උපපීඩකකර්ම 120,
උපස්තම්භ කර්ම 120,
උපේක්ෂා පාරමිතා 182,
උපේක්ෂා වේදනා 65,
ඖද්ධත්‍ය 43,
ක්ලේශකාම 95,
ක්ෂාන්තිපාරමිතා 182,
කර්ම 133,
කර්ම නිමිත්ත 132,
ක්ලේශකාමයන්ගේ
ආස්වාද 96,
කාම සුඛ කථා 112,
කාම ආදීනව 96, 97,
කාලසූත්‍ර 1,
කුම්භට්ඨාන කථා 111,
කෘතත්වාත් කර්ම 123,
කෞකෘත්‍ය 43,
ගතිනිමිත්ත 132,
ගුරු කර්ම 121,
ග්‍රාම 110,
චෝරකථා 108,
ජන්ම ක්ෂේත්‍ර 172,
ජනක කර්ම 120,
ජලාබුජ 153,
ඤාති කථා 119,
ථීන මිද්ධ 43,
ද්වේෂ 42,
දානපාරමිතා 181,
දසිහායසී 113,
නගර 110,
නිගම 110,
පහතින් අඳුරට යන්නා 32,
පහතින් පහනටයන්නා 32,
පුබ්බපේත කථා 111,
ප්‍රඥාපාරමිතා 182,
ප්‍රතිපක්ෂ භායසී 113,
භගිනි භායදී 13,
භය කථා 109,

මහා අවීචිය 1,
මහා මත්‍යා කථා 108,
මහා රෞරව 1,
මාත්සර්‍ය 43,
මාතෘභාර්‍යා 113,
මාන 43,
මෝහ 43,
යාන කථා 110,
යුද්ධ කථා 109,
රාජ කථා 108,
රෞරව 1,
ලෝකක්ඛායික කථා 111,
ලෝභ 42,
වස්තුකාම 95,
විචිකිච්ඡා 43,
විෂයක්ෂෙත්‍ර 172
විසිකා කථා 110,
වීර්‍ය පාරමිතා 182,
වෘද්ධි කථා 112,
ශාශ්වත දෘෂ්ටි කථා 111,
ස්ත්‍රී කථා 110,
ස්වාමි භාර්‍යා 113,
සංඝාත 1,
සංසේදජ 153,
සඤ්ජීව 1,
සඛිභාර්‍යා 113,
සත්‍ය පාරමිතාව 182,
සීල පාරමිතා 181,
සුරකථා 110,
සේනා කථා 109,

# කර්ම විභාගය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

i **සඤ්ජීවය** ii **කාලසූත්‍රය** iii **සඞ්ඝාතය** iv **රෞරවය** v මහා රෞරවය vi **තාපය** vii **ප්‍රතාපය** viii **අවීචිය** යන අටමහ නරකවලෙහි ආදිනරකය—

i කඩ කඩ කොට යම පලුන් විසින් සිඳිනා ලද්දහු ෂමහිලා දෙති'යි **සඤ්ජීව** නම් විය.

ii ගිනිගෙන දිලියෙන කළුහු ගසා සිවුරැස් අටැස් සොළොස් ඇස් කොට සිඳිනා සතුන් ඇති නරකය **කාලසූත්‍ර** නම් විය.

iii සතුන් සුන් සුන් කොට මිරිකන යපවු ඇති නරකය **සඞ්ඝාත** නම් විය.

iv සතුන් ගේ නව වණ මුඛයෙන් සියලු සිරුරැ[1] වැද දවන ජ්වාලා හා ක්ෂාරධූමයෙන් ගුගුරා පස්නා සතුන් ඇති නරකය **රෞරව** නම් විය.

v මෙසේමවූ දුකින් බලවත්ව ගුගුරා පස්නා සතුන් ඇති නරකය **මහා රෞරව** නම් විය.

vi දිලියෙන යපොළොව යහුල ඇවිණී හිඳ නිසලව පැසෙන එක්වන් දිලියෙන ගින්නෙන් තැවෙන සතුන් ඇති නරකය **තාප** නම් විය.

vii මෙසේම එක්වන් දිලියෙන ආයුධයෙන් පැහැර දිලියෙන යපවුවට නැගූ සතුන් කර්මජ වාතයෙන් පැහැර ඌර්ධ්වපාද කොට ගෙන හෙළා පියත්.[2] යපොළොව යකබලින් නැඟී දිලියෙන

1. සිරිරට. 2. පිවත්

සහුල හිස පටන් ගෙන ඇවිණි බලවත්ව පැසෙන සතුන් ඇති නරකය ප්‍රතාප නම් විය.

viii ජ්වාලායෙනිදු[1] දුංඛයෙනිදු සතුන් විසිනුදු නලෙක පිරූ මල් තුඹු පිටි සේ අතුරු නැතිව සතර ඉරියව්වෙන් පැසෙන සතුන් ඇති නරකය මහා අවීචි නම් විය.

මේ අටමහා නරකය චතුරශ්‍රය. චතුර්ද්වාරය. නව යොදුන් ඝනබලය. අටනරකයෙහිම ජ්වාලා හාත් පසින් සියක් යොදුන් පැතිර සිටියි. මේ අටමහා නරකයෙහි බොහෝ සෙයින් සිල්වත්නට වැරැද්දහු පැසෙති. මේ අටමහා නරකයෙහි එකී එකී වාරයෙහි සතර සතර ඔසුපත්ය. ඒ නියායෙන් එකී එකී නරකයෙහි සොළොස් සොළොස් ඔසුපති. හේ එක්සිය අටවිස්සෙකි. මහානරක අට හා සමඟ එක්සිය සතියෙකි.

i මිනිස් ලොව අනූලක්‍ෂයක් හවුරුදු මෙකියන ලද අටමහා නරකයෙහි ආදි කොට දක්වූ සඤ්ජීව නරකයෙහි එක් දවසෙක් වෙයි.[2] ඒ නියා තිස් දවස් මස් කොට, දොළොස්මස් හවුරුදු කොට, ඒ නියා හවුරුද්දෙන් ඒ නරකයෙහි පන්සියක් හවුරුද්දට ආයුෂය. ii මිනිස්ලොව තුන්කෙළ සැටලක්‍ෂයක් හවුරුදු දෙවන කාලසූත්‍ර නරකයෙහි එක් දවසෙක් වෙයි. ඒ නියාදවසින් ඒ නරකයෙහි දහසක් හවුරුද්දට ආයුෂය. iii මිනිස්ලොව තුදුස්කෙළ සතළිස් ලක්‍ෂයක් හවුරුදු තුන්වන සඞ්ඝාත නරකයෙහි එක් දවසෙක් වෙයි. ඒ නියා දවසින් ඒ නරකයෙහි දෙදහසක් හවුරුද්දට ආයුෂය. iv මිනිස්ලොව සත්පණස්කෙළ සැට ලක්‍ෂයක් හවුරුදු සතරවන රෞරව නරකයෙහි එක් දවසෙක් වෙයි. ඒ නියා දවසින් ඒ නරකයෙහි

1. ජ්වාලායෙනුදු 2. වේ.

සාරදහසක් හවුරුද්දට ආයුෂය. v මිනිස්ලොව දෙසිය තිස්කෙළ සතළිස් ලක්‍ෂයක් හවුරුදු පස්වන මහා රෞරව නරකයෙහි එක් දවසෙක් වෙයි. ඒ නියා දවසින් ඒ නරකයෙහි අට දහසක් හවුරුද්දට ආයුෂය. vi මිනිස්ලොව නවසිය එක්විසිකෙළ සැටලක්‍ෂයක් හවුරුදු සවන තාප නරකයෙහි එක් දවසෙක් වෙයි. ඒ නියා දවසින් තිස් දවස් මස්කොට දොළොස්මස් හවුරුදු කොට ඒ නියා හවුරුද්දෙන් ඒ නරකයෙහි සොළොස් දහසක් හවුරුද්දට ආයුෂය. vii සත්වන ප්‍රතාප නරකයෙහි අන්තඃ කල්පයෙන් අර්ධයකට ආයුෂය. viii අටවන මහාඅවීචියෙහි එක් අන්තඃ කල්පයකට ආයුෂය.

එහි අන්තඃ කල්පය නම් කවර? යත්;- එක් මහා කල්පයෙක් සංවර්තය, සංවර්තස්ථායී ය, විවර්තය විවර්තස්ථායි ය, යන සතරෙක් වෙයි. ඒ සතරම සතර අසංඛ්‍ය කල්ප නම් වෙයි. එහි අසංඛ්‍ය කල්පයෙක් විසි අන්තඃ කල්පයෙක් වෙයි. එක් අන්තඃ කල්පයෙක් නම්;- ශස්ත්‍රයෙන් හෝ රෝගයෙන් හෝ දුර්භික්‍ෂයෙන් හෝ හැම සතුන් විනාශයට ගිය කල එහි රැකුණු සත්ත්වයන්ගේ සන්තානයෙහි කුශල ධර්ම ප්‍රභවයෙන් දස හවුරුද්දෙහි පටන්ගෙන ක්‍රමයෙන් අභිවෘද්ධව අසංඛ්‍යයට ගොස් අසද්ධර්ම සමාදානයෙන් ක්‍රමයෙන් දස හවුරුද්දට බැස අවුදු පූර්වෝක්ත ක්‍රමයෙන් තුන් සංවර්තයෙන් එක්තරා සංවර්තයකින් හැම සතුන් විනාශයට ගියකල එක් අන්තඃ කල්පයෙක් වෙයි. හේ පොළොව එක් යොදුන් තුන් ගවුවක් වඩනා පමණ කලි.

මෙ අටමහනිරයහු මෙ කෛරාටිකයන් තවනුව හා බලවත් දුක් ඇති බැවින් ඝොරයහ. කප හටගත් කල හටගත් ගිනිවන බැවින් නිත්‍යවූ ගිනිසිළු ඇත්තාහ. මහත් භයජනකයහ.[1] දක්නටද අසන්වද නොනිස්සහ.

1. ජනකහයි.

නිත්‍යවූ දුක් ඇත්තාහ.[1] පූර්ව දිශාභාග භිත්තින් උපන්නාවූ ජ්වාලා මැද සතුන් දවා පශ්චිම භිත්තිය පැහැරැ එයින් පිටත යොදුන් සියයක් තැන පැතිරැ[2] සිටී'යි. තුබුතුන් දිශායෙහිද්[3] මත්තෙහිදු යට දු ජ්වාලායෙහි මෙම නියා'යි.

viii මෙහි මහා අවිචිය පුළුල නවයොදුන් යනබල් හා සමහ තුන්සිය අටළොස් යොදුන. වටා නවසිය සූපණස් යොදුන. ඔසුපත් හා සමහ දසදහසක් යොදුන නරකයෙන් යම්හයි පැළ දෙසෙහි සිටියානට පූර්වදිශාභාගයෙහි දෙර හළුවාසේ පැනෙයි. අතුරෙහි ජ්වාලායෙන්[4] මහත් දුක් විඳ සම්ප්‍රාප්ත කල[5] දෙර පිහියෙයි. තුබූ තුන් දිශායෙහිදු මෙම නියායි. මෙහි අටවන මහා අවිචිය අවයව භූතවූ ආයුෂ විසින් වෙන් වෙන්වූ අර්බුදය නිරර්බුදය අබබය අටටය අහහය කුමුදය සෞගන්ධිකය උත්පලය පුණ්ඩරීකය පද්මය යන දශනරකයෙහි ආදි i අර්බුද නරකයෙහි ආයුෂ කී? පමණෙක යත්;–

අටලක්ෂයක් තල එක් නැළියෙක් වෙයි. ඒ නියා සතර නැළියෙක් එක් ලහස්සෙක් වෙයි. ඒ නියා සතර ලහස්සෙක් එක් ද්‍රොණයෙක් වෙයි. ඒ නියා ද්‍රොණ සොළසෙක් එක් බාරියෙක් වෙයි. ඒ නියා විසි බාරියෙක් එක් වාහයෙක් වෙයි. ඒ වාහයෙහි තලඇට සතර නහුත නවකෙළ සැටලක්ෂයෙක් වෙයි. මෙයින් එක්තල ඇටක් මිනිසුන්ගේ ආයුගණනින් අවුරුදු සියයක් ගිය කල හරත නියායෙන් හරුත්, හැම තල ගෙවෙත්. නො ගෙවෙන ආයුෂය.

ii දෙවන නිරර්බුද නරකයෙහි මේ නියා විසි ගුණයකට ආයුෂය. හේ විසිවාහයෙක් වෙයි. දෙවන

1. ඇතිසහ. 2. පැහැර 3. තුබු දිශායෙහිදු 4. ජවාලායෙහි
5. සම්ප්‍රාප්තවූ කල.

නිරර්බුද නරකයෙහි කී පමණ තල එක්කොට ගෙන ඒ නියා විසි ගුණයකට ආයුෂය iii තුන්වන අබ්බ නරකයෙහි හේ සාරසියයක් වාහය. තුන්වන අබබ නරකයෙහි කී පමණ තල එක්කොට ගෙන ඒ නියා විසි ගුණයකට ආයුෂය iv සතරවන අටට නරකයෙහි හේ අට දහසක් වාහය. සතරවන අටට නරකයෙහි කී පමණ තල එක්කොට ගෙන ඒ නියා විසි ගුණයකට ආයුෂය. v පස්වන අහහ නරකයෙහි. හේ එක් ලක්ෂ සැටදහසක් වාහය. පස්වන අහහ නරකයෙහි කී පමණ තල එක්කොට ගෙන ඒ නියා විසි ගුණයකට ආයුෂය. vi සවන කුමුද නරකයෙහි හේ දෙතිස් ලක්ෂයක් වාහය. සවන කුමුද නරකයෙහි කී පමණ තල එක් කොට ඒ නියා විසි ගුණයකට ආයුෂය. vii සත්වන සෞගන්ධික නරකයෙහි හේ සකෙළ සතළිස් ලක්ෂයක් වාහය. සත්වන සෞගන්ධික නරකයෙහි කී පමණ තල එක්කොට ගෙන ඒ නියා විසි ගුණයකට ආෂයුය. viii අටවන උත්පල නරකයෙහි හේ එක්නහුත අටවිසි කෙළක් වාහය. අටවන උත්පල නරකයෙහි කී පමණ තල එක්කොට ගෙන ඒ නියා විසිගුණයකට ආයුෂය. ix නවවන පුණ්ඩරීක නරකයෙහි. හේ පස්විසිනහුත සැට කෙළක් වාහය. නවවන පුණ්ඩරීක නරකයෙහි කී පමණ තල එක්කොට ගෙන ඒ නියා විසි ගුණයකට ආයුෂය. x දසවන පද්ම නරකයෙහි. හේ පස් නිත්නහුත දෙළොස් නහුතයක් වාහය.

මේකී දසනිරැහි[1] මවුන් පියන්[2] හැඩුවෝ ගැසුවෝ බුදුන් දහම් සඟුන් හැඩුවෝ ගැසුවෝ බොහෝ සෙයින් උපදිති. පලමු නරකයෙහි කිවා සේම[3] තුබු නරකයෙහි හිඳු මිනිසුන්ගේ ගණතින් හවුරුදු සියයක් ගියකල එකි එකී තල ඇට ගරුත්, නො ගෙවෙත ආයුෂය.

---

1. දසනිරාහි 2. මවුන්පියන් 3. කිසේම

නොහොත් මේ දශනරකයෙහි විසිගුණ විසිගුණ කොට කී පමණ තල සහළු ආදි ගණනින් කියත් පළමු නරකයෙහි එක් සහළු නව අමුණු සතර ලහස්සෙක.

නිරර්බුද නරකයෙහි විසිනව සහල එක්මුණු තුන්පැළ තුන් ලහස්සෙක. අබබ නරකයෙහි පන්සිය එක් අසූ සහළු. සොළොස් අමුණු එක් පැළ පල්ලහස් සෙක. අටට නරකයෙහි එකළොස් දහස් සසිය සහළිස් සහළු සතරමුණු එක්පැළ එක් ලහස්සෙක. අහහ නරකයෙහි දෙලක්ෂ දෙපණස් දහස් සත්සිය සත්විසි සහළු පසමුණු එක් පැළ නවලහස්සෙක. කුමුද නරකයෙහි සූසාළිස් ලක්ෂ සිවුපණස් දහස් පන්සිය පන්සාළිස් සහළු නව අමුණු සතරලහස්සෙක. සෞගන්ධික නරකයෙහි නවකෙළ එක්තිස්ලක්ෂ අනූ-දහස් නවසිය නවසහළු එකමුණු දෙපැළ තුන් ලහස්සෙක. උත්පල නරකයෙහි එක්නහුත සගොනු කෙළ අටළොස් ලක්ෂ අටළොස් දහස් එක්සිය දෙසානු සහළු සොළොස් අමුණු එක්පැළ ලහස්සෙක. පුණ්ඩරීක නරකයෙහි සත්තිස් නහුත තෙවිසි කෙළ තෙසැටලක්ෂ තෙසැට දහස් සසිය සතිස් සහළු සතරමුණු දෙපැළ දස ලහස්සෙක. පද්ම නරකයෙහි සත්නින්නහුත සූසාළිස් නහුත දෙසැත්තෑ කෙළ දෙසැත්තෑ ලක්ෂ දෙසැත්තෑ දහස් එක්සිය සත්විසි සහළු තුදුස් අමුණු දෙපැළ දෙ ලහස්සෙක. මෙහිදු පළමු කීවාසේම හවුරුදු සියයක් ගියකල එකී එකී තල ඇට හරුත්, තො ගෙවෙන ආයුෂය.

මෙහි කෙළෙක් නම් කී? පමණෙක, නහුතයෙක් නම් කී? පමණෙක, නින්නහුත යෙක් නම් කී? පමණෙක, යත්:– දස දසයෙක් සියයෙක් වෙයි. දස සියයෙක් දහසෙක් වෙයි. සියක් දහසෙක් ලක්ෂයෙක් වෙයි. සියක් ලක්ෂයෙක් කොටියෙක්වෙයි. කොටි ලක්ෂයෙක්

ප්‍රකොටියෙක් වෙයි. ප්‍රකොටි ලක්‍ෂයෙක් කොටිප්‍රකොටියෙක් වෙයි. කොටිප්‍රකොටි ලක්‍ෂයෙක් නහුතයෙක් වෙයි. නහුත ලක්‍ෂයෙක් නින්නහුතයෙක් වෙයි. නින්නහුත ලක්‍ෂයෙක් හුතනහුතයෙක් වෙයි. හුතනහුත ලක්‍ෂයෙක් කම්භයෙක් වෙයි. කම්භ ලක්‍ෂයෙක් විෂ්කම්භයෙක් වෙයි. විෂ්කම්භ ලක්‍ෂයෙක් අබබයෙක් වෙයි. අබබ ලක්‍ෂයෙක් අටටයෙක් වෙයි. අටට ලක්‍ෂයෙක් අහහයෙක් වෙයි. අහහ ලක්‍ෂයෙක් කුමුදයෙක් වෙයි. කුමුද ලක්‍ෂයෙක් සෞගන්ධිකයෙක් වෙයි. සෞගන්ධික ලක්‍ෂයෙක් උත්පලයෙක් වෙයි. උත්පල ලක්‍ෂයෙක් පුණ්ඩරීකයෙක් වෙයි. පුණ්ඩරීක ලක්‍ෂයෙක් පද්මයෙක් වෙයි. පද්ම ලක්‍ෂයෙක් කථානයෙක් වෙයි. කථාන ලක්‍ෂයෙක් මහා කථානයෙක් වෙයි. මහා කථාන ලක්‍ෂයෙක් අසඞ්ඛ්‍යයෙක් වෙයි. යන අසඞ්ඛ්‍ය ගණන් මෙකී සෙයින් දතයුතු.

පරුෂ වචනයෙන් වැඩියන්ට පරිහාස කරන්නාහුද, සතර අගතියට ගොස් රටවැස්සනට වෙහෙස කළ රජ්ජුරුවෝ ද, vi තාප නරකයෙහි පැසෙත්. මවුන් පියන් මැරූවාහු පළමු කී දුක් ඇති ii කාලසූත්‍ර නරකයෙහි ද, පැසෙති. ලොහොකුඹු නරකයෙහි ද පැසෙති. දිලියෙන ක්‍ෂාරොදක ද පොවති. දිලියෙන යගුළි මුඛයෙහි ප්‍රක්‍ෂෙප ද කෙරෙති.

ගැබ් හෙළුවෝ බොහෝ වා දහස් උඩුමුවාත්වැ සිටි ක්‍ෂුරධාරා නරකයෙහිදු පැසෙති. වෛතරණී නරකයෙහිදු පැසෙති. ශරීරබල භොගබල ආඥබලයෙන් සමන්විතවූ මෙ හැම තැනැත්තන් පාණී ප්‍රහාරාදීන් වෙහෙසූවනට ද, නානා ප්‍රකාරවූ ආක්‍රොශ කොට පරා වෙහෙසූවනට ද, නිරයපාලයෝ දිලියෙන "අසිසත්ති තොමර භෙණ්ඩිවාල මුද්ගරාදි" ආයුධගෙන පැහැරූ

1. මරා

විද දුක් දෙති. එවුනු[1] එදුක් නො ඉවසන්නාහු "හෙණ්ඩිවාල" ප්‍රමාණ වෙත්‍ර ලතායෙන් සඤ්ජාත කම්ප්‍රත්‍යයෙන් උපන් දුර්ගන්ධ වෛතරණීය වෙත්‍රලතා-යෙහි නොයෙක් වාදහස් ගණන් දුක් විඳ කඩ කඩව කැඩී ඉක්බිති වෙත්‍ර ලතායෙන් ගැලවී දිලියෙන තල්කඳ සා අයශ්ශූලයෙහි මසුන් සේ ඇවිණී නොයෙක් වා දහස් පැසී, ඉක්බිති යහුලින් ගැලවී කරමුවහත් වැනි දිලියෙන යපොකුරු පත්හි නොයෙක් වාදහස් දුක් විඳ, ඉක්බිති දුම් නැගෙන දුර්ගන්ධ ක්‍ෂාරෝදකයෙහි ගි දුක් විඳැ, ඉක්බිති දියයට අස්වසෙක් ඇති-හෙයි?යි, ගැලී ක්‍ෂුරධාරායෙහි කඩ කඩව කැඩී එ දුක් අධිවාසනා නො කොට ගි මහ හඬින් හඬන්නාහු කලක් උඩුනදියට ගෙන යනු ලැබෙති. කලක් යට නදියට ගෙන යනු ලැබෙති. එකල්හි නරකයෙහි සිටි යමපල්හු "උසුසත්ති තොමර" ආදීන් විදිති. එකල්හි මහහඬින් හඬත්. එක්බිති[2] දිලියෙන යබිළිබහා ගන්වා, තගාගෙන දිලියෙන යපොත්‍රොව හොවා, මියෙහි[3] දිලියෙන යගුළි බහා ලති.

දන් නොදෙන මසුරනුදු, අනුන් දෙනු වළකන තද මසුරනුදු, ශ්‍රමණ බ්‍රාහමණයනට පරිහාස කරන්නනුදු පස්වණක් පැහැ ඇති මහ ඇතුන් පමණ බල්ලෝ තුන් ගවු සිරුරු ඇතිව උපන්නන් ලුහුබැඳ තිරු[4] කොට ගෙන දිලියෙන යපො-පොළ්‍රොව හොවා පෙර දෙපයින් ළැමැඩියේ ඇක්මගෙන සිට ඇටතබා මහහඬින් හඬව හඬවා කති. මහත් බඩු ගැලක්සා[5] ගිජු ලිහිණියෝ ලොහොතුඩුවැනි තුඩින් ඇට විද ඇටමුල් කති. අති භයානකවූ ලොහො තුඩුවැනි තුඩු ඇති කපු ටුවෝද කති.

ශීලාචාර සම්පන්න ස්ත්‍රී පුරුෂයන් තලා වෙහෙස දී මියැ එ පවින් නරකයෙහි දිලියෙන තුන් ගවු සිරුරු

1 ඔවුනු 2. ඉක්බිති. 3 මුවෙහි 4. තිරු 5. මහත් ගැල්සකක් පමණ තුඩු ඇති.

ඇතිව උපන්නන් යමපල්හු දිලියෙන නවයොදුන් යකබල් පිටදී ලුහුබැඳ දිලියෙන තල්කඳ සා යමුහුරෙන් පය පැහැර හුණුවන් සිපා පුන්පුන් කෙරෙත්.

අවකාශයක් ලදකල දන් හෝ දෙම්හ. පූජා හෝ කරම්හ. විහාර හෝ කරම්හ'යි දැහැමියන් කැටිකොට තුබූ අය තමන් සිත් තුබූසේ වැයකොට එහි යුක්ත යන්ට අත්ලස් දී මෙතෙක් මෙතෙක් ධන මෙනම් මෙනම් දෙයට වැය කළෙම්හ'යි කූට සාක්ෂින් ලවා කියවා ඒ ධන නසා මියැ නරකයෙහි උපන්නන් යමපල්හු දිලියෙන ආයුධයෙන් පැහැර ගහල් නොවදනා ගෙරින් සේවවා තිරකොට දිලියෙන අඟුරුවළ හෙළති. ඔවුන් අඟුරුවළ කටි ප්‍රදෙශය දක්වා ගැළුනත් හිස මහත් යපැසින් අඟුරු උකා ඔති. තුමූහු ද කම්බලයෙන් තමන් හිසම ඔති. මෙ දුකින් නොයෙක් වා දහස් මහ හඬින් හඬ ගඩා පස්ති[1].

ආචාර ගුණසම්පන්න සිල්වතුන් තලා හවා එ පවින් මියැ නරකයෙහි උපන්නන් භයානක යමපල්හු මහත් පණීත සා දිලියෙන කල්පසපිතවූ ලොහොකුඹු නරකයෙහි උඩ්ඪීවපාද කොට ගෙන බහාලති. නොයෙක් වා දහස් පස්ති.

පක්ෂීන් ගෙන කර අඹරා මියැ එපවින් නරකයෙහි උපන්නන් යමපල්හු දිලියෙන ලොහොයොත් කර එව තුන් ගවු සිරුරු නමා කර අඹරා කඩා කකියන ලොහොදියෙහි බහාලති. කැඩු කැඩු-තැන් හට ගන්නි. මේ නියායෙන් නොයෙක් වා දහස් පැසෙත්.

ශුඩවූ සප්ත විධ ධාන්‍යය දෙම්හ'යි අනුන් අතින් මිලගෙන[2] බොල් හකුරු පස් ආදි මුසුකොට දී මියැ එපවින් නරකයෙහි උපන්නාහු බොහෝකල්[3] නරකයෙහි පැසී ඉන් නික්ම මනා නොට ඇති සිහිල්

1. පැසෙති. 2. අයිනි ගෙන. 3. නොයෙක්කල්.

දියසේ පැනෙන දියට පිපාසා අධිවාසනා නොකොට හි පැන් බොම්හයි බස්ති[1]. ඔවුන් බටකල ඒ නදිය දෙ දිසායෙන් ඉවුරැගී නදිය ගැඹුරැවෙයි. දිය දිලියෙන යබුහු වෙයි. ඒ යබුහු කම්බලයෙන් කනි. හේ ඔවුන් සියලු[2] සිරැරු දවා අධොභාගයෙන් නික්මෙයි. එවුහු එදුක් අධිවාසනා නො කොට හී හෙනුවෝ මහනඩින් හඩ හඩා වලපිත්.

අනුන්ගේ සවිඥනක අවිඥනක වස්තු සන්ධිච්ඡේද දිය කොට ගත්තවුනුදු භයානකවූ නිරය පාලයෝ අරණ්‍යයෙ මුවන් නිරා කොට වටා ගන්නා සෙයින්[3] "උදු සත්ති තොමරා" දී දිලියෙන ආයුධගෙන දිරාගිය පතක් සෙයින් සිදුරැ විසිදුරැ කොට මහනඩින් හඬව හඬවා විදිති. එයින් මහත් දුක්-අනුභව කෙරෙති.

එළුවන් හූරන් ගෙරින් මීමුන් මසුන් මරා මස් වික්කාහු මියැ එපවින් නරකයෙහි උපදිති. එසේ උපන්නන් දිලියෙන ලොහො යොතින් ග්‍රීවායේ බැඳ ඇද ලොහොපොළොව හොවා යමපල්හු නානාවුධයෙන් කොටති. කඩ කඩ කොට කපති. අයොඵලකයෙහි මස් කපා රැස් කෙරෙති. මෙසේ නොයෙක් වා දහස් පැසෙත්.

අනිචාරිණී මාගම්හුද, පාරදාරික පුරැෂයෝ ද, දුගීඩ වෛතරණී නරකයෙහි උස යොදුන්. දිලියෙන සොළොස් අඟුල් කටු ඇති, සිම්බලි වනයෙහිදු, ලොහොකුඹු නරකයෙහිදු පස්ති.

සවාමින් කෙරෙහි, සවාමීන් බෑයන් බුහුණන් සුහුරැන් කෙරෙහි නිහරසරවත්නී 'හවන්ති තාප නරකයෙහිදු පස්ති. එහි තුන්ගවු සිරැරින් පැසෙත්තීය. දිව ද තුන්ගවුවෙයි. එදිව යමපල්හු පිටතට නෙරැ සැතින් කොටති. එක් හොරු නැවි සා පණුවෝ වෙති. මෙසේ නොයෙක් වා දහස් පස්ති.

1. බසිති. 2. සකල. 3. සේ.

එළුවන් හූරන් මසුන් මුවන් සොරුන් ගෙරින් මැරුවෝත් කෝලාම් කියා උතුන් කෙරේ බුත්තාහුත් මියැ එපවින් නරකයෙහි උපදිති. එසේ උපන්නන් යමපල්හු ගිනිගෙන දිලියෙන සැතින් කොටති. ගිනිගෙන දිලියෙන යකුළින් සිපා මිරිකති. දිරාගිය පතක් සේ හියෙන් විද සිදුරු කෙරෙති.

කුළු සවත් කොට කුළු දෙස් කියා මියැ එපවින් නරකයෙහි උපදිති. එසේ උපන්නන් යමපල්හු ගිනිගෙන දිලියෙන යකුළින් සිපා මිරිකති. බඩුයේ කූටයෙන් අගය තුබුවෝ මියැ එපවින් නරකයෙහි උපදිති. එසේ උපන්නන් යමපල්හු ගිනිගෙන දිලියෙන යකුළින් හිස පැහැරැ බිදිති. බුන්තැතින් වැගුරුණු හිස්මුල් නවයොදුන් දිලියෙන යකබල්හි කකිය වන්නාහු ඔවුන්ම පොවති. ඉක්බිති ක්ෂාරනදියෙහි පැසෙති. කොක්ණාහු කවුඩුවෝ කැණහිල් ගිජුහු ලොහොතුඩු වැනි තුඩින් හඬව හඬවා විදිති.

සෙමුවත් පැමුවත් සෙ ලිහිණියන් පැලිහිණියන් මැරුවාහු මියැ එපවින් නරකයෙහි ඉපද නානාප්‍රකාර නරකදුක් කම්කටුල් අනුභව කෙරෙති.,

රහපූගේ මියැ එපවින් නරකයෙහි තුන්ගවු සිරුරු ඇතිව උපද්දි[1]. එසේ උපන්නහු යමපල්හු ගිනිගෙන දිලියෙන යපොලොව් හොවා නාඹ තල්කද සා ගිනිගෙන දිලියෙන යහුලක් එක් අතක ගසති. එකල්හි ප්‍රචණ්ඩ වායු තැනෙක නැගු මඩුවෙක එක් තැනෙක බඳ වියනක් සෙයින් කම්පමාන වූවාහු ගිනිගෙන දිලියෙන නාඹතල්කද සා යහුලක් දෙවන අත්හි ගසති. එකල්හි ප්‍රචණ්ඩ වායු විසින්[2] කම්පිත වූ ධවජයක් සෙයින් කම්පමාන වූවාහු ගිනිගෙන දිලියෙන නාඹ තල්කදක් සා යහුලක් එක්පයක ගසති. එකල්හි තුන් තැනෙක බැඳ වියනක් සෙයින් කම්පමාන වූවාහු ගිනිගෙන

1. උපදිසි. 2. වායුවින්.

දිලියෙන නාඹ තල්කඩක් සා යහුලක් දෙවන පයැ ගසති. එකල්හි කඹුරු උදුනෙක බඳ සමක් සෙයින් මැද සිරුරින් අහසට පෙවෙන්නහු.[1] ගිනිගෙන දිලියෙන නාඹතල්කඩක් සා යහුලක් ළමැද ගසා තිසල කෙරෙත්. මෙසේ පඤ්ච විධ බන්ධන කර්මයෙන් තිරුව පස්නහු "කුමක් රුස්වහි[2]?" යි පිළිවිසිති. පිපාසිත-යෙමි "වහන්සේ,යි කීකල ගිනිගෙන දිලියෙන ලොහො එවින් ගිනිගෙන දිලියෙන ලොහොදිය ගන්වාගෙන ලහකෙරෙත්. ඒ බලා දෙ ඇස් මුව පියා ත්‍රාසවූවාහු නො ඉවසිය[3] හෙන්නහු යමපල්හු ගිනිගෙන යහඩියෙන් මුව විවෘතකොට ඔති. හේ ඔහු තොල් දවා දිව් දවා කටදවා උගුරුදවා [ළයදවා] අතුණු දවා අතුන් බහන් දවා අධොභාගයෙන් නික්ම යෙයි. මෙසේ මහදුක් විඳ පස්නහු වැලිදු "කුමක් රුස්ව හි"යි පිළිවිස, සාමි "වහන්සේ, යි කීකල යමපල්හු ගිනිගෙන දිලියෙන යවට ලොහො-පැස එවගෙන[4] ලහ කෙරෙත්. ඒ බලා බලවත් වූ දුක් දෙම්නස් ඇතිව ඇස්මුවපියා ත්‍රාසවූවාහු නො ඉවසත්ම ගිනිගෙන දිලියෙන යහඩියෙන් මුව විවෘතකොට මුවෙහි යවට බහාලත්. හේ ඔහු තොල් දිව් මුව උගුරු ළය අතුණු අතුනු බහන් දවා අධොභාගයෙන් නික්මයෙයි. මෙසේ නොයෙක් වා දහස් කම් කටුල් විඳ[5] සැකියන දියසැලෙක බහාලූ පරණලා[6] පතක් සෙයින් අනවසවිතව, ලුණු පිඩක් සෙයින් විරෙන[7] බලවත් දුක් දෙම්නසින් තැවෙන තිස්වා දහසකින් පැසී සැළපල්ලට බත්නා තිස්වා දහසකින් පැසි සැළ මුවවිට තැගෙන ලොහොකුඹු නරකයෙහි බහාලනු ලැබේ.

මෙතැම අකුශල් කර්මයෙහි විපාක මුඛ්‍යවූ කම් කටුළු විසින් කීයේය. බලවත් නොයෙක් පවු[8] කළ

1. පිඩෙන්නාහු - පෙළෙන්නාහු 2. රුස්හි - රුස්වයි.
3. නො ඉසයෙන්මය 4. එවාගෙන. 5. විදි ඉක්බිති. 6. පරඬලා.
7. විරෙනුව. 8. පවු.

සත්හු වූකල මෙකී හැම නිරයමැ මෙම ක්‍රමයෙන් ආයුපමණින් පැසී කඹ ගී නොගිය හොත් නැවත මහ නරකයේම බහා ලනු ලැබෙත්. මේ පිටකත්‍රයෙහි ආ නරක දුක් සංක්‍ෂෙපය.

අනෙකප්‍රකාරයෙන් තන්හි තන්හි නරක දුක් දෙසූ බුදුන් තමන්ම නරකයෙහි දුක් විස්තර කොට "මයිදු කියත් මුව නො පොහෝ" යි වදාළ බැවින් නරකයෙහි දුක් අනන්තයයි දතයුතු. නරකයෙහි පස්නට[1] නිසි බලවත් පාපකර්ම නැත්නම් තිර්‍යග් යොනිය ඉපද විඳින්ට නිසි මොගිව අන්ධබාල ජඩ දුමෙමධව කර්තව්‍ය 'කර්තව්‍ය නොදැන කළ අකුශල කර්මයෙන් පර්වතයෙහි, කන්දරයෙහි, ගිරි ගුහායෙහි, පෘථි වියැ අභ්‍යන්තරයෙහි, අභ්‍යව කාශයෙහි, උදකයෙහි ක්ෂෙත්‍රයෙහි, ග්‍රාමයෙහි, ගෘහයෙහි, පර්වතකූටයෙහි, චන්දනිකායෙහි, වර්චස් කූපයෙහි, පූතිමත්ස්‍යයෙහි, පූති කුණපයෙහි, යනාදි අනෙකස්ථානයෙහි ඇසට විෂය නොවන ක්මිකුලන් පටන්කොට යාවත් පන්සියයක් යොදුන් "තිමිර පිඞගල" මසුන් දක්වා අපාද ද්විපාද චතුෂ්පාද බහුප්පාද චක්ෂු අන්ධ ශ්‍රොත්‍රබධිර ඝ්‍රාණ විකලාදි විරූප බීභත්සාදි අපරිමිත තිර්‍යග් යොනියෙහි ඉපද කාම තෘෂ්ණා ගොචර තෘෂ්ණාතුර බඩ හෘදය ඇතිව නිරන්තරයෙන් අකුශල කර්මාභිවෘද්ධිය කෙරෙමින් මරණ භයින් සත නොද්විඝ්න සිත් ඇතිව උදුහල පාස වාරකාදි බන්ධනයෙන්, අසි ප්‍රහාර සත්ති ප්‍රහාරාදි උපක්‍රමයෙන් අන්‍යොන්‍ය භක්ෂණාදි'යෙන් ක්‍රෑර ඝොර දරුණ'නෙක දුක් විඳිති. මෙසෙයින් තිර්‍යග් යොනි යැ සත්හුදු, ඔවු'නොවුන්ට ව්‍යසස්ථානදු, ඔවු'නොවුන් විඳිනා දුකුදු සංක්‍ෂෙපයෙන් දක්වනලදු. මෙ නයින් තිර්‍යග් යොනිය අනන්තය'යි දතයුතු. කී? සේය යත්;-

එක් මිනිසකු සිරුරැහි කුල ගණනායෙන් අසූ කුලයක පණුවන් වත්තුබු නැතම කියයුතු කිම?

1. වසන්ට

මෙසේවූ තිර්‍යග් යොනියෑ උපන්නන් ඒ ජන්මයෙන් මිදී මිනිස් අත් බවක්[1] ලබනු දුර්ලභ වෙයි. කි?සේය යත්;-

විසමැහැයක්[2] ගැළැවූ වියදඬුවක් එක් සක් වළක් දියෙන් පුරා එහි බහාලූව හොත් ප්‍රචණ්ඩ වායු විසින්[3] සතර දිග්භාගයට ගෙන ඇවිදුත් හොත් ඒ වියදඬුයෙහි විසමැහැය ගැළැවූ සිදු සියක් හවුරුදු ගියකල නැගෙන කණකැසුප් තමා ග්‍රීවය වහාම ප්‍රවෙශ කෙරෙයි මේ කිසි දුෂ්කරයෙක් නොවෙයි. ''මිනිසත් බැවින් චුතව තිර්‍යග්යොනිය හුණුවන් එයින් මිදී මිනිසත් බවක් ලබනු එයට වඩා දුෂ්කරය'යි බුදුන් වදාළ බැවින් මෙසේ වූ තිර්‍යග්යොනිය උපනුවන්ගේ ආයුෂ පමණ නැති. කල්ලා'ඥ'වසථා'යෙහි මියෙත්මය. අසඞ්ඛ්‍යා' යුෂ්ක වෙත්මය. හේ මහකේළ නාරජුන් විසින් දූනෙ යි. ප්‍රේතයන් විඳිනා දුකුදු සංක්‍ෂෙපයෙන් දක්වනු ලැබෙයි. කි? සේය යත්;-

ශෛරිමරා නරකයෙහි ඉපැද නොයෙක් වා දහස් දුක්විඳ මාංශරුධිරා'දියෙන් විරහිතව ඇටසැකිලියක් සෙයින් ප්‍රේතව උපන්න නු දු ගිහිණියන් මරා මියෑ එපවින් නොයෙක් වා දහස් නරකයෙහි පැසී මස් පිඩක්[3] සේ ප්‍රේතව උපන්නනු දු, එළුවන් මරා මියෑ එපවින් නොයෙක් වා දහස් නරකයෙහි දුක් අනුභව කොට ජිවිතැති ප්‍රේතව උපන්නනුදු, ගිජුහු දු, උකුසුහු දු ලොහො තුඬුවැති තුඩින් ගඩව හඩවා ලුහුබැඳ විද මස්කා මිය යා නොදී නොයෙක් වා දහස් දුක්දෙති. හුරන් මරා මියෑ එපවින් නරකයෙහි ඉපද නොයෙක් වා දහස් නරක දුක් අනුභවකොට ''අසිලොම''- ප්‍රේතව උපන්නහු සකල ශරීරයෙන් ඒ අසිලොම් අහසට නැගි නැගි ඔහුම විද්දි.[4] හේ අධිවාසනා නො කොට හි මහ හඩින් හඩ හඩා නොයෙක් වා දහස් මහදුක්

1. අත්බැවක්. 2. වියමැයක්. 3. මස්කැටි කඩක්. 4. විදියි.

අනුභව කෙරෙයි. මුවන් මරා මියැ එපවිත් නරකයෙහි ඉපද නොයෙක් වා දහස් පැසී ගුණුකැමින් අඬයටි[1] වැනි ලොම් ඇති ප්‍රේතව උපන්නහු ඒ අඬයටි අහසට නැගි නැගී ඔහුම විදියි. හේ දුක් අධිවාසනා නොකොට හෙත්තේ මහ හඬින් හඬ හඬා නොයෙක් වා දහස් මහ දුක් අනුභව කෙරෙයි.

වධයට සම්ප්‍රාප්තවූ සත්නට කම්කටුල් දුන්නහු මියැ එ පවිත් නරකයෙහි නොයෙක්වා දහස් පැසී ගුණුකැමින් ප්‍රේතව උපන්නහු සියලු සිරුරැහි ගි දඬු වැනි ලොම් වෙයි. ඒ ලොම් අහසට නැගි නැගි ඔහුම විදියි. හේ දුක් අධිවාසනා නො කොට හෙත්තේ මහ හඬින් හඬනුයේ නොයෙක් වා දහස් දුක් අනුභව කෙරෙයි.

කේලාම් කියා මියැ එපවින් නරකයෙහි ඉපද නොයෙක් වා දහස් පැසී එයින් චුතව ප්‍රේතව උපන්නාහු සියලු සිරුරු ලොම් හිදී කටුවැනි වෙයි. ඒ ලොම් අහසට නැගි නැගී හිසින් වැද මුඛයෙන් නික්මයෙයි. මුඛයෙන් වැද ළැමැඩියෙන් නික්මයෙයි. ළැමැඩියෙන් වැද උදරයෙන් නික්මයෙයි. උදරයෙන් වැද කලවයෙන් නික්මයෙයි. කලවයෙන් වැද සිහින් කකුලෙන් නික්මයෙයි. සිහින් කකුලෙන් වැද දෙපල්ලෙන් නික්මයෙයි. හේ එ දුක් අධිවාසනා නො කොට හෙත්තේ මහ හඬින් හඬ හඬා නොයෙක් වා දහස් මහදුක් විදියි.

නොබඳ කරවුවරද ගේන දඬ ද ගෙන කුඩිනාව වෙහෙසද්දුන් ගම්ලද්දෙ[2] මියැ එපවින් නරකයෙහි ඉපද නොයෙක්වා දහස් නරක දුක් අනුභවකොට ගුණුකැමින් මහ දිය කළ සා අණ්ඩ ඇතිව ප්‍රේතව උපදිති. එත් යත් ඒ අණ්ඩය දසරියෙන් උසුලාගෙන

1. ගැණුසමින් අඬයටි වැනි ප්‍රේතව. 2. ගැම්ලද්දෙද්.

ඇවිදිති. හිදුත් එම අණ්ඩයේ හිඳිති. ගිජුහුදු, උකුසුහුදු, ලොහො තුඩු වැති තුඩින් හඬව හඬවා විදිති. මෙසේ නොයෙක් වා දහස් දුක් අනුභව කෙරෙති.

පරදාරකර්ම කොට මියැ එපවිත් නරකයෙහි ඉපද නොයෙක් වා දහස් නරකදුක් අනුභව කොට එයින් චුතව ප්‍රෙතව ඉපද හිස දක්වා ගැලෙන අසූචි වලෙහි අසූචි භක්‍ෂණය කරන්නාහු නොයෙක් වා දහස් මහදුක් අනුභව කෙරෙත්.

“අසූචි කවයි” අනුන් හවා මියැ එපවිත් නරකයෙහි ඉපද නොයෙක් වා දහස් දුක් අනුභවකොට එයින් චුතව ප්‍රෙතව ඉපද අසූචි වලෙහි අසූචි භක්‍ෂණය කරන්නාහු මහදුක් අනුභව කෙරෙත්.

තමන් සවාමින් කෙරෙන් පිටත් පුරුෂයන් හා අසද්ධර්මයෙහි පැවති මාගම්හු මියැ එපවිත් නරකයෙහි ඉපද නොයෙක් වා දහස් නරකදුක් අනුභවකොට එයින් චුතව ජවිනැති ප්‍රෙතව උපදිති. ගිජුහුදු උකුසුහු දු ලොහොතුඩු වැනි තුඩින් හඬව හඬවා විද මහ දුක් දෙති.

දෙවු දූසි[1] කම් කොට ලොව නලවා කෑවාහු මියැ එපවිත් දුර්ගන්ධ විරූප දුර්දර්ශක බීභත්ස්‍ය ප්‍රෙතව ඉපද බුභුක්‍ෂා පිපාසායෙන් ආතුරව මහදුක් විඳිති.

චෞරඝාතකර්ම කොට මියැ එපවිත් නරකයෙහි ඉපැද නොයෙක් වා දහස් නරක දුක් අනුභව කොට හිස්නැති “සවන්ධ” ප්‍රෙතව උපදිති. ගිජුහුදු උකුසුහු දු ලොහොතුඩු වැනි තුඩන් හඬව හඬවා විද මහදුක් දෙත්. එවුහු එදුක් අධිවාසනා නොකොට හෙන්නාහු මහහඬින් හඬ හඬා පස්ති. මේ ප්‍රෙතයන් මුඛය දු ඇස් දු බඩමවේ.

---

1. දෙව්දෙස්.

සිල්වතුන් හවා මියා, එපවිත් නරකයෙහි ඉපද, නොයෙක් වා දහස් පැසී එයින් චුතව “සූකර මුඛ” ප්‍රේතව ඉපද ක්‍ෂුත්පිපාසා’තුරව මහදුක් අනුභව කෙරෙත්.

කෝලාම් කියා සගුන් ඔවුනො’වුන් කෙරෙහි බිඳුවා[2] මියා, එපවිත් නරකයෙහි ඉපද පොළොව එක්යොදුන් තුන් ගවුවක් වඩනා තාක් කල් නරකයෙහි පැසී ගුණුකැමින් ප්‍රේතව ඉපද, විරූපව පූතිමුඛව සඤ්ජාත පුලවකව දුර්ගන්ධව බුභුක්‍ෂාපිපාසාතුරව නොයෙක් වා දහස් දුක් අනුභව කෙරෙත්.

“බත් දත් දෙන්නන් තෙල බත් නොපට අසුචි වෙව”යි හවා “පිළී දත්දෙන්නන් තෙල පිළි නොපට යපට වෙව” යි හවා මියා, ප්‍රේතව ඉපද විරූපව බුභුක්‍ෂා පිපාසාතුරව නග්නව මහදුක් විඳිත්. ඔවුනට දිව්‍ය භොජන දුනද, අසුචිවෙයි. දිව්‍ය වස්ත්‍ර ලදද ගිනිගෙන දිලියෙන යපට් වෙයි.

“පරහට දෙන දු වැළකුවාහු” මියා, එපවිත් ප්‍රේතව ඉපද විරූප වෙති. යුගත් ගිනි සේ ඇතුළුකුස දිලියෙන ගිනි ඇති වෙති. මුඛය විවෘත කළකල පිටතට නැගී දිලියෙයි. මුඛය පියා ලූකල මුවනම ඇතුළුකුස දිලියෙයි. “යොදුන් ගැඹුරු පුළුල් පිරීයන ගඟ දියෙහි හඩ අසා පැන් බොම්හ”යි බටකල ඇස්මුණු පියවර දුම් නැගී දවන කරකැට වෙයි. පිනිබිඳු සා දිය ටිකක් ඇසට නො පැනෙ’යි. සිහිල් සෙවන ඇති රුක්පයට වත්කල ගිනිරස් බඳු රශ් පවත්නි. මෙසේ යම් සෙයින් අස්වස් නො ලබන්නාහු මහත් දුක් අනුභව කෙරෙත්.

අසුචිවූ කායවාක් සමාචර ඇති පාපධර්ම ඇතිවූ රහසින් පවු කරන අශ්‍රමණව ශ්‍රමණ ප්‍රතිඥ ඇති,

අබ්‍රහ්මචාරීව බ්‍රහ්මචාරී ප්‍රතිඥා ඇති, ඇතුළුසතත උපදනා අකුශල කර්මයන් විසින් ඇතුළතින් කුණුවූ නිත්‍යයෙන් කෙලෙසුන් විසින් මඩනාලද, නිත්‍යයෙන් සංකා කරන්නට නිසිවූ, කසලගොඩ වැනි දුශ්ශීල භික්ෂුහුද, භික්ෂුණීහුද, ශික්ෂ්‍යමාණයෝද, සාමණේරයෝද, සාමණේරීහුද, සිල්වත්නට යයි දෙනලද චතුර්විධ ප්‍රත්‍යය ඒ ගුණධර්ම තමන් කෙරෙහි නැතිව පරිභෝග කොට මිය, නරකයෙහි ඉපද නොයෙක් වා දහස් දුක් අනුභවකොට එයින් චුතව ප්‍රේතව උපදිති සිවුරුද කාබානුද පසිදු, ගිනිමෙන් දිලියෙයි. එසේ තමන් දවන සිවුරු ආදී පහකොට නොගත හෙනුවෝ[1] යුගත් ගිනි සේ කුස ඇතුළ ඇවිළ දිලියෙන සාදුක් අධිවාසනා නොකොට හෙනුවෝ නොයෙක් වා දහස් මහදුක් විඳිති.

ආවාස මාත්සය්‍ය කර්මකොට මිය, එපවින් ලොහොගෙයි ප්‍රේතව ඉපද ඒ ගෙයි කසළ හිසින් උසුලනුවෝ මහදුක් අනුභව කෙරෙත්. සඞ්ඝයා ගණයා සනාතක ලාභයෙහි මසුරුව පුද්ගලික පරිභොගයෙන් පරිභොග කොට අජගර ප්‍රේතව මහදුක් අනුභව කෙරෙත්. ගිකියා බෙරවයා නවා ඒ අකුශල කර්මයෙන් ප්‍රේතව උපන්නාහු බලනුවන්ට "ප්‍රාසාද තොරණ අට්ටාල ගොපුර ප්‍රාකාරාදී" සම්පන්න දෙව්නුවරක් සේ පැනෙන තැන්හි අන්නට ගී කියා බෙරවයා නටනුවන් සේ පැනෙන්නාහු මහදුක් අනුභව කෙරෙත්.

මවුපියන්ට නිහරසරවූවෝද, සෙසු බලවත් පවු කොළෝද, බලනුවන්ට පිපිපිසුමක් සේ පැනෙන උරසකින් හිසපටන් ගෙන පය දක්වා කඩනු ලැබෙත්. සකල ශරීරයෙන් බස්නා රුධිරයෙන් රත්සඳුන්

1 නොහන්නාහු

විලවුන් ගතුවන් සේයින් පැනෙති. මග හඬින් හඬ හඬා පස්නාහු ගිතානට ගී කියා නටනුවන් සේ පැනෙති. මෙසේ පැනෙනුවන් ගේ කම් ගුණු කල වැලිදු බලවත් පවු කළ සත්හු ඒ උරසක් මල්දම දක ලද දහ''යි ඉල්වා ගතිත්.

කලක් කුශල් කොට කලක් අකුශල් කළාතට කුසලුදු අකුසලුදු එක ජන්ම යෙහි විවස්නෝ වීනම් ඇතැම් දවසක් ඇතැම් වේලක් දිව්‍ය සම්පත් අනුභව කෙරෙත්. ඇතැම් දවසක් ඇතැම් වේලක් ප්‍රෙතව මහදුක් අනුභව කෙරෙත්. මෙසේ වසනුවෝ විමාන ප්‍රෙත නම්වෙත්. මෙසෙයින් ප්‍රෙත යොනියෙහි ඉපද විඳිනා දුක් සංක්‍ෂෙපයෙන් දතයුතු.

කුශල කර්මයෙන් සුගතිය උපන්නත් සාදුක් මාත්‍රාවක් අධිවාසනා කට නොහී කිසිවැනි විළිඳු බිරිඳු අඳරඳු එබිදු මදදුද පිදු දුරුකොට සතුරනුදු ගෙදෙර සිහනු කෙරෙත්. බලවත් පවු කැමින් උපන් ප්‍රෙතයන්ගේ සාදුක්ම කියයුතු කිම? ප්‍රෙතයෝ වනාහි තමන් උදෙසා කරනලද පින්කම්හි පෙත් ලදහු නම් ඒ ජන්මයෙහි සිටියානුදු ප්‍රෙතා'ත්ම භාවයෙන් මිදී දිව්‍ය සම්පත් පිළි ලබත්[1] යම් තැනෙක්හි සිට පින්කම්හි පෙත් දෙද්ද, එහි ප්‍රෙතයෝම ඇනිවෙති. නැති කියන්ට නිසි තැනෙක් නැත්. කී සේය? යත්;-

බමුණෙක් බුදුන් කරා එළඹ, "භවත් ගෞතමය, අපි අප නෑයන් උදෙසා දන්දී පින්පෙත් දෙම්හ. ඒ දන එල ඔවුන්ට පැමිණේ හෝ වේ'' යි පිළිවිත. එසඳ[2] බුදුහු නරකය තිර්‍යග් යොනිය මනුෂ්‍ය යොනිය උපනහොත් එවිගස එහි සන්නිහිතව පින්කම් අනුමෝවන්නට නො පිළිවත් බැවිනුදු, අනුමෙවියද, එම ජන්මයෙහි දිව්‍යව පෙරළි දිව්‍ය සම්පත් අනුභව

1. පිළිලැබෙත්. 2. එවෙනි.

කරත්නම් ප්‍රේතයන් වන බැවිනුදු, දුශ්ශීලයන්ට දුන් දන්පෙත් ප්‍රේතයන්ට නො පැමිණෙන බැවින් ඒහැර යම් කවර අඛණ්ඩ කොට සිල්රක්නා කෙනෙක්හට දුන් දන් පෙත් ප්‍රේතයන්ට පැමිණෙන බැවින් එවැනි[1] පින්කම් අපෙක්‍ෂායෙන් පින්කම්හි පෙත් ප්‍රේතයෝ ලබති. එසේම සිටියානු දිව්‍යව පෙරළි දිව්‍ය සම්පත් අනුභව කෙරෙති"යි වදාළහ. එසඳ බමුණු යම් තැනෙක්හි තෑ ප්‍රේතයෝ නැත්නම් කවුරු අනුමෝ වෙති"යි පිළිවිත. එසඳ බුදුනු "යම් තැනෙක තෑ ප්‍රේතයෝ නැද්ද එ වැනි තැනෙක් නැතැ"යි වදාළහ. මෙසේ සියල්ලෝ ප්‍රේතයන් විසින් ගනත"යි ප්‍රේතයන් විසින් සියල් ලෝ ගනත පරිදි මෙසේ දතයුතු.

එක් මහතෙර කෙනෙකුන් වහයිසේ තු බු රොඹ[2] සිට නුවර සිඟන්නට වඩිති. මහතෙරුන්ට තුබු රොඹ දෙර ආසන්නයෙහි ප්‍රේතියක දරුවෝ දෙදෙනෙක් බලවත් සා දුක් අධිවාසනා කට නොහෙන්නාහු පළමු ලද යම් කැහැකි දූයක් හැරගෙන තමන් මව ලත් නොව තමන් කරා එනු කැමතිව දුන්වූහ.[3] මහතෙරහු "අපට ඈ නො පෙනෙයි. කුමක් කරම්හ"යි වදාළහ. මේ මූලගන්නේය. එසේ වන්නානාමැ පැනෙ"යි කියා මූලක් දී තමන් මවගේ සලකුණු කීහ. මහතෙරහු මූල අනුභාවයෙන් ගනතව සිටි ප්‍රේතයන් දූක අවසර මග නො ලදින් මනත් ප්‍රයත්නයෙන් ඉනා ආසන්න වේලේ දකුණු දෙර සතුරුහල් බු නුරුව කරා වැඩ දරුවන් කී සලකුණෙන් ප්‍රේතිය හැඳින දරුවින් කී හසුන් වදාළහ. ප්‍රේතිය මා කෙසේ දුටද්දූ'යි පුළුවුත්තී "තී දරුවන් දුන් මූල අනුභාවයෙන් දුටුම්හ"යි වදාළහ. එසඳ "ප්‍රේතිය, මේ මූල අත තුබුවහොත් ගනතව පැනෙන ප්‍රේතයන් තිසා සා නොහී මේ වහන්සේ අද සුන්බත් වෙති"යි සිතා අතින් මූල හැරගත.

1 එවෙනි. 2. තුබරොඹ 3. දූන්වුහු

එසඳ ප්‍රෙතයෝ නො පැනුනාහ. මහතෙරහු වේලා නො වරදවා සිඟා අහර ලදහු. මෙසේ වූ ප්‍රෙතයෝ වැදූමස් ඉඳුල් හුලූකෙනෙ ලොම් තිය බඩු[1] සෙම් මූකුණු පමණක් ලබන ප්‍රෙතයහ'යි දතයුතු. ප්‍රෙතයන් කෙරෙහි අහර නො ලබන්නට තිසි ප්‍රෙතයෝ පිනි බිඳක් සා අහර නො ලබති. ලබන්නට තිසි ප්‍රෙතයෝ මෙකී තියා අහර ලබති. මෙයින් පිටත් ප්‍රණීත අන්නපාන වස්ත්‍රා'දිය ඔවුන්ගෙන වළඳ කරම්හ''යි සිතූ කල ඇසට නො පැනෙ'යි. එයින් මෙ ගෙන වළඳ කරන්නට නො හැක්කම්හ''යි දතයුතු.

අසුර යොනිය තුන් සක්වළ එක්වූ තැන සුවාසූ දහසක් සුවාසූ දහසක් යොදුන් තුන් සක්වළ ගල්මැද හිර සඳරැස් නො පවත්නා බොල් අදුරු ඇති මෙරගලුදු බහාලුවහොත්, ලුණු පිඩක් සේ විරෙන ගඟනවූ ඇල් ඇති ක්‍ෂාරොදකයෙහි ඉපද තත් කබල බහාලූ වෙඬරු පිඩක්සේ විරිවිරී නොයෙක් වාදහස් දුක් අනුභව කොට ඒ දුකින් මිදී පනවම්හ'යි සිතා ඇඟිලි අග කුලුවැනි තිය ඇති අතින් සක්වළගල් ගන්මින් තැඟී ඔවුන් ඔවුන් වෙරැ අත් පහළ කල කන්නට තිසි දූයක් ලදුම්හ''යි ඔවුනො'වුන් ගෙන සක්වළගලින් අත්හැර දියෙහි වැගිරැ මෙසේ නොයෙක් වාදහස් කම් කටුල් විදිනා[2] සත්හුද කාලකඤ්ජාදි අසුර යොනිය උපදනා සත්හුද බලවත් පාපඵල විඳිනානාක් ප්‍රෙතයන් කෙරෙහි ගන්නා ලැබෙත්. මෙරයට ත්‍රිකූටමධ්‍යයෙහි දස දහසක් යොදුන් අසුරභවනයෙහි උපදනා අසුරයෝ දිව්‍යයන් කෙරෙහි ගන්නා ලැබෙති. මෙසේ ද ක්ඛනලද ප්‍රෙතයන්ගේ ආයුෂ පමණ නැති. පවු ගෙවෙන නාක් කම් කටුල් විඳිත්.

1. තියබඩ 2. විඳුනා.

කි සේ ද? යත්:—

“මෙකප පටන් දෙසා’නූ වන කප උපන් ‘ඵුස්ස’ නම් සම්මා සම්බුදුන් දවස බුදුපාමොක් මහ සඟනට දෙන දන්වැට සොරාගෙන එකප පටන්ගෙන මෙකප දක්වා අතුරෙහි දෙසා’නූ කපක් අපාදුක් විඳ මෙකප ආදිය මැ ප්‍රෙත ව ඉපද පොළොව එක්යොදුන් තුන්ගවුවක් වඩනා තාක් යුගත්ගිනි වැනි සාදුකින් පෙළී දිව’ග තබන පිනි බිඳක් පමණ[1] අහරක් නො ලදින් කකුසඳ, සම්මාසම්බුදුන් ලොකයෙහි උපන් කල බුදුන් කරා එළඹ තමන් වහන්සේ දවස අහරක් ලබමෝද’’යි[2] පිළිවිස “අප දවස නො ලබව්’’ මන්තේ, ‘කොණාගමන’ නම් බුදුකෙනෙක් වෙති. උන් පිළිවිසිව්ය’’යි[3] වදාළකල්හි ඒ බුදුන් උපදනා තාක් මහදුක් විඳ මේ නියායෙන් තුන් බුඬානතරයක් අහරක් ඉල්වා නො ලදින් අපබුදුන් දවස අහර ලදින් ප්‍රෙතාත්මභාවයෙන් මුක්තවූහ. මෙසේ ප්‍රෙතයන්ගේ ආයුෂ පමණ කැනැ’යි දතයුතු. මෙතෙකින් චතුර්විධ අපායස්වරූප දක්වන ලදි.

## 2

මනුෂ්‍යයෝ චතුර්විධ වෙත්. ‘i මනුෂ්‍යනාරකිකයහ ii මනුෂ්‍ය තිර්‍යග්ගතයහ, iii මනුෂ්‍යප්‍රෙතයහ, iv මනුෂ්‍ය භූතවූ මනුෂ්‍යයහ’’යි.

මෙහි i මනුෂ්‍යනාරකිකයෝ නම් කවරහ යත්:—

අපායෙහි දුක්විඳින්නට නිසි කම්බැඳ දුඹුල් පින්කැමින් මිනිස් අත්බැව ඉපද අත් සිඳුනා පා සිඳුනා අත්පා සිඳුනා-කන් සිඳුනා - නාසා සිඳුනා-කන්නාසා සිඳුනා කම්කටුලෙන් දුක් දෙන ලදුවෝ ද, අත්පය සියලු සිරුරු ගිනි අවුළුවන සියලු සිරුරු කකියන තෙල් ඔනා කම්කටුලෙන් දුක් දෙන ලදුවෝ ද, මියෙහි

1. සා පමණ 2. ලබම්හො’යි 3. පුළුවුස්වයි

තෙල් එව, පහන් දල්වන දිලියෙන යවට බහාලන කම්කටුලෙන් දුක්දෙන ලදුවෝ ද, සියලු සිරුරු කියදි එව ලුණු ඇඹුල් ගල්වන කම්කටු කම්කටුලෙන් දුක් දෙන ලදුවෝ ද, සුනඛයන් ලවා සියල් සිරුරු මස් කවන කම්කටුලෙන් දුක්දෙන ලදුවෝ ද, හිස සම් උපුටවා හකුරු එව, සක් සේ සුදු කොට දේනා කම්කටුලෙන් දුක්දෙන ලදුවෝ ද, ඇලයෙන් හොවා මතු වූ කණින් යහුල් බහා යට වූ කණින් තෙරු බිම දී තිරු කොට ගසා සත්මැඬිලි[1] හෙලනුවන් සෙයින් කත්වයින් මැඬිලි වලට අදනවුන් සෙයින් කකුලෙහි ගෙන වට වටා සිසාරණ කම්කටුලෙන් දුක්දෙන ලදුවෝ ද, දෙඅත දෙපය යහුල් ගසා ඒ සතර යහුලින් මුවගොනකු සෙයින් අහස් කොට සිටුවා යට ගිනි මොලවා[2] දවන කම්කටුලෙන් දුක් දෙන ලදුවෝ ද, හිස් මුදුන සිල් කොට දිලියෙන යවට බහා ලා හිස්මුල් කකියවා උතුරුවන කම්කටුලෙන් දුක් දෙන ලදුවෝ ද, කටුමතිගායෙන්[3] සියල් සිරුරු පහර ඕනා කම්කටුලෙන් දුක් දෙන ලදුවෝ ද, සියල් සිරුරු ඇට සුන් සුන් කොට බිඳ පිදුරුසුඹුළුවක් සේ හකුළුවන කම්කටුලෙන් දුක් දෙන ලදුවෝ ද, සියලු සිරුරු මස් කහවණු සේ කපා කවන කම්කටුලෙන් දුක් දෙන ලදුවෝ ද, දසරුවෙහි පටන් ගෙන වෙරු සම් වැහැරි[4] කොට බිම පහරණ තාක් කපා එල්වා දිවවන කම්කටුලෙන් දුක් දෙන ලදුවෝ ද, තො මිරා හුල හිඳුවන ලදුවෝ ද, යන එවමාදි කම්කටුලෙන් දුක් දෙන ලදුවෝ මනුෂ්‍ය නාරකිකයෝ නම් හ.

මෙකී තාක් කම්කටුල් දෙන කුළුණු නැති, සැදැහැ නැති, පරලොව භය නැති සසර හිඳුවූ වැඹක් බදු වූ කෲරඝොර දරුණු මනුෂ්‍යයෝ මිත්‍යමපල්හු නම් වෙත්.

1. සතමැඩිලි. 2 දල්වා 3. කටුසැමිපියෙන් 4. වැහිරි

ii **මනුෂ්‍යතිර්යග්ගතයෝ නම් කවරහ? යත්:--**

වල ඉපද වලවාසය කොට මිනිසුන් දුටුකල වල සැඟවෙන වනචර මිනිස්හු ද, ග්‍රාමාදියට නො බැස සැඟැසිකම් කොට වල් වැද මිනිසුන් දුටුකල වල සැඟවී ඇවිදුනා මිනිස්හු ද, අපියරු පියෙස්[1] ඉපද අකුසල් කොට දහම් හැඳිනගත නොහී දුශ්චරිත කම්යෙන් පෙවෙත් වටන මිනිස්හු ද, පියරුපියෙස් ඉපද ධර්මා'ධර්ම නො හැඳින දහම්පිළිවෙත් නැති ව මඩ හුණු පහණ සේ අධර්මයෙහි පවත්නා මිනිස්හු ද, යන එවමා'දි අන්ධබාලජනයෝ මනුෂ්‍යතිර්යග්ගතයෝ නම් හ.

iii **මනුෂ්‍යප්‍රේතයෝ නම් කවරහ? යත්:—**

දිළිඳු කුලයෙහි ඉපද විඝාසාදව ඝාසච්ඡාදනමාත්‍ර ද නො ලදින් නානාප්‍රකාරව්‍යාධින් මඩනාලදු ව කපාල හස්ත ව රාත්‍රිදිවායෙහි අන්නපානාදිය පර්යේෂණය කෙරෙමින් නොයෙක් ජනයන් කරන නින්දයෙන් බලවත් දුක් දෙම්නස් විඳිමින් බුභුක්ෂාපිපාසා'තුර ව ඇවිදුනා මිනිස්හු ද, මහාකුලෙහි ඉපද අන්නපාන වස්ත්‍රා'භරණ මාලාගන්ධවිලෙපනශය්‍යා වසථ ප්‍රදීපෙය්‍යධන ධාන්‍යාදි විරහිතව බුභුක්ෂාපිපාසා'තුර ව කෘපණ පරිද්දෙන් දිවිපෙවෙත් වටන මිනිස්හු ද, යන එවමා'දි මනුෂ්‍යයෝ මනුෂ්‍යප්‍රේතයෝ නම් හ.

iv **මනුෂ්‍යභූත වූ මනුෂ්‍යයෝ නම් කවරහ? යත්:—**

සකසා කරන පින්කැමින් මිනිස්අත්බැව ඉපද පළමු කී සෙසින් අත්පා සිදුනා ආදි කම්කටුළුට නො පැමිණෙමින් මනුෂ්‍යනෙරිසන් බැවින් මිදී වනචරා, දිනාවයට නො පැමිණෙමින් 'මනුෂ්‍යතිර්යග්ගතභාවයෙන් මිදී, සුලභ අන්නපානාදියට පැමිණෙමින් මනුෂ්‍ය ප්‍රේතභාවයෙන් මිදී, පහන් සිතින් සරණ පිහිටා සරණ පිහිටි උපාසකයන් විසින් නො කටයුතු,

1. පියස.

සත් වෙණෙදහමෙත් මිනිසුන් ඇරැ විකුණන වෙණෙදහමෙත් රත වෙණෙදහමෙත් විෂ වෙණෙදහමෙත් මස් වෙණෙදහමෙත් දුරු ව, ධැමින් සෙමෙත් උපයා පූර්‍ව චෙතනා-මධ්‍ය චෙතනා-අපර චෙතනා-සුද්ධ කොට දන් දී පින් කිරිය වත් පුරණ විසින් කුසල් කොට, සතතයෙන් අඛණ්ඩ කොට පන්සිල් රැක පොහොය[1] අටසිල් රැක පින්කිරියවත් පුරමින්[2] කුසල් කොට "ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො" යනාදි විසින් අනන්තා'පරිමෙය්‍ය සේ[3] බුදුගුණ සමරණය කොට බුද්ධානුස්මෘති භාවනායෙන් යෙදී "ස්වාක්ඛාතො භගවතා ධම්මො" යනාදි විසින් නවලොවුතුරු දහම් සමරණය කොට ධර්‍මානුස්මෘති භාවනායෙන් යෙදී "සුපටිපන්නො භගවතො සාවක සංඝො" යනාදි විසින් සගුරුවන් සමරණය කොට සඞ්ඝානුස්මෘති භාවනායෙන් යෙදී, සියල්ලෝ සුවපත් වෙත්ව'යි නිදුක් වෙත්ව'යි නිරොගි වෙත්ව'යි යනාදි විසින් සියලු සතුන් කෙරෙහි මෛත්‍රී[4] කරන විසින් මෛත්‍රී භාවනායෙන් යෙදී, දුක්පත් සත්හු එදුකින් මිදෙත්ව,යි යනාදි විසින් කරුණාභාවනායෙන් යෙදී, සුවපත් සත්හු එ සැපතින් නො පිරිහෙත්ව,යි ඔවුනො'වුන්ගේ සම්පත් ඔවුනො'වුන්ට මැ නියත වේව,යි යනාදි විසින් මුදිතාභාවනායෙන් යෙදී, "කෙසා ලොමා" යනාදි විසින් මේ සිරුරු[5] පිළිකුල් සේ සිතමින් අසුභ භාවනායෙන් යෙදී, පිණිසසුමුපන්දහම්හු සිටි සේ සිටිනාහු නම් නැති, එබැවින් මරණ නියත ය, යනාදි විසින් ස්මරණ ය කොට මරණානුස්මෘතිභාවනායෙන් යෙදී, මෙපෙවෙත් තුබකුස්හි පහළ විදුලියක් සෙයින් අනිස. කඹිසිනි රළෙක්හි හුණු ගැඩහුල් බිළිඳක්හු සෙයින් දුක. අහස්හි අත් පිරිමැද නො ගත හැකි සෙයින් අනත. නොහොත්,

1. පොහොය අඟ විසින් 2. පුරණවිසින් 3. අනන්ත අපිරිසේ 4. මෙත් 5. සිරිරු

ගජපියවරෙක්හි තුබූ කුකුළුබිජක් සෙයින් අනිස. දෙකෙළවරහි ගිනිගත් හුණු පුරුකෙක ඇතුළේ හිදුනා[1] පුහුණු බිළිදක්හු සෙයින් දුක. මහ අවුවෙහි පැතෙත මිරිඟු දස්නක් සෙයින් අනත. නොහොත්, දිය ඇතුළේ තුබූ ලුණු පිඩක් සෙයින් අනිස. ගින්නෙහි වැගිරෙන පළඟ බිළිදක්හු සෙයින් දුක. සිත්තම්[2] කළ ගිනියමක් සෙයින් අනත. මෙසෙයින් අනිස් වන බැවින මේපෙවෙත් නො තැකිය හැක්ක. දුක් වන බැවින් සතතයෙන් පෙළෙයි. අනත් වනබැවින් තමා හිමියන්ට නො නිස්ස. අනිස් වන බැවින් මෙපෙවෙත් සවිර ය යන සංඥවට නො වන. දුක් වන බැවින් මෙපෙවෙත් සුව ය, යන සංඥවට නො වන. අනත් වනබැවින් මෙපෙවෙත් තුමා ය යන සංඥවට නො වන. ප්‍රබන්ධයෙන් පවත්නා නාමරූපයන් විසින් අනිත් ලකුණු මූවහය. ඉරියවු පිරිවටලීමෙන් දුක් ලකුණු මූවහ ය. මෙපෙවෙත් ඝනසංඥවෙන් අනත් ලකුණු මූවනය. අනිස් වනබැවින් මෙපෙවෙත් විදුලියක් සෙයින් ව හාම බිඳෙයි. දුක් වනබැවින් මෙපෙවෙත් ගඬපොළක්[3] සෙයින් අශාන්තය.[4] අනත් වනබැවින් මෙපෙවෙත් මිරිඟු දස්නක් සෙයින් ආසවාද කරන්ට නො වන. අනිස් වනබැවින් මෙපෙවෙත්. සැමකල නො වෙයි. දුක් වනබැවින් පෙළෙයි. අනත් වනබැවින් විස්වස් කරන්ට නො වන. අනිස් වන බැවින් මෙපෙවෙත් තිඹිරිගෙයකට ගෙ කෙරෙයි. දුක් වනබැවින් බඹ පෙවෙතු දු හොත් පෙරළා තෙරිසන් හු කෙරෙයි. අනත් වනබැවින් බුදු පෙවෙ තුදු හොත් අවසන් කෙරෙයි යනාදි විසින් තුන්ලකුණු මෙනෙහි කොට විදශීනා භාවනායෙන් යෙදී භවුන්පින්කිරියවත් පුරන විසින් කුසල් කොට, තමා විසින් කළ පින්කම් අන්නට දී පුණ්‍යදාන පින්කිරියවත් පුරන විසින් කුසල් කොට,

---

1. හුණුපුරුකක් මැද නැවෙන 2. සිත්තම. 3. ගඬරුවක්,
4. අසාධ්‍යාන්තය

අනුන් විසින් කළ පින්කම් අනුමෝදව පුණ්‍යානුමෝදනා පින්කිරියවත් පුරණ විසින් කුසල් කොට, සිල්වත්නට දෙමාපිය[1] නැදිමසිල් බෑ බූ හුණනට සකසා මෙහෙ කොට වෛයාවච්ච පින්කිරියවත් පුරණ විසින් කුසල් කොට ගඳමල් ආදීන් තුනුරුවන් පුදා අපචායන පින්කිරියවත් පුරණ විසින් කුසල් කොට, බුදුන් විසින් දෙසූ නෛර්‍යාණික දහම් එකනයකු දු පමණ ඉගෙන පරහට කියා දෙසුන්පින්කිරියවත් පුරණ විසින් කුසල් කොට, බුදුන් විසින් දෙසූ නෛර්‍යාණික දහම් අසා දම්සවුන්පින්කිරියවත් පුරන විසින් කුසල් කොට, මෙත් සෙයින් දන් දුන්නෙහි, සිල් රැක්කෙහි භාවනා කෙළෙහි, පින්කම් දුන්නෙහි පින්කම් අනුමෝ වූයෙහි සිල්වත් ආදීන්ට මෙහෙකෙළෙහි, තුනුරුවන් පිදුයෙහි බණ දෙසුයෙහි, බණ ඇසූයෙහි, එල ඇතැ'යි හදහන, මෙලෝ ඇති, පරලෝ ඇති, කම් ඇති, කම්පල ඇති, කුශලකර්මයෙන් සගමොක් පිළි ලබති, අකුශලකර්මයෙන් අපායභාග් වෙති,යි හදහන සම්‍යග්දෘෂ්ටි පින්කිරියවත් පුරාණ විසින් කුසල් කොට, දශපුණ්‍යක්‍රියා වස්තු පුරා, සිය අතින් සතුන් නො මරා මරනු සඳහා පරියායෙනු දු අන්නට නො හඟවා හැම සතුන් කෙරෙහි කුළුණු ඇති ව පවත්නා විසින් පණිවායෙන් දුරු ව, පරඅයත්දෑහුවැලයකු දු සොරසිතින් නො ගන්නා විසින් ගන්ව,යි අන්නට නො අණවන විසින් අසිනාදනින් දුරු ව, පරුෂයන් හා අසද්ධර්මයෙහි නො පවත්නා කැමැති ව මවු විසින් රක්නා ලද්දී ය. එසේම පියා විසින් රක්නා ලද්දීය. මවු පිය දෙදෙනා විසින් රක්නා ලද්දී ය, බෑයා විසින් රක්නා ලද්දී ය, බූ හුණු විසින් රක්නා ලද්දී ය, නෑයන් විසින් රක්නා ලද්දි ය. සවගොත්‍රයෙහි ඇත්තන් විසින් රක්නා ලද්දී ය. සහධාර්මිකයන් විසින් රක්නා ලද්දී ය, ස්වාමීන් විසින් මල් පළඳවනු පිළී හඳවනු ආදීන් තිරා කරනු

1. දෙමෝපිය

ලද්දී ය, මෙතම් ස්ත්‍රිය කරා වන්නත් අතින් මෙතෙක් දඩය,යි සම්මත කරන ලද්දී ය, යන මේ පරස්ත්‍රි හු දසදෙන ය, පුරුෂයා විසින් ධනඑවා වාසය කරන භාර්‍ය්‍යා ය, තමහට ප්‍රියයෙන් වාසය කරන භාර්‍ය්‍යා ය, යම් කවර භොගයක් දී වාසය කරන භාර්‍ය්‍යා ය. පිළිදී වාසය කරන භාර්‍ය්‍යාය. මවුපියන් ආදි නෑයන් විසින් දියපය දෙදෙනා අත් ගළා මෙදිය සේ ඔවු නො 'වුන් කෙරෙහි නො බිඳී වාසය කරව් ය,යි මඞගලවිධින් දක්වා දුන් භාර්‍ය්‍යා ය, බර උසුලන්නිය. දියතොට ආදී තැන දූක සුඹුළු බහවා පියා වාසය කරන භාර්‍ය්‍යා ය, දැසී ව තමා සවාමින් කෙරෙහි මෑ වසන භාර්‍ය්‍යා ය, මෙකි නාක් ප්‍රකාරයෙන් පිටත් ගෙහි[1] මෙහෙ කොට වසන භාර්‍ය්‍යා ය, සංග්‍රාම කොට දුනු තැනින් ගෙනෙන ලද භාර්‍ය්‍යා ය, අවධි පරිච්ඡෙද කොට අයතිගත් ගණිකාය, යන මේ භාර්‍ය්‍යාවෝ දසදෙනය. මෙසේ[2] ස්ත්‍රිනාමයෙන් භාර්‍ය්‍යා නාමයෙන් දෙකොටසක් කොට දක්වනලද පරස්ත්‍රින් විසිදෙනා හා අසද්ධර්මයෙහි නො පැවත, පුරුෂයා විසින් පරදාරගමනින් දුරු ව, මේ විසිදෙනා කෙරෙහි ආදී කොට දක්වූ මව විසින් රක්නාලද, පියා විසින් රක්නාලද, මවු පිය දෙදෙනා විසින් රක්නා ලද, බෑයා විසින් රක්නාලද, බුහුණු විසින් රක්නාලද, නෑයන් විසින් රක්නාලද, සවගොත්‍රයෙහි ඇත්තන් විසින් රක්නාලද, සහධාර්මිකයන් විසින් රක්නාලද, අටදෙනා හා අසද්ධර්මයෙහි පැවති පුරුෂයන්ට පරදාරගමන සිද්ධවන් මිසැ ඔවුන් අටදෙනා හට පුරුෂාන්තර ගමනයෙන් මිථ්‍යාචාර සිද්ධ නො වන බැවින් ,ඒ අට දෙනා විනා තුබූ දොළොස්දෙනා විසින් තමන් සවාමීන් කෙරෙන් පිටත් පුරුෂයන් හා අසද්ධර්මයෙහි නො පවත්නා විසින් මිථ්‍යාචාරයෙන් දුරු ව ත්‍රිවිධකාය සුචරිත පුරන විසින් කුසල් කොට, සබා මැදට පිරිස්

1. හෙයි 2. මෙකි.

මැදට නෑයන් මැදට ගම් ලදුවින් මැදට රජ්ජුරුවන් මැදට එළවා යමක් දන්හි? නො ද දන්හි? කියා පුළුවුස්නා ලදු ව, තමා නිසා හෝ මෙරමා නිසා හෝ කිසි කවර ආමිෂයක් නිසා හෝ සිතාසු බසින් හෝ බොරු නො කියා, යුක්ත ප්‍රාප්තස්ථානයෙහි නුදුටු දෑ නුදුටුයෙමි කියන විසින්, නො ඇසූ දෑ නො ඇසූයෙමි කියන විසින්, ආඝ්‍රාන නො කළ දෑ ආඝ්‍රාන නො කෙළෙමි. කියන විසින්, රස නො දත් දෑ රස නො දත්තෙමි. කියන විසින් ස්පර්ශ නො කළ දෑ ස්පර්ශ නො කෙළෙමි කියන විසින් සිතින් නො සැලකූ දෑ සිතින් නො සැලකූයෙමි කියන විසින්, දුටු දෑ දුටියෙමි කියනවිසින්, ඇසූ දෑ ඇසුයෙමි කියන විසින් ආඝ්‍රාන කළ දෑ ආඝ්‍රාන කෙළෙමි කියන විසින්, රස දත් දෑ රස දත්තෙමි කියන විසින් ස්පර්ශ කළ දෑ ස්පර්ශ කෙළෙමි කියන විසින්, සිතින් සැලකූ දෑ සිතින්, සැලකූයෙමි කියන විසින්, සිතින්, හදහන්ට -නිසි ව සපිර ව ලොකාථාට අවි සංවාදක ව සබාතෙපුල් කියන විසින්, මුසවායෙන් දුරුව නාම ගොත්‍ර ලිඞ්ග[1] ආබාධ ජාති ශිල්පකර්මාදි විසින් හවනු අසා ප්‍රියකාමී ව හෝ හෙද 'භිප්‍රායෙන් හෝ ඔවුනො'වුන් කී තෙපුල් ඔවුනො'වුන්ට නො කියන විසින් බුන්නන් සමග කරන විසින්, සමගනට අනුබල ප්‍රදන කරන විසින් සමගබව රති උපයා සමග බව සතුටු ව සමග වීමට කාරණ වූ තෙපුල් බණන විසින්, කෝලාමෙන් දුරු ව, වාග්දෙෂ විරහිත වූ කන් සලු වූ පෙම් වඩනා වූ සිත්ගන්නා වූ ඔවුනො'වුන් වයස් අනුකූල කොට "අම්ම තාත" යනාදී විසින් නොයෙක් ජනයන්ට රිසියෙන නොයෙක් ජනයන් සිත් ගන්නා මියුරු තෙපුල් බණන විසින් පරුෂවචනයෙන් දුරු ව, යුක්තප්‍රාප්ත කාලයෙහි සබා වූ ධර්මයෙන් නො පිටත් කාය වාග්විනයට පැවෙන නාක් සිත තබා රක්නට නිසි පිරිකැපුණු තමහට ද පරහට ද අර්ථයට වැටෙන තෙපුල් බණන විසින්

1. නම් ගොත් ලිඟු

**සම්භින්නප්‍රලාපයෙන්** දුරු ව, මෙසේ චතුර්විධ පරප්‍රතිබද්ධ වූ ස්ත්‍රීපුරුෂධනධාන්‍යගවමහිෂා'දි සම්පත් දු අරණ්‍යගතක්ෂේත්‍රගතවස්තු දු උද්‍යානා'දි සම්පත් දු තමහට වුව දන'යි නො පතන විසින් **අභිධ්‍යායෙන්** දුරු ව, සියලු සත්නු සමග ව ඔවුනො'වුන් කෙරෙහි තුෂ්ට වූවාහු ඔවුනො'වුන් හා විවාද නො කරන්නාහු ඔවුනො වුන් කෙරෙහි නො බිඳී කිරි හා දිය සේ හැනෙන්නාහු ඔවුනො'වුන් ප්‍රිය වූ චක්ෂුසින් බලන්නාහු සමග ව වාසය කෙරෙත්ව'යි පතන විසින් **ව්‍යාපාදයෙන්** දුරු ව, දන් දුන්නෙහි ඵල ඇති, සිල් රැක්කෙහි භාවනා කෙළෙහි ඵල ඇති, කුශලකර්මයෙන් සුගති සිද්ධවෙයි. අකුශල කර්මයෙන් අපාය සිද්ධ වෙයි, හදහන විසින් මෙලෝ ඇති, පරලෝ ඇති, මවුපිය ආදීනට කළ හාක් උපකාරයෙහි ඵල ඇති, මෙලෝ පරලෝ දැන නිසාහිත දහම් දෙසන ධාර්මික ශ්‍රමණයෝ ඇති, හදහන විසින් **සම්‍යග්දෘෂ්ටිකා** ව ත්‍රිවිධ **මනඃසුචරිත** පුරන විසින් කුසල් කොට, **දශ කුශල කර්මපථයන්** පුරා, දාන—ප්‍රියවචන—අර්ථචර්යා—සමානාත්මතා යන සතර **සංග්‍රහ වස්තු** විසින් සියල්ලෝ සගෙනැ සගමොක් දෙකට නියත ව සිටි මනුෂ්‍යයෝ **මනුෂ්‍යභූත** වූ මනුෂ්‍යයෝ නම් හු.

මෙසේ මිනිස්හු 'මනුෂ්‍යනාරකිකය ය, මනුෂ්‍ය තිර්යග්ගතය ය, මනුෂ්‍ය ප්‍රේතය ය, මනුෂ්‍යභූත වූ මනුෂ්‍ය ය'යි සතරෙක් වෙත්.

3

i "අඳුරෙන් අඳුරට යන්නාහ, ii අඳුරෙන් පහනට යන්නාහ, iii පහනින් අඳුරට යන්නාහ, iv පහනින් පහනට යන්නාහ"යි මනුෂ්‍යයෝ සතර දෙනෙක් වෙත්

එහි i අඳුරෙන් අඳුරට යන්නාහු නම් කවරහ? යත්:—

චණ්ඩාල කුලය-වේණකුලය-නෙසාද කුලය-රථකාර කුලය පුක්කුසකුලය යනාදි නීචකුලයෙහි දළිද්ද ව අප්පන්නපානභොජන වී කශිරවෘත්තික ව දුර්වර්ණ ව දුර්දර්ශ ව ඔක්කොටිමක ව බහ්වාබාධව කාණව කුණි ව ඛඤ්ජ ව පක්ඛහත ව අන්නපාන වස්ත්‍රයානමාලාගන්ධවිලෙපන ශය්‍යාවසථප්‍රදීපෙය්‍යාදි විරහිත ව ඉපද, සතුන් මරනු අනුන් අයති සොරාගනු[1] පරදර ගමනාදි කාය දුශ්චරිත පුරණ විසින්, බොරු කියනු, කේලාම් කියනු, නො මිපුරු තෙපුල් බණනු නිරර්ථක වූ ප්‍රලාප බණනු ආදි වාග් දුශ්චරිත පුරණ විසින්, 'අනුන්ගේ සම්පත්ලොභ කොට මට වුව දැහ'යි පතන අභිධ්‍යා විසිනුදු, ව්‍යාපන්න සිත් ඇතිව, වෛෂයෙන් කිපී මේ සත්හු නසිත්වා,යි විනාශයට යෙත්වා,යි උච්ඡින්නඤට යෙත්වා,යි නගම් වෙත්වා,යි යනාදි විසිනු දු මේලෝ නැති, පරලෝ නැති, කම් නැති, කම්පල නැති, යනාදි විසිනුදු, මනො දුශ්චරිත පුරන විසින් තත් තත් අකුශලකර්මයෙහි පැවැත ත්‍රිවිධ දුශ්චරිත පුරා, කාබුන් මරණින් මත්තෙහි අපායෙහි උපදනානු අඳුරෙන් අඳුරට යන්නාහු නම් වෙත්.

ii **අඳුරෙන් පහනට යන්නාහු නම් කවරහ?** යත්:—

මෙකී ප්‍රකාර නීච කුලයෙහි ඉපද දරිද්‍රභාවයට පැමිණ හැම සතුන් කෙරෙහි මෙත් කුළුණු මුදිතා උපයන විසින් ප්‍රාණතිපාත කර්මයෙන් දුරු ව, අනුන් අයත්දෑහුවැලයකුත් සොරසිතින් නො ගන්නා විසින් අසිනාදනින් දුරු ව, මාතුරක්ඛිතාදීන් හා අසද්ධර්මයෙහි නො පවත්නා විසින් පරදරගමනයෙන් දුරුව, කායදුච්චරිත පුරා, බොරු කීමෙන් දුරුව සබා බස් කියන විසින්, කේලාමෙන් දුරු ව සමග ව වැටෙන තෙපුල් බණන විසින්, පරුෂවචනයෙන් දුරුව මධුර වූ ප්‍රිය වූ කන්කලු වූ තෙපුල් බණන විසින්, සම්භින්නප්‍රලා

1 සොරාගන්නා

පසෙන් දුරු ව තමහට ද මෙරමාහට ද හිතයට වැටෙන ධම්යෙන් යුත් පෙපුල් බණන විසින්, වාක්සුචරිත පුරා, අනුන්ගේ සම්පත්හි ලොභ නූපයා ඔවුනො'වුන්ගේ සම්පත් ඔවුනොවුන් ට මැ නියත වේ ව'යි පතන විසින්, ව්‍යාපන්න සිත් නැති ව වෙෂයෙන් නො කිපි හැම සත්හුමැ සමග ව නිදුක් නිරෝගී ව සුවයෙන් වැටෙත්ව'යි සිතන විසින්, මිථ්‍යා දෘෂ්ටි නො ගෙන සම්‍යක් දෘෂ්ටින් හැම මනා සිතන විසින්, මනඃසුචරිත පුරා, නානාප්‍රකාර වූ පුණ්‍යා'පචය කරන විසින් ත්‍රිවිධ සුචරිත පුරා, කාබුත් මරණින් මත්තෙහි සුගතිය උපදනාහු **අඳුරෙන් පහනට යන්නාහු නම් වෙත්.**

iii **පහනින් අඳුරට යන්නාහු නම් කවරහ? යත්:—**

කැත්කුලෙහි බමුණුමහසල්කුලෙහි සිටුකුලෙහි ආඪ්‍ය ව මහත් ධන ඇති ව මහත් භොග ඇති ව අපරිමිතජාතරූපරජත ඇති ව අපරිමිත විත්තූපකරණ විසින් අපරිමිත ධන ධාන්‍ය ඇති ව අභිරූප ව දර්ශනීය ව ප්‍රාසාදික ව පරමවණ්ණපොක්ඛරතායෙන් සමන්විත ව අන්නපානවත්ථයානමාලාගන්ධවිලෙපනසෙය්‍යාවසථ පදීපෙය්‍යාදි සම්පන්න ව ඉපද පූර්වෝක්තක්‍රමයෙන් කාය දුශ්චරිත වාග්දුශ්චරිත මනොදුශ්චරිත පුරා, කාබුත් මරණින් මත්තෙහි අපායෙහි උපදනාහු **පහනින් අඳුරට යන්නාහු නම් වෙත්.**

iv **පහනින් පහනට යන්නාහු නම් කවරහ? යත්:—**

මෙකී නාක් ප්‍රකාරයෙන් කැත්කුලාදිය ඉපද, ආඪ්‍ය ව මහත් ධන මහත් භොගාදිභාවයට ද අභිරූපාදිභාවයට ද, අන්නපානාදි සමෘද්ධභාවයට ද පැමිණ ශීලාදි ගුණසම්පන්න ව පූර්වෝක්තක්‍රමයෙන් කායසුචරිත වාක්සුචරිත මනො සුචරිත පුරා, කාබුත් මරණින් මත්තෙහි සුගතිය උපදනාහු **පහනින් පහනට යන්නාහු නම් වෙත්:—**

## 4

මෙහි අකුශල කර්මයන් ක්‍රියෙසින් සිද්ධකෙරෙයි යත්:—

ප්‍රාණාතිපාත ද, පරුෂවචන ද, ව්‍යාපාද ද, ද්වෙෂ මොහයෙන් යුත් අකුසල් සිතින් සිඬ වෙයි. අදත්තාදාන ද, මෘෂාවාද ද, පෛශුන්‍ය ද, සම්ප්‍රලාප ද, ද්වෙෂමොහයෙන් යුත් අකුසල් සිතින් හෝ සිද්ධ වෙයි. ලොභමොහයෙන් යුත් අකුසල්සිතින් හෝ සිද්ධ වෙයි. කාමමිථ්‍යාචාර ද, අභිධ්‍යා ද, මිථ්‍යාදෘෂ්ටි ද, ලොභමොහයෙන් යුත් අකුසල්සිතින් සිද්ධ වෙයි. පූර්විභාගයෙහි[1] වනාහි මෙහැම තැන ම ලොභ ද්වෙෂ මොහ තුන ම සම්භව වේ. කි සේ ය? යත්:—

"මාංස පරිභොග කෙරෙමි"යි ලොභ උපයා හෝ ප්‍රාණවධ කෙරෙයි. මස් විකොට ගන්නා අයතියෙහි ලොභ උපයා හෝ ප්‍රාණවධ කෙරෙයි. අත්ලස ලොභ උපයා හෝ ප්‍රාණවධකෙරෙයි. "සොර ව පරා අයති ගෙත වැටෙමි"යි සිතා හෝ ප්‍රාණවධ කෙරෙයි. මොවුන් හැමදෙනහට මැ ප්‍රාණාතිපාත පූර්වභාගයෙහි ලොභ වෙයි. "පළමු මට අනර්ථයක් කෙළේ"යි බද වෛරයෙන් ද, "දැන් මට අනර්ථයක් කෙරෙ"යි බද වෛරයෙන් ද, "මත්තේ මට අනර්ථයක් කෙරෙයි" බද වෛරයෙන් ද, "පළමු මට ප්‍රියයනට අනර්ථයක් කෙළේ"යි බද වෛරයෙන් ද, "දැන් අනර්ථයක් කෙරෙයි" බද වෛරයෙන් ද, "මත්තේ අනර්ථයක් කෙරෙයි" බද වෛරයෙන් ද, "පළමු මට අප්‍රියයනට අර්ථයක්කෙළේ" යි බද වෛරයයන් ද, "දැන් අර්ථයක් කෙරේයි" බද වෛරයෙන් ද, "මත්තේ අර්ථයක් කෙරෙයි" බද වෛරයෙන් ද, රුහැණී[2] සපයමින්

1. පූර්විභාගයෙන්. 2. රුණී.

ද්වේෂයෙන් කිපී මරන්නාහට[1] ප්‍රාණාතිපාතපූර්වභාගයෙහි ද්වේෂ වෙයි. 'ශතයාග-සහස්‍රයාගයෙහි එකෝ'හි කුලෙන් සිය බැගින් දහස් බැගින් මරා යාග කරන්නාහට අකුසල් නැති, මහත් කුසලැ''යි මරන්නාහට ද. නීතිශාස්ත්‍රයෙහි කී සෙයින් වධයට සම්ප්‍රාප්ත සත්ත්වයන්ට වධකළ වරද නැතැ'යි ප්‍රාණාතිපාත කර්මයෙහි පවත්නා රජ්ජුරුවනට ද, රාජාමාත්‍යයනට ද, ''මවු පියහු ඉතා ලෙඩදුක් නො විඳදී මැරිය යුත්තෝය, එහි කුසලැ''යි මරන්නාහට ද, ''සර්පවෘශ්චිකාදීහු මනුෂ්‍යයන්ට වධ කෙරෙති. එබැවින් එවුහු මැරිය යුත්තෝ ය''යි මරන්නාහට ද, ''මෘග සූකර පක්ෂි ආදීහු මනුෂ්‍යයන් විසින් පරිභොගකරනු සඳහා උපන්නාහ, එබැවින් උන් මැරුයෙහි අකුසල් නැතැ''යි ප්‍රාණවධයෙහි පවත්නාහට ද, සත්ත්වයෝ නම් නැති, සත්ත්වයන් ඇති සේ වටහාගත් මත්ත. එබැවින් උන් මැරුයෙහි අකුසල් නැතැ''යි නාස්තිකදෘෂ්ටි ගෙන මරන්නාහටද ''සත්ත්වයෝ නම් අහෙතුකයහ. කිසි කවර ප්‍රත්‍යයෙකින් උපදනාහු නොවෙති. එබැවින් උන් මැරුයෙහි අකුසල් නැතැ''යි අහෙතුකදෘෂ්ටි ගෙන මරන්නාහට ද, සතුන් මැරූකල පවු සිද්ධවන්නේ නො වේ'යි අක්‍රිය දෘෂ්ටි ගෙන මරන්නාහට ද, ප්‍රාණාතිපාත පූර්වභාගයෙහි මොහ වෙයි.

මෙසේ ප්‍රාණවධ කරන්නාහට ප්‍රාණාතිපාත පූර්වභාගයෙහි ලොභ හෝ වෙයි. ද්වෙෂ හෝ වෙයි. මොහ හෝ වෙයි.

''දනා අයත්හු සොරා ගත්මි''යි සිතා තමා විසින් අභිමත වූ අයති හෝ අනෙක් යම් කවර අයතක් හෝ තමා වැටෙනු සඳහා හෝ පුත්‍ර දරාදීන් පොෂණය කරනු සඳහා හෝ හරණය කරන්නාහට අදත්තාදාන පූර්වභාගයෙහි ලොභ වෙයි. පරාගේ අයතියෙන්

1. මරන්නාහට.

තමහට ප්‍රයෝජන නැත ද, අනුන් නසනු සඳහා ගන්නාහට ද, පූර්වෝක්තනවප්‍රකාරවෛරවශයෙන් ගන්නාහට ද, අදත්තාදානප්‍රවිභාගයෙහි ද්වේෂ වෙයි. නීති ශාස්ත්‍රයෙහි කී සෙසින් දුෂ්ට නිග්‍රහ කරමිහ 'යි පරස්වහරණය කරවන රජ්ජුරුවන්ට ද, රාජාමාත්‍යයනට ද, සියල්ල බ්‍රහ්මණයන් ගැත්තේ ය. බ්‍රාහ්මණයන්ට දුන්නේ ය. බ්‍රාහ්මණයන් දුර්බලයෙන් සෙස්සෝ පරිභොග කෙරෙති. එබැවින් පරස්වහරණය කරන බ්‍රාහ්මණයන්ට පවු නැතැ 'යි සිතා පරස්ව හරණය කරන්නාහට ද, "බමුණන්ගේ සවර්ණ ගන්නාහට මැ අකුසල, සෙසුදූ සොරා ගන්නාහට අකුසල් නැතැ" යි ගන්නාහට ද, ආපදා වූ කල සොරකම් කළාහට වරද නැතැ 'යි ගන්නාහට ද, සොරා අයති ගන්නෙහි දෝෂ නැති, එබැවින් අනුන්ගේ අයති ගතයුත්තේය 'යි අශ්‍රද්ධාදෘෂ්ටි උපගත ව ගන්නාහට ද, දන් නොදෙන්න වුන්ගේ කුසල් නො කරන්නවුන්ගේ අයති සොරා ගන්නාහට පවු නැතැ 'යි ගන්නාහට ද, අදත්තාදාන ප්‍රවිභාගයෙහි මෝහ වෙයි. මෙසේ අදත්තාදානයෙහි පවත්නාහට ප්‍රවිභාගයෙහි ලෝභ වේ ම ය. ද්වේෂ වේ ම ය. මෝහ වේ මැ යි.

මාතුරක්ඛිතාදි විසිදෙනාගේ සුන්දරවූ වර්ණශොභායෙහි වස්ත්‍රාභරණහස්තපාදදිශොභායෙහි රාගඋපයා ද, ඔවුන්ගේ තමහට ප්‍රිය වූ ශබ්දයෙහි රාග උපයා ද, පලන් මල් ආදි ගන්ධයෙහි රාග උපයා ද, ඔවුන් අතින් වළඳවන ලද අන්නපානාදි රසයෙහි රාග උපයා ද, මෘදු වූ ශරීරස්පර්ශයෙහි රාග උපයා ද, ඔවුන් හා කල සංවාසයෙන් ලාභ ලැබෙමි 'යි සිතාද, අනුන් විසින් සත්කාර ලැබෙමි 'යි සිතා ද, ස්ථානාන්තරයකට යා හැක්කැ 'යි සිතා ද, තමා දිවි වැටිය හැක්කැ 'යි සිතා ද, දෙමාපිය නැදිමයිල් ආදීහු පොෂණය කට හැක්කැ 'යි සිතා ද, මිථ්‍යාචාරයෙහි පවත්නාහට[1] ප්‍රවිභාගයෙහි

1. පවත්නාහට ද.

ලෝභ වෙයි. පරස්ත්‍රීන් විසිදෙනා කෙරෙහි ද, ඔවුන් ස්වාමීන් කෙරෙහි ද, ඔවුන් දෙමාපිය නෑදිමයිල් ආදීන් කෙරෙහි ද, වෛර උපයා ඔවුන්ගේ මානභග්නය කෙරෙමි 'යි අමර්ෂයෙන් උද්දීප්ත ව මිථ්‍යාචාරයෙහි පවත්නානට මෛථුන පූර්වභාගයෙහි ද්වේෂ වෙයි. තමා මවුනු ද හා මෛථුනයෙහි පැවති කල පවු නැතැ යි ගන්නා යොන්නට ද, වත්පොරෝනන් සඳහා වූයේ, මල් පලදනවුන් සඳහා වූයේ, පක්බත් කන්නවුන් සඳහා වූයේ, දියතොට බැස සනහන්නවුන් සඳහාවූයේ, මග ගමන් යන්නවුන් සඳහා වූයේ, එසේ මැ ස්ත්‍රීහු මෛථුන යෙහි පවත්නා සඳහා වූ හ, එබැවින් යම් කවරස්ත්‍රියක් හා මෛථුනයෙහි පවත්නානට ද, දෝෂ නැතැ,යි ගන්නානට ද, යම් හේතුවෙකින් පුත්‍රමුඛ සන්දර්ශනයෙන් මවුපියෝ විගතශෝක වෙද්ද, එබැවින් මෛථුන දිව්‍යලොක යන්නට ද, පලල් වූ ඔහක් නැති මාර්ගයෙක. එහි සබව දන්නාහු මෘග සූකරපක්ෂි ආදිහ. එයින් එවුහු තමන් මවුන් හා මෛථුනයෙහි පවත්නෝ යයි ගෙන අසද්ධර්මයෙහි පවත්නානට ද, කාමමිථ්‍යා චාර පූර්වභාගයෙහි මොහ වෙයි. මෙසේ කාමමිථ්‍යාචාර පූර්වභාගයෙහි ලොභ වේ ම ය. ද්වේෂ වේ ම ය. මොහ වේ මැ යි.

ජීවනවෘත්ති සඳහා අත්ලස් ආදි සඳහා බොරු කියන්නානට ද, මෘෂාවාදපූර්වභාගයෙහි ලොභ වෙයි. නවප්‍රකාර ආඝාත වස්තු විසින් කිපී මෙරමා නසම් යන සිතින් බොරුකියන්නා හට මෘෂාවාදපූර්වභාගයෙහි ද්වේෂ වෙයි. ධර්ම හා යුක්ත කොට බොරුකියන්නානට දෝෂ නො ද ඇති. සත්‍රීන්ට මෛථුන සේවා සඳහා ඔවුන් පොලඹවන්නට කී බොරුයෙහි දෝෂ නො ද ඇති. විවාහකාලයෙහි ඒ සිද්ධවනු සඳහා කී තාක් බොරුයෙහි දෝෂ නො ද ඇති. ජීවිතවිනාස වේ නම් ඒ රක්නා සඳහා කී තාක් බොරුයෙහි දෝෂ නැති.

තමාගේ ධන ධාන්‍ය විනාශ වේ නම් ඒ රක්නා සඳහා කී නාක් බොරුයෙහි දොෂ නො ද ඇති 'යි බොරු කියනුවනට ද, බොරු කීයෙහි පවු නැති යනාදි විසින් නාස්තිකා'හෙතුක අක්‍රියදෘෂ්ටි ගෙන බොරුකියනුවනට ද, මෘෂාවාදපූර්වභාගයෙහි මොහ වෙයි.

ජීවනවෘත්ති සඳහා යම් කවර ද්‍රව්‍යයෙක්හි ලොභයෙන් යම් කවර ප්‍රකාරයකින් ඔවුනො'වුන් බිඳෙන්නට නිසි තෙපුල් කියනුවනට ද, පෛශුන්‍ය පූර්වභාගයෙහි ලොභ වෙයි. නව ආඝාතවස්තුවින් කිපී නිරපරාධයන්ට විනාශ සඳහා ද ඔවුනො'වුන් බිඳෙන්නට නිසි තෙපුල් කියනුවනට ද, පෛශුන්‍ය පූර්වභාගයෙහි ද්වෙෂ වෙයි. ඔවුනොවුන් බිඳෙන්නට නිසි තෙපුල් කීමෙහි දොෂ නොද ඇති යනාදි විසිනු දු, දුෂ්ටනිග්‍රහ සඳහා කීමෙහි දොෂ නොද ඇතැයි ද, නාස්තිකා'හෙතුකඅක්‍රියදෘෂ්ටි ගෙන කේලාම් කීමෙහි දොෂ නැතැ 'යි ගෙන කියනුවනට ද, පෛශුන්‍ය පූර්වභාගයෙහි මොහ වෙයි.

ජාත්‍යා දීන් සවා හවනු නො ඇසියටි ව යම් කවර ද්‍රව්‍යයක් දෙති,යි ලොභ උපයා හවනුවනට ද, අත්ලය ලොභ උපයා ජාත්‍යා'දීන් සවා හවනුවනට ද, රාගයෙන් රත් ව කළට වූ වචනයෙන් ආක්‍රොෂ කරනුවනට ද, පරුෂවචන පූර්වභාගයෙහි ලොභ වෙයි. තමහට වූ අර්ථ හානි පිණිස හවන්නානට ද, පර ගුණෙහි අක්ෂමායෙන් උද්දීප්ත ව හවනුවනට ද, පරාගේ ලාභ සත්කාරාදි නො විද හී සවා බිණීයටි ව හවන්නානට ද, නව ආඝාත වස්තු පිණිස හවනුවනට ද, පරුෂවචන පූර්වභාගයෙහි ද්වෙෂ වෙයි. දසයනට දාස ය යි හැවීමෙහි දොෂ නැති 'යි. චණ්ඩාලාදීනට චණ්ඩාලාදි ආක්‍රොෂවචනයෙන් සවා බිණුයෙහි දොෂ නැති 'යි නාස්තික දෘෂ්ටි ගෙන ද, දුෂ්ටනිග්‍රහ සඳහා හැවූයෙහි

දෙෂ හොඳ ඇති,යි ඟවනුවනට ද, පරා ඇති කල පරහට ආක්‍රොෂ නම් දෙයක් ඇත්තේය. පරා ම නැති බැවින් ආක්‍රොෂ නැති යනාදි විසින් ඟවනුවනට ද, **ආක්‍රොෂ පූර්වභාගයෙහි මොහ** වෙයි.

ජීවන වෘත්තියට ද නිසි යම් කවර ද්‍රව්‍යයක් ලැබෙම් යන සිතින් කාව්‍යනාටකාදි[1] සම්ඵප්‍රලාප කියනුවනට ද, රචනා කොට කියනුවනට ද, ජීවනවෘත්තිය සඳහා පරාරාධනපර ව ශාස්ත්‍ර ව නො අා යම් කවර ප්‍රලාපයක් කියනුවනට ද, **සම්ඵප්‍රලාප පූර්වභාගයෙහි ලොභ** වෙයි. රුස් පිරිස ප්‍රෙම නො වන පරිද්දෙන් සම්ජනයන් ඔහට නින්දකරන පරිද්දෙන් පරිභූත කොට බෙණෙම්,යි අක්‍ෂමාඇති ව ප්‍රලාපබණනුවනට **සම්ඵප්‍රලාප පූර්වභාගයෙහි ද්වෙෂ** වෙයි. කාව්‍යනාටකාදී පරදශිත සවරූප හඟවම් යන සිතින් නො කියා, කාව්‍යවින්‍යාසක්‍රම හඟවම් යන සිතින් නො කියා, අභිධාන උගත්වම් යන සිතින් නො කියා; පරයන් විසින් අභිමත මෙවැනි මෙවැනි ආනුභාව ඇත්තෝ ද පවා අනිත්‍යතාවට ගියහ යනු හඟවම් යන සිතින් නො කියා, කාව්‍යනාටකාදි පරමාර්ථ කොට ප්‍රතිපත් කොට කියනුවනට ද, අසම්න් හුන්නන් එවිගස මැ මලනොත් අපායෙහි උපදවන්නට නිසි වූ අසද්ධර්මසඞ්ඛ්‍යාත කාව්‍යනාටකාදි කියෙහි දු ඇසුවෙහි දු කුසලැ'යි නෙත කියනුවනට ද, යම් කවර ප්‍රලාපයක් බැණ අන්නට හශී උපයූ කල කුසලැ,යි කියනුවනට ද, නාස්තිකාහෙතුකඅක්‍රියදෘෂ්ටි ගෙන සම්ඵප්‍රලාපයෙහි අකුසල් නැතැ'යි කියනුවනට ද, **සම්ඵප්‍රලාප පූර්වභාගයෙහි මොහ** වෙයි. කාව්‍යනාටකාදි ප්‍රලාප පරිද් ''විජම්අටුවායෙහි'' කීයේ මැනෝ?

**''පාපකං සුතනං නාම:-භාරතයුද්ධසීතාහරණාදි පවිසං යුතනං. පාපකං පවිභාගං නාම:-දුබ්භාසිත**

1. කාව්‍යනාටකාදීන්.

සුතනං ඝාවත්‍යනාටකවිලම්බනාදි පටිසංයුත්තං” යි. මෙසේ මෘෂාවාදපෛශුන්‍ය පරුෂවාක්සම්භින්නප්‍රලාප පූර්වභාගයෙහි ලෝභ වේ ම ය. ද්වේෂ වේ ම ය. මෝහ වේ මැ යි.

පරාගේ සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තු දැක එහි ලෝභ උපයා පසුව ඒ මට උව දැහ 'යි පතනුවනට අභිධ්‍යා පූර්වභාගයෙහි ලෝභ වෙයි. අනුන්ගේ සම්පත් දැක ඒ උන්ට වූ සේ නො යෙදෙ යි සැටී තමහට උව දැහ,යි පතනුවනට ද, අභිධ්‍යා පූර්වභාගයෙහි ද්වේෂ වෙයි. පරා අයත් සවිඤ්ඤාණක අවිඤ්ඤාණකවස්තු තමහට වුව දැහ 'යි පැතුයෙහි අකුසල් නැතැ 'යි ගන්නාහට ද, පරා අයත් තම හට වුව දැහ 'යි පැතුවාහු චතුර්විධ අපායෙහි නූපදිති 'යි ගන්නාහට ද, නාස්තිකා 'හෙතුක අක්‍රියදෘෂ්ටි ගෙන පරා අයත් සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තුවලෝභ උපයුවාහට අකුසල් නැතැ,යි ගන්නාහට ද, අභිධ්‍යා පූර්වභාගයෙහි මෝහ වෙයි.

පරා අයත් සම්පත ලෝභ උපයා ඒ සම්පත් ස්වාමීන් ජීවිත විනාශයට ගිය කල තමහට ලැබෙති,යි ගෙන ඒ සම්පත් ස්වාමීන් නට දැහ 'යි සිතන්නාහටද, ව්‍යාපාදපූර්වභාගයෙහි ලෝභ වෙයි. පරාගේ ලාභසත්කාරාදි දැක ද, අසා ද, ක්ෂමා නො කොට හී ඔවුන් නට දැහ 'යි සිතනුවනට ද, නවවිධආඝාතවස්තුවින් කිපී මෙරමා නට දැහ 'යි සිතනුවනට ද, ව්‍යාපාද පූර්වභාගයෙහි ද්වේෂ වෙයි. මැරුවන් මරණු ගැසූවන් ගසනු හැවුවන් හවනු වොලොගන්නන්ගේ වොලො ගන්නේ. අපකාර කළාහට අපකාර කරනු දැහමැ 'යි ගෙන පරහිංසා කරන රජ්ජුරුවන ට ද, රාජාමාත්‍යා දීනට ද, මැරුවන් මැරිය යුත්තේය යනාදි විසින් වින්‍යස්ත නීති ශාස්ත්‍රය ගෙන පරාපකාර සිතනුවනට ද, නාස්තික දෘෂ්ටි ගෙන අහෙතුක දෘෂ්ටි ගෙන අක්‍රියදෘෂ්ටි

නෙත ව්‍යාපාදයෙහි දෙෂ නැතැ,යි ගන්නාහට ව්‍යාපාද පූර්වභාගයෙහි මොහ වෙයි.

ගලනකලම්හොහාගර ව මියුරු ව ගුලුකල[1] දුඃඛදායකවූ බිලිබඳු කිපක් බඳු හලාහල විෂමිශ්‍ර ශාලි මාංශොදන බඳු වූ ද, රජකයන්[2] විසින් සකලශරීරයෙහි ලොම් විසිතුරු කොට පොවන්නට නිසි බැවින් රඹගක්‍ෂම වූ මුද්ගරයෙන් ආකොටනප්‍රත්‍යාකොටනාදි විසින් උභතොභාගවිමට්ඨාදි නො කට හැකි බැවින් විමාජිත ක්‍ෂම නො වූ වාතරයක්හු බඳු මනොඥ ව සිතට වැටහෙන බැවින් රඹගක්‍ෂම වූ සිනින් පිරිමැද නුවණින් විසිතා බලන කල ගත හැකි සාරයක් නැති මිථ්‍යාදෘෂ්ටි ගන්නාහට අත්‍යන්ත ලොභ කරවන බැවින් මිථ්‍යාදෘෂ්ටි පූර්වභාගයෙහි ලොභ වෙයි. සූකර පොෂණය කරන මිනිසුන් ශුෂ්ක වූ අශුචිරාශිය දක තුෂ්ට වැ උත්තරාසඞ්ගයෙහි භණ්ඩිකා කොට බැඳ වත්නා මහ වැස්සේ හිස තබා අදනා කල්හි හිස පටන් ගෙන පාදයෙහි තබාග්‍රය දක්වා බස්නා අශුචි දුටු මනුෂ්‍යයන් විසින් උම්මත්තකය ව! මේ අශුචි කුමට අදව 'යි කී කල "නොපිය උම්මත්තකය ව" අපි අපගේ සූකරහතනා ගෙන යම්හ යි තමන් ගත් අශුචි නො පියා ඒ නො මැනවැ'යි ගරහා බිණුවන් හවන සූකර පොෂණය කරන පුරුෂයන් සේ යමෙක් මිථ්‍යාදෘෂ්ටික වී නම් හේ නරකයෙහි හෝ උපද්දී. තිර්යග්යොනිය හෝ උපද්දී. මෙයින් පිටතට නොයෙ යි. ඒ මිථ්‍යා දෘෂ්ටි නම් නො ගත්ව යන බණ අසාද, අන්‍ය කාරණ අසාද, එසේ කිවත් කෙරෙහි සැරී අපට තිවන් සාදන්නේ මේ ම ය. අවිප්‍රතිසාර උපයන්නේ මේ ම ය. පිළිවෙතට සුවය මේ ම ය. මෙලෝ ද පරලෝ ද සුවයන් අපට සාද 'යි විපර්යාෂ වූ දෘෂ්ටි ග්‍රහණය කරනුවනට මිථ්‍යාදෘෂ්ටි පූර්වභාගයෙහි මොහ වෙයි. යම් කවර

1. ගැලුකල. 2. රජකයන්

හෙයකින් මිනිසුන් පලා ගිය ගමකට දිවි චටත්නට නිසි අයතක් සොයමින''යි ගිය සබඳුත් දෙදෙනා සණවැහැරි දූක ''සබඳ තෝ සණවැහැරි භාරයක් ගත. මම ද සණවැහැරි භාරයක් ගන්මි.''යි සසඳැ සණවැහැරි දෙභාරයක් බැඳගෙන දෙදෙනා වැලිදු එක් වට ගොස් සණහු දූක සබඳ මේ සණවැහැරට වඩා සණ හු මහාඝීය, මම ද මේ සණ වැහැරි හැර පියා සණ හු භාරයක් බැඳ ගන්මි. තොද සණ වැහිරි හැරපියා සණ හු භාරයක් බැඳ ගණැ''යි කී කල ''සබඳ දුරින් අළියේ පෙළා බද්දේය. තෝ ගතැ''යි කී කල තමා ගත් සණවැහැරි භාරය හැරපියා සණ හු භාරයක් බැඳ ගෙන, වැලිදු එක්වූට ගොස්, සණපිළි දූක කපුහු දූක කපුපිළි දූක යදූක ලොහො දූක තඹ දූක රිදී දූක පළමු කී සෙයින් ම කියා ඔහු නො ගත් කල තමා ගතු ගතුවනට වඩා මහ ඇගිතාක් වස්තු ගන්මින් ගොස් රිදීභාරයක් ගෙන, වැලිදු එක්වට ගොස් රන් දූක ''සබඳ මේ රිදීයට වඩා රන් මහ ඇගිය. මම මේ රිදී භාරය හැර පියා රන් භාරයක් ගන්මි. තො ද තෙල සණ වැහැරි භාරය හැරපියා රන් භාරයක් ගෙනැ''යි කී කල ''සබඳ දුරින් අළියේ පෙළා බද්දේය. තෝ ගතැ''යි කී කල රිදී භාරය හැර පියා රන් භාරය ගෙන ගියේය. මෙසේ තමා සබඳු රිදී භාරය හැර පියා තමහට ද, තමා නිසුවාහට ද, වෙසෙසින් සුව සොම්නස් කාරණ වූ සවණ්භාරය ගන්නා දූක ද, අඥකාමි වූ තමා සබඳ හු කිවා නො කොට තමා ගත් සණ වැහැරි, භාරය මැ ''දුරින් අළියේ පෙළා බද්දේ ය''යි නො හැර තමා ගෙට ගොස් තමහට ද, තමා නිසුවා හට ද, කායිකචෛතසිකදුඃඛදෞර්මනස්‍යය උපදූ බාලයා සේ අනෙකාසඞ්ඛ්‍යකල්පයෙහි දු දුලීභ වූ බුද්ධෝත්පාදයට සම්ප්‍රාප්ත ව, බුදුන් තමන් විසින් මැ ''මානේ ධර්ම විතය බොහෝ රුවන් ඇත්තේ ය, අනෙකරුවන් ඇත්තේ ය, එකි රුවන් නම් කවරහ?යත්:-

චතුර්විධ ස්මෘත්‍යුපස්ථානය, චතුර්විධ සම්‍යක් ප්‍රධානය, චතුර්විධ ඍද්ධිපාදය, පඤ්චෙන්ද්‍රියය, පඤ්චබලය, සප්ත බොධ්‍යඞ්ගය, ආය්‍ර්‍යාෂ්ටාඞ්ගමාර්ගය යනාදි විසින් දෙශිත ධර්ම රත්නය ඇති ව 'එගත්ව'යි කියන කල්‍යාණමිත්‍රයන් ඇති ව ඒ නොගෙන "මේ ධර්මය"යි තමහට ද, තමන් අනුගත පශ්චිමජනයන්ට ද, විනාශභාග් වූ මිථ්‍යාදෘෂ්ටි සංග්‍රහයට යන බුද්න් විසින් අදෙශිත ධර්මය "මේ ධර්ම"යයි ගන්නනට මිථ්‍යාදෘෂ්ටි පූර්වභාගයෙහි මොහ වෙ. මෙසේ අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි පූර්වභාගයෙහි ලොභ වේ මය. ද්වෙෂ වේ මය. මොහ වේ මැ යි. මෙසේ දක්වනලද ලොභ ද්වෙෂ මොහ. වෙයි.

5

මේ තුන්දෙනා කෙරෙන් ලොභ – රූපායතන ශබ්දායතන ගන්ධායතන රසායතන ස්ප්‍රෂ්ටව්‍යායතන ධර්මායතන යන ෂඩාලම්බනයන් කල් කොට ගන්නා සවභාව ඇත්තේ ය. විදුරුලනවක් සෙයින් එම අරමුණෙහි බලවත් ව ඇලෙන සවභාව ඇත්තේ ය. හුණු කබලෙක බනාලූ ලේ මුසු මස්ගඩුවක් සෙයින් සනතින් දුරු නොකට හැකි සවභාව ඇතියේ ය. තෙල්දූලියක්[1] සෙයින් සර්වසංස්කාර ධර්මයන් කෙරෙහි මැ ආස්වාද උපයන සවභාව ඇතියේ ය. සතත උපන් විග ස එයට තිසි භාවනායෙන් දුරු නො කට හුණ හොත් යම් තැනෙක ද වට වැසි මුහුද මිසැ නො නවත්නා සේ අපායට ගෙන යන සවභාව ඇත්තෝ' යි.

ද්වෙෂ-කිපෙන සවභාව ඇත්තේ ය. පහර ලද ආශීවිෂ සර්පයක්හු සෙයින් ව්‍යාප්ත වන සවභාව ඇත්තේ ය. ව්‍රණයක ගෑසූ විෂයක් සෙයින් ඇතුලෙන් දවන සවභාව ඇත්තේ ය. රුක් බුහුර ගත් ගිනියක් වැන්න. පමා අතක් බලා මරම්'යි ඇවිදුනා සතුරකු වැන්න. විෂයෙන් පරිභාවිත වූ මූත්‍රයක් වැනි මැ යි.

---

1. තෙල්ලක්.

මොහ-සිත්හුගේ අන්ධභාවයක් වැන්න. අනුවණ බවක් වැනි මැයි. අරමුණෙහි ඇති සවභාව මුවහ කොට මැනවක් සේ හඟවයි. අඳුරක් වැන්න. අයොනිසොමනස්කාරයෙන් උපද්දී. මේ තුන්දෙන හැම අකුසල්හට මුල්හ. මොවුන් තුන්දෙනා ප්‍රධාන විසින් දක්වූයේ ය.

සෙසු අකුසලුන් කෙරෙහි ද ඖද්ධත්‍ය-අව්‍යුපශාන්ත ලක්‍ෂණ ඇත්තේ ය. වයින් චලිත ව එක් තැනෙක නො සිටිනා දියක් වැන්න සුලඟ හමන තැනෙක දුගැබෙක බැඳි ධවජයක් වැනි මැයි. පහණින් ගැසූ හළු රැසක් වැනි මැයි.

මාන-හිවි වත සවභාව ඇතියේ ය. උන්මත්තක යක්හු වැනි මැයි. ඊර්ෂ්‍යා-අනුන්ගේ සම්පතැ සැවෙන සවභාව ඇතියේ ය. උකටලී සවභාව ඇතියේ මැ යි. අනුන්ගේ සම්පතට පිටිපැණියක් වැනි මැයි.

මාත්සය්‍ය-ලැබියයුතු සම්පතුදු, ලද සම්පතුදු, පැටිකරන සවභාව ඇතියේ ය. අනුන් හා සාධාරණ වනුනො කැමැතියේ ය. විරූප ආකාරයකින් හැකිළෙන සවභාව ඇතියේ ය. සිත්හුගේ නො යාපත් බවක් වැනි මැයි.

කෞකෘත්‍ය-පසුව තැවෙන සවභාව ඇතියේ ය. කළ අකුසල් නො කළ කුසල් පිණිස සොස්නා සවභාව ඇතියේ ය. විපිළිසරයක් වැනිමැයි. දස්බවක් වැනිමැ යි.

ථීනමිද්ධ-දෙදෙන කුසල් කරන වීය්‍ය්‍ය ද නැති කෙරෙයි. තිදී ගත් කලක් සේ සිනලු සිරුරු අකර්මණ්‍ය කොට උපදියි.[1]

විචිකිච්ඡා ශංසය සවභාව ඇතියේ ය. කිසේය? යත්:-බුදුහු ඇති හෝ නැති හෝ, සව්නෝ දතිති හෝ?

1. උපදින්.

නො දනිති හෝ? ධර්ම ස්වාඛ්‍යාත වේසි හෝ? නො වේසි හෝ? සඟහු සුපිළිපන්නාහ. හෝ? එසේ නො වෙති හෝ? අතීතයෙහි මම වීම් හෝ? නො වීම් හෝ? අනාගතයෙහි වෙමි හෝ? නො වෙමි හෝ? මම ය හෝ? මම නො වෙමි හෝ? කොයින් අවුත් මත්තේ කොයට යෙමි හෝ? සියලු දනම්හු පිණිස උපදිති හෝ? එසේ නො වෙති හෝ? සසර දුකින් මිදෙන පිළිවෙත් ඇති හෝ? නැති හෝ? යනාදි විසින් උපද්දී. මෙසේ වන බැවින් මැ එක් තැනෙක පිහිට නැත්තිය. නො සෑ ගැන්මෙන් උපද්දී.

**අහිරිකා**–කාදුසිරි ආදි පවුකැම්හි ජුගුප්සා නැති. ලජ්ජා නැතිව පවු කරන සුලු ය. පාපයෙන් නො හැකිලෙන සුලුය.

**අනොත්තප්ප**–කායදුශ්චරිතාදි අකුශල ධර්මයෙහි භය නැති. උත්‍රාස නැති. නො බා පවු කරන ස්වභාව ඇතියේ ය. මෙසේ අකුශල ධර්මයන්ගේ උත්පත්තික්‍රම දතයුතු.

## 6

**කුශලධර්මයන්ගේ උත්පත්ති කිසේ ය? යත්:—**

දතින් සිද්ධවන සම්පතුදු, සිලින් සිද්ධවන සුගතිදු, ප්‍රඥවෙන් පිළිලැබියැ යුතු නිවනුදු, කරුණායෙන් සිද්ධ වන බුදුබවුදු, සත් පුරුෂයන් විනා නො වන බැවින් සත්පුරුෂසංසර්ගයෙන් වන බැවින් සත්පුරුෂයෝ ලෞකිකලොකොත්තරසම්පත් දායකයහ. ඔවුන් විසින් සිද්ධවන ලෞකිකලොකොත්තර සම්පතුදු' පිළිවෙත් කරන ජනයන්ට ආදිය ම සිද්ධ වන්නේ නො වේසි. බුදුන් විසින් දෙශිත නෛර්‍යාණික ධර්මයෙහි පිළිවෙත් කරන එදහම් විභාග කොට දන්නා පණ්ඩිතජනයන් කෙරෙහි පළමු ශ්‍රද්ධා උපද්දී. ශ්‍රද්ධා ජාතවූවාහු උපසංක්‍රමණය කෙරෙති. උපසංක්‍රාන්ත වූවාහු ඔවුන්

කෙරෙහි නිෂණ්ණ'දිය කටට් වෙති. නිෂණ්ණදියැ පවත්නාහු ධර්මශ්‍රවණය කටැ'ටිවෙති. ධර්මශ්‍රවණය කැමැති වූවාහු ශ්‍රොතාවධානය කෙරෙති. අවහිතශ්‍රොත වූවාහු ධර්ම ශ්‍රවණය කෙරෙති. ධර්මශ්‍රවණය කොට ඒ ධර්මය සිත තබා දැරියැටි වෙති. ධෘතධර්මයාගේ අර්‍ථොපපරීක්‍ෂා කෙරෙති. අර්‍ථොපපරීක්‍ෂා කරන්නාහට ධර්ම නෛර්‍යාණික ක්‍ෂාන්ති උපද්දී. ධර්මනෛර්‍යාණික ක්‍ෂාන්ති උපන්නාහට "ඒ ධර්මයෙහි පිළිපදිම්හ" යන බලවත් ඡන්‍ද උපද්දී. බලවත් ඡන්‍ද උපන්නාහට "එදහම් පිළිවෙත් කරම්හ" යන උත්සාහය උපද්දී. උපන් උත්සාහය ඇත්තාහු පූර්වබුද්ධයන් කෙරෙහි කෘතාධිකාර මහපිනැති කෙනෙක් වූහු නම් සම්‍යක්දෘෂ්ටික වූහු නම් කල්‍යාණාධ්‍යශාය වූහු නම්, බුදුන් විසින් දේශිත නිර්වාණ ද නෛර්‍යාණිකධර්ම ම "මේ ධර්ම ය"යි තුලනා කෙරෙති. සර්වසංස්කාරධර්මයෝ අනිත්‍යහ. දුඃඛයහ. අනාත්මයහ. යනාදි විසිතුරු තුලනා කෙරෙති. තුලනා කොට එහි පිළිවෙත් කෙරෙත්. මෙසේ සජ්ජනයෝ ලද වහලින් කුසල් කෙරෙත්ම ය.

පූර්වබුද්ධයන් කෙරෙහි කෘතාධිකාර ශ්‍රද්ධාසම්පන්න මහපිනැ'ති සත්ත්වයෝ ධර්මයෙන් යුක්තවෙති. එබැවින් ම කායදුශ්චරිත වාග්දුශ්චරිත මනොදුශ්චරිතයෙහි ලජ්ජා උපයති. ලජ්ජා ඇති බැවින් මැ ඒ හැම අකුසල් විෂයෙහි අපත්‍රපා ඇති වෙති. එබැවින්ම පවු කිරීමෙහි භය උපයති. ශ්‍රිධර්මයෝගයෙන් තමන් කෙරෙහි හරසරින් පවු නො කෙරෙති. අපත්‍රපා ධර්මසොභයෙන් අනුන් කෙරෙහි හරසරින් පවු නො කෙරෙත් ම ය. තමන් කෙරෙහි හරිසරින් පවු කි සේ? නො කෙරෙති යත්:- "පවු කිරීම" නම් ජාති සම්පන්නයන්ගේ කර්ම නො වෙයි. හීනජාතික වූ කෛවර්තිකාදීන්ගේ කර්ම ය. එබැවින් මා වැනි ජාති සම්පන්නයන් මෙවැනි පව්ටු කර්ම කරනු නො යෙදේ'යි.

ජාති ප්‍රත්‍යවෙක්‍ෂා කොට පවු නො කෙරෙත් ම ය. "පවු කිරීම" නම් කාර්ය්‍යාකාර්ය්‍යය නො දන්නා ළදරු වයස සිටියවුන් කරන දෑයෙක. මා වැනි නා මනා බෙද දන්නා මහලු වයස සිටියවුන් පවු කරනු නො යෙදේ'යි වයස් ප්‍රත්‍යවෙක්‍ෂා කොට පවු නො කෙරෙත් ම ය. "පවු කිරීම" නම් දුර්බලයන් කරන දෑයෙක[1]. මා වැනි ශූරභාවයෙහි සිටියවුන් පවු කරනු නො යෙදේ'යි ශූරභාව ප්‍රත්‍යවෙක්‍ෂා කොට පවු නො කෙරෙත් ම ය.

පවු කිරීම නම් අඥබාලජනයන්ගේ කම් ය. මා වැනි පණ්ඩිත බහුශ්‍රැතයන් මෙවැනි පවිටු කම් කරනු නො යෙදේ'යි පණ්ඩිත භාව ප්‍රත්‍යවෙක්‍ෂා කොට පවු නො කෙරෙත් මැ යි. මෙසේ තමන් කෙරෙහි හරසරින් පවු නො කෙරෙත්.

පරා කෙරෙහි හරසරින් පවු කි? සේ නො කෙරෙති යත්:- ඉදින් තෝ මේ පාපකර්මය කොළෙහි නම් සිවුවණක් පිරිසැ ගර්හාවට සම්ප්‍රාප්ත වෙහි. යම් සේ නගරජනයෝ ශුචි ප්‍රිය වෙද්ද, අශුචි ගරහද්ද, එසෙයින් ම "තා සිවුවණක් පිරිස ඇත්තෝ ගරහති"යි ප්‍රත්‍යවෙක්‍ෂා කොට පවු නො කෙරෙත් ම ය. "මා වැනි සැදැහැ ඇත්තවුන් විසින් බොහෝ බණ ඇසුවවුන් විසින් අන්තට අවවාද කරනුවන් විසින් පවු කරනු නො යෙදේ"යි පවු නො කෙරෙත් ම ය. ලොකය මහත. මහත් වූ ලෝකයෙහි සෘද්ධි ඇත්තෝ අනුන් සිත් දන්නාහු ඇති වෙති. මා වාසය කරන ගෙහි ද රට ද දෙවියෝ ඇති වෙති. එවුහු වෙත සිටියාහුදු නො පෙනෙති. දුර සිටියාහුදු දකිති. එවුහු බලව මේ කුලදරුවා සැදැහැ නැතියේ පවිටු කම් කරනුයේ ය"යි මා ගරහති. එබැවින් මා පවිටු කම් කළ නො යෙදෙයි. පවු නො කෙරෙත්. අකුසලින් දුරුවෙත්. තමන්

1. කළමනා දෑයෙක 2 තමාකෙරෙ

ආත්ම ශුද්ධ කොට පස්වකත්. යම්සේ මූත්‍රපුරීෂාදි කරන්නාහු ලජ්ජා කරන්නට යුත් පුරුෂයන් දුටු කල බලවත් ලජ්ජා උපයද්ද, එසේ ම කුල දරුවෝ පවුකම් හි ලජ්ජා කෙරෙති. යම්සේ තිවී ගිය සවට අශුචීන් ම්‍රක්‍ෂිතවූයේ අශුචිය ජුගුප්සා උපයා නො ගනිද්ද, එසේ ම කරන්නට පිළිවනුදු තමන්කෙරෙහි හරසරින් පවු නො කෙරෙත්.

යම් සේ දිලිසෙන සවට අත් දනු තබා උෂ්ණ භයින් නො ගනිද්ද, එසේ ම පණ්ඩිත ජනයෝ අපාය භයප්‍රත්‍යවෙක්‍ෂා කොට පවු නො කෙරෙත්.

ඇතැම්හු තමන්ගේ ජාති ප්‍රත්‍යවෙක්‍ෂා කොට අප වැනි[1] ජාති සම්පන්නයන් පවු කරනු නො යෙදෙ"සි. පවු නො කෙරෙති.

ඇතැම්හු තමන් දෙමාපියන් ස්මරණය කොට "එ වැනි දෙමාපියන්ට දුවූවන් විසින් මෙ වැනි පවු කරනු නො යෙදෙ"සි මවුපියන් කෙරෙහි හරසරින් පවු නො කෙරෙත් ම ය.

තමන් නැයන් ස්මරණ කොට. එ වැනි නැයන් ඇති අප මෙ වැනි පවු කරනු නො යෙදෙ'සි පවු නො කෙරෙත් ම ය.

සබඳුන් ප්‍රත්‍යවෙක්‍ෂා කොට මෙ වැනි පව්වු කම් කරන්නාවූ අප සබඳුහු ගරහති'යි පවු නො කෙරෙත් ම ය.

ඇතැම්හු පවු කළ කල පසුව තවහට එසින් තාපවේ'යි පවු නො කෙරෙත් ම ය.

ඇතැම්හු අප මෙ වැනි පවු කළ කල දඬ ගනිති. අත්පා සිඳිති. මරති. මිය අපායේ උපදම්හ යනාදි

1 මාවැනි.

විසින් ප්‍රත්‍යවෙක්‍ෂා කොට පවු නො කෙරෙත් ම ය. මෙසේ පවු නො කොට කුසල් කෙරෙත් ම ය. මෙසේ අකුසල් සිද්ධ වත සවරූප ද කුසල් සිද්ධ වත සවරූප ද දශිතසමතත්සරයෙන් දුන් ඔවුන් විසින් සිද්ධ වත හීනභාවප්‍රණීතභාව දක්වනු ලැබෙයි. කිසේය? යත්:-

7

ප්‍රාණාතිපාතකර්ම කළාහු ඒ පාපකර්මයෙන් සතර අපායෙහි දුක් අනුභව කොට මිනිසත්බැව උපන් කල අල්පායුෂ්ක වෙත්. ප්‍රාණාතිපාතයෙන් දුරුවූවාහු ඒ පුණ්‍යකර්මයෙන් දිව්‍ය සම්පත් අනුභව කොට මිනිසත්බව උපන් කල දීර්ඝායුෂ්ක වෙත්.

අදත්තාදාන කළාහු ඒ පාපකර්මයෙන් සතර අපායෙහි දුක් අනුභව කොට මිනිසත් බව උපන් කල රාජභයින් චෞරභයින් අග්නිභයින් උදකභයින් ශත්‍රුභයින් නස්නා සම්පත් ඇති වෙති. දිළිඳුව දෙහොතින් කබල් ගෙන සිඟති. අදින්නාදනින් දුරු වූවාහු එපින්කැමින් දිව්‍යසම්පත් අනුභව කොට මිනිසත්බව උපන් කල රාජභයින් චෞරභයින් අග්නිභයින් උදකභයින් ශත්‍රුභයින් නො නස්නා සම්පත් ඇති වෙති. සර්වකාලයෙහි සම්පත්තීන් සමෘද්ධ වෙති. දිළිඳුබවට බැගෑබවට නො පැමිණෙත්.

පරදාරකර්මයෙහි පැවති පුරුෂයෝ ඒ පාපකර්මයෙන් සතර අපායෙහි දුක් අනුභව කොට මිනිසත් බව උපන් කල නො ගැණි නො පිරිමි වෙති. නපුංසක පණ්ඩක වෙති. නොයෙක් ජන්මයෙහි බීජෝද්ධරණය කරණු ලැබෙති. ගුණුකැමින් ස්ත්‍රී ව අනෙකවාරයෙහි උපදිති. අනෙක සතුරන් ඇති වෙති. ස්ත්‍රීහු මිථ්‍යාචාරයෙහි පැවත ඒ පාපකර්මයෙන් සතර අපායෙහි දුක් අනුභව කොට මිනිසත්බව උපන් කල තමන් ස්වාමීන් ප්‍රතිබද්ධ ශරීරස්පර්ශී අන් පුරුෂයන්ට

දුන් පවින් කුෂ්ට කිලාසාදි ඡවිරොගයෙන් උපහත වෙති. ස්ත්‍රීභාවයෙන් නො මිදෙත්. පරදාරකර්මයෙන් දුරුවූ පුරුෂයෝ එ පින්කැමින් දිව්‍යසම්පත් අනුභව කොට මිනිසත්බව උපන් කල ඡවිරොග නැතිවෙති. සම්ජනයන්ට ප්‍රිය වෙති, බොහෝ මිත්‍රයන් ඇතිවෙති. පිරිමි බැමින් නො පිරිහෙත්. ස්ත්‍රීහු මිථ්‍යා'චාරයෙන් දුරුවූවාහු ඒ පුණ්‍යකර්මයෙන් දිව්‍යසම්පත් වළඳ මිනිසත්බව උපන් කල ඡවිරෝග නැති වෙති. සම්ජනයන්ට ප්‍රිය වෙති. ස්ත්‍රීභාවයෙහි විරාග ඇත්තාහු වූ හු නම් ස්ත්‍රී භාවයෙන් මිදී පිරිමි වෙති.

බොරු කිවාහු මියැ ඒ පාපකර්මයෙන් සතර අපායෙහි දුක් අනුභව කොට මිනිසත්බව උපන් කල නිරපරාධයෙහි හවනු ලැබෙත්. මුසවායෙන් දුරුවූවාහු එ පින්කැමින් දිව්‍යසම්පත් අනුභව කොට මිනිසත්බව උපන් කල අනුන් විසින් ගුණ කියනු ලැබෙත්.

කේලාම් කිවාහු මියැ ඒ පාපකර්මයෙන් සතර අපායෙහි දුක් අනුභව කොට මිනිසත්බව උපන් කල මිත්‍රයන් කෙරෙහි බිඳුනා ලැබෙති. කේලාමෙන් දුරුවූවාහු ඒ පුණ්‍යකර්මයෙන් දිව්‍යසම්පත් අනුභව කොට මිනිසත්බව උපන් කල මියුරු තෙපුල් අසති. හැමදෙනා හා සමඟ ව වාසය කෙරෙති. ඔවුන් කෙරෙහි අන්හු නො ද බිඳැ හැකි වෙත්.

අනුන් හැව්වාහු මියැ ඒ පාපකර්මයෙන් සතර අපායෙහි දුක් අනුභව කොට මිනිසත්බව උපන් කල නො මියුරු තෙපුල් අසති. අනුන් නො හැව්වාහු ප්‍රිය වූ තෙපුල් බිණූවාහු එපින්කමින් දිව්‍යසම්පත් අනුභව කොට මිනිසත්බව උපන් කල මි යුරු වූ කන්කලු වූ තෙපුල් අසති.

**සම්භින්නප්‍රලාප** බිණුවාහු මියැ ඒ පාපකර්මයෙන් අපා දුක් අනුභක කොට මිනිසත්බව උපන් කල අනුන් හරසර කරන්නට නිසි නෙපුල් නැති වෙති. අනාදෙය්‍ය වූ වචන ඇති වෙති. **සම්භින්නප්‍රලාපයෙන්** දුරුවූවාහු එපින්කැමින් දිව්‍යසම්පත් අනුභව කොට මිනිසත්බව උපන් කල හැම දෙනා විසින් හරසර කරන්නට නිසි ආදෙය්‍ය නෙපුල් ඇතිවෙති.

**රහපූවාහු** මියැ ඒ පාපකර්මයෙන් සතර අපායෙහි දුක් අනුභව කොට මිනිසත්බව උපන් කල හිරි ඔතප් නැති වෙති, එබැවින් නිර්ලජ්ජාව සජ්ජනයන් විසින් පරිභූත වෙති. උන්මත්තක වෙති. **රහමෙරින්** දුරුවූවාහු එපින්කැමින් සුගතියැ ඉපැද දිව්‍යසම්පත් අනුභව කොට මිනිසත්බව උපන් කල සිහි නුවණ ඇති වෙති හිරි ඔතප් ඇති වෙති.

**මිථ්‍යාදෘෂ්ටික** වූවාහු මියැ ඒ පාප කර්මයෙන් අපායෙහි මියැ නූප දිති. නොයෙක් වාදහස් අපායෙහි දුක් අනුභව කොට මිනිසත්බව උපන් කල මිථ්‍යාදෘෂ්ටික වෙති. මිථ්‍යාසංකල්පනා ඇති වෙති. ඍජු වූ ප්‍රතිපත්ති මාර්ගයෙහි පිහිටුවන්නට නො පිළිවන් වෙති. මෙලොව පරලොව වරදන්නට නිසි ප්‍රතිපත්හි හික්මවන මිථ්‍යා දෘෂ්ටි ගත්තන් කෙරෙහි භක්ති කෙරෙති. මිනා කල්‍යාණමිත්‍රකෙනෙකුන් ලදින් සම්‍යක්ප්‍රතිපත්හි සිත් පිහිටුවා නො මනා අධ්‍යාශයෙන් දුරුකරවා ගත හුණ මියැ මඩැ හුණු පහණ සේ සසර නිමග්න වෙති. පෑපිවිය හා සටන් කොට "නී පිට නො හිඳිම්"යි අනෙක වාරයෙහි අහසට පැණ පෑපිවියැ මැ හුණු සාබිළිඳ සෙයින් "සසරින් මිදෙන්නට නිසි පිළිවෙත් කරම්හ"යි සසර වැඩි වන්නට නිසි පිළිවෙත් කොට සසරින් උඩු හුරු නො විය හෙති. **සම්‍යග්දෘෂ්ටිකවූවාහු** ඒ පුණ්‍යකර්මයෙන් සුගතිය ඉපද දිව්‍යසම්පත් අනුභව කොට මිනිසත්බව උපන් කල සම්‍යග්දෘෂ්ටික ව සම්‍යක්

සංකල්පනා ඇති ව තමන්ගේ වයසිා තුබූ පරිද්දෙන් ත්‍රිවිධ බොධි හා සැටී සිටි පිළිවෙත් ඇති වෙත්. සම්‍යග්දෘෂ්ටිකව පහන් සිතින් ශරණශීල පිහිටි තැන් පටන් ගෙන සම්‍යක්ප්‍රතිපත් පත්වමින් ත්‍රිවිධ බොධින් එක්තරා බොධියකට සම්ප්‍රාප්තව මිසැ නො නවත්නා බැවිනි.

අතින් දඬුයෙන් කැවින් සිපා මෙරමාහට දුක් දුන්නාහු මියැ එ පවින් අපා දුක් අනුභව කොට මිනිසත්බවක් ලද්දහු නම් රොගී වෙත්. අතින් දඬුයෙන් කැටින් සිපා දනා නො වෙහෙසූවාහු මියැ ඒ පුණ්‍යකර්මයෙන් දිව්‍යසම්පත් අනුභව කොට ඉදින් මිනිසත් බවක් ලද්දහු නම් නිරෝගි වෙත්.

ක්‍රොධයෙන් කිපී තමන් සිත උපන් කොප ද්වෙෂ අප්‍රීතභාව ප්‍රකට කළාහු මියැ එපවින් අපායෙහි දුක් අනුභව කොට මිනිසත්බවක් ලද්දහු නම් විරූප ව දුර්වර්ණ ව දුදිගී වෙති. ක්‍රොධයෙන් අනුන් කෙරෙහි නො කැටි සිතිදු වූ කුළුණුබැරි සිතින් මෙරමා කෙරෙහි පැවැත්තාහු එපින්කැමින් දිව්‍යසම්පත් අනුභව කොට මිනිසත් බවක් ලද්දහු නම් රූප ශොභාසම්පන්න වෙති. දුටුවන්ට කල් වෙති.

අනුන් ලබන ලාබයෙහි අන්නට කරන සත්කාර යෙහි ගරුකාරයෙහි මානනයෙහි වන්‍දනයෙහි පූජායෙහි "ඔවුන් කළ පින්කමින් ඔවුන් ලද්දේය"යි ක්‍ෂමා නො කොට ඊ ර්‍ෂ්‍යා කළාහු මියැ එපවින් අපාදුක් අනුභව කොට මිනිසත් බවක් ලද්දහු නම් අනුභාව නැතිවෙති ප්‍රසිද්ධ නැති වෙති. හැමදෙනා විසින් ගරහනට නිසි වෙති. අනුන් ලබන ලාභයෙහි අන්නට කරන සත්කාරයෙහි මානනයෙහි වන්‍දනයෙහි පූජායෙහි තුෂ්ට වූහාහු "ඔවුන් කළ පින්කැමින් ඔවුන් ලද්දේය"යි . මුදිතා උපදුවාහු එපින්කැමින් දිව්‍යසම්පත් අනුභව

කොට මිනිසත් බවක් ලද්දාහු නම් මහත් අනුභාව ඇති වෙති. ප්‍රසිද්ධ වෙති. හැම දෙනා විසින් පූජිත වෙති.

තමන් තමන් පොහෝනා පමණින් දන් නො දී ආත්ම පොෂණපරව මසුරුවූවාහු ඒ පාපකර්මයෙන් අපාදුක් අනුභව කොට මිනිසත්බව උපන් කල සම්පත් නැති වෙති. දිළිඳු ව දනා ඇසුරු කොට වැටෙති. මඳකල බොහො නොසිල්වා තමන්ගේ සම්පත් තිබූ පමණින් දන්දුන්නාහු එපින්කැමින් දිව්‍යසම්පත් අනුභව කොට මිනිසත්බව උපන් කල මහත් ධන ඇති වෙති. හැම සත්තට පිළිසරණ ව බැගෑබවට නො පැමිණ සමෘද්ධ වූ අන්නපානා'දියට සපැමිණ සුවයෙන් වාසය කෙරෙති

සිල්වතුන් කෙරෙහි නැදිමයිලන් කෙරෙහි බැබුහුණුන් කෙරෙහි නිහරසර වූවාහු වැන්දයුත්තන් නො වැන්දහු හුනස්නෙන් නැඟ මනාවුත් දැක හුනස්නෙන් නො නැංගාහු අඤ්ජලි කර්ම කළ මනාවුන්ට අඤ්ජලිකර්ම නො කළාහු පෙරමඟට ගිය මනැවුත් දැක පෙරමගට නො ගියාහු මගදී පහවූව මනාතට මගදී පහ නො වූවාහු හිඳිනා අසුන් සලසා දුන මනාතට හිඳිනා අසුන් සලසා නො දුන්නාහු හරසර කට යුත්තානට හරසර නො කළාහු ගරු[2] කළමනාවුනා ගරු නො කළාහු පුදන්නට නිස්සත් නො පිදූවාහු ඒ අනාදරසඞ්ඛ්‍යාත වූ පවුකැමින් මිය අපාදුක් විඳ මිනිසත්බව උපන්නාහු නම් චණ්ඩාලා'දි නීචකුලයෙහි උපදිත්. මෙකිනාක් දෙනා කෙරෙහි වැන්ද යුත්තන් වැඳ පිදිය යුත්තන් පුදා හරසර කළ මනාතට හරසර කළාහු හුනස්නෙන් නැඟ මනාවුන් දැක හුනස්නෙන් නැංගාහු අඤ්ජලිකර්ම කළ යුත්තානට අඤ්ජලිකර්ම කළාහු පෙරමගට ගිය මනාවුන් දැක පෙරමගට ගියාහු මග දී පහවූව මනාතට මග දී පහවූවාහු හිඳිනා අසුන් සලසා දුන මනාතට

හිඳිනා අසුන් සලසා දුන්නාහු ගරු කළ මනානට ගරු කළාහු පුදන්නට තිස්සන් පිදුවාහු එපින්කැමින් දිව්‍ය සම්පත් අනුභව කොට මිනිසත්බවැ උපදිත් නම් ක්ෂත්‍රිය කුලා'දි වැඩිසිටි කුලෙහි උපදිත්.

බුදුන් විසින් දෙසිත නෛර්‍යාණික දහම්හි සෙයින් කර්තව්‍යා'කර්තව්‍යය බෙද කියන පණ්ඩිතජනයන් කරා එළඹ "වහන්සේ, කුසල් නම් කිම? අකුසල් නම් කිම? සාවද්‍ය නම් කිම? නිරවද්‍ය නම් කිම? කුමක් සෙවිය යුත්තේ ද? කුමක් නොසෙවිය යුත්තේ ද? කුමක් කළ හොත් දීර්ඝරාත්‍රියෙහි අහිතයට දුඃඛයට වැටේ'යි. කුමක් කළ හොත් දීර්ඝරාත්‍රියෙහි හිතයට සුවය වැටේ'යි පිළිවිස්මෙහි ආදරය නො උපයූ හෙයින් සම්‍යක්ප්‍රතිපත නො පැවති හෙයින් අපායෙහි දුක් අනුභව කොට මිනිසත් බව උපන් කල අන්ධබාල ව කර්තව්‍යාකර්තව්‍යය නො දන්ති. එබැවින් මැ නුවණ නැති වෙති. බුදුන් විසින් දෙසිත නෛර්‍යාණික දහම්හි සෙයින් කර්තව්‍යා කර්තව්‍යය බෙද කියන පණ්ඩිතයන් කරා එළඹ "වහන්සේ, කුසල් නම් කිම? අකුසල් නම් කිම? සාවද්‍ය නම් කිම? නිරවද්‍ය නම් කිම? කුමක් සෙවිය යුත්තේද? කුමක් නො සෙවිය යුත්තේ ද? කුමක් කළ හොත් දීර්ඝරාත්‍රියෙහි අහිතයට දුඃඛයට වැටෙ යි. කුමක් කළ හොත් දීර්ඝරාත්‍රියෙහි හිතයට සුවයට වැටෙ යි. පිළිවිස්මෙහි ආදර උපයා සම්‍යක් ප්‍රතිපත පැවති හෙයින් දිව්‍යසම්පත් අනුභව කොට මිනිසත්බව උපන් කල කර්තව්‍යා'කර්තව්‍යය බෙද දන්ති. බලවත් ප්‍රඥා ඇති වෙති.

ඡන්දයෙන් ද්වෙෂයෙන් මෝහයෙන් භයින් අකර්තව්‍යයෙහි පැවැත්තේ වී නම් පස'ඩමස සඳ සේ පිරිහෙමින් යෙයි. ඡන්දයෙන් ද්වෙෂයෙන් මෝහයෙන් භයින් පවු නො කරන්නේ වී නම් පෙර'ඩමස සඳ සේ පරිපූර්ණ වෙයි.

"යාචකා'දීන් ඉල්වූ දා යම් පමණක් දෙමි"යි ගිවිස පසුව තමා කී පමණින් වඩා දුන්නේ වී නම් එපින්කැමින් දිව්‍ය සම්පත් අනුභව කොට මිනිසත් බව ඉපද "යම් පමණක් ලැබෙමි"යි වෙළඳම් තවාම් සැම්වැටිලි කෙළේ වී නම් ඔහු පැතූපමණින් බොහෝව කර්ම තුබූ පරිද්දෙන් අමිත් සම්පත් උපද්දී.

පළමු කී පමණ ම පසුව දුන්නේ වී නම් එපින්කමින් දිව්‍ය සම්පත් අනුභව කොට මිනිසත් බව උපන් කල "යම් පමණ ලැබෙමි"යි පතා වෙළඳම් තවාම් සැම්වැටිලි කෙළේ වී තිම් ඔහු පැතූ පමණින් ලැබෙයි.

පළමු "බොහෝවක් දෙමි"යි ගිවිස පසුව සුළුක් කොට දුන්නේ වී නම් යම් පමණක් දෙමි"යි සිතා වෙළඳම් තවාම් සැම්වැටිලි කෙළේ වී නම් ඔහු පැතූ පමණ නො ලැබෙයි. අල්පවූ අකිඤ්චිකර දෑයෙක් ලැබෙයි. යම් පමණක් දෙමි"යි කියා ලොභ උපදවා පසුව කී දෑ නුදුන්නේ වී නම් එපවින් අපායෙහි දුක් අනුභව කොට මිනිසත්බව උපන් කල දිළිඳු වෙයි. බැගෑ වෙයි. සිතට සුව නම් නැත්.

අධර්මයෙන් භොග උපයන්නේ වී නම්, එසේ උපයූ භොගයෙන් තෙමේ සුවයෙන් නො වැටෙන්නේ වී නම්, පුත්‍රදරාදීන් සුවයෙන් පෝෂණය නො කරන්නේ වී නම්, දන් නො දෙන්නේ වී නම්, මේ සතරඅඟින් ගර්හ්‍ය වෙයි. සඵා ධම මිනිස්පෙරෙළෙවෙයි. රාක්‍ෂස පරිගෘහීත විලක් බඳු වෙයි.

අධර්මයෙන් භොග උපයා තෙමේ සුව්යෙන් නො වැටෙන්නේ වී නම්, පුත්‍රදරා'දීන් සුවයෙන් පොෂණය නො කරන්නේ වී නම්, දන් දෙන්නේ වී නම්, ආදියෙහි කී තුන් අඟින් ගර්හ්‍ය වෙයි. අධර්මයෙන් භොග උපයා තෙමේ සුවයෙන් නො වැටෙන්නේ

වී නම්, පුත්‍රදරාදීන් සුවයෙන් පොෂණය කරන්නේ වී නම්, දන් දෙන්නේ වී නම්, ආදියෙහි දෙඅඟින් ගහ්‍ය වෙයි, අන්තයෙහි දෙ අඟින් ප්‍රශංස්‍ය වෙයි[1]. අධර්මයෙන් භොග උපයා තෙමේ සුවයෙන් වැටෙන්නේ වී නම්, පුත්‍රධාරාදීන් සුවයෙන් පොෂණය කරන්නේ වී නම්, දන් දෙන්නේ වී නම්, අධර්මයෙන් භොග උපයයි යන ආදියෙහි එක අඟින් ගහ්‍ය වෙයි. අන්තයෙහි තුන් අඟින් ප්‍රශංස්‍ය වෙයි. ධර්මයෙන් භොග උපයා තෙමේ සුවයෙන් නො වැටෙන්නේ වී නම්, පුත්‍රදරාදීන් සුවයෙන් පොෂණය නො කරන්නේ වී නම්, දන් නො දෙන්නේ වී නම් ආදියෙහි එක අඟින් ප්‍රශංස්‍ය වෙයි. තුබු තුන් අඟින් ගහ්‍ය වෙයි. ධර්මයෙන් භොග උපයා තෙමේ සුවයෙන් වැටෙන්නේ වී නම්, පුත්‍රදරාදීන් සුවයෙන් නො වටන්නේ වී නම්, දන් නො දෙන්නේ වී නම් ආදියෙහි දෙ අඟින් ප්‍රශංස්‍ය වෙයි. අන්තයෙහි දෙඅඟින් ගහ්‍ය වෙයි. ධර්මයෙන් භොග උපයා තෙමේ සුවයෙන් වැටෙන්නේ වී නම්, පුත්‍රදරාදීන් සුවයෙන් පොෂණය කරන්නේ වී නම්, දන් නො දෙන්නේ වී නම් ආදියෙහි තුන් අඟින් ප්‍රශංස්‍ය වෙයි. අන්තයෙහි එක අඟින් ගහ්‍ය වෙයි. ධර්මයෙන් භොග උපයන්නේ වී නම්, එ සම්පතින් තෙමේ සුවයේ වැටෙන්නේ වී නම්, පුත්‍රදරාදීන් සුවයෙන් වටන්නේ වී නම්, දන් දෙන්නේ වී නම්-- දෙනුන් තෙනෙන් කිරි දෙව එකිරි හිඳුවා මුද. එදිහි අලලා වෙඩරු ගෙන එ වෙඩරු දවා තෙල් කළ කල එ දුවූ තෙල් පැහැදි මතුව සිටි 'සප්පිමණ්ඩ'ය යි කියනලද පහන්තෙල හැමයෙන් උතුම් වන්නා සේ--පූර්වචෙතනා--මද්ධ්‍යචෙතනා--අපර චෙතනා ශුද්ධ කොට අන්තයෙහි ති ප්‍රකාරයෙන් දන් දුන්නේ සියලු දනපතීන් කෙරෙහි මහඇගි වේ'යි වදළ බැවින් මේ සර්වදනපතීන්ට අග්‍ර වෙයි.

---

1. ප්‍රශස්ථ

දන් දෙන කල රහත් කෙනෙක්හට දුන්නේ වී නම්, රහත්හට ද නිරොධසමාපත්තින් නැගි වේලේ දුන්නේ වී නම්, එ වේලෙහි දෙන දනවස්තුව ධැමෙන් සෙමෙනුදු උපන්නේ වී නම්, ධැමෙන් සෙමෙන් උපදවන පූර්වචෙතනා-මධ්‍යචෙතනා-අපරචෙතනා ශුද්ධ කට හුණුයේ වී නම්, එම ජන්මයෙහි විපාක දෙයි; නොඑසේ වී නම් විපාක දෙන කාලයෙහි හිම් නැති; තමාගේ සාමාර්ථ්‍යය තුබූ පරිද්දෙන් විපාක දෙයි.

බුද්ධා'දීන්ගේ මහත්ත්ව ප්‍රත්‍යවෙක්‍ෂා කොට, උපකාරයන්ගේ උපකාර ගුණ ප්‍රත්‍යවෙක්‍ෂා කොට, දෙමාපිය නැදිමයිල් ආදීන් කෙරෙහි හරසරින්, පුත්‍රදාරාදීන් කෙරෙහි ස්නෙහයෙන්, දුඃඛිතයන් කෙරෙහි කාරුණ්‍යයෙන්, මෙයින් පිටතුන් කෙරෙහි ශ්‍රද්ධායෙන් භොග ජීවිත අභය දෙනු දන නම් වේ.

තමහට අපකාරයෙහි බද්දන් කෙරෙහි මෛත්‍රී උපයා දන් දිය යුතු. ගුණ නැත්තන් කෙරෙහි අනුකම්පා උපයා දන් දිය යුතු. ගුණවතුන් කෙරෙහි මුදිතා උපයා දන් දිය යුතු. උපකාරයන් කෙරෙහි මැදහත්ව දන් දිය යුතු.

එක් තිරශ්චීනගතයක්හට දුන් දන සියක් පින්වේ. කිසේ ය.¿ යත්:—

ගුණ විසිතුරු උපකාර විසිතුරු පෝෂණය සඳහා ද දුන්නා නොගත යුත්තේ ය. ආලොපයෙන් අර්ධයක් හෝ ආලොපයක් හෝ දුන ද දන කොට නො ගත යුත්තේය. යම් කවර සුනක සූකර කුක්කුටා'දීන් කෙරෙහි සම්ප්‍රාප්ත එක් සතක් හට එලා'සායෙන් තෘප්ති තිවා පරිභොග කරන පමණක් දුනහොත් සියක් පින් වේ'යි දන යුතු. සියක් පින්කම නම් කි සේ? දන යුත්තේ ය, යත්:-

සියක් ජන්මයෙහි ඒ ඒ ජන්මයට ප්‍රතිනියත වූ ආයුෂයෙන් නො පිරිහෙළා පවත්වන විසින් ආයු සියක් දෙයි. සියක් ජන්මයෙහි වර්ණවත් කොට උපය යි. සියක් ජන්මයෙහි ඉෂ්ටප්‍රෂටව්‍ය එළවා ඒ අනුභව කරවා කායික සුඛ දෙයි

ඉෂ්ට වූ මනොඥ වූ පුණ්‍යකර්මයෙන් නිර්මිත චක්ෂුසට විෂය වූ රූපායතන, ශ්‍රොත්‍රයට විෂය වූ ශබ්දායතන, ඝ්‍රාණයට විෂය වූ ගන්ධායතන, ජිහ්වාවට විෂය වූ රසායතන එළවා අනුභව කරවා චෛතසිකසුඛ දෙයි. සියක් ජන්මයෙහි බල දෙයි. සියක් ප්‍රතිභාන ඇති කෙරෙ යි. මෙසේ සියක් ජන්මයෙහි පරිත්‍රාණ නොයිපැද්ද දී[1] සුව දෙ යි. මෙසේ උපදනා පුණ්‍යඵල ගෙන කියති. 'තිරශ්චීනගතයක්හට දුන් දන සියක් පිණැ'යි. මත්තේ දහසක් පිණ ලක්ෂයක් පිණ යනාදී තැන මෙසේ දත යුතු: පෘථග්ජනයන්[2] කෙරෙහි කිසි කවර ගුණ විශෙෂයක් නැති මිනිසක් හට පළමු කී ප්‍රකාරයෙන් දුන් දන දහසක් පිණ. සංයම ඇති මිනිසක් හට දුන් දන ලක්ෂයක් පිණ. කාමයෙහි වීතරාග ශාසනයෙන් පිටත් මිනිසක්හට දුන් දන කෙළලක්ෂයක් පිණ. පහන් සිතින් තිසරණ ගිය උපාසකයක් හට දුන් දන අසඞ්ඛ්‍යෙය අප්‍රමෙය පිණැ' යි දත යුතු.

මෙසේ තිසරණ යන්නාහු දුර්ලභ නො ද වෙති. ඔවුනට මෙසේ දෙන් දන් කිසි උගනටෙක් නො ද වෙයි. එසේ දුන් දන මෙතෙක් විපාක නම් වේද"යි මෙකී දූය සැක නො කට යුත්තේ ය. කුකුස් නො ද උපවිය යුත්තේ ය. හැදහිය යුතු. මේ ඉතා සුලභ නො වූ උගනට දෙයෙකැ"යි දතයුතු. කී සේ ය.? යත්:—යොදුන් පළල් යොදුන් උස් සලගලෙක ඇක්ම නමා හත් සළකොණ[3] ගනා එක් දිව්‍යයක්හු හවුරුදු

1. නො උපද්දී 2. පෘථජ්ජනයන් 3. කඩ.

සියක් ගිය කල ඇවිදුත් එ සලගල වහා ම ක්‍රමයෙන් ගැහැ[1] මූහැටක්සා වෙයි. එක් කපෙක් නො-ගෙවෙයි. මෙසේ එක් මහ කපෙක පමණ වෙ යි. උපමායෙන් මිසැ නො හැඟවිය හැක්ක.

අනන්තඃකල්ප විසින් හඟවත් පොළොව එක් යොදුන් තුන් ගවුවක් වඩනා තාක් කල් එක් අනන්තඃකල්පයෙක් වෙයි. ඒ නියා අනන්තඃකල්ප අසූවක් එක් මහ කපෙක් වෙයි. එසේ වූ කප බුදුන් නැති ව පෙරලා කප නැතිව අනෙකා'සඞ්ඛ්‍යකල්ප අනෙකවාරයෙහි ඉක්-මෙයි. මෙහි අතුරතුරෙහි බුදුහු ඇතැම් කපෙකැම උපදිති. මෙසේ බුදුන් සුලභ නො වන්නෙත්[2] බුදුරුවන් සුලභ නොවෙයි. බුදුරුවන් සුලභ නො වන්නෙන් ම ඔවුන් විසින් දෙසන ලද ධම්රුවනුදු සුලභ නො වෙයි. ධම්රුවන් සුලභ නො වන්නෙන් ම එ දහම්හි සේ පිළිපදනා සඟුරුවනුදු සුලභ නො වෙයි. මෙසේ සුලභ නො වූ තුණුරුවන් සරණ යන්නාහු දු සුලභ නො වෙත්. මෙසේ සුලභ නො වූ තුනුරුවන් සරණ යනුවෝ කි සේ? සුලභ නො වෙති යත්:

අනන්තා පරිමාණ චක්‍රවාලයෙහි අනන්තා පරිමාණ සතුන් අතුරෙහි සම්‍යග්දෘෂ්ටික වූ රත්නත්‍රයෙහි ප්‍රසාද කරන සත්හු සුලභ නො වෙති. කරකයෙහි නැඟි පියුම් සෙයින් අතුරතුරෙහි සම්‍යග් දෘෂ්ටික වූ ඇතැම් සත් සෙනෙක් රත්නත්‍රයෙහි ප්‍රසාද කොට සරණ යෙති. මෙසේ තුනුරුවනුදු තුනුරුවන් සරණ යනුව-නුදු සුලභ නො වන්නෙන් ම ඔවුනට දුන් දන ඵල අසඞ්ඛ්‍යය අප්‍රමෙය වේ ය යි දත යුතු. මෙසේ වූ තිසරණ යනුවෝ ලාමක සත්හු නො ද, වෙති. කි සේය? යත්:—

හෙට්ඨිමකොටියා තිසරණගතො උපාසකො'පි සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො නාම

1. °උපක්‍රමයෙන් ගැසී. 2. නොවන බැවින්

හොති. තස්මිං දින්නදානම්පි අසංඛෙය්‍යං අප්පමෙය්‍යං යි, වදාළ බැවින්. මොවුනට දුන් දනට වඩා අධිකය පන්සිල් රක්නානට දුන් දන. පන්සිල් රක්නානට දුන් දනට වඩා අධිකය අටසිල් රක්නානට දුන් දන. අටසිල් රක්නානට දුන් දනට වඩා අධිකය දසසිල් රක්නානට දුන් දන. දසසිල් රක්නානට දුන් දනට වඩා අධිකය පළමු මහණ වූ දවසුදු පාපිසි වැනි අතගැම් බඹතට දකැට වත්නට තිසි සාමණේරයනට දුන් දන. ඔවුනට දුන් දනට වඩා අධිකය කොවියක් සංවරයෙහි සිටියානට දුන් දන. මෙසේ සරණගතයන් පටන් කොට ශ්‍රොත ආපත්තිඵල සාක්ෂාත් ක්‍රියාවට ප්‍රතිපන්නයනට දුන් දන ඵල අධික තර අධිකතර ම ය. ශ්‍රොත ආපත්ති මාර්ගස්ථයනට, ශ්‍රොත ආපත්ති ඵලස්ථයනට, සකෘද්ගාමිමාර්ගස්ථයනට, සකෘද්ගාමි ඵලස්ථයනට, අනාගාමිමාර්ගස්ථයනට, අනාගාමිඵලස්ථයනට, අර්හත්මාර්ගස්ථයනට, අර්හත්ඵලස්ථයනට, සම්‍යක්සම්බුද්ධයනට, සඞ්ඝයාට, බුද්ධප්‍රමුඛ භික්ෂුසංඝයාට දුන් දන කිය යුතු කිම?

සඞ්ඝයා කෙරෙහි කළ හරසරින් එක් සඟකෙනෙක්හට ද, දක්ෂිණාව දුන්නාහු වූහු නම් සඞ්ඝදක්ෂිණාව ම දුන්නා නම් වෙයි. කිසේ ය.? යත්'— සාමාන්‍යයෙන් සඞ්ඝරත්නයෙහි ප්‍රසාද උපයා 'සඟනට දන්දෙමි'යි සිතා දන්වැට සරහා වෙහෙරට ගොස් සඟුන් උදෙසා මට එක් සඟකෙනෙකුන් දෙන්නේය'යි ඉල්විය යුතු. සඟනුදු විසින් එක් සඟකෙනෙකුන් දක්වා දිය යුතු. කැමැත්තහු විසිනුදු සඞ්ඝස්ථවිරයන් ලද හොත් "මම සඞ්ඝස්ථවිරයන් ලදිමි"යි සොම්නස් නො ද උපවිය යුත්තේ ය. එසේ වුව පෞද්ගලික දක්ෂිණා වෙයි. බාල භික්ෂුවක්හු ලද නොත් සාමණේරයක්හු ලද නොත් "බාලභික්ෂුවක්හු ලදිමි" සාමණේර යක්හු ලදිමි"යි දොම්නස් නො ද උපවිය යුතු.

එසේ ද වී නම් පෞද්ගලික දක්ෂිණා වෙයි. මෙසේ විවෙක නුපයා යමෙක් සාමණේරයක්හු හෝ උපසම්පන්නයක්හු හෝ, බාලයක්හු හෝ, පණ්ඩිතයක්හු හෝ, සඟුන් උදෙසා ලදින් ඔහු කෙරෙහි විමති නො උපයා 'සඞ්ඝයාට දෙමි'යි දුන්නේ වී නම් සඞ්ඝගතදක්ෂිණා වෙයි. සඟුන් උදෙසා එක්කෙනෙකුන් දෙන්නේ ය. දෙන්නෙකුන් දෙන්නේ ය, තුන්දෙනෙකුන් දෙන්නේය යනා'දී විසින් බොහෝ දෙනා ඉල්වා ගෙන දන් දුන්නේ වී නම් කිය යුතු කිම?

සඟුන් වඩනා මග සම කරවා, පුන්කලස්, දදපෙළ, ගඳමල් වියන් සදා,[1] හමදවා, සුදුවැලි ඔවා පියවිළි අතුරුවා පුදකරවා, ගෙහි ගෙවර කරවා මඟුල් ගෙයක් සේ සදා, සකස් කොට අසුන් පණවා, එ අස්නෙහි සඟුන් උදෙසා තමා ලද සඟුන් වඩා හිඳුවා, ගඳින් මලින් පුදා, සිල්සමාදන්ව සඞ්ඝගත ආදරයෙන් පිනා, 'සඟනට දෙමි'යි දුන් සම්භවභොග සම්පත්සාධක සර්වකාමදද මණිරත්නයක් වැනි පරිපූර්ණ වූ මහඇගි දානයෙකිදු කිය යුතු කිම?

බුදුන් පිරිනිවි කළ ද, බුදුපාමොක් උභතො සඞ්ඝයාට දන් දිය හැකි ද? යත්:- දිය හැක්ක. කි සේ ය.? යත්: "බුදුපාමොක් සඟනට දන්දෙමි"යි දන් වැට සරහා, සඟුන් නිමන්ත්‍රණය කොට, වඩා ඇර තමන් පොහෝනා පමණක් සත්කාර කොට, මහාර්ඝ වූ අස්නක් බුදුනට පණවා, සධාතුක වූ ප්‍රතිමාවක් එ අස්නට වඩා, උභතොසඞ්ඝයාට අසුන් පණවා, වඩා හිඳුවා, පළමු බුදුන් පෙරට ආධාරයක් තබා, දක්ෂිණෝදකය පටන් ගෙන සැරහූ තාක් දන්වැට පළමු බුදුනට දී, ඉක්බිති "උභතො සඞ්ඝයාට දෙමි"යි දිය යුතු. මෙසේ දුන් කල බුදුන් ජීවමාන කාලයෙහි බුදුපාමොක් සඟනට දුන් දන් හා සම වෙයි.

1. පුන්කලස් සදා. දෙපපස මල් ගඳ විලවුන් සදා

මෙසේ බුදුනට දුන් දෑ කුම් කටයුත්තේ ය? යත්:- යම් භික්ෂුවක් බුදුනට මෙහෙ කෙරේ ද, ව්‍රතසම්පන්න ද, ඕහට දිය යුතු. පියන් සතු ධන දරුවන් ලබන බැවින්. නොහොත් සඟනට හෝ දිය යුතු. බුදුනට දුන් දන්වැට ගිතෙල්-මීතෙල් ආදිය ගෙන බුදුනට පහන් හෝ පිදිය යුත්තේ ය. පිළිගෙන පතාකා පිදිය යුත්තේ ය. සඞ්ඝගත දක්ෂිණාව වනාහි සඞ්ඝයා කෙරෙහි චිත්තීකාර උපදිය හෙන්නාහටම වෙ යි; නො එසේ වූවාහට නොවෙ යි; සඞ්ඝගත ආදරය උපදනු. දුෂ්කර බැවින්. මෙසේ සිත්[1] ශුධ කොට ජම්බුද්වීප වාසීන් දන් දෙන්නෙන් කි හ. දක්ෂිණා විභඞ්ග සූත්‍ර අටුවායෙහි 'පරසමුද්දවාසිනො කිර එවං කරොන්ති'යි.

"පුබ්බෙව දානා සුමනො-දදං චිත්තං පසාදයෙ
දත්වා අත්තමනො හොති-එසා යඤ්ඤස්සසම්පදා"යි

සාමාන්‍ය දානයෙහි හා පූර්වචේතනා-මධ්‍යචේතනා-අපරචේතනා ශුද්ධ වූවමනා සේ කියති. මෙසේ සිත් සතොස උපදමනා දක්ෂිණායෙහි ම කිය යුතු කි ම?

9

මෙසේ කුසල් කරන පණ්ඩිත ජනයෝ අලොභ -අද්වෙෂ - අමොහ තුනෙන් යුක්ත වෙත්. එහි අලොභ අරමුණෙහි සිත්හු ගිජුවිය නො දෙන සවභාව ඇතියේ ය, අරමුණෙහි නො ඇලෙන සවභාව ඇතියේ ය. පියුම් පත ඔත් දිය සෙයින්; පරිග්‍රහ නො කරන සවභාව ඇතියේ ය. රාත්කෙනෙකුත් සෙයින්; අරමුණෙහි නො ඇලෙන සවභාව ඇතියේ ය. අශුචින් නැඟි ශුචිපුරුෂයක් හු ඒ අශුචිය නො ඇලෙන්නා සෙයින්.

අද්වෙෂ නො කැකුළ සවභාව ඇතියේ ය; අවිරුද්ධ සවභාව ඇතියේ ය. අනුකූල මිත්‍රයක් හු

1. හෙයින්

සෙයින් සියල් සිරුරු සතහා ආඝාත විනයන ස්වභාව ඇනියේ ය රසඳුන්[1] ආලේපයක් සෙයින්. සෞම්‍ය-ස්වභාව ඇනියේ ය පුන්සඳක් හු සෙයින්. අමොහ වස්තූන්ගේ ස්වභාව දක්නා ලක්ෂණය-නො පැකිළ දක්නා ස්වභාවය දක්ෂ වූ යොධයක් හු විසින් පත්‍රපුට-යෙහි විදුනා දිලියෙන තාරාවයක් සෙයින්; වස්තුධර්ම සිතට නංවා ප්‍රකට කොට දක්වයි. ප්‍රදීපයක් සෙයින් මුළා නො වන ස්වභාවය හැම දිශාවට ම මගහඳුනන පුරුෂයක්හු සෙයින්.

'මෙ තුන් දෙනා සියලු කුශල ධර්මයනට මුල් හ'යි දතයුතු. කි සේ ය? යත්: මොවුන් තුන්දෙනා කෙරෙහි අලොභ-දන් දීමට හේතු වෙයි. අද්වෙෂ-සිල්රැකීමට හෙතු වෙයි. අමොහ-භාවනා කිරීමට හෙතු වේයි. අලොභයෙන්-අධික කොට නො ගන්නි. ලුබ්ධයා බොහෝ ගන්නා බැවින්. අද්වෙෂයෙන් - පමණින් ගන්නි. ද්වෙෂීහු නොමඳ කොට ගන්නා බැවින්. අමොහයෙන්-අවිපරීත කොට ගන්නි. මූඪයාවිපරීත කොට ගන්නා බැවින්.

අලොභයෙන්-විද්‍යමානදෙෂ දෙෂ විසින් ධරා දෙෂයෙහි පවත්නි. ලුබ්ධයා දෙෂ ප්‍රතිච්ඡාදන කරන බැවින්. අද්වේෂයෙන් විද්‍යමාන ගුණ ගුණ විසින් ධරා ගුණයෙහි පවත්නි. වෙෂීහු ගුණ ම්‍රක්ෂණය කරන බැවින්. අමොහයෙන්-යථාස්වභාව යථාස්වභාව විසින් ධරා යථාස්වභාවයෙහි පවත්නි මූඪයා අතත්ත්ව තත්ත්ව ය'යි ගන්නා බැවින්.

අලොභහෙයින්-ප්‍රියවිප්‍රයොග දුඃඛ නොවෙයි. ලුබ්ධයාට ප්‍රිය ස්වභාව වන බැවින්, ප්‍රියවිප්‍රයොග අසහන බැවින් අවෙෂ හෙයින් අප්‍රිය සම්ප්‍රයොගදුඃඛ නො වෙ යි - වෙෂීහට අප්‍රියස්වභාව වන බැවින්. අප්‍රියසම්ප්‍රයොග අසහන වන බැවින්. අමොහ හෙයින් ඊප්සිතාලාභදුඃඛ නො වෙ යි. අමූඪයා "යම්

1. රත්සඳුන්

සම්පතක් ලද මනා පිතක් ඇතිකල ලැබෙයි; නො ලද මනාකල නො ලැබෙ"යි. ප්‍රත්‍යවෙක්‍ෂා කොට තිබෙන බැවින්. අලොභ හෙයින් ජාති දුඃඛ නො වෙයි අලොභියා තෘෂ්ණා ප්‍රතිපක්‍ෂ වන බැවින්, ජාති තෘෂ්ණාමූලක වන බැවින්. අද්වෙෂ හෙයින් ජරා දුඃඛ නො වෙයි වෙෂිහට වහාම ජරා සම්භව වන බැවින්. අමොහ හෙයින් මරණදුඃඛ නො වෙයි. සම්මූඪව මියනු දුක් වන බැවින්, එ දුක් අමූඪයහට නැතිවන බැවින්. අලොභ හෙයින් ගෘහස්ථයන් හා සුවයෙන් වාස-කරන්නට නිසි වෙයි. අමොහහෙයින් ප්‍රව්‍රජිතයන් හා සුවයෙන් වාස කරන්නට නිසි වෙයි. අද්වෙෂ හෙයින් හැම සතුන් හා සුවයෙන් වාස කරන්නට නිසි වෙයි.

අලොභ හෙයින් ප්‍රෙතලොකයෙහි නො උපදී. බොහෝ සෙයින් සත්ත්වයන් තෘෂ්ණා වශහව ප්‍රෙත-ලොකයෙහි උපදනා බැවින්, අලොභ තෘෂ්ණාප්‍රතිපක්‍ෂ වන බැවින්. අද්වෙෂ හෙයින් නරකයෙහි උත්පත්ති නො වෙයි. නරකා'ග්නි හා සම වෙෂයෙන් යුක්තවූවන් නරකයෙහි උපදනා බැවින්, වෙෂප්‍රතිපක්‍ෂ වන බැවින් අවෙෂය. අමොහ හෙයින් නිත්‍යසම්මූඪවූ තිරිසන් යොනිය නූපදී. එසේ වූ මොහයට ප්‍රතිපක්‍ෂයා අමොහ යි. අලොභ හෙයින් කිසි වස්තුවෙක රාගවිසින් ඇලී උපගමන නො කෙරෙයි. අද්වෙෂ හෙයින් කිසි වස්තුවෙක ඝැටී අපගමන නො කෙරෙයි. අමොහ හෙයින් හැම තැන මැදහත් වෙයි. නො මැදහත් නො වෙයි. අලොභ හෙයින් ගිහිගේ පියා සසුන් වැද්දූ'වි වේයි. අද්වෙෂ හෙයින් හැමසත්තට වධ නො කැමති වෙයි. අමොහ හෙයින් හැමසත්නට වෙහෙස නො කැමති වෙයි. අලොභ හෙයින් ශරීර අශුභ සේ දැක අශුභ භාවනායෙන් යෙදී වාසය කෙරෙයි. අද්වෙෂ හෙයින් මෛත්‍රී-කරුණා-මුදිතා භාවනායෙන්

යෙදී වාසය කෙරෙයි. අමොහ හෙයින් සර්වධර්මයන් ධාතු විසින් ප්‍රත්‍යවේක්‍ෂා කොට වාසය කෙරෙයි.

අලොභ හෙයින් කාමසුඛල්ලිකා'නුයොගයන් සේවනය නො කෙරෙයි. අද්වෙෂ හෙයින් ආත්මක්ලමථානුයොගයන් සේවනය නො කෙරෙයි අමොහ හෙයින් මධ්‍යම ප්‍රතිපත්තිය පවත්නී. අලොභ හෙයින් අභිධ්‍යාකායග්‍රන්ථයාගේ භෙදනය වෙයි. අද්වෙෂ හෙයින් ව්‍යාපාදකායග්‍රන්ථයාගේ භෙදනය වෙයි. අමොහ හෙයින් සෙසු ග්‍රන්ථද්වයයාගේ භෙදනය වෙයි. අලොභ අද්වෙෂ හෙයින් කායානුදර්ශීන-වෙදනානුදර්ශීන ස්මෘත්‍යුපස්ථානද්වයයාගේ සමෘද්ධිය වෙයි. අමොහ හෙයින් චිත්තානුදර්ශීන-ධර්මානුදර්ශීන ස්මෘත්‍යුපස්ථානද්වයයාගේ සමෘද්ධිය වෙයි. අලොභ නීරොගී බවට ප්‍රත්‍යය වෙයි. අලුබ්ධවූයේ ලොභකරන්නටද නිසි වූ අසත්ප්‍රාය නො සෙවේ. එහෙයින් නීරොගී වේ. අද්වෙෂ ළදරු වයස සිටිනා බවට ප්‍රත්‍යය වෙයි. අද්වෙෂී වූයේ වලිතපලිතාදීභාවකර ද්වෙෂා'ග්නීන් නො දන්නේ දීර්ඝරාත්‍රිය ළදරුවේ නොයි. අමොහ දීර්ඝායුෂකභාවයට ප්‍රත්‍යයවෙයි. අමූඪ වූයේ හිතා'හිත දැන අහිත දුරුකොට හිතප්‍රත්‍යය සෙවා කරන්නේ දීර්ඝායුෂ්ක වේ නො යි.

අලොභ භොගසමෘද්ධියට ප්‍රත්‍යය වෙයි. පරිත්‍යාගයෙන් භොගප්‍රතිලාභ වන බැවින්. අද්වෙෂ හෙයින් මිත්‍රයෝ බොහෝ වෙති. මෛත්‍රීන්[1] මිත්‍රයන් බොහෝ වන බැවින්, මිත්‍රයන් කෙරෙන් නො පිරිහෙන බැවින්, අමොහ ආත්මසම්පත්තියට වැටෙයි. අමූඪ වූයේ තමහට හිතයක් මැ කරන්නේ තමා රකී නො යි.

අලොභ හෙයින් ස්වකීය පක්‍ෂයෙහි සත්ත්වසංස්කාර විෂයෙහි නිර්විසතන් ඇතිවෙයි ඔවුන්ගේ විනාශයෙහි අභිසඞ්ගහෙතු වූ දුක් නැති වන බැවින්. අද්වෙෂ හෙයින් පරපක්‍ෂයෙහි සත්ත්වසංස්කාරවිෂයෙහි නිර්-

සතන් ඇති වෙයි අද්වෙෂිහට සතුරන් කෙරෙහිදු සතුරහ යන සංඥ නැති වන බැවින්. අමොහ හෙයින් සත්ත්වසංස්කාරවිෂයෙහි උදාසීන වෙයි. අමූඪයහට හැමදෙනා කෙරෙහි ඇති අභිසඞ්ග නැතිවන බැවින්.

අලොභ හෙයින් සකලසංස්කාරධර්මයන් අනිත්‍ය විසින් දක්කී. ලුබ්ධවූයේ උපභොගා 'සායෙන් අනිත්‍යවූ සත්ත්වසංස්කාරධර්මයන් අනිත්‍ය විසින් නො දක්කී. අද්වෙෂ හෙයින් අඝානවස්තු පියා සර්වසංස්කාරධර්මයන් දුක් සේ දක්කී. අමොහ හෙයින් අනාත්මදර්ශීන වෙයි. අමූඪවූවහු යථාස්වභාව ග්‍රහණයෙහි දක්ෂවන බැවින්.

අපරිනායක වූ ස්කන්ධපඤ්චකය පරිනායකයක්හු නැතිසේ දක්නහුට අලොභ උපද්දී. දුක් විසින් දක්නහුට අද්වෙෂ උපද්දී. අනාත්ම විසින් දක්නහුට අමොහ උපද්දි. කි සේ ය? යත්:-

කවරෙක් නම් 'සර්වසංස්කාරධර්මයෝ අනිත්‍යහ'යි දැන දැන 'ඔවුන් ලද්දහ'යි පතයි. සර්වසංස්කාරධර්මයන් දුක් බැව් දැන දැන අත්‍යන්ततීක්ෂ්ණක්‍රොධදුඃඛ උපයයි. සර්වසංස්කාරධර්මයන් අනාත්මසේ දැන දැන නැවත කුමට සම්මූඪවෙයි. කුමට අනාත්මයයි ගන්නේයි[2] මෙතුන් ධර්මයෝ ප්‍රධාන විසින් දක්වන ලද්දහ. මොවුන් හා එක්ව සෙසු කුශලධර්මයෝද උපදිත්. කි සේ ය? යත්:-

බුඩා'දීන්ගේ දර්ශනයෙහිදු දන්පින් කිරියවත් ආදි-කොට ඇති කුශල ධර්මයෙහි පවත්නා වේලෙහිදු කුශල ධර්මයන් උපදනට නිසි කොට ගත් ආලම්බනයෙහිදු මිහුරු බොජුනක් වළඳන කලක් සෙයින් සුඛවෙදනා උපද්දී. නො ඉපිලෙන සවභාව ඇති යනට සත්හුන් මැදහත් ආකාරයෙකින් උපෙක්ෂාවේදනා උපද්දී.

1. මෛත්‍රී ඇත්තාහු 2 ගන්නි.

අරමුණු කල් කොට ගැන්මෙන් කා සිත් පිණවමින් ප්‍රීතිජරූපයන් උපයන විසින් සියල් සිරුරු ව්‍යාප්ත වනසේ දුටුකල දියවතුරක් සෙයින් සියල් සිරුරු සල්හු[1] කොට කා සිත් පිණවමින් පියල්ලක් මෙන් අහසට නඟන ප්‍රීතිදු උපද්දී.

සිත්හු නානාලම්බනයෙහි විසිර නො පැවැත්ත දී සමාහිත කොට එක් ආලම්බනයෙක්හි ම පවත්වන විසින් චිත්තෙ'කාග්‍රතාදු උපද්දී.

කුසල් කිරීමෙහි සිත්හු දුබුල් නො විය දී, මුඩුවක් සෙයින් එබිය නොදී, මනා කොට ආරම්භ කරන ලදුයේ සියලු සම්පත්තට මූල් වෙමින් වීර්‍ය්‍යදු උපද්දී.

බුද්ධා'දීන් කෙරෙහි විමති නැතිව හදහන ස්වභාව වූ, දිය පහයනමිණියක් සෙයින් සිත්සතන් පහයන ස්වභාව වූ, අක්ලිෂ්ට ස්වභාවයක්වැනි[2] බුද්ධා'දිශ්‍රද්ධෙය-වස්තුදු සද්ධර්මගුණ – යොනිසො මනස්කාර – ධර්මා'නුධර්ම-ප්‍රතිපත්තිදු ආසන්නකාරණ කොට ඇති, සගමොක් ගන්නට දික්කරන අතක් බඳු වූ, දිළිඳුබවට නො පැමිණිය දෙන මහඇගි රුවනක් බඳු වූ, සියලු කුසල්නට බිජුවළක් බඳු වූ ශ්‍රද්ධාදු උපද්දී.

අරමුණෙහි නොයිපිලෙන ස්වභාව වූ, සම්මුඪ නො වන ස්වභාව වූ, කායගතා'නුස්මෘත්‍යාදීන් ආසන්නකාරණ කොට ඇති, අරමුණෙහි මනාව පිහිටන විසින් ඉන්ද්‍රඛීලයක් බඳු වූ, චක්ෂුර්වාරාදීන් රක්නා නැන දෙරවූ ගොවුවකු බඳුවූ ස්මෘතිදු උපද්දී.

කායචිත්ත අව්‍යුපශාන්තිකර වූ ඖද්ධත්‍යාදි ක්ලේශ ධර්මයන් දුරු කෙරෙමින් කායදරථ චිත්තදරථ සන්-හිඳුවන ස්වභාව වූ කායප්‍රශ්‍රබ්ධිදු චිත්තප්‍රශ්‍රබ්ධිදු උපද්දී.

---

1 සැහැල්ලු   2. අකාලුෂ්‍ය භාවයක් වැනි

කායචිත්ත දෙදෙනා බර කරනු වූ ස්ත්‍යාන මිඩා’දි අකුශල ධර්මයන් දුරු කෙරෙමින් කුසල් කිරීමෙහි කායිත් බර නො විය දී **කායලඝුතාද්‍ය චිත්තලඝුතාද්‍ය උපද්දී.**

කායචිත්ත දෙදෙනා ඝනබද්ධ කොට නොනැමෙන දඬුවක් සෙයින් දැඩි කොට බුඩා’දි මහතුන් කෙරෙහි ද, නෛර්යාණික ධර්මය කෙරෙහි ද නො නැමිය දී පවත්නා දෘෂ්ටි-මානාදි අකුශලධර්මයන්ට ප්‍රතිපක්ෂ වූ, කාය චිත්ත දෙදෙනා මොලොක් කොට බුඩා’දි මහතුන් කෙරෙහි ද, නෛර්යාණික ධර්ම කෙරෙහි ද සිත් නතු කරන සවභාව වූ **කායමුදුතාද්‍ය චිත්තමුදුතාද්‍ය උපද්දී,** ප්‍රසාද කරන්නට නිසි වස්තුව ප්‍රසාද නො කට දෙන මෙලොවට ද පරලොවට ද හිත වූ ක්‍රියායෙහි නො පැවැත්ත දෙන අකුසල්නට ප්‍රතිපක්ෂ වූ, ප්‍රසාද කරන්නට නිසි වස්තුව ප්‍රසාද උපයමින් මෙලොවට ද පරලොවට ද හිතවූ ක්‍රියායෙහි පවත්වමින්, කායචිත්ත දෙදෙනාගේ අකර්මණ්‍යභාවව්‍යුපශම කෙරෙමින්, කැමති කැමති පළඳනාවක් කරන්නට නිසි කොට දල් හෙලා දැවූ රන්පිඩැල්ලක්[1] බඳුවූ **කායකර්මණ්‍යතාද්‍ය චිත්ත-ප්‍රාගුණ්‍යතාද්‍ය උපද්දී.**

කුසල් කිරීමෙහි සිත්හු ගිලන් කරන අශ්‍රඩාදි අකුශල කර්මයනට ප්‍රතිපක්ෂ වූ කුසල් කිරීමෙහි කාය චිත්ත දෙදෙනාගේ ගිලන්බව මඩිමින්, කුසල් කිරීමෙහි කායචිත්ත දෙදෙනා නිරොග කෙරෙමින්, නිරාදීනවාකාර යෙන් **කාය ප්‍රාගුණ්‍යතාද්‍ය චිත්තප්‍රාගුණ්‍යතාද්‍ය උපද්දී.**

කුසල් කිරීමෙහි කායචිත්ත දෙදෙනා සෘජු නො වියදී වඞ්කකුටිලාදි භාවයට පමුණුවමින් උපදනා මායා සාඨෙය්‍යාදි අකුශලධර්මයන්ට ප්‍රතිපක්ෂ වූ, කාය චිත්ත දෙදෙනා වඞ්කකුටිලාදි භාවයට නො පැමිණියැ දී අවඞ්ක අකුටිල කොට සෘජු කොට **කායර්ජුතාද්‍ය චිත්තර්ජුතාද්‍ය උපද්දී.**

1. රන්පිඩුවිලල්ලක්.

කායදුශ්චරිත - වාග්දුශ්චරිත - මනොදුශ්චරිත වස්තු ව්‍යතික්‍රම නො කරන සවභාව වූ, නො මඬනා සවභාව වූ, කායවාඞ්මනො දුශ්චරිතයෙන් හැකිළෙන සවභාව වූ, ඒ ඒ වස්තු ව්‍යතික්‍රම නො කරන සවභාව වූ, -සද්ධා හිරි-ඔත්තප්ප-අප්පිච්ඡතාදි ගුණයන් පදස්ථාන කොට ඇති, පවු කිරීමට පිටු පානා බදුවූ සම්‍යග්වාක්-සම්‍යක්කර්මාන්ත - සම්‍යගාජීවදු උපද්දී.

පරහට දුක් උපන්කල සාධුනට කම්පා කරනු වූ, පරාගේ දුක් විනාශ කරනු වූ, පරාගේ දුක් අපනයනාකාරයෙන් පවත්නා, පරාගේ දුක් නො ඉවසියැහෙන අවිහිංසාවක් සේ වටහන, දුක්ඛා'භිභූතයන්ගේ අනාථසවභාව දක්නා සවභාව වූ කාරුණ්‍යාදු උපද්දී.

අනුන්ගේ සම්පතෙහි ප්‍රමුදිතසවභාව වූ, අනුන්ගේ සම්පතට ඊර්ෂ්‍යා නො කරන සවභාව වූ, අනුන්ගේ සම්පත උකටලී විනාශ කරන්නියක සේ වටහනු වූ, අනුන්ගේ රූපශොභාදි සම්පත සමෘද්ධි දැක්කැටිවූ මුදිතාදු අමාරසයිතක් සෙයින් සියල් සිරුරු පිණවමින් උපද්දී.

මෙතෙකින් කුශලධර්මයන්ගේ සවරූප පරිඥනයට නය දක්වන ලදි.

10

"සුරාමෙරයපානං භික්ඛවෙ ආසෙවිතං භාවිතං බහුලීකතං නිරයසංවත්තනිකං හොති, තිරච්ඡානයොනි සංවත්තනිකං හොති, පෙත්තිවිසය සංවත්තනිකං හොති, යොසබ්බ ලහුසො සුරාමෙරයපානස්ස විපාකො මනුස්සභූතස්ස උම්මත්තකභාව සංවත්තනිකො හොති''යි වදාරාද කාමමිථ්‍යාචාරයෙහිදු, අභිද්ධ්‍යායෙහිදු,මිථ්‍යාදෘෂ්ටියෙහිදු සවභාව විසින් සඞ්ග්‍රහ-යට යන්නෙත් ප්‍රාණාතිපාත - අදත්තාදාන-මාෂාවාද - පෛශුන්‍ය - පාරුෂ්‍ය - සම්භින්න ප්‍රලාප -ව්‍යාපාදයෙහිදු

උපකාර බැවින් සඞ්ග්‍රහයට යන්නේත්, දශඅකුශලකර්මපථයෙහි ම එළවා එහි ම සඞ්ග්‍රහකොට දක්වනලද සුරාමෙරයපානයෙන් මෙම ජන්මයෙහි සම්භව වන ආදීනව සයෙකි: ප්‍රත්‍යක්ෂ වූ උපයා තුබූ ධනයට විනාශ කෙරෙයි. කලහ වඩයි. රෝගයට පිහිට වෙයි. අයශස් අකීර්ත්ති උපයයි. හිරි-ඔතප් සහ මහල්ලන් කෙරෙහි හරසර පියවන බැවිනුදු, සාගතමහතෙරුන් වහන්සේ වැනි සෘද්ධිසම්පත් ඇත්තත් ඒ සෘද්ධින් පිරිහෙලා බුදුන් වැන්නනට පා ලා හෝනා කරවන බැවිනුදු, කුමරවයසදු පවා වස්ත්‍රයෙන් ඡාදන කරණ රහස්‍ය ප්‍රදේශ විවෘත කොට පාන කෙරෙයි. ප්‍රගුණ-ග්‍රන්ථදු පවා සිහි නො කොට දෙන පමණට අඥාන කෙරෙයි. මෙසේ රහයෙන් මෙම ජන්මයෙහි සිඩ වන ආදීනව දතයුතු.

## 11

අඥානවශයෙන් රාත්‍රිභාගයෙහි අනාතරවීපිය ඇවිදුමෙහි ආදීනව සයෙක් වෙයි. කී සේ ය? යත්:—

කෘතකර්ම - අකෘතකර්මවෛරාදීන් හා සමාගම වන බැවින් ආත්මය අගුප්ත ද වෙයි. අරක්‍ෂිත ද වෙයි ස්වාමීන් රාත්‍රිභාගයෙහි ඇවිදුත්ම ඔවුන් කරන ක්‍රියා අනුව ඔවුන්ගේ භාර්‍යාවෝ ද දරුවෝ ද රාත්‍රිභාගයෙහි ඇවිදුනාහු අගුප්ත ද වෙති අරක්‍ෂිත ද වෙති. "අසුවල් පුරුෂ රාත්‍රිභාගයෙහි ඇවිද්දී. ඔහු ගෙහි සම්පත්ති අභිමියක් වැත්ත. කභිවකුදු විසින් ගනුත් ගත හැක්කැ"යි සිතන වෛරාදීන් විසින් ඔහුගේ සම්පත් ගන්නා ලැබෙයි. කභිවකු විසින් කළ නො මැනවෙක "අසුවල් පුරුෂ රාගයෙන් ඇවිද්දී. ඔහු විසින් කළ දෙයක් වන්නේ ය"යි ආසංකා කරන්නට තිසි වෙයි. නො කළ වරදකුදු 'ඔහු වරද කරනු ලැබේ ය"යි අභූතවචන ඔහු කෙරෙහි රූඪ වෙයි. අනෙකදුඃඛධර්ම

පූර්ණගම කොට ඇති වෙයි. මෙසේ රාත්‍රිභාගයෙහි අන්තරවීථිය ඇවිදුමෙහි ආදීනව සයෙක් වෙයි.

## 12

බොහෝදෙනාගේ ක්‍රීඩාස්ථානයෙහි නෘත්‍යාදි දක්නා සඳහා යනුවහට ආදීනව සයෙක් වෙයි. "නැටුම් ඇති තැන් යෙමි"යි ගඳ මල්-පිළි-පානාදි පයෙසීෂණ කරනු කෙසිනුදු, ගියතැන නැටුම් බලා කිහිපදිනක් නවත්නා සෙයින් ගෙහි කළමනාතාක් කෘත්‍ය වරදනා හෙයිනුදු, වනතාක් අනර්‍ථහානි එකෙකි. එසෙයින් ම ගී අසනු සඳහා යනුව හට ද, හෙරිවාද අසනු සඳහා යනුවහට ද, භාණකාදීන් ඔවුනො'වුන් කළ ක්‍රියා හඟවා පුරාණ-භාරත කියනු අසනු සඳහා යනුව හට ද, හස්ත තාලයෙන් කරන ක්‍රීඩා දක්නා සඳහා යනුවහටද කළ දසරුයෙහි තබා හුණ දඬු ආදියට නැගී නටනු ආදි ක්‍රියා දක්නා සඳහා යනුව හට ද වන අනර්‍ථහානි පූර්‍වෝක්තක්‍රමයෙන් දතයුතු. මේ නෘත්‍යාදි දශීන සජ්ජනයන් විසින් අකාතීව්‍ය ය දෙලොව ම වරදනා බැවින්. මෙසේ නෘත්‍යාදී දශීනයෙහි ආදීනව සයෙක් වෙයි.

## 13

ද්‍යූතක්‍රීඩායෙහි ආදීනව සයෙක් වෙයි. කිසේය? යත්:-දූකෙළ දිනන්නේ සතුරන් උපයයි. පැරද නමා දෙන අයතිය පිණිස සොස්සි. උපයා රැස්කොට තුබූ අයනි නසයි. සභායෙහි දු රැස් පිරිස ඔහු කී තෙපුල් පමණ නො වේ. මිත්‍රයන් විසින් නෑයන් විසින් පරිභූත වෙයි. ආවාහ විවාහ කට'ටියෝ ඔහු නො පතති "අක්‍ෂධූර්‍තී පුරුෂයෙක් දරහරණයට නො හැකි වේ"යි. මෙසේ ද්‍යූතයෙහි ආදීනව සයෙක් වෙයි.

## 14

පව්ටු මිත්‍රයෝ සදෙනෙක් වෙත්. ඔහු කවරහ යත්:- යම්කෙනෙක් ද්‍යූතයෙහි රුස්වද්ද, එක්වත් කනු-

බොනු රුස්වද්ද, පානාශක්ත වේද්ද, වඤ්චක වේද්ද, නො හැක්කදී හැක්කක් වඤ්චාවගත්තා සඑ වේද්ද, පවුකරන තැන භය නැතිව සහසා පවතිද්ද යනමේ සදෙනයි.

15

අලස වීමෙහි ආදීනව සයෙක් වෙයි. හේ කවර? යත්:— 'ඉතා සිහිලැ'යි කර්මාන්ත නො කිරීමද, 'ඉතා උෂ්ණැ'යි කර්මාන්ත නො කිරීමද, 'ඉතා රෑයින්ම ය'යි කර්මාන්ත නො කිරීමද, 'ඉතා සවසැ'යි කර්මාන්ත නො කිරීමද, 'ඉතා සාමි'යි කර්මාන්ත නො කිරීම ද, 'ඉතා සුහිතයෙමි'යි කර්මාන්ත නො කිරීමද යන සයයි. මෙසේ උත්සාහ නැතිව ඒ ඒ ලෙසයෙන් දවස් යවනුවහට නූපන් භොග නූපද්දී. උපන් භොග විනාශයට යෙයි.

අනාපානාදි දූක සබඳ! සබඳ!! යනුවත් අමිත්‍ර බව් දූන, තමනට උපන් කිසියෙක සමව දුක් විඳින වූත් මිත්‍රබව් දූන, "හිරු නැඟෙනතාක් නිදනුදු, පර ස්ත්‍රී සේවාදු, අනුන් කෙරෙහි වෛර උපයනුදු, තම හට ද පරහට ද අනර්ථයට වැටෙන ක්‍රියා කිරීමදු, පවිටු මිත්‍රයෝදු, තදමසුරු බව්දු, 1 මිනිස්නට විනාශ මූලහ'යි දූන – පවිටු මිත්‍රයන් ඇත්තේ ද, පවිටු සබඳුන් ඇත්තේ ද, ලාමක වූ කායවාක්සමාචාර ඇත්තේ ද ආදීනව සහිත වූ නො එළඹුන මතා තාක් තැනට එළඹෙත්තේ ද, මෙලොවිනුදු පරලොවිනුදු පිරිහෙ'යි දූන – ධූර්තස්ත්‍රීහුද, සුරාපානද, නැටුම්ද, ගීද, දහවල් නිදිද, අකාලයෙහි සරනබව්ද, පවිටුමිත්‍රයෝ ද, තදමසුරු බව්ද, යන මෙතෙක් කාරණයෝ පුරුෂයන් නසති"යි හැඳින, – දූකෙළිනුයේද, රඟබොනුයේ ද, පරපුරුෂයන් කෙරෙහි බද ස්ත්‍රීන් සෙවුනේද, පණ්ඩිතජන සෙවනය නො කොට බාලජනසෙවනය කරත්තේ ද, ඔහුගේ යශස් පසඹමස සඳසේ පිරිහෙ" යි දූන – "දහවල්

1. කෞරාපික බවද

නිදනසුලු, රාත්‍රියෙහි කළමනාතාක් කෘත්‍යයට නැඟෙනු නුරුස්වනසුලු, සතතයෙන් සුරාපානයෙහි පවත්නාසුලු පුරුෂයෝ ගිහිගෙයි වාසය කරන්නට නො නිස්සහ”යි දැන–“ඉතා සිහිල, ඉතා හුණ, ඉතා සවස, ඉතා රැයින් මය, ඉතා සාමී, ඉතා සුහිතයෙමි’යි කුසීතව කර්මාන්ත යෙහි නො පවත්නහු හැම අර්ථයෝ ඔහු පියා ඔහු ඉක්ම යෙති”යි දැන– “සිහිල්හුණු ආදිය තෘණලව ද සේ නො හැඟ පුරුෂයන් විසින් කළමනා තාක් කෘත්‍යය පවත්නේ හැම සම්පත්තියෙනුදු සජී සුඛයෙනුදු නො පිරිහෙ”යි දැන ගිහිගෙහි වාසය කටයුතු.

16

සතර කාරණයෙකින් හරණය කරන මිත්‍රප්‍රතිරූපකඅමිත්‍ර හැඳින්න යුතු වේ. ගේ කවර? යත්:–

සබඳුගෙට අවුදු දුටු දුටු දෑ දුන් සේ දුන් සේ ගෙන යේද, මඳ දෙයක් ඇර දී බොහෝ දෙයක් ලද දහ’යි පතාද, භය උපන් කල වහල් නො වේ ද, තම හට අර්ථ සඳහා සෙවාද[1] යන මේ සතර අගින් හරණය කරන මිත්‍ර ප්‍රතිරූපක අමිත්‍ර හැඳින්නයුතු.

17

සතර කාරණයකින් වචීපරම වූ මිත්‍රප්‍රතිරූපක අමිත්‍ර හැඳින්න යුතු: යමක් ඉල්ලූ කල “පළමු නො අව; ඒ කාලයේ අවනොත් දුන්නාමහ”යි අතීතවස්තුවින් සගණීද, “මත්තේ එව ඒ කාලයෙහි අපගේ ශස්‍යා’දි සමෘධ වෙයි. තොප කැමැති දෑ ඒ කාලයෙහි දෙම්හ”යි අනාගතවස්තුවින් සඞ්ග්‍රහ කෙරේ ද, මා හිණ සහල තව දෙමි.[2] අතික් හඳනට තිසි දෑයෙක් නැති” යනාදි විසිතුදු, ඇත් පිට හිඳ යෙමින් ‘සබඳ! මේ ඇත්පිට හිඳ, යනාදි විසිතුදු නිරර්ථක කාරණයෙන් සඞ්ග්‍රහ කෙරේ ද, ප්‍රත්‍යුත්පන්නයෙහි කළ මනා කිසයෙහි[3] ව්‍යසන දක්වා ද–යන මේ සතර කාරණයෙන් වචීපරම වූ මිත්‍රප්‍රතිරූපක අමිත්‍ර හැඳින්න යුතු වේ.

1. සෙවීමද 2. දුන්නෙමි. 3. කිසියෙහි

## 18

සතර කාරණයකින් අධ්‍යාශය බල බලා ප්‍රිය කොට බණන මිත්‍රප්‍රතිරූපකඅමිත්‍ර හැඳින්න යුතු: පව්ට්කමක් කටැ’ව් ව පුළුවුත් කල ඔහු ඒ කැමැති බව දැන ‘මැනව සබඳැ’යි ගිවිසීද, මනා කමක් කටැ’ව් වූ කල ඔහු කැමැත්තට කොට ගිවිසීද, සමක්‍ෂයෙහි ගුණ කියාද, පරොක්‍ෂයෙහි අගුණ කියාද – යන මේ සතර කාරණයෙන් අනුපියභාණීවූ මිත්‍රප්‍රතිරූපකඅමිත්‍ර හැඳින්න යුතු.

## 19

සතර කාරණයකින් අපායට ගෙන යන සහාය හැඳින්න යුතු: සුරාමෙරයපානයෙහි සබඳ වේ ද, රාත්‍රි භාගයෙහි අතුරුවෙය ඇවිත්නට සහාය වේද, ගී නැටුම් ආදී බලනු සඳහා සහාය වේද, දූ කෙළනා සඳහා සහාය වේද–යන මේ සතරකාරණයෙන් අපායට ගෙන යන සහායයා[3] හැඳින්න යුතු.

මෙසේ හරණය කරන මිත්‍රද, වචීපරමවූ මිත්‍රද, අනුපියභාණීවූ මිත්‍රද, අපායසහායවූ මිත්‍ර ද පණ්ඩිතයන් විසින් හැඳින සප්‍රතිභයමාගී සේ, විෂඝොරසර්පයන් සේ දුරු කටයුත්තෝ. මෙසේ දක්වනලදුවෝ ‘බාලයහ’යි දතයුතුයි. සම්ානතීමූලය හ’යි දතයුතුයි. මොවුන් විසින් අනෙක උපද්‍රව වෝ’යි දතයුතු. “මහණෙනි, යම් සේ හුණදඬියෙන් තණයෙන් කළා වූ ගෙහි ඇවිලි ගිනි වෙන සිටි කවුළුදොරබායෙන් යුත් සුරැකිවූ පහකුළුදු දවාද, එසේමැ යම් කවර භයෙක් වේ නම් බාලජනයන් විසින් වෙයි. පණ්ඩිතයන් විසින් නො වෙයි. කිසියම් උපද්‍රවයෙක් වේ නම් බාලයන් විසින් වෙයි. පණ්ඩිත ජනයන් විසින් නො වෙයි. පණ්ඩිතයෝ සතුරුදුවූහු නම් අනර්ථාවහ නොවෙත්, බාලයෝ මිත්‍රද වූහු නම් විනාශ කරයහයි” වදාළ බැවින්.

## 20

සතර කාරණයකින් උපකාර වූ සුහෘත්මිත්‍රා දතයුතු. කි සේය? යත්:- ප්‍රමත්ත වූවහු රකිද, ප්‍රමත්ත වූවහු සම්පත් රකි ද, භිතයහට පිළිසරණ වේද, මිත්‍රයාගේ භොගයෙන් කළමනා කිස ඇති කල ඉල්වූ පමණින් විගුණ කොට භොග දේද- යන මේ සතර කාරණයෙන් උපකාරමිත්‍ර හැඳින්න යුතු.

## 21

සතර කාරණයකින් සමානසුඛදුඃඛ සුහෘද හැඳින්න යුතු: තමාගේ රහස් කියාද, තමහට කී රහස් රකිද,. ආපදයෙහි නො පියාද, සබඳහට කළමනා කිසයෙහි දිවිදු පියා සපයම්'යි සිතාද-යනු මේ සතර කාරණයෙන් සමානසුඛදුඃඛසුහෘද හැඳින්න යුතු.

## 22

සතර කාරණයකින් අර්ථ කියන මිත්‍ර හැඳින්න යුතු: පව්ටිකම් කරනුවත් බැණ වළකාද, කල්‍යාණ වූ කළමනා දූ උගන්වාද, නො ඇසූ සගමොක් සාදන බණ[1] කියා ද, සුගති මදනා නිසි පිළිවෙත් කියාද-යන මේ සතර කාරණයෙන් අර්ථකියන මිත්‍ර හැඳින්න යුතු.

## 23

සතර කාරණයකින් අනුකම්පා ඇති මිත්‍ර හැඳින්න යුතු: අනාථකල නො සුවපත් කල රැකැණී වේද,. සුවපත් කල සතුටු වේද, අගුණ කියන්නන් වළකාද, "මසබඳු කෙනෙරනි එ වැනි දෙෂ නැතැ"යි ගුණ කියාද,. ගුණකියනු අසා සතුටු වේද-යන මේ සතර අඟින් අනුකම්පා ඇති මිත්‍ර හැඳින්න යුතු.

## 24

සත් අඟකින් සමන්විතවූ උපකාර මිත්‍රතෙම මිත්‍රයන් කැමැත්තන් විසින් සෙවියයුතු: නො දියහැකි

1. දහම්.

සම්පත් දේද, නො කට හැකි ක්‍රියා කෙරේද, අප්‍රිය බස් බිණූ කල ක්‍ෂමා කෙරේද, රහස් කියාද රහස් රකිද, ආපදායෙහි නො පියාද, අනාථ කල අවමාන නො කෙරේද යන මේ සත් අගින් යුක්ත[1] මිත්‍ර මිත්‍රයන් කැමැත්තන් විසින් සෙවිය යුතු වේ. මෙසේ උපකාර මිත්‍රයාද, සුඛදුඃඛයෙන් සහාය වූ මිත්‍රයාද, වැඩව වැටෙන දෑ කියන මිත්‍රයා ද, අනුකම්පා ඇති මිත්‍රයා ද, සෙවියයුතු මිත්‍රයාද, පණ්ඩිතයන් විසින් හැඳින මවුපියන් කෙරෙහි සෙයින් පැවත්ත යුත්තේය. මෙසේ දක්වනලදුමෝ පණ්ඩිතහ'යි දතයුතු. ෂවිසම්පනව මූලහ'යි දතයුතු.

## 25

පඤ්චස්ථානයෙක්හි පුතුන් විසින් මවුපියෝ උපස්ථාන කටයුතු වෙත්. කි සේය.? යත්:-''දසමසක් කු සින් උසුලා ප්‍රසූතිය පටන් ගෙන රාත්‍රින්දිවයෙහි මහදුක් විඳ පුස්නා ලද්දෙත් ඒ උපකාරයට නිසි කොට පෝෂණය කෙරෙමි''යි ද, මවුපිය දෙදෙනාව කළමනා යම් කෘත්‍යයක් ඇත්නම් ඒ නො පිරිහෙලා කෙරෙමි'යිද, කුලවංශ නො නසා පවත්වමි'යි ද, දරුවන් විසින් දෙමාපියන්ට කළමනා තාක් කිස නොපිරිහෙලා කොට දායාද භොගයෙහි හිමි වෙමි'යිද, මෙසේ දෙමා පියන් දිවි ඇතිකල ඔවුන් සිත්සේ වැටී මළ කල දන්දී පින්කම් දෙම්දූ'යි. මෙසේ පඤ්චස්ථානයෙක්හි දරුවන් විසින් අනුකම්පා කරන ලද දෙමාපියෝ පඤ්චස්ථානයෙක්හි පුත්‍රයන් කෙරෙහි අනුකම්පා කෙරෙත්. කී සේය.? යත්:- පවිට්ටකම් නො කොටදී හික්මවති. කල්‍යාණවූ කළමනා ක්‍රියායෙහි පවත්වති. ශිල්පයෙහි හික්මවති. ඹිනට නිසි වයස කලත්‍ර ගෙන දෙති. දායද දුනමනා සමයෙහි දායාද දෙති. මෙසේ පඤ්චස්ථානයෙක්හි දරුවන් විසින් අනුකම්පා කරන ලද දෙමාපියෝ පඤ්චස්ථානයෙක්හි දරුවන් කෙරෙහි

1. සමන්විත.

අනුකම්පා කෙරෙත්. මෙතෙකින් දෙමාපියන් විසින් දරුවනට ක්ෂෙම වෙයි. නිර්භය වෙයි. උපද්‍රව නො වෙයි.

26

පඤ්චස්ථානයෙක්හි ස්වාමිහි විසින් භාර්‍ය්‍යාව උපස්ථාන කටයුතු වේ. කි සේය? යත්:- මියුරු කොට හරසර ඇතිව බිණීමෙනුදු, නිහරසර නො වීමෙනුදු, සෙසු ස්ත්‍රීන් හා අනාචාරයෙහි නො පවත්නා විසිනුදු, ගෙහි ඓශ්වර්‍ය්‍ය දක්වා දීමෙනුදු පලඳනා දීමෙනු දු'යි මෙසේ පඤ්චස්ථානයෙක්හි ස්වාමිහි විසින් අනුකම්පා කරන ලද භාර්‍ය්‍යා පඤ්චස්ථාන යෙක්හි ස්වාමිහි කෙරෙහි අනුකම්පා කෙරෙයි. කිසේය? යත්:- තැත්පත් කොට කරනලද කර්මාන්ත ඇති වෙයි, දැසිදසුනුදු, ඔවුන් කෙරෙන් පිටත් ගෙවැස්සනුදු, ඔවුන් කෙරෙන් අවශිෂ්ට සාමාන්‍ය ජනයනුදු නො කුප්පවා හැමදෙනා භක්ති කරන පරිද්දෙන් සඞ්ග්‍රහ ඇති වෙයි. තමා ස්වාමිහි පියා සෙසු පුරුෂයන් හා අසද්ධර්මයෙහි නො පවත්නා විසින් ස්වාමිහි ඉක්ම නො වටෙයි. උපයා ගෙට අලධන නො නසා රක්කි. සියලු කළමනා තාක් කර්මාන්ත යෙහි දක්ෂ වෙයි. අලස නැති වෙයි. මෙසේ පඤ්චස්ථාන යෙක්හි ස්වාමිහි විසින් අනුකම්පා කරනලද භාර්‍ය්‍යා පඤ්චස්ථානයෙක්හි ස්වාමිහි කෙරෙහි අනුකම්පා කෙරෙයි. මෙතෙකින් භාර්‍ය්‍යාවන් විසින් ස්වාමීන්ට ක්ෂෙම වෙයි. නිර්භය වෙයි. උපද්‍රව නො වෙයි.

27

පඤ්චස්ථානයෙක්හි ස්වාමිහි විසින් දැසිදසයෝ උපස්ථාන කටයුතු වෙත්. කි සේ ය? යත්:-ඔවුනො'වුන් බල පමණින් ඔවුනො'වුන් කරන්නට පිළිවන් මෙහෙ කරවීමෙනුදු, ඔවුනො'වුන්ට දූනමනා වැටුප්[1] නො සිටුවා දීමෙනුදු, ලෙඩකල පිළියම් කොට සුව කිරීමෙ-

1. කෘත්‍යයෙහි.

නුදු, මියුරුවූ අනඝිවූ අන්නපානාදි ලද කල නො ගහවා සම කොට බෙදා දීමෙනුදු, වහල්කල් බලා අවසර දුනමනා වේලා බලා අවසර දීමෙනුදු යි. මෙසේ පඤ්චස්ථානයෙක්හි ස්වාමීන් විසින් අනුකම්පා කරන ලද දාසි දාසයෝ පඤ්චස්ථානයෙක්හි ස්වාමීන් කෙරෙහි අනුකම්පා කෙරෙත්. කි සේය? යත්:- තමන් ස්වාමීන්ගේ කළමනා තාක් මෙහෙ මනාව නො පිරිහෙලා සපයම්හ'යි සිතනුවෝ රාත්‍රිභාගයෙහි ශය්‍යාස්ථානයෙන් හැමදෙන හට පෙරටව නැඟෙති. පෙරයම්හි ගෙහි කළමනා තාක් කිස නිමවා පසුව හොති. දූන් සේ මිසැ නුදුන් සේ ගෙහි අයති සොරා නො ගනිති. තමන් කරන තාක් මෙහෙ සකස් කොට එයින් සිඩ වන ඵල නො වරදනා සේ කෙරෙති. තමන් ගිය තාක් තැන ස්වාමීන්ගේ ගුණ කියති: "අපි අනුන්ගේ දාස බවුදු නො දනුම්හ. දෙමාපියන්ගේ ගෙහි වාසය කරන්නන් වැන්නම්හ"යි. මෙසේ පඤ්චස්ථානයෙක්හි ස්වාමීන් විසින් අනුකම්පා කරනලද දාස් දස්හු පඤ්චස්ථානයෙක්හි ස්වාමීන් කෙරෙහි අනුකම්පා කෙරෙති. මෙතෙකින් දාසි දාසයන් විසින් ස්වාමීන්ට ක්ෂෙම වෙ යි. නිර්භයවෙ යි. උපද්‍රව නො වෙ යි.

28

පඤ්චස්ථානයෙක්හි සබඳුන් විසින් සබඳහු උපස්ථාන කටයුතු වෙත්. කි සේය? යත්:- ඉල්වුවද නො ඉල්වුවද සබඳුන්ට වුවමනා තාක් දෑ දීමෙනුදු, ප්‍රිය වූ කන්කලුවූ තෙපුල් බිණීමෙනුදු, සබඳනට අර්ථයට වැටෙන කළමනා තාක් කෘත්‍ය නො පිරිහෙලා කිරීමෙනුදු, නිෂ්කරසර නැතිව අවඥ නැතිව තමන් හා සම කොට තිබීමෙනුදු, සබා තෙපුල් කීමෙනුදු'යි. මෙසේ පඤ්චස්ථානයෙක්හි සබඳුන් විසින් අනුකම්පා කරන ලද සබඳහු පඤ්චස්ථානයෙක්හි සබඳුන් කෙරෙහි අනුකම්පා කෙරෙත්. කි සේය? යත්:- ප්‍රමත්තයන් රක්ති. ප්‍රමත්ත වූවන්ගේ සම්පත් රක්ති. භීත

වූහට පිළිසරණ වෙති. ආපදායෙහි නො පියති. තමන් සබඳුන් දරුමුණුබුරන් කෙරෙහි හරසර ඇති වෙති. මෙසේ පචස්ථානයෙක්හි සබඳුන් විසින් අනුකම්පා කරන ලද සබඳහු පචස්ථානයෙක්හි සබඳුන් කෙරෙහි අනුකම්පා කෙරෙති. මෙතෙකින් සබඳුන් විසින් සබඳුනට ක්ෂෙම වෙයි. නිර්භය වෙයි. උපද්‍රව නො වෙයි.

29

පඤ්චස්ථානයෙක්හි ශිෂ්‍යයන් විසින් ආචාර්‍ය්‍යයෝ උපස්ථාන කටයුතු වෙත්. කි සේය? යත්:- ආචාර්‍ය්‍යයන් දක හුනස්නෙන් නැඟෙනුවිසිනුදු, දවස තෙවරක් උවටැන් පිණිස එලඹෙනු විසිනුදු, නො මැලිව හදරනු අසනු පිරිවහනු විසිනුදු, නො ඈඟවී ආචාරීන් කරා එලඹෙනු විසිනුදු, සකස් කොට ශිල්පග්‍රහණ කරනු විසිනුදු·යි මෙසේ ශිෂ්‍යයන් විසින් උපස්ථාන කරනලද ආචාර්‍ය්‍යයෝ පඤ්චස්ථානයෙක්හි ශිෂ්‍යයන් කෙරෙහි අනුකම්පා කෙරෙත්: සුවිනීත කොට සකස්කොට විනයනය කෙරෙති. මනාකොට උගන්වති. සර්වශිල්පයෙහි ඇසුබැව් කෙරෙති. තමන් කෙරෙහි නො ඇසූ ශාස්ත්‍ර කියත්තට නිසි ඇති ආචාර්‍ය්‍යයන්ට දක්වා දෙති. මිත්‍රාමාත්‍යයන් හමුයෙහි ගුණ කියති. "යමක් අපි දන්නමෝ ද ඒ ඔහු දනිති. සකස්කොට උගත්තාහ''යි. මෙසේ පචස්ථානයෙක්හි ශිෂ්‍යයන් විසින් අනුකම්පා කරන ලද ආචාර්‍ය්‍යයෝ පඤ්චස්ථානයෙක්හි ශිෂ්‍යයන් කෙරෙහි අනුකම්පා කෙරෙත්_ මෙතෙකින් ශිෂ්‍යයන්ට ආචාර්‍ය්‍යයන් විසින් වන භය— නො වෙයි. ක්ෂෙම වෙයි. අප්‍රති භය වෙයි.

30

පඤ්චස්ථානයෙක්හි කුලපුත්‍රයන් විසින් යුත් වියත් තපස්විහු උපස්ථාන කටයුතු වෙත්. කි සේය? යත්:— දක්මින් මැ පෙරමඟට යනු, හුනස්නෙන් නැඟෙනු වඳිනු අඤ්ජලිකර්ම කරනු මඟදී පහවනු ආදී මෛත්‍රීන් යුත

කායකර්මයෙනුදු, "කිම? "වහන්ස, ශරීරය යැපෙසි හෝ කරනතාක් කුසලට බෑද නො කෙරේ" යි යනාදී මියුරු වූ මෛත්‍රීත් යුත් වාක්කර්මයෙනුදු "අපගේ වහන්සේ නිදුක් වෙත්වා'යි නිරෝගී වෙත්වා'යි උත්කණ්ඨිත නො වෙත්වා'යි තමන් විසින් කරන ශ්‍රමණ ධර්මයන් මුදුන් පමුණුවත්වා'යි යනාදි විසින් මෛත්‍රීත් යුත් මනඃකර්මයෙනුදු, තමන්ගේ ගෙට එනු දුටු කල පෙරමගට ගොස් වඩා ඇර හිඳුනා අසුන් පණවා තමන්ගේ ගෙහි වඩා හිඳුවා කැමැති දෑ සපයනු විසිනුදු, තමන්ගේ විභව තුබූ පරිද්දෙන් ප්‍රත්‍යයදන දෙන විසින්දෑ'යි මෙසේ කුල දරුවන් විසින් පඤ්චස්ථානයෙක්හි උපස්ථාන කරන ලද යුත්වියත් තපස්වීහු ෂඩ්ස්ථානයෙක්හි කුලදරුවන් කෙරෙහි අනුකම්පා කෙරෙති. කි සේය? යත්:-- පව්කම් නො කොට දී වළකති. කල්‍යාණ වූ සුන්දරකර්මයෙහි පිහිටි වති. කල්‍යාණ වූ සිහින් අනුකම්පා කෙරෙති. නො ඇසූ තාක් දහම් කියා අස්වති දහම් ග්‍රන්ථිස්ථාන නො පිරිහෙලා ඉගැන්විමෙන් පයර්‍යවදන කෙරෙති. ස්වර්ගෝත්පත්තියට මග උගන්වති. මෙසේ පඤ්චස්ථාන යෙක්හි කුලදරුවන් විසින් උපස්ථාන කරන ලද යුත් වියත් තපස්වීහු ෂඩ්ස්ථානයෙක්හි කුලදරුවන් කෙරෙහි අනුකම්පා කෙරෙත්. මෙතෙකින් යුත් වියත් තපස්වින් විසින් සේවනය වෙයි. නිර්භය වෙයි. උපද්‍රව නො වෙයි.

31

මෙසේ ඒ ඒ දිග්භාගයෙහි ආදර ඇති කුල තපස්වීන් විසින් එළඹිය යුතු වෙයි; නො එසේ වූ කුල එළඹිය යුතු නො වෙයි. කි සේය? යත්:— "නවහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතං කුලං අනුපගන්ත්වා වා නාලං උපගන්තුං උපගන්ත්වා වා නාලං උපනිසීදිතුං කතමෙහි නවහි? න මනාපෙන පච්චුට්ඨෙන්ති න මනාපෙන අභිවාදෙන්ති, න

මනාපෙන ආසනං දෙනන්, සගනමස්ස පති ගුහන්ති, බහුකම්පි ථොකං දෙන්ති, පණීතම්පි ලූඛංදෙන්ති" යනාදි විසින් නො එලඹියයුතු කුල වදළ බැවිනි.

## 32

සිවුදෙනෙක් අවඥ කළ මනාහු නො ද වෙති. කි සේය? යත්:- සර්පයෝ අනාදරව කිම? මොවුන් විසිතැ" යි මුඛයෙහි ඇඟිලි තබන්නට තිස්සෝ නො ද වෙති. ඔවුන් දෂ්ට හොත් මරණ හෝ මරණ සමාන දුක් හෝ වන බැවින් ගිනියෙහිදු අනාදර ව "කිම? මෙයි තැ"යි අල්පමාත්‍ර වූ විස්ඵුලිඞ්ගයකුදු සයන භාණ්ඩාදිය තිබියයුතු නො වෙයි දිලි ක්‍රමයෙන් මහත්ව යම් තාක් උපාදන ඇත් නම් එ දවා මිසැ නො නවත්නා බැවින්. ක්ෂත්‍රියයෝ ද ළදරු බැවින් හුදකලා බැවින් "කළහට වත්හ"යි දුත අනාදර වියයුත්තෝ නො වෙත් කාලාන්තරයෙහි සමවාය ලද කල සිත තබා රැක අනර්ථ කරන බැවින්. සිල්වත් තපස්විහු ද "කළානට කරන දෑ මූත් කෙරෙහි නැතිබැවින් කිම? මොවුන් විසිතැ"යි අනාදර වියයුත්තෝ නො වෙත් මේ ජන්මයෙහිත් ජන්මා'න්තරයෙහිත් මහත් අනර්ථ ඒ අනාදරයෙන් සිද්ධ වන බැවින් උක්ත මැ නො? තථාගතයන් විසින්:-

"භුජඞ්ගමං පාවකඤ්ච - ඛත්තියඤ්ච යසස්සිනං,
භික්ඛුඤ්ච සීලසම්පන්නං-සම්මදෙව සමාචරෙ"යි.

## 33

"දක්ෂිණාවිභඞ්ගසූත්‍ර යෙහි" කී තාක් සම්බුදුනයට වඩා ආගතානාගත චාතුද්දිසික සඞ්ඝයා උදෙසා සතර රියන් කිළිපැලකුදු කරවා දුන්නේ වී නම් එහි පුණ්‍යඵල අසඞ්ඛ්‍යය ය; අප්‍රමෙය ය. එසේ මහත්ඵල මහානෘශංස සෙනසුන් සඟනට කරවා දුන්නේ චතුර්විධප්‍රත්‍යය දුන්නා නම් වේ. කි සේය? යත්:-

බලවත් සාදුක් අධිවාසනා කට නො හෙන්නවුන් සෙනස්නට වැද සැතපී. උන්කල අහර වැලඳුවා සේ කය යැපෙන බැවින්; සෙනසුන් දුන්නේ අහර දුන්නා නම් වෙයි. සෙනස්හෙන් පිටත සිවුරු පෙරවිය මිසැ නො පෙරවිය හොත්, නො ද වන්නට තිසි අඟ සෙනස්නට වන් කල සිවුරු පෙරව හුණ ද මුවහ වන බැවිනුදු, සිහිල්හුණු ආදීන් වැළකෙන බැවිනුදු සෙනසුන් දුන්නේ සිවුරු දුන්නා නම් වෙයි. සිහිල් හුණු ආදීනෙන් වන රොග සෙනස්නටවන් කල ව්‍යුපශම වන බැවින් සෙනස්න රොගයට පිළියමක් වැන්න. එබැවින් සෙනසුන් දුන්නේ ගිලන්බෙහෙත් දුන්නා නම් වෙයි. සෙනස්න සිහිල් හුණු ආදි පිළිබහ'යි. ව්‍යාලමෘගයන් විසින් වන උපද්‍රව වළකා'යි. සපීයන් විසින් මැසිමදුරුවන් විසින් වන උපද්‍රව වළකා'යි. හිමයෙන් වැස්සෙන් වන පීඩා වළකා'යි. ඝොරවූ වාතා'තප වළකයි. 'රැකෙම්හ'යි සිතුවනට පුරැකියෙක. 'සුව විඳුම්හයි'යි සිතුවනට සුව දයකය. භාවනා කරනුවනට පිහිටයෙක. උක්ත මැ නො? තථාගතයන් විසින්:-

"සීතං උණ්හං පටිහන්ති-තතො වාලමිගානි ච,
සිරිංසපෙ ච මකසෙ-සිසිරෙ චාපි වුට්ඨියො.

තතො වාතා'තපෙ ඝොරෙ-සඤ්ජාතෙ පටිහඤ්ඤති,
ලෙණත්ථඤ්ච සුඛත්ථඤ්ච-ඣායිතුඤ්ච විපස්සිතුං"සි.

මෙසේ වූ සෙන්සුන් සඟනට කරවා දෙන්නහු විසින් "සැරියුත් මහමුගලන් දෙඅගසවුවන් පරම්පරා-සෙන් ආවා වූ සුපළිපන් මහසඟනට මේ සෙනස්න සතර ඉරියව්වෙන් පැහැර වැලඳ. ගන්නා සඳහා කැපකිළි කොට දෙමි" යි දිය යුත්තේය. කරවන කල ද ආදි වෙතනා ශුඞ කොට "සුපිළිපන් සඟනට කරවමි" යි කරවිය යුත්තේය. සෙනස්න සඟනට

දුන් කලත් "සුපිළිපන් සඟනට සෙතස්ත කරවා දිනිමි"යි අපර චෙතනා ශුඩ කොට ප්‍රීතිප්‍රමොද්‍යය ඉපදවිය යුත්තේ ය.

චීවර-පිණ්ඩපාත-ග්ලානප්‍රත්‍යය දෙන්නහු විසිනුදු "සැරියුත්මහමුගලන් දෙඅගසවුවන් පරම්පරාවෙන් ආ සුපිළිපන් සඟනට දෙමි"යි සැරහිය යුත්තේ ය. දෙනකලත් මෙසේ සිතා දිය යුත්තේ ය. දුන් කල ද "මෙ වැනි මෙ වැනි සඟනට දින්මි" යි අපර චෙතනා ශුඩ කොට සතුටු විය යුත්තේ ය. මෙසේ දෙන චතුර්විධප්‍රත්‍යය ගන්නන් එයට නිසි නො ව දුශ්ශීලව ගත හොත්, දුශ්ශීලභාවයෙන් සිඩ වන තාක් අකැපී ගත්තානට ම වෙයි; දායකයනට නො වෙයි "සුපිළිපන් සඟනට දෙමි"යි දෙන දෙයවස්තුව දායකයනට චනාහි චෙතොපුඞ්න් කුසල් උදාරතර වන බැවින්.

භික්ෂූන් කෙරෙහි සම්‍යක්ප්‍රතිපත්ති දක ප්‍රසාද උපයා ද, නො දක ප්‍රසාද උපයා ද "මොවුනට දන් දෙමි"යි සිතූ තැන් පටන් ගෙණ උපන් ප්‍රසාද ම රැක්ක යුත්තේ ය. එයින් මත්තේ ගන්නවුන්ගේ දෙෂ නො සැමිණිය යුත්තේය. කිසේය? යත්:- "මහණෙනි! මත්තේ අනාගත අධ්වයෙහි දුශ්ශීල වූ කාසාව කණ්ඨ වූ ගොත්‍රභූවූ මහණනු වෙති. ඔනට දන් දෙන්නාහු සඞ්ඝයා උදෙසා දෙන්නාහුනම් දක්ෂිණාව අසඞ්ඛ්‍යවෙයි; අප්‍රමෙය වේ" යි . වදාළ බැවිනි.[1] මෙසේ දන් දී සම්සත්ඛානත්ට පුණ්‍යපරිණාමය කටයුත්තේය.

සසර සිටිනාතට යම් භවභොගසම්පතකින් ප්‍රයෝජන ඇත්නම් එ හැම බුදු බවට පිරිණමා කල කුසලින් සිඩ වන බැවින් රූපභොගා'දිභවභොගසම්පත් කැමැත්තන් විසිනුදු, ත්‍රිවිධ බෝධීන් එක්තරා බොධියකට ආශා ඇත්තන් විසිනුදු බුදුබවට පිරිණමා ම

1. බැ:විත්.

කුසල් කටයුත්තේ ය. එසේ කළ කුසලින් සියලු සම්පත් සිඩ වන බැවිනි. මෙසේ චතුර්විධ ප්‍රත්‍යය දෙන්නන් විසින් ‘‘මෙම ජන්මයෙහි දන් ගන්නන් කෙරෙහි කිසි කවර ලාභයක් විඳුම්හ’’ යි නො දියයුත්තේය[1] එසේ වුවහොත් මහානිශංස මහත්-ඵලදත නො වේ. දන් ගන්නන් කෙරෙන් මහත්ඵල කැමැත්තන් විසින් කුසල් අකුසල් ආදියෙහි හෙයො-පාදෙය බෙද පිළිවිස හෙයාංශ පියා උපාදෙයාංශ ගෙන එහි සේ පිළිවෙත් කොට සඟමොක් ගතයුත්තේය. එයින් වදාළහ බුදුහු:-

‘‘විහාරදානං සඞ්ඝස්ස-අග්ගං බුද්ධෙන වණ්ණිතං,
තස්මා හි පණ්ඩිතො පොසො-සම්පස්සං
අත්තමත්තනො:
විහාරෙ කාරයෙ රම්මෙ-වාසයෙත්ථ බහුස්සුතෙ.
තෙසං අන්නඤ්ච පානඤ්ච-වත්ථසෙනාසනානි ච,
දදෙය්‍ය උජුභූතෙසු-විප්පසන්නෙන චෙතසා.

තෙ තස්ස ධම්මං දෙසෙන්ති-සබ්බදුක්ඛාපනූදනං,
යං සො ධම්මං ඉධඤ්ඤාය-පරිනිබ්බාති
අනාසවො’’ති.

දන් ගන්නනුදු විසින් ‘‘මේ උපාසකයෝ ඉතා අපට වනල්හ. ඔහට අපට කළ උපකාරධර්මයට තිසි උපකාර කළ මැනවැ’’ යි සිතන්නවුන් විසිනුදු බුදුන් වදාළ ප්‍රකාරයෙන් ‘කළමනා බැවින් තමන් සතන් දායකයනට අනුතුරු පින්කෙත් වූ කල දානය මහත්ඵල මහානිශංස වන බැවින් තමන් විසින් රක්නා චතුර්විධශීලයම සුපරිශුඩ කොට රැක්ක යුත්තේය. කුලදූෂණයට යන මිථ්‍යාජීවයට යනතාක් විඥප්ති නො කට යුත්තේය එසේ කළ විඥප්තියෙන් ඔවුන් දුන් ප්‍රත්‍යය නො මනා වන බැවිනි. එයින් වදාළහ:-

---

1. නො සිතිය යුතු ය.

අත්තත්ථං වා "භික්ඛවෙ, සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං, පරත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං, උභයත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං" යිද–"යෙසාහං චීවරපිණ්ඩපාත සෙනාසනගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරං පරිභුඤ්ජාමි; තෙසං තෙ කාරා මහප්ඵලා අස්සු මහානිසංසාති" සීලෙස්වෙවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං'යි–නයිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං වුස්සති ජනකුහනත්ථං; ජනලපනත්ථං : න ලාභසක්කාරසිලොකා'නිසංසත්ථං; න ඉතිවාදප්පමොක්ඛානිසංසත්ථං න ඉති මං ජනො ජානාතූති. අථ ඛො ඉදං භික්ඛුවෙ බ්‍රහ්මචරියං වුස්සති සංවරත්ථං, පහාණත්ථං විරාගත්ථං, නිරොධත්ථං" යි.

මෙසේ බැවින් දන් දෙන්නන් විසින් ත්‍රිවිධචෙතනා ශුද්ධ කොට සිත් සකසා කර්මඵල සම්බන්ධ අදහා දන් දියයුත්තේය. ගන්නන් විසින් තමන්ගේ සීල සුපරිශුද්ධ කොට සොයා ප්‍රත්‍යයට පූජා කටයුත්තේය. පූර්වයෙහි පණ්ඩිත ජනයෝ සිත් සකසා ම දන් දුන්හ. සාමීචිමාත්‍රයකුදු නො කැමැති වූහු. කි සේය? යත්:–

එක් තපස්වී කෙනෙක් එක් ගමෙක මැහැලි කෙනෙකුන්ගේ කුලූපග ව වාසය කෙරෙති. ඒ කාලයෙහි එ ගම ගිනි ගෙන ද ගියේය.. එ ගම සෙසු කුලූපගසඟහු තමතමන් එළඹෙන කුලෙහි ඇත්තනට වැත්තා දන් මැහැල්ලන්ගේ කුලූපග පැවිද්දේ වනාහි "සාමීචිමාත්‍රයකින් උන්ට සැහෙනු නැති" යි දන්නාහු තමන් වසන වෙහෙර ම තමන්ට රිසියෙන කර්මස්ථානයකින් දවස් යැවූහ. මැහැල්ලෝ ගෙහි ගිනි නිවීගිය කල දැකිය ගෙහි වලද

සොයත්තාහු නො දු තුබූ සහල් බුදක් ලදින් එ ගෙන දවහලට දත්වැට සරහා ද ගිය ගෙහි නො වැටී හුණු බිත්කාඩෙක ඡායායෙහි අස්නක් පණවා කල් බලා සිටියහ. ඔවුන්ගේ කුලුපග පැවිද්දෙ වේලා බලා හැඳ පෙරව ද ගිය ගමට අවුදු මැහැල්ලන්ගේ ගෙය වූ තැනට සම්ප්‍රාප්ත වූහ. මැහැල්ලෝ දැක වැඳ නවතා ගෙන තමන් පැණ වූ අස්නෙහි වඩා හිඳුවා යුත් කළ භොජනයෙන් සැතපූහ. පැවිද්දෙ වළඳා මැහැල්ලන්ගේ ගෙය නො දු කල යම්සේ වඩිද්ද, එසේ ම වැඩියහ.

එ සඳ මැහැල්ලන්ගේ දූ "අන්න, අපගේ වහන්සේ ඉතා නිෂ්ඨුර දූය. සෙසු සඟහු තම තමන් එළඹෙන කුලට ඝාම්චි කළහ. අපගේ වහන්සේ වළඳා යම් දෙයක් නො බැණ වැඩිදූ"යි කිව.

එසඳ මැහැල්ලෝ "ඔවුන්ගේ සඟහු ඔවුනට මනාහ. මාගේ වහන්සේ මට මනාහ" යි කිවූහ. මෙසේ දත් දී පණ්ඩිතජනයෝ කම්ඵල ම තකති. සාම්චිමාත්‍රයකුදු නො තකත්. අසංඛ්‍යෙය අප්‍රමෙය විපාක ඇති කුසල් කළවුන් ලාමක වූ උපකාරයක් දත් ගත්තත් කෙරෙන් නො තැකුව මනා පරිදි මෙයින් දතයුතු.

තමා සතන් පිත්කෙත් කොට ප්‍රත්‍ය දුන් දායකයන්ගේ දන මහත්ඵල මහානෘශංස පරිදි කි සේය? යත්:- රුහුණු මාගම එක් අනාථ උපාසකයෙක් අප්‍රණීත වූ දනක් දෙයි. සඟුන් ඒ ප්‍රශංසා ඇති ව නො ගන්නෙත් තමා දුවක උකස හිඳුවා සොළොස් කහවණුවක් ගෙන එයින් දෙනක් ගෙන ක්‍ෂීරපායාස පැවැත්විය. පසුව උපාසක සඟුන් එ බත ප්‍රණීතභක්ත ගන්වත් ලඟයෙන් ගන්වත[1] සේ

1. ගත්තා.

බලා සන්තුෂ්ට ව "මදුව විසින් මේ දනය අග්‍ර වීය. මෙ වැනි අග්‍ර වූ දනයට උපකාර වියව මයිදු උපකාර වුව මැනව. උපකාර නම් අයති උපයා උකසින් විහුදුවා ගැන්මැ" යි සිතා ගල්වල් අවුදු[1] බැලමෙහෙ කොට සොළොස් කහවණුවක් ලදින් 'දුව උකසින් විහිදුවා ගන්මි' යි රුහුණු යන්නේ තමා හා එක්ව රුහුණු වඩනා සඟකෙනෙකුන් මග ගමනාට වැද ආසන්නවෙලා වන තාක් සිඟා අහර නො ලබන සේ දක "කි සේ? නම් සුන්බත් නො කොට අහරක් දියහැක්ක හෝ" යි සිතනුයේ බත්මුළක් ගෙන යන මිනිසකු දක "මදුව උකසින් විහිදුවා ගැන්මට වඩා මෙ වහන්සේ සුන් බත් නො විය දෙනු[2] අවශ්‍යය. අන අයති ඇති මා වැන්නක්හු එක්තැන මේ වහන්සේ සුන්බත් වනු නො යෙදෙයි. පසුව යම් ප්‍රකාරයකින් මදුව උකසින් විහිදුවා ගන්නා අයතක් තන් කොට ගන්මි[3]. දන් මෙ වහන්සේ සුන්බත් විය නො දෙමි"යි සිතා සොළොස් කහවණු මුත්, බත්මුළ වටනා පමණක් අන නැත්තෙන් "කහවුණක් ගෙණ තෙල බත්මුළ දෙ" යි කිය.

එසඳ එමිතිස් "මේ එකවට ම කහවණුවක් ගන්ට කියයි. මේ බත්මුළ මෝහට ඉතා අවශ්‍ය වන එබැවින් නො දෙමි'යි කියමි. එසේ වන්නා හා රන් වඩ"යි සිතා 'නො දෙමි' යි කිය. එසඳ උපාසක දෙකාවුණකට දෙව; තුන්කහවුණකට දෙව යනාදි විසින් ක්‍රමයෙන් වඩා "සොළොස් කහවුණකට දෙව"යි කිය. එතෙකටවත් නො දෙමි"යි කිය. එසඳ "මා අත මෙ සොළොස් කහවණු මිසැ වඩා අයති නැතැ"යි කිය. එකල සොළොස් කහවුණ ගෙන බත්මුළ දිණ. උපාසක බත්මුළ ගෙන පැවිද්දන් වළඳවා වැළඳු කල තමා මහ ගමට වන් තැන් පටන් ගෙන කළ තාක් දූ කිය.

1. ඇවිදු. 2. නො විය. 3. කොටගන්මි.

එ අසා පැවිද්දේ බලවත් සංවේග උපයා "මෙ බත අප කම්සථාන මෙනෙහි කෙරෙමින් යන ගමන් මාත්‍රයකින් නො දිර විය හැක්ක. එසට නිසි පිළිවෙත පැවැත්ත මැනව. මෙසේ මොහු කළ උපකාරයට උපකාර කළ මැනවැ"යි සිතා "උපාසකය! තෝ යා. අපි මෙහි නවතම්හ"යි කියා ඔහු තහා යවා මගින් පහව වලට වැද එක් රුක්මූලක පළඟ බැඳ වැඩහිඳ රාත් ව මිසැ මෙ පළඟ නො බිඳිමි'යි අධිෂ්ඨාන කොට සත් දවසක් නිරහාර ව භාවනායෙහි පැවත සත් වනදෘ අනිඳු හා සමග රාත් ව, ඔහුගේ දානය සඵල කොට, ආහාරක්ෂයින් ක්ෂීණවූ ආයුෂ ඇතිව, සෘඩින් මහගම් වැඩ, උපාසකයා විසින් කළ තාක් දෑ සහනට සැලකොට, "අප පිරිනිවි කල අප හොත් සිවිකාව සුසානයට ගෙන යන කල එ උපාසකයා මුත් සෙස්සන් නහන කල නො නැගේවා"යි අධිෂ්ඨාන කොට පිරිනිවියහ. ඒ කාලයෙහි මහරජ මහගම වාසය කරන්නේ "සඟ කෙනෙකුන් පරිනිවිලි වූහ" යනු අසා ආලාහණ කරනු සඳහා ඇමැත්තන් තහා යැවී ඇමැත්තෝ සිවිකාවක් සද මහතෙරුන් සිවිකාවට වඩා සුසානයට ගෙන යම්හ'යි නහන්නට වන්නාහු කොෂාග්‍ර තන් පමණකුදු නො සෙල්විය හුනහ.

එසඳ නො යෙක් ප්‍රකාරයෙන් උත්සාහ කොටත් සොල්වාද නො පියහී රජහට සැලකළහ. මහරජ අවුදු තෙමේ ද , නහන්නට උත්සාහ කරවා නො සෙල්වෙන්නෙන් "මෙ වහන්සේ රහත් කෙනෙකුන් වුවමැනව; මෙ සිවිකාව නො සෙල්වෙන්ට කළ අධිෂ්ඨානයක් ඇතමැනව; ඒ සඟුන් පිළිවිස දත මැනවැ"යි සඟුන් කරා එළඹ "මෙ වහන්සේ පිරිනි-වෙන පෙරටද වදළ දෑයෙක් ඇති හෝ?"යි පිළිවිත. එකල සඟහු "පිරිනිවුනාට[1] පෙරට මෙ වෙනි උපාසකයක්හුගේ මෙවෙනි ගුණයක් වදළ දෑය" යි

1. පරිනිවන්.

දැන්වූහු. එ සඳ මහරජ "උපාසකයා නියත කොට ගෙණ එව" සි කියා නියත කරවා ගෙන්වා ගෙණ ඔහට පිළි දී 'මෙ සිවිකාව නඟව' යි කිය. එසඳ හේ සිවිකායෙහි අත් ලිය. එවිගස ම සිවිකාව අහසට නැංග. එකල මහතෙරුන් සුසානයට වඩා ආලාහණ නිමවා එරජ උපාසකයහට ගම්වර දී උපභොගපරි-භොගයට තිසි අයනි දී "මෙතැන් පටන් ගෙන තා සියඅතින් උපයා දුක් විඳ වැටෙනු නම් නැති; මේ සම්පත් ගෙණ දන් දී සුවසේ වාසය කොට සග මොක් අත්හි කරා" යි අනුශාසනා කෙළේ. මෙසේ දායකයන්ට දානඵල තමන්ගේ සතන් සකසා මහත්ඵල මහානුශංස කොළෙෝ. මෙනයින් දායකයන්ට උපකාර වන්නෙන් තමන් රක්නා සිල්, සුපරිසුඬ කොට රක්මෙන් උපකාර වුවමනා පරිදි දීපිත යි.

## 34

තපස්වීන් විසින් කුලෙහි ගෙණෙහි නො ඇලුන මනා පරිදි කි සේය? යත්:- එක් මහතෙර කෙනෙක් තමන් නැගනියන් විසින් කරවූ සෙනස්නෙක වාසය කෙරෙති. ඒ කාලයෙහි මහතෙරුන් නැඟනියෝ මබැයන් වහන්සේට මෙහෙ කොට සිල් රැක වාසය කෙරෙති'යි සිතා තමන් පුතණුකෙනෙකුන් මහණ කරවා දක්වා දුන්හ. ඔහු පිටකත්‍රය උගණැ'විව රුහුණු දනවු වැඩියහ. මයිල්මහනෙරහු කලින් කල ගොස් බෑනණුවන්ගේ පවත් බලා එති. මෙසේ බොහෝ කල් ගිය කලැ මැතියෝ පුතණුවන් දක්නැ'ටි ව බැයන්ට හැඟවූහ. මහතෙරහුදු මැනවැ'යි "එත් හොත් ගෙන එම්හ' යි ගොස් නො එන්නෙන් එති. එකල්හි මැණියෝ "මපුතණුවෝ මළ වනහ. නො මළ නො ගෙන එනදූ දූ" යි කීහ. "තොප පුතණුවෝ නො මළහ මෙ වර එවම්හ"යි වදරා බෑනණුවන් කරා ගොස් මෙපවත් සැල කළහ. එකල බෑනණුවෝ

"මැනව මෙ වර ගොස් වඳවා මෙ ඇතවස ඔවුන් කෙරේ වාස කෙරෙම්හ'' යි ගිවිස දෙමාපියන් වසන ගමට අවුදු දෙමාපියන් විසින් කරන ලද සෙනස්නෙහි වැඩහුන්හ.[1] ඒ කාලයෙහි සෙනස්නෙහි වැඩහුන්නා දුටු ජනයෝ දෙමාපියන් කරා ගොස් "තොපගේ සෙනස්නෙහි සඟකෙනෙක් වැඩහුන්හ"යි කීහ. එ කල්හි දෙමාපියෝ ගඳමල් පහන්තෙල් ගිලන්බෙහෙත් සඳ ගෙන අවුදු දැක වැඳ තමන් පුතණුවන් බව් නොදැන "කොහි? සිට වැඩිසේක්ද කුමක් සඳහා වැඩිදෑ ද'' යි පුළුවුත්හු. පුතණුවෝ රුහුණ සිට වස් වුසුව මනා තැනක් කැමැති ව ආ පරිදි හැඟවූහ. "එසේ වුව වහන්සේ! මෙ සෙනස්නෙහි වාසය කරන්නේය. වහන්සේ නිසා මෙතුන්මස දන් දෙනු[2] සරණසීල පිහිටනු ආදි කුසල් පුරා සගමොක් ලබම්හ'' යි ආරාධනා කළහ. පුතණුවෝ ද ගිවිස තුන්මස දෙමාපියන්ගේ දන් ගෙන වාසස කළහ. "ඇපි තොප පුතණු වම්හ. තෙපි අපගේ දෙමාපියව. අප මයිල්මහතෙරුන් වඳලෙන් තොප වඳවන්නට ආම්හ'' යි යන පමණක් නො ද කීහ. සෙසු නඟුන් මල්බෑයන්ටත් නො ද හැඟවූහ.

මෙසේ තුන්මස වාස කොට දෙමාපියන්ට කුසල් පුරවා රුහුණු වැඩියැ'ටි ව හැඟවූහ. දෙමාපියෝ වැඩියැ'ටි බව් දැන සකසා දන් දී සමූ ගත්හ. පිළියකුදු ඇවිස්සීහ. සකුරුකැටියකුදු දුන්හ. තෙල්පතකුදු දුන්හ. මෙ ගෙණ පුතණුවෝ 'රුහුණු යම්හ'යි වැඩියහ. ඒ කාලයෙහි මයිල් මහතෙරහුදු වස් වුසු නැත පවරා, නැඟණියන්ගේ විහාරයට වඩනාහු[3] අතර මගදී තමන් බෑණණුවන් දැක, "තොප දෙමාපියන් දුටුද? වැඳපුදු'' යි පුළුවුත්හ. "දුටුම්හ. මෙ තුන් මස අපට දන් දුන්හ. පිළියකුදු

1. වැඩහුන්නු 2. දන්දී. 3. වඩනා.

ඇවිස්සහ සකුරු කැටියකුදු ගිතෙල් පතකුදු දුන්හ'' යි කියා මහතෙරුන් රුක්මුලකට වඩා, පා දෙවා, තමන් ගෙන ගිය තෙලින් පය තෙල් ගා සකුරුකැටිය මැඩ පැන් වළඳවා තමහට දෙමාපියන් ඇවිසි පිළිය මහතෙරුන්වහන්සේට ඇවිස ''වාසයට රුහුණුදනවු ඵාසු වෙ'' යි කියා වැඩියහ.

ඉක්බිති මහතෙරහු නැගණියන් සාර වූ වෙහෙරට වැඩියහ. නැගණියෝ 'මහතෙරහු වැඩියහ' යනු අසා ''මෙ වර මපුතණුවන් ගෙන වැඩිදූ වන්නේය'' යි සිතා දෙදෙනහට දන්වැට සරහා පෙරමග බලනුවෝ සිටියහ. එකල්හි මහතෙරහු වැඩියහ. නැගණියෝ මහතෙරුන් වඩනවුන් බලා ''මපුතනුවන් මෙලෙ දූන් කල් තියතය. නො මළ හොත් ගෙන නො වඩිනදූ දූ'' යි මහතෙරුන් පෙරව ගී වලප්ති.

මහතෙරහු මෙ දූත ''උපාසිකාදූති! කුමට? හඬා වලප්ව'' යි වදාළහ. එසඳ නැගණියෝ ''වහන්සේ මපුතණුවන් මෙවර ගෙන එම්හ'යි වදුරා වැඩිදූය. නො මළ හොත් ගෙන නො එන දූ ද? මළ සේ වන්නේ වෙ'යි වලප්මි'' යි කිහු. එසඳ මහතෙරහු ''මෙ තුන්මස තොප සෙනස්නෙහි වාස කොට තොපගේ දන් ගෙන වැඩිසහු තොප පුතණුවහ. රුහුණු වඩනවුන් අපි මග දූක පුළුවුසුම්හ. මෙ තුන්මස තොපගේ පැල වාසය කළ සේ දන් ගත් සේ කීහ. තමහට තොප දුන් තෙලින් ඇප පය ගැල් වූහ. තොප දුන් සකුරුකැටිය ගෙන මැඩ අප පැන් වැළඳැ වූහ. තොප දුන් පිළිය අපට ඇවිස්සහ. මෙ බලව! තොප දුන් පිළිය'' යි පාත්‍රස්තවිකාහස්සේ තුබුවා හැරගෙන දුන්හ. මෙ පවත් අසා පිළිය දූක එකල තමන් පුතණුවන් බව් දූත ''බුදුහු පිරිනිවියෙන් මිසැ

මපුතණුවත්වහන්සේ අපිපුත් කෙරෙහි, කුලෙහි ගෙණෙහි නො ඇලෙනුවන් කෙරෙහි මිහ ඇගි කොට තුබූහ'' යි පුතණුවන් වැඩි දිසාව බලා වැන්දහ.

මෙ තසින් තපස්වීත් කුලෙහි ගෙණෙහි නො ඇලුන මනා පරිදි දීපිත යි. එයින් වදළහ:-

**මිත්තෙ සුහජ්ජෙ අනුකම්පමානො**
**හාපෙති අත්ථං පටිබද්ධචිත්තො,**
**එතං භයං සන්ථවෙ පෙක්ඛමානො**
**එකො චරෙ ඛග්ගවිසාණකප්පො.**

**සංසග්ගජාතස්ස භවන්ති ස්නෙහා**
**ස්නෙහන්වයං දුක්ඛමිදං පහොති,**
**ආදීනවං ස්නෙහජං පෙක්ඛමානො**
**එකො චරෙ ඛග්ගවිසාණකප්පො'** යි-ද

**න ච කත්ථිතා සියා භික්ඛු**
**න ච වාචංපයුතං භාසෙය්‍ය,**
**පාගබ්භියං න සික්ඛෙය්‍ය**
**කථං විග්ගාහිකං න කථයෙය්‍ය'** යි.

35

**මහත් යශස් කි** සේ? වූවාහු ලැබෙති යත්:-

යම් උපාසක කෙනෙක් නුවණැත්තෝ ද, සිල්වත්හු ද, කකීශ වූ කායවාක් ප්‍රයොග නැත්තෝ ද, යුක්තප්‍රාප්තස්ථානයෙහි කළම්නා දූ වහා දනිද් ද, නිවිද්‍යා වූ[1] පියෝ ඇත්තෝ ද, දූඹ වූ පියෝ නැත්තෝ ද, නො මැලි වී වීය්‍යී කොට සම්පත් උපයත් ද, කළමනා තාක් කෘත්‍යයෙහි අලස නැත්තෝ ද, සම්ප්‍රාප්ත වූ ආපදයෙක ත්‍රාස නැත්තෝ ද, කහිවකු තමහට ''මේ කළ සේ බිණූ සේ නො යෙදේ'' යි කිය නො හැකි

1. නිම්යාවූ

පරිද්දෙන් සිදුරු නො දී වාස කෙරෙද් ද, හැම ජනයන් කෙරෙහි සංග්‍රහ ඇති වෙද් ද, තමනට මිත්‍රයන් බොහෝ වන සේ වාස කෙරෙද් ද, කනිවතු කිදූය පිළිබඳ කියන පරිද්දෙන් නො පවතිද් ද, මසුරු කෙලෙස් නැත්තෝ ද, නො මැනවින් දුරු කොට ජනයන් හික්මවද් ද, ඔවු’ නොවුන් කළ මනා කිස යෙහි අවවාද කොට පවත්වද් ද යන මේ ගුණයෙන් යුක්ත වූවාහු මහත් යශස් ලැබෙත්. උපන් යශසින් නො පිරිහෙත්.

36

හැම සතුන් කෙරෙහි සම්භව වන, හැම සතුන් නො පියා පවත්නා අෂ්ටලෝකධර්මයෝ නම් කවරහ? යත්:-

ලාභ ය, අලාභ ය, අයස ය, යස ය, නින්දා ය, පසංසා ය, සුඛ ය දුක්ඛ ය යි.

37

ලොකයහට දශධර්මකෙනෙක් ඉෂ්ටයහ; කාන්තයහ; මනාපයහ; දුර්ලභයෝ යි ඔහු කවරහ? යත්:-භොග ය. වර්ණ ය, ආරොග්‍ය ය, ශිල ය, බ්‍රහ්මචර්‍ය ය, මිත්‍ර ය, බාහුශ්‍රැත්‍ය ය, ප්‍රඥ ය, ධර්ම ය, ස්වර්ග ය යන මේ දශධර්මයෝ යි.

මේ දශධර්මයනට පරිපන්ථ කවරි? යත්:- ආහාර කවර? යත්:- අලස වීම් ව්‍යායාම නො කිරීම් සම්පතට පරිපන්ථ යි; අලස නො වීම් ව්‍යායාම කිරීම් ආහාරයි. අමණ්ඩනය අවිභූෂණය වර්ණයට පරි පන්ථයි; මණ්ඩනය විභූෂණය වර්ණයට ආහාරයි. අසත්ප්‍රායක්‍රියා ආරො-ග්‍යයට පරිපන්ථ යි; සත්ප්‍රාය ක්‍රියා ආරොග්‍යයට ආහාර යි. පවිටු මිත්‍රයෝ ශිලයට[1] පරිපන්ථයහ; කල්‍යාණමිත්‍රයෝ ශීලයට ආහාර යි. ඉන්ද්‍රිය අසංවර

1. ශිලසංරක්ෂණයට

බ්‍රහ්මචර්‍යයට පරිපන්‍ථ යි, ඉන්ද්‍රිය සංවර බ්‍රහ්මචර්‍යයට ආහාර යි. බොරු කිම් මිත්‍රයනට පරිපන්‍ථ යි; සැබෑ කිම් මිත්‍රයනට ආහාරයි. නො හැදෑරුම් නො පිරුළුම් බාහුශ්‍රැත්‍යයට පරිපන්ථ යි; හදාරණු පිරිවහනු බාහුශ්‍රැත්‍යයට ආහාර යි. නො ඇසීම් නො පිළිවිසීම් නො උගැණුම් ප්‍රඥාවට පරිපන්ථ යි; ඇසීම් පිළිවිසීම් උගැණුම් ප්‍රඥාවට ආහාර යි අනනුයොගදු ප්‍රත්‍යවෙක්‍ෂා නො කිරීමුදු ධර්‍මයට පරිපන්‍ථ යි: අනුයොගදු ප්‍රත්‍යවෙක්‍ෂා කිරීමුදු ධර්‍මයට ආහාරයි. මිථ්‍යාදෘෂ්ටි ස්වර්ගයට පරිපන්ථයි; සම්‍යග්දෘෂ්ටි ස්වර්ගයට ආහාරයි. මෙසේ දශධර්‍මයන්ට පරිපන්ථදු ආහාරදු දතයුතු.

38

අෂ්ටබල දතයුතු. හේ කි සේය? යත්:- රොදන ළදරුවන්ගේ බලයි. ක්‍රොධ මාගමුන්ගේ බල යි. ආවුධ චෞරයන්ගේ බල යි. ඓශ්වර්‍ය රජදරුවන්ගේ බල යි. දහන දෑ බාලයන්ගේ බල යි. නො දහන දෑ පණ්ඩිතයන්ගේ බල යි. ප්‍රතිසංඛ්‍යාන බහු ශ්‍රැතයන්ගේ බල යි. ක්‍ෂමා තපස්වීන්ගේ බල යි.

39

ක්‍ෂත්‍රියයෝ කවර අභිප්‍රාය ඇත්තාහ. කුමක් හෙතු කොට ඇත්තාහ. කුමක්? පිහිට කොට ඇත්තාහ. කිමෙක? අභිරති ඇත්තාහ. කුමක් පර්‍යවසාන කොට ඇත්තාහ. යත්:- ක්‍ෂත්‍රියයෝ භොගා'භිප්‍රායය හ. ප්‍රඥා හෙතු කොට ඇත්තාහ. බලකාය පිහිට කොට ඇත්තාහ පෘථිවිය අභිරති කොට ඇත්තාහ. ඓශ්වර්‍ය පර්‍යවසාන කොට ඇත්තාහ.

40

බ්‍රාහ්මණයෝ කවර? අභිප්‍රාය ඇත්තාහ. කුමක් හෙතු කොට පවත්ති කුමක් පිහිට කොට ඇත්තාහ.

කිමෙක අභිරති ඇත්තාහ. කුමක් පර්‍යවසාන කොට ඇත්තාහ. යත්:- බ්‍රාහ්මණයෝ භොගා'භිප්‍රායයහ. ප්‍රඥා හෙතු කොට පවත්ති. මන්ත්‍ර පිහිට කොට ඇත්තාහ. ධ්‍යානයෙහි අභිරති ඇත්තාහ. "බ්‍රහ්මලොකයෙහි උපදම්හ" යනු පර්‍යවසාන කොට ඇත්තාහ.

41

**ගෘහපතිහු** කවර අභිප්‍රාය ඇත්තාහ. කුමක් හෙතු කොට පවත්ති. කුමක් පිහිට කොට ඇත්තාහ. කිමෙක අභිරති ඇත්තාහ. කුමක් පර්‍යවසාන කොට ඇත්තාහ.? යත්:- ගෘහපතිහු භොගා'භිප්‍රායයහ. ප්‍රඥාහෙතු කොට පවත්ති. සිල් පිහිට කොට ඇත්තාහ. කර්මාන්තයෙහි අභිරති ඇත්තාහ. නිමියා වූ කර්මාන්ත පර්‍යවසාන කොට ඇත්තාහ.

42

**ස්ත්‍රීහු** කවර? අභිප්‍රාය ඇත්තාහ. කුමක් හෙතු කොට පවත්ති. කුමක් පිහිට කොට ඇත්තාහ. කිමෙක අභිරති ඇත්තාහ. කුමක් පර්‍යවසාන කොට ඇත්තාහ. යත්:- ස්ත්‍රීහු පුරුෂාභි'ප්‍රායයහ. අලඞ්කාර හෙතු කොට පවත්ති පුත්‍රයන් පිහිට කොට ඇත්තාහ. තමන් සවාමීන් සෙසු ස්ත්‍රීන් හා අනාචාරයෙහි නොපවත්නා ම කැමත්තාහ. එබැවින් මෙ 'සැතිරියහ'යි කියන ලද සෙවෙතුන් නැති තැන අභිරති ඇත්තාහ ගෙහි ඓශ්වර්‍ය්‍ය තමන් පමණ කරණු කැමැත්තාහ. එ බැවින් ම ඓශ්වර්‍ය්‍ය පර්‍යවසාන කොට ඇත්තාහ.

43

**චෞරයෝ** කවර? අභිප්‍රාය ඇත්තාහ. කුමක්? හෙතු කොට පවත්ති. කුමක්? පිහිට කොට ඇත්තාහ.

කිමෙක? අභිරති ඇත්තාහ. කුමක්? පර්‍යවසාන කොට ඇත්තාහ? යත්:- චෞරයෝ පරා අයති ගන්නා අභිප්‍රාය ඇත්තාහ. වල් හෙතු කොට පවත්ති. ශස්ත්‍ර පිහිට කොට ඇත්තාහ. අඳුරු තැන අභිරති ඇත්තාහ. නො දක්කදී මුවන වනු පර්‍යවසාන කොට ඇත්තාහ.

44

ශ්‍රමණයෝ කවර? අභිප්‍රාය ඇත්තාහ. කුමක්? හෙතු කොට පවත්තී. කුමක්? පිහිට කොට ඇත්තාහ. කිමෙක? අභිරති ඇත්තාහ. කුමක්? පර්‍යවසාන කොට ඇත්තාහ? යත්:- ශ්‍රමණයෝ ක්ෂාන්ති සෞරත්‍යාභිප්‍රායන. ප්‍රඥා හෙතු කොට පවත්ති. සිල් පිහිට කොට ඇත්තාහ. රාගාදි කිසිවක් නැති බව අභිරති ඇත්තාහ. නිවන් පර්‍යවසාන කොට ඇත්තාහ.

45

කාම දෙකෙක් වේ: ක්ලෙශකාමය, වස්තුකාමය යි. ක්ලෙශකාම නම් කවර? යත්:- රූපවිෂය වූ තෘෂ්ණා ය, ශබ්ද විෂය වූ තෘෂ්ණා ය, ගන්ධවිෂය වූ තෘෂ්ණා ය, රසවිෂය වූ තෘෂ්ණා ය, ප්‍රෂ්ටව්‍ය විෂය වූ තෘෂ්ණා ය යි.

වස්තුකාම නම් කවර? යත්:- චක්ෂුසට විෂය වූ රූපය, ශ්‍රොත්‍රයට විෂය වූ ශබ්ද ය, ඝ්‍රාණයට විෂය වූ ගන්ධ ය, ජිහ්වාවට විෂය වූ රස ය, කායයට විෂය වූ ප්‍රෂ්ටව්‍ය ය යි.

මෙහි ක්ලෙශ කාමයන්ගේ ආස්වාද නම් කවර? යත්:- චක්ෂුසට විෂය වූ රූපයෙහි ග්‍රීෂ්මයෙන් තැවුණු පුරුෂයක්හු පස් පියුමෙන් සුසන් විලකට වදනාක්හු සෙයින් ඇලී ගිජුව අනන්තාපරිමාණ කාලයෙහි විඳුනා

අපායදුඃඛයෙහි ආදීනව නො හැහැම්ය දී බලවත් ව පවත්නා තෘෂ්ණාදු, මෙසේ ම ශ්‍රොත්‍රයට විෂය වූ ශබ්දයෙහි ද, ඝ්‍රාණයට විෂය වූ ගන්ධයෙහි ද, ජිහ්වාවට විෂය වූ රසයෙහි ද, කායයට විෂය වූ ප්‍රෂ්ටව්‍යයෙහි ද ඇලි ගිජු ව අනන්තාපරිමාණකාලයෙහි විඳුනා අපාය-දුඃඛයෙහි භය නො ඉපැද්ද දී බලවත්ව උපදනා තෘෂ්ණාදු කාමයන්ගේ ආසවාද නම්.

**කාමයන්ගේ ආදිනව නම් කවර? යත්:-** කාමයෙහි ගෘධ්‍රව කාමානුභව සඳහා ද්‍රව්‍යාශායෙන් ශීත පූර්‍වාඛගම කොට උෂ්ණ පූර්‍වාඛගම කොට විඳුනා දුක්‍ඛ’දු, ක්‍ෂුත්පිපාසාතුරව විඳුනා දුකුදු කාමයන්ගේ ආදීනව නම්.

කාමයෙහි ගෘධ්‍ර ව කාමා’නුභව සඳහා ද්‍රව්‍යා’ශායෙන් රාජා’මාත්‍යාදීන් පටන් කොට චණ්ඩාලයන් දක්වා ක්‍රමයෙන් තමන්තමනට අධිකයන් චිත්තාරාධනා කරම්හ’යි රාත්‍රින්දිවයෙහි සැම්වට හස්ති අශ්ව රථ යනාදින් හා ධාවන කරණාදීන් විඳුනා දුකුදු කාම-යන්ගේ ආදීනව නම්.

කාමයෙහි ගෘධ්‍රව කාමා’නුභව සඳහා ද්‍රව්‍යා’ශායෙන් ත්‍රිමදගලිතහස්තීන් පෙරට දිවුමුදු, ගෙහි ද තෙලුවන් කණ ගෙන බඳනාක්හු සෙයින් තිර කොට බැඳුමුදු, රණබෙර හඬ අස අසා දිලියෙන අසි-ශක්ති-තොමරාදි ආයුධ දක දක ශර වර්‍ෂා දක දක අසිප්‍රහාර-ශක්ති ප්‍රහාර - ඉෂුප්‍රහාරාදි ලබන්නන් දක දක එහි අසිප්‍රහාරාදීන් මියන්නන් දක දක එසේ වූ සංග්‍රාමයට වැදුමුදු, සංග්‍රාමයෙහි අසිප්‍රහාරාදීන් මහදුක් විඳුමුදු, ජීවිතොපච්ඡෙද වීමුදු කාමයන්ගේ ආදීනව නම්.

කාම හෙතු කොට ගෙණ කාමානුභව සඳහා ද්‍රව්‍යා’ශායෙන් දෙවියන් යැද ලත් දරුවන් උරෙහි ලා

කෙළනුවන් සෙයින් උග්‍ර වූ විෂ ඇති කෘෂ්ණසර්පයන් කෙලවීමුදු, මල දිය දෙර දෙන්නවුන් සෙයින් මූත්‍රරුධිරාදින් සංක්ලිෂ්ට වූ වස්ත්‍ර ඇපිළිමුදු, කපුරු කස්තුරු මිරිකුසඳුන් කළුවැල්කලල් අඳනවුන් සෙයින් ගම් දූන්නේ සිරුරු වැළඳ පියනුදු කාමයන්ගේ ආදීනව නම්.

කාමහෙතුකොට කාමනිදනකොට අත් සිඳුනා, පා සිඳුනා අත්පා සිඳුනා, කන් සිඳුනා, නාසා සිඳුනා, කන්නාසා සිඳුනා ආදි දෙතිස් කම්කටුල් අනුභව කිරිමුදු කාමයන්ගේ ආදීනව නම්.

කාම හෙතු කොට කාම නිදාන කොට කාමා'නුභව සඳහා ත්‍රිවිධ දුශ්චරිත පුරා අනන්තාපරිමාණ කාලයෙහි සතර අපාහි අනන්තා'පරිමාණ දුක් විඳුමුදු කාමයන්ගේ ආදීනව නම්.

රූපයන්ගේ ආශ්වාද නම් කවර? යත්:- ඇසට විෂය වූ වස්ත්‍රා'භරණාදිගත නීලපීතාදීන් පිණිස උපදනා සුඛසෞමනස්‍යය රූපයන්ගේ ආස්වාද නම්. මෙසේ සාමාන්‍ය කොට දක්වුව ද "මහණෙනි! මම ලොකයෙහි අනික් රූපයක් නො දක්මි, යම් රූපයක් මෙසේ පුරුෂයන්ගේ සිත් ගෙවා[1] සිටී ද, යේ ස්ත්‍රීරූප ය"යි වදාළ බැවින් ස්ත්‍රීරූපය අනුභව කරන්නන් විසිනුදු රූප සොභා ඇත්තන් විසිනුදු ආස්වාද වන බැවින් රූපයන්ගේ ආස්වාද නම්. ශබ්දාදීයදු මෙම නියා යි.

ස්ත්‍රීන් සාමාන්‍ය කොට දක් වූයේ "භගිනී'ති ඛත්තියාපි සොළස වස්සුද්දෙසකාලෙ ෆොකං වණ්ණසණ්ඨානං පස්සෙය්‍යාති" යි ආ බැවිනි. සිල්රැක්කානු අනත පාත

---

1. හෙදා.

වස්ත්‍රාභරණාදීන් සමෘද්ධ ව, වැඩිසිටි කුලෙහි ඉතා නො උස් ව, ඉතා නො මිටි ව. ඉතා කෘශ නො ව, ඉතා ස්ථූල නො ව, ඉතා නො කැළු ව ඉතා නො හෙළිලි ව, පරම වූ වර්ණසෞන්දර්‍ය්‍යයෙන් සමන්විත ව උපදිති. පූර්ණඵල පැණියක වැනි නාගකන්‍යාවක් හෝ? දිව්‍ය කන්‍යාවක් හෝ!? යි සම්භාවනා කරන්නට නිසි කවිජනයන් විසින් වණන්නට නිසි සම්පන්න වූ කෙසා'දිකොඨාස ඇති මෙලෙක් පියෝ ඇති කුමාරිකාවන්ගේ දුටු දුටුවන් නුවන් වොලොගන්නා වර්ණසම්පතු ද, ඔවුන් හන් පිළිපලදනෙහි පලන්මල මනොඥ වූ නීලපීතාදිවර්ණද්‍ර පිණිස උපදනා සුඛසෞමනස්‍යන රූපයන්ගේ ආස්වාද නම්.

රූපයන්ගේ ආදීනව නම් කවර? යත්. ඉදින් මරණයෙහි භස්ම නො කළ හොත් ඔවුන් ම ජරාදුර්ජ්‍රාවස්ථාවට සම්ප්‍රාප්ත ව, ඛණ්ඩදන්ත ඇති ව, නියඳ වලු සේ පිපී සුදු ව වගුළා වූ කෙහෙ ඇති ව, හකුළුවා බඳ සම්කස්සක් සෙයින් වලි ඇති ව, බරස්පඟී වූ තිලකාංකන ඡවි ඇති ව, ගොනස්සක් සෙයින් බිඳි නැමුනු සිරුරු ඇති ව, විනාශයට ගියා වූ යොවුන් ඇති ව, ආතුර ව, දෙනෙප්ලක් එක් කොට බැණ කැමැති අර්ථයක් නො ගැඟවිය නෙන වෙව්ලන ශබ්ද ඇති ව, ඇවිදුත් හොත් සැරයටියෙහි එල්බ වෙව්ලමින් ඇවිදිනා බැවෙක් ඇද්ද, මෙසිඳු රූපයන්ගේ ආදීනව නම්. මෙවැන්තනුදුගේ රූප මෙසේ සාදීනව වත් තු බූවන්ගේ රූපයෙහි ම කියයුතු කිම?. ශබ්දදීය ද මෙම නිසා යි. වෘද්ධභාවයට සම්ප්‍රාප්ත වුවහොත් මෙසේ වෙයි. ඉදින් රෝගී වුව හොත් ශිරොරොගයෙන් හෝ, අක්ෂිරෝගයෙන් හෝ, මුඛරොගයෙන් හෝ, කුක්ෂිරොගයෙන් හො කුෂ්ට කිලාසාදි ඡවිරොගයෙන් හෝ, ගණ්ඩපිළිකාදීන් හෝ උපහත ව, දරුදෙමාපියන්

1. උපහත.

මූත් තුබු ජනයන් විසින් පෙම්සුත් අඬි සදහා සෙවුනත් මූත් තුබුජනයන් විසින් ළඟ වන්නට ද නො තිසි වූ, අනුන් විසින් නහා සිඳුවනු බහා නොවනු ලබන, දෙකපොලයෙන් වෑම්හෙන[1] දුගඳ පිළිකුල් බොල් කෙළ ඇති, හස්තපාදදි චලන මුත් සවකීය ශරීරය ද දීගු කරත් නො පොහොසත් වූ, සවකීය මූත්‍රපුරීෂාදීන් ම්‍රක්ෂිත වූ, දුගීඬවිරූප බීභත්සාකාරයට සම්ප්‍රාප්ත වීමුදු, රූපයන්ගේ ආදිනව නම්. දිවි තුබුව හොත් මෙසේ වෙයි.

ඉදින් මළ කල භස්මභාවයට පමුණුවන්නන් නැත හොත් ඉදිම් තිල්ව කාක සුනඛ සිගාලාදීන් විසින් ඛාද්‍යමාන ව, නවචාරයෙන් ශ්‍රව වන පූයා-රුධිර-කෘමි කුලයන් ඇතිව, දුර්ගන්ධ - බීභත්ස - භයානකභාවයට පැමිණිමුදු රූපයන්ගේ ආදීනව නම්. මාංස රුධිරා දීන්ගේ සම්බන්ධය ඇති කල මෙසේ වෙයි.

උත්තරකාලයෙහි වනාහි හිස්ඇට, අත් ඇට, පා ඇට ආදී ඇට රාශිය විසිර තිබීයනු ලැබෙයි. කාලාන්තරයෙහි ශ්වේතභාවයට යෙයි. පූතිභාවයටදු පැමිණේයි. මෙයි දු රූපයන්ගේ ආදීනව නම්. මෙතයින් රූපයන්ගේ ආදීනව දතයුතු.

ශබ්දයන්ගේ ආස්වාද නම් කවර? යත්:-ශොත්‍රයට විෂයවූ මෘදඞ්ගවීණා ගීතිකාධ්වනි ආදී ශබ්දයන් පිණිස උපදනා සුඛසෞමනස්‍යය ශබ්දයන්ගේ ආස්වාද නම්, මෙසේ සාමාන්‍ය කොට දක්වුව ද "මහණෙනි! මම ලොකයෙහි අතික් ශබ්දයක් නො දක්මි, යම් ශබ්දයක් මෙසේ පුරුෂයන් සිත් ගෙවා සිටී ද, හේ ස්ත්‍රීශබ්ද ය"යි වදාළ බැවින් ස්ත්‍රීශබ්ද පුරුෂයන්ගේ සිත් ගෙවා සිටී. එහිදු මෙසෙසින් නවයොවුන්වයස සිටි පූර්වෝක්ත ප්‍රකාර රූපශොභා සම්පන්න කුමාරිකාවන්ගේ දිවකිඳුරු වෙණ රැව් බදු

1 වෑම්මෙන

ගීතිකාධ්වනිද, හර්ෂාදි ශබ්ද ද, විභූෂිතා'භරණගත ශබ්දද පිණිස උපදනා සුඛසෞමනස්‍යය ශබ්දයන්ගේ ආස්වාද නම්. මෙතයින් ශබ්දයන්ගේ ආස්වාද දතයුතු.

ශබ්දයන්ගේ ආදිනව නම් කවර? යත්:- එසේ වූවනුදුගේ ශබ්ද පූර්වෝක්තප්‍රකාරයෙන් ජරාදුර්බලව ඛණ්ඩදන්තාදිභාවයට පැමිණි කල අකර්මණ්‍ය වන බැවින් කැමැති අර්ථයක් හඟවන පමණකටදු නො නිසිවන බැවින් අත්‍යන්තජුගුප්සනීය වෙයි. මෙසිදු ශබ්දයන්ගේ ආදිනව නම්. මෙතයින් ශබ්දයන්ගේ ආදිනව දතයුතු.

ගන්ධයන්ගේ ආස්වාද නම් කවර? යත්:- ගෝශීසඳුන් තුවරලා කපුරුකළුවැල් ආදි ගන්ධයන් පිණිස උපදනා සුඛසෞමනස්‍යය ගන්ධයන්ගේ ආස්වාද නම්. මෙසේ සාමාන්‍ය කොට දක්වූව ද "මහණෙනි! මම ලොකයෙහි අනික් ගන්ධයක් නො දක්මි, යම් ගන්ධයක් මෙසේ පුරුෂයන්ගේ සිත් ගෙවා සිටී ද, හේ ස්ත්‍රීගන්ධය"යි වදාළ බැවින් ස්ත්‍රීන්ගේ පුරුෂයන් සිත්ගෙවා සිටි. එහිදු වෙසෙසින් තවයොවුන් වයස සිටි යථොක්ත ප්‍රකාර රූපශෝභාසම්පත්ත කුමාරිකාවන්ගේ ශරීරයෙහි ගන්ධද, ඔවුන් හත්මල්පහසිත ගන්ධ විලෙපනයන්ගේ ගන්ධ ද පිණිස උපදනා සුඛසෞමනස්‍යය ගන්ධයන්ගේ ආස්වාද නම්. මෙතයින් ගන්ධයන්ගේ ආස්වාද දතයුතු.

ගන්ධයන්ගේ ආදිනව නම් ක්වර? යත්:- මෙසේ වූවනුදුගේ ශරීරගන්ධදු ජරාදුර්බලාදිභාවයට සම්ප්‍රප්ත වත් ම උවතීතාදීන් සකසා කරන්ට නොහැකි වන බැවිනුදු, විකිරෙත[1] බැවිනුදු, ශරීරමල ජල්ලිකාදි උපගත වන බැවිනුදු, හස්තපාදමුඛධෝවනාදිය ප්‍රබල නො වන බැවිනුදු, වයොනුකූලව ශ්‍රව වන ලාලාක්ෂිමලාදි ඇතිවන බැවිනුදු අත්‍යන්තජුගුප්සනීය වෙයි. ඉදින්

1. දිවිකිරෙණ

ගන්ධ විලෙපන කළ හොත් "මේ මහල්ලිකා උම්මත්තිකා ය"යි කියන්නට නිසි වන බැවිනුදු, බලවත් කුණපා කුලගෘහයෙක වාසිතවනු සඳහා තුබූ ගන්ධද්‍රව්‍යයක් සේ ප්‍රතිකූල වන බැවිනුදු, ඔවුන්ගේ ශරීරගන්ධදු විලෙපනගන්ධදු අත්‍යන්තජුගුප්සනීය වෙයි. මේ ගන්ධයන්ගේ ආදීනව නම්. මෙතයින් ගන්ධයන්ගේ ආදීනව දතයුතු.

**රසයන්ගේ ආස්වාද නම් කවර?** යත්:- සකුරු මී ගිතෙල් ආදීන්ගේ රස පිණිස උපදනා සුඛසෞමනස්‍යය රසයන්ගේ ආස්වාද නම්. මෙසේ සාමාන්‍ය කොට දක් වුව ද "මහණෙනි! මම ලොකයෙහි අනික් රසයක් නො දක්මි, යම් රසයෙක් මෙසේ පුරුෂයන්ගේ සිත් ගෙවා සිටී ද, හේ ස්ත්‍රීරස ය"යි වදාළ බැවින් ස්ත්‍රීරසය පුරුෂයන්ගේ සිත් ගෙවා සිටී. එහිදු වෙසෙසින් ම නවයොවුන් වයස සිටි පූර්වොක්තප්‍රකාර රූපශොභා සම්පන්න කුමාරිකාවන්ගේ මුඛගත තාම්බුලාදි මිශ්‍රවූ ලාලා ද, ඔවුන්ගේ හස්තයෙන් පරිභොග කරවන ලද අන්නපානාදි රසද පිණිස උපදනා සුඛසෞමනස්‍යය රසයන්ගේ ආස්වාද නම්. මෙතයින් රසයන්ගේ ආස්වාද දතයුතු.

**රසයන්ගේ ආදීනව නම් කවර?** යත්:- එසේ වූවනුදුගේ ජරාදුර්ව්‍යාදිභාවයට සම්ප්‍රාප්ත වත්ම ධොවනකාලාතික්‍රාන්ත ව්‍රණ වූ මුව වන බැවින් මුඛගත ලාලා අත්‍යන්ත ජුගුප්සනීය වෙයි. අනන්තරොක්තක්‍රමයෙන් ශරීරගන්ධ අත්‍යන්තප්‍රතිකූල වන බැවින් ඔවුන් අතින් පිරිමදනා ලද අන්නපානාදිය ද අත්‍යන්තප්‍රතිකූල වෙයි. මේ රසයන්ගේ ආදීනව නම්.
මෙතයින් රසයන්ගේ ආදීනව දතයුතු.

**ප්‍රෂ්ටව්‍යන්ගේ අස්වාද නම් කවර?** යත්:-හිඹුල් පුළුන් කපුපුළුන් පොළා ගෙතූ[1] දෙවාගපටවැරළි ආදියෙන්

1. ඔත්.

කළ තිලිකන්වයිනුදු, සිහින් පිළී තබා ගෙත්තම් කළ කෙසෙල්මුවසම් ඇතිරිදු, තුන් අළුවෙක[1] අවුලුවා කටනා ලද සිහින්හුයින් වී උභතොභාග විමට්ට වූ කාශිවස්ත්‍ර ආදිවූ ස්පර්ශනීය වස්ත්‍රදු පිණිස උපදනා සුඛසෞමනස්‍යය ප්‍රෂ්ටව්‍යයන්ගේ ආස්වාද නම්. මෙසේ සාමාන්‍ය කොට දක්වූව ද "මහණෙනි! මම ලොකයෙහි අනික් ප්‍රෂ්ටව්‍යයෙක් නො දක්මි, යම් ප්‍රෂ්ටව්‍යයෙක් මෙසේ පුරුෂයන්ගේ සිත් ගෙවා සිටී ද, හේ ස්ත්‍රිප්‍රෂ්ටව්‍ය ය"යි වදළ බැවින් ස්ත්‍රින්ගේ ප්‍රෂ්ටව්‍යය පුරුෂයන්ගේ සිත් ගෙවා සිටී. එහිදු වෙසෙසින් තවයොවුන්වයස සිටි උක්තප්‍රකාර රූපශොභාසම්පන්න කුමාරිකාවන්ගේ නාතිශිත-නාත්‍යුෂ්ණ වූ පුළුන් පිරූ කොලබෝ විතක් සේ මොලොක් වූ සිතිදු වූ ප්‍රෂ්ටව්‍යයන් පිණිස උපදනා සුඛ සෞමනස්‍යය ප්‍රෂ්ටව්‍යයන්ගේ ආස්වාද නම්. මෙනයින් ප්‍රෂ්ටාව්‍යයන්ගේ ආස්වාද දතයුතු.

**ප්‍රෂ්ටව්‍යයන්ගේ ආදිනව** නම් කවර? යත්:- එසේ වූවනු දුගේ ශරීරස්පර්ශ ඛණ්ඩදන්ත-පලිතකෙශ-තිලකාහත ගාත්‍රාදි භාවයට පැමිණි කල ප්‍රතිකූල වන බැවින් නිඤ්ඤ වන බැවින් ශරීරයෙන් ස්පර්ශ කරනු වරා ඇසින් දක්නට ද නො නිසි වන බැවින් මහත් සංවෙගකාරණ වෙයි. මේ ප්‍රෂ්ටව්‍යයන්ගේ ආදීනව නම්. මෙ නයින් ප්‍රෂ්ටව්‍යයන්ගේ ආදීනව දතයුතු. මෙසේ වස්තුකාමයන්ගේ ආස්වාදදු, ආදිනවදු දතයුතු. ගාථා විසිනුදු මේ අර්ථය දක්වන ලද්දේ යි.

°

**පඤ්චකාමගුණා එතෙ-ඉත්ථිරූපස්මිංදිස්සරෙ,**
**රූපා සද්දා රසා ගන්ධා-ඵොට්ඨබ්බාච මනොරමා "යි**

---

1 තුන් ආසැවෙක,

## 46

i සුගතියෙහි ඉපද පිළිසිඳ පටන් ගෙන සුව අනුභව කෙරෙත් ම ය. ii සුගතියෙහි ඉපද පිළිසිඳ පටන් ගෙන දුක් අනුභව කෙරෙත් ම ය. iii දුගතිය ඉපද පිළිසිඳ පටන් ගෙන සුව අනුභව කෙරෙත් ම ය. iv දුගතිය ඉපද පිළිසිඳ පටන් ගෙන දුක් අනුභව කෙරෙත් මැයි. කිසේ ය? යත්:-

i සකසා කරන ලද කුසල් ඇත්තන් පවු නො කළවුන් ඒ කුශල කර්මයෙන් සුගතිය උපන් කල ඔවුන් විසින් කළ කුශල කර්මයෝ මෙසේ සැහැසෙන් තවුත් වැත්තෝ: "තොප කුසල් කළසේ මැනව. එ විඳුතට තිබි සුගතිය උපන්ව පිළිසිඳ පටන් ගෙන සුව විඳුවනු අප කෙරේ බද්දේ වේ තො" යි.[1] මෙසේ සැහැසිවැද විපාක දෙන්තවුන් වැනි කුශලකර්මයෝ සුගතිය උපත්තන් පිළිසිඳ පටන් ගෙන සුව අනුභව කරවත්. මෙසේ සකසා කුසල් කළ සත්හු පිළිසිඳ පටන් ගෙන සුව අනුභව කෙරෙත්.

ii සකසා කරන ලද කුසල් නැත්තන් බොහෝ පවු කළවුන් එ දුබුල් කුශලකර්මයෙන් සුගතිය උපන් කල ඔවුන් විසින් කළ අකුශලකර්මයෝ මෙසේ සැහැසෙන් තවුන් වැත්තෝ: "අප එක්තැන් තො විය හුණ්‍යෙන් වැරද සුගතිය උපත්ව. ඉදින් තොපගේ පිළිසඳ කාලයෙහි සමක්‍ෂ වූමෝ නම් සතර අපායෙහි උපදවා නිරන්තරයෙන් දුක් අනුභව කැරවූම්හ. එ වැරැද්දෙන් කිම්? තොප සුගතිය උපනද පිළිසඳ පටන් ගෙන දුක් අනුහම කරවනු අප කෙරේ බද්දේ වේ තො" යි. මෙසේ සැහැසිවැද විපාක දෙන්තවුන් වැනි අකුශල කර්මයෝ සුගතිය උපන් කල පිළිසඳ පටින් ගෙන

1. බද්දේනුයි

දුක් අනුභව කරවත්. මෙසේ සකස්‍ා කුසල් නො කළ බොහෝ පවු කළ සත්හු සුගතිය උපනු ද පිළිසඳ පටන් ගෙන දුක් අනුභව කෙරෙත්.

iii සකස්‍ා කරන ලද කුසල් ඇත්තත් බලවත් පවු නො කළවුන් එදුඹුල් පවුකැමින් හස්තිඅශ්වනාග සුපර්ණාදිව දුගතිය උපන් කල ඔවුන් විසින් කළ කුශල කර්මයෝ මෙසේ සැහැසෙන්නවුන් වැන්නෝ: "තොපගේ පිළිසඳට[1] හඬා අප සමක්‍ෂ නො වියහුණුයෙන් වැරද දුගතිය උපන්ව. ඉදින් තොපගේ පිළිසඳ කාලයෙහි සමක්‍ෂ වූමෝ නම් සුගතිය උපදවා නිරන්තරයෙන් සුව අනුභව කැරුවූවම්හ. එ වැරුද්දෙත් කිම? තොප දුගතිය උපනද පිළිසඳ පටන් ගෙන සුව අනුභව කර වනු අප කෙරේ බද්දෙ වේ නො"යි. මෙසේ සැහැසී වැද විපාක දෙන්නවුන් වැනි කුශලකර්මයෝ දුගතිය උපනද මගුල් ඇත් කොට මඟුල්අස් කොට සිටිනා තැන රන්තරු රිදීතරු ආදීන් සැදූ සෙල්විතන් බඳවා, ගඳතෙල්පහන් දල්වා, සාලිමංසොදනාදිභොජන වළඳවා රාජ්‍යසුඛ බඳු සුව අනුභව කරවත්. නාගසුපර්ණ යොනිය උපන්නන් දිව්‍යසම්පත් හා සම සම්පත් අනුභව කරවත්. මෙසේ සකස්‍ා කරන ලද කුසල් ඇත්තෝ බලවත් පවු නො කළාහු දුගතිය උපනු ද පිළිසඳ පටන් ගෙන සුව අනුභව කෙරෙත්.

iv කුසල් නො කළවුන් බලවත් පවු කළවුන් ඒ අකුශලකර්මයෙන් දුගතිය උපන් කල ඔවුන් විසින් කළ අකුශලකර්මයෝ මෙසේ සැහැසෙන්නවුන් වැන්නෝ: "කුසල් නො කොට පවු කළව[2] එ විඳුනට තිසි දුගතිය උපන්ව. අප විපාක දෙන්නට අවකාශය. තොප කළ අකු-සල කර්මයට තිසි කොට පිළිසඳ පටන් ගෙන පඤ්චවිධ වධබන්ධනාදි කම්කටුල් අනුභව කරවනු අප කෙරේ

1. පිළිසඳ පටන් ගෙන 2. පව්කළවුන්

බද්දේ වේ නො''යි. මෙසේ සැහැසිවැද විපාක දෙන්න වුත් වැනි අකුශලකර්මයෝ දුගතිය උපන්නන් පිළිසඳ පටන් ගෙන දුක් අනුභව කරවත්. මෙසේ කුසල් නො කළාහු බලවත් පවු කළාහු දුගතිය ඉපද පිළිසඳ පටන් ගෙන දුක් අනුභව කෙරෙත්.

## 47

ධර්මසමාදාන සතරෙක් වේ. හේ කි සේය ? යත්:- i. ඇතැම් ධර්මසමාදානයෙක් මෙලොව සුව දායක වෙයි. පරලොව දුක් දායක වෙයි. ii. ඇතැම් ධර්මසමාදානයෙක් මෙලොවද පරලොවද දුක් දායක වෙයි. iii. ඇතැම් ධර්මසමාදානයෙක් මෙලොව දුක් දායක වෙයි. පරලොව සුවදායක වෙයි iv. ඇතැම් ධර්මසමාදානයෙක් මෙලොවද පරලොවද සුව දායක වෙයි කිසේය? යත්:-

i. මෙලොව සුව දායක වූ පරලොව දුක් දායක වූ ධර්මසමාදාන දක්වන තැන ''ඒ ශ්‍රමණබ්‍රාහ්මණයෝ මෙහි කවර නම් ආදීනවයක් දුටහ; මේ තරුණ වූ පරිව්‍රාජිකාවගේ බාහුස්පර්ශය ඉතා සුවය'' යනාදි විසින් මිථ්‍යාප්‍රතිපත් ගත් දෘෂ්ටිගතිකයන්ගේ ප්‍රවෘත්ති ක්‍රම සංදර්ශිත වන බැවින් එසේ වූවන්ගේ ප්‍රතිපත්ද, ''සිත් තුබූ පරිද්දෙන් පස්කම් ගුණ අනුභව කිරීම් සග මොක් පිළිවෙත් වේ''යි රචනා කළ ග්‍රන්ථ ගෙන එහි සේ දුශ්චරිත පුරන්නන්ගේ ප්‍රතිපත්ද මෙලොව සුව දායක වූ පරලොව දුක් දායක වූ ධර්මසමාදාන නම්.

ii. මෙලොවද පරලොවද දුක් දායක ධර්මසමාදාන දක්වන තැන් තීර්ථකයන්ගේ ''අප සසර වසන කල කළ තාක් පවු මේ දුෂ්කරක්‍රියායෙන් විද නැති කොට එසිත්ම සුඛ වම්හ''යි තෘණ භක්ෂණ-ගොමයභක්ෂණාදි භෝජනගත වික්‍රියායෙහි පවත්නා විසින් විෂමාහාර යේවායෙනුද, කටුපැලැල්ලේ හෝනාදි විෂම ඊර්යාපථ

සේවායෙනුද, හිමත් බලවත් පින්තෙහි උදය සිහිල් දියෙහි ගැලෙනු ආදි විසින් විෂම වූ සෘතු සේවායෙනුද, ග්‍රීෂ්ම කාලයෙහි පඤ්චාතාපයෙන් තැවී සූර්‍ය්‍යානුවර්තනාදි කාරන විසින් ශරීරපීඩා උපයනාදි දුෂ්කරක්‍රියා මෙලොව ද පරලොවද දුක් දායක වූ ධර්මසමාදාන නම්.

iii. මෙලොව දුක් දායක පරලොව සුව දායක ධර්මසමාදාන දක්වන තැන "ඉධ භික්ඛවෙ එකච්චො පකතියා තිබ්බරාගජාතිකො හොති, සො අභික්ඛණං රාගජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පකතියා තිබ්බදොසජාතිකො හොති, සො අභික්ඛණං දොසජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පකතියා තිබ්බමොහජාතිකො හොති, සො අභික්ඛණං මොහජං දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. සො සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අස්සුමුඛොපි රුදමානො පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති – පෙ – අයං වුච්චති භික්ඛවෙ ධම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං සුඛවිපාකං"යි වදාළ බැවින් යමෙක් එක්වත් රාගවශයෙන් ද්වේෂවශයෙන් තත් තත් වස්තුව්‍යතික්‍රමයෙන් බලවත්ව පවත්නා සිත් ඇතිව ද බුදුන්ගේ ආඥාව්‍යතික්‍රමභය ආත්මානුවාදභය පරා'නුවාදභය දණ්ඩභය දුර්ගතිභයාදී ප්‍රත්‍යවේක්ෂා කොට වැලප වැලපදු දතින් දත ඩැහැ ද, දිවින් තල්ල ඔබා ද, බලවත් දුක් දොම්නසින් තැවී තැවී අඛණ්ඩ කොට බඹසරවස් රකී ද, මෙසේ වූ ධර්මසමාදාන මෙලොව දුක් දායක වූ පරලොව සුව දායක වූ ධර්මසමාදාන නම්.

iv. යමෙක් රාගී නොව, ද්වේෂී නොව, මෝහී නොව, යම්තාක් නො කළ මනා නො කළ මැනවැ'යි කී කා; ඒ හැම මැනවැ'යි තුෂ්ටව ගිවිස ගෙන සුව

යෙන් නො කළකිරි හර්ෂප්‍රීතිප්‍රමෝද්‍ය බහුල ව "මේ සම්‍යක් ප්‍රතිපත්තීන් සඟමොක් ගන්මි"යි සිතනුයේ නිත්‍යයෙන් ගිහිගෙහිදු පස්කම් ගුණෙහිදු අසුණු සේ දක සත්නෙහි ගුණ දක පරිසුඬ කොට සිල් රකී ද, මෙසේ වූවහුගේ ධම්සමාදන මෙලොවදු පරලොවදු සුවදයක වූ ධර්මසමාදාන නම්. මෙනයින් චතුර්විධ ධම්සමාදන දත යුතු.

## 48

රාජකථං, චොරකථං, මහාමත්තකථං, සෙනාකථං, භයකථං යුද්ධකථං, අන්නකථං, පානකථං, වත්ථකථං, සයනකථං, මාලාකථං, ගන්ධකථං, ඤාතිකථං, යානකථං, ගාමකථං, නිගමකථං, නගරකථං, ජනපදකථං ඉත්ථි කථං, සූරකථං, විසිඛාකථං, කුම්භට්ඨාන කථං, පුබ්බපෙතකථං, නානත්තකථං, ලොකක්ඛායිකං, සමුද්දක්ඛායිකං,යි දක්වන ලද සවිසි කථායෙහි 'ඉති භවාභවකථං, යනු සයක් කොට ගත් කල දෙතිසක් වෙයි. කියේය? යත්:– 'ඉති භවා'භව කථං' යනු 'ඉති භවො' 'ඉති අභවො'යි දෙකක් වෙයි. එහි 'භවො' යනු තුනෙක් වෙයි. 'අභවො' යනු තුනෙක් වෙයි. කිසේය? යත්:–භවො'ති සස්සත දිට්ඨි; අභවො'ති උච්ඡේදදිට්ඨි; භවො'ති වුද්ධි; අභවො'ති හානි; භවො'ති කාමසුඛං; අභවො'ති අත්තකිලමථො"යි සයෙක් වෙයි. මෙ සය හා පළමු කී සවිස්ස හා දෙතිස් කථා නම් වෙයි. මේ දෙතිස් කථාවෝ සජ්ජනයන් විසින් නො බිණිය යුත්තාහ. නෛර්‍යාණිකයෝ නො වෙති. ස්වර්ග මොක්ෂ දෙක්හට බාධකයහ.

මෙහි රජ්ජුරුවන් පිළිබඳ පැවති කථා රාජකථා නම් වෙයි. චොරකථාදිය ද මෙ ම නය යි. කිසෙසින්

1. පස්කම්රසගුණෙහිදු 2. ගුණගණවිසින්දක

කියනලද්දවෝ ස්වර්ග මෝක්ෂ දෙකට බාධක' වෙති. කිසෙසින් කියන ලද්දවෝ ස්වර්ග මෝක්ෂදෙකට බාධක නො වෙති. යත්:- ගෘහාශ්‍රිත ප්‍රේමවශයෙන් ක්ලේශොත්පත්ති කාරණ වන සේ කියන ලද්දවෝ ස්වර්ගමෝක්ෂ දෙකට බාධක වෙති, එබැවින් එසේ කියනු නො වටී. විරාග ජනවමින් ක්ලේශයන්ට නිග්‍රහ කෙරෙමින් පැවැති කථාවෝ ස්වර්ගමෝක්ෂ දෙකට කාරණ වෙති. එ බැවින් එසේ වූ කථා කියත් වටී. කි සේය? යත්:-රාජකථායෙහි ''අසුවල් රජ අභිරූපය; දර්ශනීය ය'' යනාදි විසින් රූපශොභාදි විභූති පිණිස ප්‍රවෘත්ත ගෘහාශ්‍රිතකථා 'තිරශ්චීන කථා' නම් වෙයි. ''එ වැනි මහා'නුභාව රජද පවා ක්ෂයට ගියේය; යනාදීන් සංවේග කාරණ කොට කියන ලද්දේ 'නෛර්‍යාණික කථා'' නම් වෙයි.

චෞරකථායෙහි- 'මූලදෙව' 'මෙඝමාලාදීහු' චෞර යන්ගේ කර්ම පිණිස ඉතා ශූරයහ; ආශ්චර්‍යය ''යනාදි විසින් ශූරභාව පිණිස ප්‍රවෘත්තකථා 'තිරශ්චීනකථා' නම් වෙයි. ''එ වැනි අනුභාව ඇත්තෝ ද පවා විනාශයට ගියහ'' යනාදි විසින් කියන ලද්දේ 'නෛර්‍යාණික කථා' නම් වෙයි.

මහාමාත්‍යකථායෙහි- ''මෙ නම් මෙනම් මහාමාත්‍යයෝ රූප ශොභා සම්පන්නයහ; ආනුභාව සම්පන්නයහ'' යනාදි විසින් කියනලද්දේ 'තිරශ්චීනකථා' නම් වෙයි. ''එ වැනි අනුභාව ඇත්තෝද පවා විනාශයට ගියහ'' යනාදි විසින් කියනලද්දේ කර්මස්ථාන වඩන බැවින් 'නෛර්‍යාණිකකථා' නම් වෙයි

සේනාකථායෙහි- ''අසුවල් සෙනා හස්ති-අශ්ව-රථ-පදාති-යොධාදීන් විසින් සම්පන්නය; සුනිවිෂ්ටය

දුර්නිවිෂ්ටය" යනාදී විසින් ප්‍රවෘත්ත ගෘහාශ්‍රිතකථා 'තිරශ්චීනකථා' නම් වෙයි. "එවැනි සෙනාවෝ ද විනාශයට ගියහ" යනාදි විසින් ප්‍රවෘත්තකථා 'නෛර්‍යාණික කථා' නම් වෙයි.

**භයකථායෙහි**- භිරුක ජාතීන්ට භය උපදනු සඳහා, ප්‍රශංසා ඇති ව අසනුවනට හර්ෂ උපදනු සඳහා කියනලද ගෘහාශ්‍රිත වූ භයකථා 'තිරශ්චීනකථා' නම් වෙයි. 'එවැනි භය නො වෙව'යි යනාදි විසින් හිතොපසංහාර ව ප්‍රවෘත්තකථා 'නෛර්‍යාණික කථා' නම් වෙයි.

**යුද්ධකථායෙහි**-"භාරතයුද්ධා දියෙහි අසුවල්හු විසින් අසුවල්හු මරණලද්දු; විදුනාලද්දු"යි යනාදි විසින් කාමාස්වාදයෙන් ප්‍රවෘත්තකථා 'තිරශ්චීනකථා' නම් වේ. "එ වැන්නෝ ද විනාශයට ගියහ"යි විරාග උපදනු සඳහා කියන ලද කථා කර්මස්ථාන වෙයි. එබැවින් 'නෛර්‍යාණිකකථා' නම් වෙයි.

**අන්නකථායෙහි** - "මෙ වැනි වර්ණ - ගන්ධ - රස සම්පන්නශාලි මාංසෞදනාදි භොජන පරිභොග කළම්හ"යි ආස්වාද විසින් කියන් නො වටී. "මෙ වැනි වර්ණ - ගන්ධ - රසසම්පන්න භෝජන සිල්වත්නට දුන්මහ; චෛත්‍යා'දියට පූජා කළම්හ"යි කියන් වටී.

වර්ණ-ගන්ධ-රසසම්පන්න අම්බපාන-යාගුපානාදි-යෙහිදු; වර්ණස්පර්ශසම්පන්න වස්ත්‍රයෙහිදු; රත්පුප්ඇතිරි සුදුපුප්ඇතිරි තිලිකත්වයින් හැඳ පුටු ආදි සයනාසන යෙහි දු, චම්පක-වස්සිකාදි මාලායෙහිදු, කස්තුරු ආදි ගන්ධයෙහිදු විනිස අන්නකථායෙහි වුක්ත නයින් දත යුතු.

**ඥාතිකථායෙහි**:-"අප නෑයෝ ශූරයහ; සමර්ථයහ" යනාදී විසින් කියනු නො වටී. එසේ වූවෝ ද පවා "

ක්ෂයට ගියහ; ව්‍යයට ගියහ" යනාදී විසින් කියත් වටී.

**යානකථායෙහි**:-"ඇපි පූර්වයෙහි මෙ වැනි මෙ වැනි විචිත්‍ර යානයෙන් ඇවිද්දම්හ"යි ආස්වාද විසින් කියත් නො වටී. "මෙ වැනි ඉදෙලු-වහන් සිල්වත්නට දුනුම්හ"යි කියත් වටී.

ආපණද්ද, ප්‍රාකාරද්ද නැත්තේ 'ග්‍රාම' නම් වෙයි. ආපණ ඇතිව ප්‍රාකාර නැත්තේ 'නිගම' නම් වෙයි. ආපණද්ද, ප්‍රාකාරද්ද ඇත්තේ 'නගර' නම් වෙයි මෙසේ වූ ග්‍රාමාදීහු "සුනිවිෂ්ටයහ; දුර්නිවිෂ්ටයහ; ප්‍රාසාද-තොරණ-අට්ටාල-වීථි-ප්‍රාකාරාදී සම්පන්නයහ; සුභික්ෂයහ; දුර්භික්ෂයහ" යනාදී විසිනුදු, "එහි වාසය කරන්නාහු ශූරයහ" යනාදී විසිනුදු ආස්වාද විසින් කියත් නො වටී. "ශ්‍රද්ධාසම්පන්නයහ; ප්‍රසන්නයහ; එ වැනි ග්‍රාමාදී වාසීහුදු විනාශයට ගියහ" යනාදී විසින් විරාග කාරණකොට කියත් වටී **ජනපදකථායෙහිදු** මෙ ම නය යි.

**ස්ත්‍රීකථායෙහි**:-ආස්වාද විසින් ස්ත්‍රීන්ගේ වර්ණ සංස්ථානාදී විසින් ශොභා කියත් නො වටී. "ශ්‍රද්ධා-සම්පන්නයහ; ප්‍රසන්නයහ; යනාදී විසිනුදු, "ක්ෂයට ගියහ; විනාශයට ගියාහ" යනාදී විසිනුදු කියත් වටී.

**සූරකථායෙහි**:- "නන්දිමිත්‍ර' නම් යොධ ශූරය" යනාදී විසින් ආස්වාද උපසා කියත් නො වටී. "ශ්‍රද්ධා-සම්පන්නය" යනාදී විසිනුදු "ක්ෂයට විනාශයට ගියේය" යනාදී විසිනුදු කියත් වටී.

**විසිඛාකථායෙහි**:-"අසුවල් වීථිය සුනිවිෂ්ටය; දුර්නිවිෂ්ටය; ඒ වීථිය වාසය කරන්නෝ ශූරයහ, සමර්ථයහ" යනාදී විසින් ආස්වාද විසින් කියත් නො වටී.

"ශ්‍රද්ධාසම්පන්නයහ; ප්‍රසන්නයහ; ක්ෂයට ගියහ; විනාශයට ගියහ" යනාදි විසින් කියත් වටී.

**කුම්භට්ඨානකථායෙහි**:- 'කුම්භට්ඨානකථා' නම් දියතොට උපදනා කථාය; කුම්භදාසීන්ගේ කථාවේ ම ය. "කුම්භදාසීහු රූපශෝභාසම්පන්නයහ; නෘත්‍යාදි දක්ෂයහ; යනාදී විසින් ආස්වාද උපයා කියත් නො වටී. "ශ්‍රද්ධාසම්පන්නයහ; ක්ෂයට ගියහ; විනාශයට ගියහ" යනාදි විසින් කියත් වටී.

**පුබ්බපෙතකථායෙහි**:-'පුබ්බපෙතකථා' නම් මළනෑයන් පිණිස කියන කථා' යි. හේ වර්තමාන 'ඥාතිකථා' හා සම' යි.

**නානත්තකථායෙහි**:-නානත්තකථා නම් මෙහි පළමු කී නාක් කථායෙන් පිටත් මත්තෙහි කියන කථායෙන් පිටත් නානාස්වභාව වූ තිරශ්චීන කථා යි. හේ සම්ප්‍රකාරයෙන් කියයුතු නො වෙ යි.

**ලොකක්ඛායිකකථායෙහි**:-"මේ ලෝකය කාවිසින් නිර්මිතය අසවල්හු විසින් නිර්මිත ය යි ද, කවුඩුවෝ සුදුහ ඇට සුදු වන බැවින්; කොක්කු රත්හ ලේ රත් වන බැවින්" යනාදි විසින් ප්‍රවෘත්තලෝකායතශාස්ත්‍රයෙහි සේ කියන ලදුයේ විතණ්ඩ සල්ලාපකථා' යි. මෙයි ද සම්ප්‍රකාරයෙන් සජ්ජනගර්හිත' යි.

**සමුද්දක්ඛායිකකථායෙහි**:-"කවර නම් හේතුවකින් 'සමුද්‍ර' නම් විය 'සගර' නම් දිව්‍යපුත්‍රයා විසින් කණන ලද බැවින් 'සාගරා' නම් විය; "මා විසින් කණන ලද්දේ ය"යි හස්තමුද්‍රායෙන් පැයෙන් 'සමුද්‍ර' නම්" විය යනාදි තිරශ්චීකථා 'සමුද්දක්ඛායිකකථා' නම්.

**ශාශ්වතදෘෂ්ටිකකථායෙහි**:-"ආත්මද, ලෝක ද නිත්‍යය; ධ්‍රැවය; විපරිණාමස්වභාව නැත්තේය" යනාදි

විසින් ප්‍රවෘත්ත කථා 'ශාශ්වතදෘෂ්ටිකථා' නම් වේ. 'මේ සත්‍යය'යි ආස්වාද උපයා කියත් නො වටි. මෙසේ ගත් දෘෂ්ටි මිථ්‍යාදෘෂ්ටි නමැයි'' එහි ස්වරූප හඟවනු සඳහා විරාග කාරණකොට කියත් වටී.

**උච්ඡේදදෘෂ්ටිකථායෙහි**:-''ආත්ම උච්ඡින්න වෙයි; විනාශයට යෙයි; මරණින් ඌර්ධ්වයෙහි නො වෙයි'' යනාදි විසින් කියන ලද්දේ 'උච්ඡේදදෘෂ්ටිකථා' නම්. ''මෙසේ ගත් දෘෂ්ටි උච්ඡේද නමැ''යි එහි ස්වරූප හඟවනු සඳහා, සංවේග උපයනු සඳහා කියත් වටී.

**වෘද්ධිකථායෙහි**:- රූපශොශාභායෙන් භොගයෙන් යසසින් මෙසේ වෘද්ධි වේ''යි ආස්වාද උපයා කියන ලද කථා ''වෘද්ධිකථා'' නම් වෙයි. මෙසේ කියත් නො වටී. සම්‍යග්ප්‍රයොගඵල පුණ්‍යඵල හඟවනු සඳහා කියත් වටී.

**හානිකථායෙහි**:-''රූපශොභායශස් ඓශ්වර්‍ය්‍යාදීන් පිරිහුණහ''යි ආස්වාද උපයා කියත් නො වටී. ''මෙ වැනි ප්‍රයොග විහත්තීන් පාපකර්මානුභාවයෙන් ඓශ්–වර්‍ය්‍යාදීන් පිරිහුණහ''යි විරාග හෙතු කොට කියත් වටී.

**කාමසුඛකථායෙහි**:- පස්කම්ගුණෙහි අනුසස් ආස්වාද විසින් කියත් නො වටී. එසේ ද වුව ''පඤ්ච කාමගුණයෝ අනිත්‍යයහ; ක්ෂයට ගියහ; විනාශයට ගියහ''යි ද, ''මෙ වැනි කුශලකර්මයෝ මෙ වැනි පඤ්ච–කාම ගුණ ඵලවති; අනුභව කරවති''යි ද, ''මෙ වැනි කුශලකර්ම කළාහු මෙ වැනි පඤ්චකාම ගුණ අනුභව කෙරෙති''යි ද කර්මඵල සම්බන්ධ ප්‍රකාශ වන විසින් කියත් වටි.

**ආත්මක්ලමථානුයොගකථායෙහි**–මිථ්‍යාදෘෂ්ටිකයන් විසින් කරණ තාක් දුෂ්කරක්‍රියායෙහි ආස්වාද උපයා කියත් නො වටී. ආත්මක්ලමථානුයොගස්වරූප කියා ''මෙයින් මෙ වැනි අපායදුඃඛ සිඬවෙයි' යනාදී

විසින් උගැන්වියෑ,ඊ ව කියත් වරි. මේ සජ්ජන ගර්හිත වූ ද්වාත්‍රිංශත්කථාවෝ තිරශ්චීක්කථා නම්.

භාර්‍ය්‍යාවෝ ප්‍රවෘත්තික්‍රම පිණිස සත්දෙනෙක් වෙත්. කි සේ ය.? යත්:- i මාතෘභාර්‍ය්‍යා ය. ii භගිනී-භාර්‍ය්‍යා ය, iii සඛීභාර්‍ය්‍යා ය, iv දාසීභාර්‍ය්‍යා ය, v ස්වාමිභාර්‍ය්‍යා යය, vi ප්‍රතිපක්ෂභාර්‍ය්‍යා ය, vii වෛරභාර්‍ය්‍යා, යි.

i ස්වාමිහි තො මැතැවින් දුරුකොට මැතවැ පවත්වා පුතක්හු කෙරෙහි පවත්නා මවක සෙයින් කුළුණු බැරිව ස්වාමිහි තො ඉක්ම වාසය කරන්නී මාතෘ ය යිදු කියනු ලැබේ. භාර්‍ය්‍යා යයිදු කියනු ලැබේ. ii එක් කුස හොත් මලක්හු කෙරෙහි සෙයින් පෙම්බර ස්වාමිහි තො යික්ම ,වාසය කරන්නී ද, එ සේ ම එක් කුස හොත් බෑයක්හු කෙරෙහි සෙයින් පෙම්බැරිව ගරසර ඇතී ව ස්වාමිහි තොයික් ම වාසය කරන්නී ද, භගිනී යයිදු කියනු ලැබේ. භාර්‍ය්‍යා ය යි දු කියනු ලැබේ. iii සබඳක්හු කෙරෙහි සෙයින් දුටු කල සොම්-නසින් පිණා හිතකාමීව ස්වාමිහි තො යික්ම වාසය කරන්නී සඛී යයි දු කියනු ලැබේ. භාර්‍ය්‍යා ය යිදු කියනු ලැබේ. iv දාසක සෙයින් ගරසර ඇතිව හැමකිස සපයා ස්වාමිහි තො යික්ම වාසය කරන්නී දාසී යයි දු කියනු ලැබේ. භාර්‍ය්‍යා ය යිදු කියනු ලැබේ. v දාසයන් අභිභවා පවත්නා ස්වාමියක් හු සෙයින් තමා ස්වාමිහි අභිභවා පවත්නී ස්වාමි ය යි දු කියනු ලැබේ. භාර්‍ය්‍යා ය යිදු කියනු ලැබේ vi ස්වාමිහු පියා සෙසු පුරුෂ-යන් හා අනාචාරයෙහි පවත්නී ප්‍රතිපක්ෂසැතිරි යයිදු ,කියනු ලැබේ. භාර්‍ය්‍යා ය යි දු කියනු ලැබේ. vii ස්වාමිහු උපයූ ධන ධාන්‍ය නසන්නී වෛරී ය යි දු කියනු ලැබේ. භාර්‍ය්‍යා ය යි දු කියනු ලැබේ. මෙසේ භාර්‍ය්‍යාවෝ ප්‍රවෘත්තික්‍රම පිණිස සත්දෙනෙක් වෙත්.

මනුෂ්‍යයන්ගේ ආයුෂ කෘතයුගයෙහි වඩී. කලියුගයෙහි පිරිහෙයි. මේ ධර්මතාය. යම් ප්‍රකාරයකින් නො පිරිහෙළිය හැකි. එසේ වූවත්ව "ප්‍රාණා'තිපාත කළාහු අල්පායුෂ්ක වෙති. නො එසේ වූවාහු දීර්ඝායුෂ්ක වෙති" යනු නො යෙදෙ නො? යත්:- ඊට[1] දෙෂ නැති ඒ ඒ කාලයෙහි පිරිහුන් ආයුෂ ගෙන කි වන[2] බැවින්. හෛෂජ්‍යා'ප්‍රයොගයෙන් නක්‍ෂත්‍රයෙන්වත දීර්ඝායුෂ්කතා ද, අල්පායුෂ්කතා ද කර්මබලයෙන් ම වෙයි. නො එසේ වූව නො වේ. බුදුවන බෝසත්හු ද බුදුවන ජන්මයෙහි සෞමනස්‍යසහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරිකමෛත්‍රිධ්‍යාන පූර්වභාග වූ ප්‍රථම මහා කුශලචිත්තයෙන් ප්‍රතිසන්ධිග්‍රහණය කෙරෙති. එසේ දුන් ප්‍රතිසන්ධිය අසංඛ්‍යායුෂ්ක වෙයි. මෙසේ ද වූ කර්ම මේ කලියුගයට සම්ප්‍රාප්තව බුදුන් අසූහවුරුද්දක්[3] පැවැත් වී. තුබු මිනිස් සතුත්ගේ[4] ආයුෂ පිරිහෙන පරිදිදු මෙ නයින් දත යුතු.

යම් සේ පූතිභාවයට නො ගිය පරිපූර්ණ වූ තණ්ඩුල වූ කල වර[5] ගෙන මනා කොට වියලා සඟවා තබන ලද සාලිබීජාදිහු දුහුරු බිමැ අකාලයෙහි වපුරන ලද්දාහු, දිය ලද මනා කාලයෙහි දිය නො ලබන්නා හු, නෙලුව මනා කාලයෙහි නෙලුම් නො ලබන්නාහු, රකවල් ආදි සෙසු කර්මාන්ත දු සෘතු ආදී ප්‍රත්‍යදු නො ලබන්නාහු විපන්නඵල වෙද්ද, එසේ ම අවිශුද්ධප්‍රයොග වැටෙන විපන්න වූ උත්පත්ති ඇති කලියුගයෙහි උපන්නන්ගේ ආයුෂාදී කාරණවයකින් පිරිහෙයි. හේ කි සේය? යත්:- අල්පා'යුෂ්කතාවට වැටෙන අකුශලකර්ම බොහෝ සෙයින් කරන කාලයෙහි ඒ කර්මයෙන් පරිභාවිත සන්තානයෙහි උපන් පිතෘහුගේ ශුක්‍ර හා මවගේ උතුනීලේ හා මේ දෙක මවුපියන්ගේ ආයුෂය[6] වැනි අල්පායුෂ්කතාව හා මවුපියන්ගේ වර්ණ වැනි වර්ණයවදු,

1. එයට 2. කිවමනා 3. අසූ අවුරුද්දට 4. තුබුසතුන්ගේ
5. බර 6. ආයුෂයම

මවුපියන්ගේ ආකාර වැනි ආකාරයවද්දු ප්‍රත්‍යය වන බැවින් එක් කාරණයෙක. කලියුගයෙහි උපන් රජ්ජුරුවෝ ද කාල ප්‍රභාවයෙන් ම රාගද්වේෂාදි බහුල භාවයට පැමිණෙති. මෙසේ වත් ම දශරාජධර්ම පියා සතර සංග්‍රහ වස්තු පියා එහි සේ නො වැටී සතර අගතියට යෙති. ඔවුන් මෙසේ පවතුත් ඔවුන්ගේ යුවරාජ සේනාපති ආදීහු ද නො මැදහත් වෙති. මෙසේ ක්‍රමයෙන් හැම සත්හු අධර්මයෙහි පවත්නාහ. චන්ද්‍ර සූර්‍ය්‍යා'දීහු මනාව නො පවත්ති. ඔවුන් මනාව නො පවතුත් ම මනා ඍතු නො වෙයි. සම්‍යග්වර්ෂණ නො ද වෙයි. එසේ වූ කාලයෙහි පොළොව ඔජස් පාතට බැසයෙයි මෙසේ වූ පෘථිවිය කරනලද ශස්‍ය සම්‍යග්වර්ෂණ ඍතු ආදි සත්ප්‍රාප්ත නො ලබන්නේ විපන්න වූ තණ්ඩුල ඇතිවෙයි. එසේ විපන්නතණ්ඩුල ආදි දුර්ජරාහාර පරිභොග කරන්නාහු ආරෝහපරිණාහයෙන් වර්ණයෙන් ආයුෂයෙන් පිරිහෙති. අනෙකව්‍යාධීන් උපහත ශරීර ඇති වෙති. මෙසේ වූ මවුපියන් පිණිස උපන් ශුක්‍රශොණිත අල්පායුෂ්කතාදියට ප්‍රත්‍යය වන බැවින් එක් කාරණයෙක, මෙසේ කාරණවයකින් උපනනාවූ ශුක්‍රශොණිත ප්‍රත්‍ය වන බැවින් ඔවුන් පිණිස උපන් දරුවෝ අල්පායුෂ්ක වෙති වැලිත් ඔවුන් පිණිස උපන් දරුවෝ අල්පායුෂ්ක වෙති' අල්පායුෂ්කතාවට කාරණ දතයුතු මෙසේ වන බැවින් මෙසේ වූ කාලයෙහි උපන්නෝ මෙසේ අල්පායුෂ්ක වෙත්. මෙකි තාක් කාරණයට විපර්‍ය්‍යාස විසින් ආරෝහපරිණාහ වර්ණ ආයුෂාදියට ප්‍රත්‍යය දතයුතු.

• බුදුන් කෙරෙහි අනාදර නම් කවර? යත්:-යමෙක් දාගබ්වදනට නොයේද, චෛත්‍යාඞ්ගනයට නැඟෙන දාගැබ් වඳනාකල සේසත් හි සට කෙරේ ද, වහන් ලා යේ ද, දස බල බලා වදීද, අනුන් හා බැණ බැණ වදී ද, දෙ දසරුව වසාපොරොවී ද, දාගැබට පැනෙන තැන පය වහන් ලා සක්මන් කෙරේ ද, ස්තානයෙහි පවතී ද, මූත්‍රපුරීෂ

පවත්වා ද, දගැබට පැනෙන සේ උස්බිම සක්මන් කෙරේ ද, ඝටමහලේ ධාතු වඩා තබා උඩුමහලේ ලගීද; "මෙසේ කුමට? කෙරෙහි ද බුදුන් කෙරෙහි ලජ්ජා කටයුත්තේය"යි කී කල උදාසීන වේ ද, මෙසේ වූයේ බුදුන් කෙරෙහි අනාදර නම්. ශාරීරිකධාතුව යම් සේ පැවැත්ත යුත්තේ ද, එසේ ම පාරිභොගිකධාතු වූ මහාබොධි-පාත්‍රාදියදු උද්දෙසිකධාතු වූ ප්‍රතිමායෙහිදු පැවැත්ත යුතු.

## 52.

**ධර්මයෙහි අනාදර** නම් කවර? යත්:-යමෙක් බණ අසන්නට කල්හඬගෑ කල සාමණෙරයන් විසින් පිරිවරන ලදුව හිඳී ද, නවකර්මාන්තා'දිය කෙරේ ද, වහ වහා තුෂ්ට නො වේ ද, සකස් කොට නො අසා ද, බණපිරිස හිඳ නිදා ද, වික්ෂිප්තව අනුන් හා බෙණේ ද, සකස් කොට කියවා ගෙන නො හදරා ද, සකස් කොට නොකියා ද, "ධර්මයෙහි කුමට? අනාදර වෙහි"යි කී කල උදාසීන වේ ද, මෙසේ වූයේ "ධර්මයෙහි අනාදර" නම්.

## 53.

**සංඝයා කෙරෙහි අනාදර** නම් කවර යත්:- මහලු සඟුන් අවසර නො ගෙන බණ කියා ද, අවසර නො ඉල්වා ගෙන හිඳී ද, නො වැඳ හිඳී ද, හස්තපාදකෞකෘත්‍යයෙහි පවතී ද, අනුන් පුළුවුත් ප්‍රශ්න අවසර නො ගෙන කියා ද, ආසන්නයෙහි සැටී යේ ද, සිටී ද, හිඳී ද, අතින් හෝ පිළියෙන් හෝ අකවටු ගත්වා හිඳී ද දෙ දසරුව වසා පොරොවී ද, සත් වහන් දරා ද, "සඟුන් කෙරෙහි නිහරසර වනු නො යෙදේ"යි කී කල උදාසීන වේ ද, මෙසේ වූයේ 'සංඝයා කෙරෙහි අනාදර' නම්. මෙසේ වූ අනාදර එක් සඟකෙනෙකුන් විෂයෙහිදු කළ සංඝයා කෙරෙහි ම අනාදර කළා නම් වේ.

54.

අෂ්ටප්‍රකාරයෙකින් කුලයෝ විනාශයට යෙත්. කි සේය? යත්:-රජ්ජුරුවන් විසින් හෝ විනාශයට යෙත්. සොරුන් විසින් හෝ විනාශයට යෙත්. අග්නියෙන් හෝ විනාශයට යෙත්. උදකයෙන් හෝ විනාශයට යෙත්. සඟවා තුබූ ධනයට සම්ප්‍රාප්ත නො වීමෙන් හෝ විනාශයට යෙත්. මිනා කොට නො කරන ලද කර්මාන්තයෙන් හෝ විනාශයට යෙත්. ඒ කුලයෙහි උපන් කුලඅඞගාර වූ බාලයන් විසින් හෝ විනාශයට යෙත්. අනිත්‍යතායෙන් හෝ විනාශයට යෙත්. මෙසේ කුලයන්ට විනාශ කාරණ අටෙකි.

55.

කුසල් කරන කල දෙයවසතු – ප්‍රතිග්‍රාහකා'දීන් කෙරෙහිදු ලොභ උපයා ලොභ පරිවාර කොට කුසල් කළාහු නම් මහත් සම්පතදු ඇතිව ලොභී වෙති. දන් ගන්නවුන් කෙරෙහි සෑටී පරිජනයන් කෙරෙහි ද්වෙෂ පරිවාර කොට කුසල් කළාහු නම්[1] විපුලවූ පඤ්චකාම ගුණයෙහිදු පුත්‍රදාරාදීන් කෙරෙහිදු අභිරති නූපදනා පරිද්දෙන් ද්වෙෂී වෙත්. මොහී ව මොහ පරිවාර කොට කුසල් කළාහු නම් රාජ්‍යපදයට සම්ප්‍රාප්ත ව කතීව්‍යා'කාතීව්‍යය නො දන්නා පමණට මොහී වෙත්. දන් දී පශ්චාත්තාප උපයුහු නම්[2] මහත් භොගයට ද පඤ්චකාම ගුණයට ද සම්ප්‍රාප්ත ව ඒ අනුභව නො කට හැකි වෙති. 'ඒ අනුභව කරම්හ'යි සිතුදු ඔහට නූපද්දී.[3] දන් දී ත්‍රිවිධ චෙතනාව ශුඩ කට නුහුණුවාහු නම් පශ්චාත්තාපයට නො පත් වූහු නම්, මහත් භොග යශස් ඓශ්චර්‍ය්‍ය පඤ්චකාම ගුණයට සම්ප්‍රාප්තව එ සම්පත් සුවයෙන් අනුභව කෙරෙති. "එ අනුභව කරම්හ"යි යන සිතුදු උපද්දී.

1.වූහුනම් 2. උපයුවාහුනම් 3. නො උපදි

යම් තාක් ලෝකයෙහි අපද ද්විපද චතුෂ්පද බහුප්පද රූපි අරූපී සංඥී අසංඥී නෛවසංඥිනාසංඥී සත්ත්වයෝ ඇද්ද, ඔවුන් හැම දෙනහට තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධ අග්‍ර ය යි කියනු ලැබේ[1] එ සේයින් ම යම් තාක් කුශලධර්මකෙනෙක් ඇද්ද, ඔවුන් හැමදෙනහට අප්‍රමාද අග්‍රය. හැම කුශලධර්මයෝ අප්‍රමාද තමන්ට මුල් කොට පිහිට කොට ඇත්තෝ. පයින් ඇවිදුනා තාක් සතුන් පියවර ඇතුන්පියවර සංග්‍රහයට යෙයි ද, ඇතුන් පියවර හැම පියවරට අග්‍රවෙයි ද, එ සෙයින් ම යම් තාප් කුශලධර්ම කෙනෙක් ඇද්ද, ඔවුන් හැම දෙනහට අප්‍රමාද අග්‍රය'යි කියනු ලැබේ. යම්සෙයකින් කූටාගාරයෙහි හැම ගෝනසට කැණි-මඬල අග්‍ර වේ ද, යම්තාක් මූලගන්ධයට කළුවැල් අග්‍ර වේ ද, යම් තාක් සාරගන්ධයට ගෝසිස සඳුන් අග්‍ර වේ ද, යම්තාක් මල්ගඳට දූසමන් මල් ගඳ අග්‍ර වේ ද, යම් තාක් ගඞ්ගාවට සමුද්‍රය අග්‍ර වේ ද, යම් තාක් රජ්ජුරු-වන්ට චක්‍රවර්ත්ති අග්‍රවේ ද, යම් තාක් තරුපහනට සඳපහන අග්‍ර වේ ද, යම් සේ ශරත් කාලයෙහි නැගි හිරු සර්වා'කාශගත තමස් විධ්වංසනය කොට විරාජමාන වේ ද, එසේ ම සකල කුශලධර්මයන්ට අප්‍රමාදය අග්‍ර වෙ යි. සර්'කුශලධර්මයෝ අප්‍රමාද තමනට මූල් කොට පිහිට කොට ඇත්තෝ.

57.

අසත්පුරුෂයන් හා සංසර්ග පරිපූර්ණ වූයේ අසද්ධර්ම ශ්‍රවණ පරිපූර්ණ කෙරෙයි. අසද්ධර්මශ්‍රවණ පරිපූර්ණවූයේ සැදැහැ නැති බව පරිපූර්ණ කෙරෙයි. සැදැහැ නැති බව පරිපූර්ණ වූ යේ අයොනිසොමනස්කාර පරිපූර්ණ කෙරෙයි. අයොනිසොමනස්කාර පරිපූර්ණ වූයේ සිහි නුවණ නැති බව පරිපූර්ණ කෙරෙයි. සිහි නුවණ නැති බව පරිපූර්ණ වූයේ ඉන්ද්‍රියසංවර නැති බව පරිපූර්ණ කෙරෙයි. ඉන්ද්‍රිය සංවර නැති බව පරිපූර්ණ වූයේ ත්‍රිවිධ

1] ලැබෙයි.

දුශ්චරිතයන් පරිපූර්ණ කෙරෙයි. ත්‍රිවිධ දුශ්චරිතයෝ පරිපූර්ණ වූවාහු පඤ්චනීවරණධර්මයන් පරිපූර්ණ කෙරෙත්. පඤ්චනීවරණධර්මයෝ පරිපූර්ණ වූවාහු අවිද්‍යා පරිපූර්ණ කෙරෙත්. අවිද්‍යා පරිපූර්ණ වූවා භවතෘෂ්ණා පරිපූර්ණ කෙරෙයි. මෙසේ අසත්පුරුෂ සංසර්ග වශයෙන් ක්‍රමයෙන් පරිපූර්ණ වූ භවතෘෂ්ණා සංසාරසථානු කොට, භවබීල කොට, භවබීජ කොට, සංසාරයෙන් උඩුහුරු නො විය දෙයි.

සත්පුරුෂසංසර්ග වනාහි පරිපූර්ණ වූයේ සද්ධර්මශ්‍රවණ පරිපූර්ණ කෙරෙයි. සද්ධර්මශ්‍රවණ පරිපූර්ණවූයේ ශ්‍රද්ධා පරිපූර්ණ කෙරෙයි. ශ්‍රද්ධා පරිපූර්ණ වූවා යොනිසොමනස්කාර පරිපූර්ණ කෙරෙයි. යොනිසො මනස්කාර පරිපූර්ණ වූයේ, සමෘතිප්‍රඥ පරිපූර්ණ කෙරෙයි. සමෘතිප්‍රඥ පරිපූර්ණ වූවා ඉන්ද්‍රිය සංවර පරිපූර්ණ කෙරෙයි. ඉන්ද්‍රිය සංවර පරිපූර්ණ වූයේ ත්‍රිවිධ සුචරිතයන් පරිපූර්ණ කෙරෙයි. ත්‍රිවිධසුචරිතයෝ පරිපූර්ණ වූවාහු චතුර්විධ ස්මෘත්‍යුපස්ථානයන් පරිපූර්ණ කෙරෙත්. චතුර්විධස්මෘත්‍යුපස්ථානයෝ පරිපූර්ණ වූවාහු සප්තබොධ්‍යඞ්ගයන් පරිපූර්ණ කෙරෙති. සප්තබොධ්‍යඞ්ගයෝ පරිපූර්ණ වූවාහු ත්‍රිවිද්‍යාදී, අෂ්ට විද්‍යාදී, විමුක්තිදු පරිපූර්ණ කෙරෙති. මෙසේ පණ්ඩිතජනසෙවනයෙන් ක්‍රමයෙන් පරිපූර්ණ වූ විද්‍යා විමුක්ති නිරුපධිශෙෂනිර්වාණ ධාතුවට ප්‍රත්‍යය වෙයි. මෙතෙකින් සර්වසංස්කාරදුඃඛ[1] විනාශයට යෙයි.

59.

මෙසේ නානාප්‍රකාරයෙන් සිඩ කළ තාක් කුශල කර්මයෝද, අකුශල කර්මයෝ ද සතරෙක් වෙත්.

කි සේය? යත්:[2]–i ජනකයහ, ii උපස්තම්භකයහ; iii උපපීඩකයහ, iv උපඝාතකයහ යි. මෙහි i ජනකකර්මයෝ නම් කවරහයත්:– සුගතිය උපයන

1. සර්වසංසාරදුඃඛ. 2. කිසේවෙතියත්

කුශල කර්මයෝද, දුගතිය උපයන අකුශල කර්මයෝ ද සුගති දුගති දෙක සත්ත්වයන් ජනවන්නෙන්, උපයන්නෙන් ජනකකර්ම නම් වෙත්. ii **උපස්ථම්භකකර්මයෝ** නම් කවරහ? යත්:-සුගතිය ද, දුගතිය ද, ජනකකර්මයෙන් සත්ත්වයන් උපයු කල සුගතිය උපන්නන් සුවයෙන් නො පිරිහිය දී දුගතිය උපන්නන් දුකින් නො පිරිහිය දි ඒ ඒ භවයෙහි ආයුෂ පමණින් මහලු ගෙකක් නො හෙණු සඳහා ගැන් වූ උපස්තම්භ සේ සුව දුක් දෙක පවත්වන්නාහු උපස්තම්භක කර්මයෝ නම් වෙත්.

iii **උපපීඩකකර්මයෝ** නම් කවර හ? යත්:-කුශල කර්මයෙන් සුගතිය උපන්නන් සුව නො වින්දදී පෙළන අකුශලකර්මයෝ ද, අකුශලකර්මයෙන් දුගතිය උපන්නන් දුක් නො වින්ද දී, පෙළන කුශල කර්මයෝ ද සුව දුක් දෙක සන්තානව අවිරලව නො පැවැත්ත දී, පෙළෙන්නෙන් උපපීඩක කර්මයෝ නම් වෙත්.

iv **උපඝාතකකර්මයෝ** නම් කවරහ? යත්:- සුගතිය කුශල කර්මයෙන් උපද සුව විඳින්නවුන් ඵ සුවයෙන් පිරිහෙලා දුක් විඳුවන අකුශල කර්මයෝ ද, දුගතිය අකුශල කර්මයෙන් උපද දුක් අනුභව කරන්නවුන් ඵ දුකින් පිරිහෙලා සුව විඳුවන කුශල කර්මයෝද, ඒ ඒ කර්මයන් විසින් දෙන විපාක මැඩ තුමූහු විපාක දෙත් නො,යි උපඝාතක නම් වෙත්. මෙසේ කර්මයෝ සතරෙක් වෙත් විපාක පිණිස.

59

සර්වකර්මයෝ i ගුරුකර්ම ය, ii ආසන්නකර්ම ය, iii අභ්‍යස්තකර්ම ය, iv කෘතත්වාත්කර්ම ය යි විපාකවාර පිණිස සතරෙක් වෙත්.

i මෙහි **ගුරුකර්ම** නම් කවර? යත්:- දෙව්ලොව මිනිස්ලොව උපදනට තිසි යම් තාක් කුශලකර්ම ඇද්ද,

ධ්‍යාන හැව්වහු ඒ ධ්‍යානයෙන් නො පිරිහුණ හොත් සෙසු තැන නො උපද්දදී බඹලොව ඇර උපයන රූපාවචර අරූපාවචර කුශලකර්ම කුශලගුරුකර්ම නම්. බඹලොව දෙව්ලොව මිනිස්ලොව උපදනට නිසි යම් තාක් කුශලකර්ම කළවුත් එ හැම තැනින් පිරිහෙලා කපකුදු දවස් බුදුන්ට දන් දී මුත් බුදුන් ගසුන් කණ ගෙන සිටිය ද, එහි නො තැවතී අපායෙහි ඇර උපයන පඤ්චානන්තර්‍යකර්ම අකුශලගුරුකර්ම නම්.

ii ආසන්නකර්ම නම් කවර? යත්:-බඹලොව උපදනට නිසි මහද්ගතකර්ම ද, අනිවාර්‍ය විපාක වූ පඤ්චානන්තර්‍යකර්ම ද නැත් නම්, මරණාසන්නයෙහි තමා ප්‍රතිබද්ධ තාක් වස්තු සොම්නස් සිතින් බෙදා දෙන විසින්, වෛර ඇති තාක් දෙන කෙරෙහි ක්‍ෂමා කරන විසින්, අන්නපානවස්ත්‍රයානමාලාගන්ධවිලෙපනශය්‍යාවසථප්‍රදීපෙය්‍යාභරණධනධාන්‍යාදි දෙයවස්තු දන්දෙන විසින්, ගඳ මල් දුම් දද පිළි පහන් ආදීන් තුනුරුවන්[1] පුදන විසින්, පහන්සිතින් තුනුරුවන් සරණ යන විසින්, පන්සිල් අටසිල් දසසිල් ආදී සමාදන් වන විසින්, පින්කම් දෙන විසින් පින්කම් අනුමොවුනා[2] විසින්, බුදුන් විසින් දෙසූ නෛර්‍යාණික දහම් අසන විසින්, තුනුරුවන් ස්මරණය කරන විසින්, මෛත්‍රී කරුණා මුදිතා භාවනා කරන විසින්, සිරුරු[3] පිළිකුල් සේ දක්නා විසින්, මෙ පෙවෙත් අස්ථිර සේ දුක් සේ විසිය නො වැටෙන සේ මෙනෙහි කරන විසින් මෙසේ මරණාසන්න යෙහි කළ තාක් කුශලකර්ම ආසන්න භවයෙහි පිළිසඳ දේ නො, සි කුශල ආසන්නකර්ම නම්.

මෙසේ මරණමඤ්චකයෙහි හෙව යොනිසොමනස්කාරයෙන් පවත්නා පණ්ඩිතජනයනට කි සෙයින් කුසල් වඩී. යත්:-සවස් වේලෙහි මහත් පර්වතයෙහි ඡායා පෘථිවිය පැතිරෙමින් යම්සේ වඩී ද, එසේ ම

1.තෙසරණ 2. අනුමෙවුනා 3. සිරිරු

යෝනිසෝමනස්කාරයෙන් පවත්නා පණ්ඩිත ජනයනට කුසල් වඩී'යි දතයුතු. මෙ නයින් කුශල ආසන්නකර්ම දතයුතු.

ii **අකුශල ආසන්නකර්ම** නම් කවර යත්:-මරණාසන්නයෙහි තමාගේ ඇති තාක් වස්තුව ලෝභ උපයා "ඒ අන්නට නොවුව දහ''යි සිතන විසින් තමහට මෙහෙ කරන්නවුන් විෂයේහි අන්නපානවස්ත්‍රශයනාසනග්ලානප්‍රත්‍යාදි නො දෙන්නවුන් විෂයෙහි තමා ගැනිතාක් වස්තු නුදුන් සේ ගන්නවුන් විෂයෙහි වෛර උපයන විසින්, පුත්‍රදාරාදීන් කෙරෙහි බලවත් ලෝභ උපයන විසින්, කුසල් නො කෙළෙමි; අකුසල් කෙළෙමි''යි පළමු කළ තාක් පවු ස්මරණ කොට පශ්චාත්තාප උපයන විසින්, මේසේ මරණාසන්නයෙහි කළ තාක් අකුශලකර්ම ආසන්න භවයෙහි පිළිසඳ දේ නොයි අකුශල ආසන්නකර්ම නම්.

මෙසේ මරණ මඤ්චකයෙහි හෙව අයෝනිසෝමනස්කාරයෙන් පවත්නානට අකුසල් කි සේ වඩී. යත්:- සවස් වේලෙහි මහත් පර්වතයෙහි ඡායා පෑපිවිය පැතිරෙමින් යම්සේ පවතී ද, එසේ ම අයෝනිසෝමනස්කාරයෙන් පවත්නා බාලයනට පවු වඩී'යි දතයුතු. මෙනයින් අකුශල ආසන්නකර්ම දතයුතු.

iii **අභ්‍යස්තකර්ම** නම් කවර යත්:- පළමු වනුව විපාක දෙන ගුරුකර්ම ද, දෙවනුව විපාක දෙන ආසන්නකර්ම ද නැත්නම්, පණ්ඩිත ජනයන් විසින් එක්වන් සඳහන් කරන විසින් අභ්‍යාස කරන ලද සුගතිය උපයන කුශලකර්ම ද, බාලජනයන් විසින් එක්වන් සඳහන් කරන විසින් අභ්‍යාස කරන ලද දුගතිය උපයන අකුශලකර්ම ද සතතා'භ්‍යාස විසින් බලවත් කරන ලද්දහු ප්‍රගුණ වූවාහු තුන්වනුව විපාක දෙන අභ්‍යස්ත කර්ම නම්.

iv **කටත්තාකම්ම** නම් කවර? යත්:- යම්තාක් කම් මැඩ පළමු විපාක දෙන ගුරුකම් නැත්නම්, ගුරුකම් සිඩ නො කළාහට දෙවනුව විපාක දෙන මරණාසන්නයෙහි සිඩ කරන ලද ආසන්නකම් නැත්නම් උපත් තැන් පටන් ගෙන කුසල් එක්වන් සඳහන් කරන විසින් අකුසල් එක්වන් සඳහන් කරන විසින් බලවත් කරන ලද තුන්වනුව විපාක දෙන අභ්‍යස්ත-කම් නැත් නම්, මෙලොව හෝ පරලොව හෝ සිඩකරන ලද සුගති දුගති දෙ තැනින් එක් තැනෙක උපයන සතර වනුව විපාක දෙන්නට තිබි කම් කටත්තාත්-කම් නම්. මෙසේ කම්යෝ සතරෙක් වෙත්. මෙසේ දක්වන ලද චතුෂ්කද්වයෙහි අෂ්ටප්‍රකාර කර්මයන් විසින් සත්හු සුගති දුගති දෙ තැන උපද සුවදු, දුකුදු අනුභව කෙරෙත්.

60

ධර්මස්වභාවයෙහි අකොවිද බාලජනයන් රාගද්වේෂ දෙදෙන වර්ධනය කෙරෙත්. කි සේය යත්:-මෛත්‍රී ලෙශයෙන් රාග වර්ධනය කෙරෙයි. කරුණා ලෙශයෙන් ද්වේෂවර්ධනය කෙරෙයි.

කි සෙයින් මෛත්‍රීලෙශයෙන් රාගවර්ධනය කෙරෙයි යත්:- මෛත්‍රී භාවනා කරනුවන් විසින් "මම නිදුක් වෙම්වයි නිරොගි වෙම්වා"යි යනාදි විසින් පළමු තමන් කෙරෙහි මෛත්‍රී පතුරුවා, තමන් කෙරෙහි සුවයෙන් මෛත්‍රී පැවති කල "මම යම්සේ නිදුක් නිරෝගි වෙම්ද," එසේ ම 'බුඩරක්ඛිත' 'ධම්මරක්ඛිත' නිදුක් වේවා'යි නිරෝගි වේවා"යි යනාදී විසින් දෙවනු කොට තමහට ප්‍රියයන් කෙරෙහි මෛත්‍රී පතුරුවා, "යම් සේ 'බුඩරක්ඛිත' 'ධම්මරක්ඛිත' නිදුක් නිරොගි වේ ද, එසේ ම මා හා එක සෙනස්නෙහි වාසය කරනාහාක් දෙන ද, මට හිතයෝ ද, මැදහත් හු ද, අහිතයෝ ද, මා වසන

විහාරයෙහි හැමසත්හු ද, ගොචරග්‍රාමයෙහි හැම සත්හුද, මා වසන ගෙයි හැම සත්හු ද, මා වසන බුහුරුයේ[1] හැමසත්හු ද, හාත්පස ගම, මා වසන දනව්යෙහි, රට විපයෙහි, සතරමහ දිව, දෙදහසක් කුදිව, මේ සක්වළ හාත්පස සක්වළ, උඩ ද, යට ද, දශදිශායෙහි ද, ස්ත්‍රීහුද, පුරුෂයෝ ද, දෙවියෝ ද, මිනිස්හු ද, සතර අවාහි සත්හු ද, සියුම් අත් බැව් ඇත්තෝ ද, මහත් අත් බැව් ඇත්තෝ ද, පැනෙන සත්හු ද, නො පැනෙන සත්හුද, දුර වූ සත්හු ද, ආසන්නයෙහි වූ සත්හු ද, නිදුක් වෙත්වා'යි නිරෝගි වෙත්වා'යි ඔවුනො'වුන්ට වෙහෙස නොසිතත්වා'යි ඔවුනො'වුන්ට වෙහෙස නො කෙරෙත්වා''යි යනාදි විසින් මෙසේ පුරුෂයන් තමහට ප්‍රිය පුරුෂයන් කෙරෙහි පළමු මෛත්‍රි පතුරුවා, පසුව සාමාන්‍යයෙන් ස්ත්‍රීපුරුෂයන් කෙරෙහි මෛත්‍රි පැතිරවිය යුත්තේය. ස්ත්‍රීහුදු විසින් පූර්වෝක්තක්‍රමයෙන්, පළමු තමහට ප්‍රිය වූ ස්ත්‍රීන් කෙරෙහි මෛත්‍රි පතුරුවා, පසුව සාමාන්‍ය කොට ස්ත්‍රී පුරුෂයන් කෙරෙහි මෛත්‍රි පැතිරවිය යුත්තේ යි.

මෙසේ කළමනා මෛත්‍රීභාවනා කියන තැන "තමහට ප්‍රියයන් කෙරෙහි පළමු මෛත්‍රි පතුරුවන්නේ ය"යනු ගෙන "ස්ත්‍රීහු මට ප්‍රියයහ. එසේ, වන බැවින් ස්ත්‍රීන් කෙරෙහි මෛත්‍රි පතුරු වමි"යි පළමු ස්ත්‍රීන් කෙරෙහි මෛත්‍රී පතුරුවන පුරුෂද්, "පුරුෂයෝ මට ප්‍රියයහ. එසේ වන බැවින් පුරුෂයන් කෙරෙහි මෛත්‍රී පතුරුවමි"යි පළමු පුරුෂයන් කෙරෙහි මෙත්‍රි පතුරුවන ස්ත්‍රීද්, මෛත්‍රීලෙශයෙන් රාගවර්ධනය කෙරෙයි. මෙතයින් . ග්‍රීයමාණයන් විෂයෙහි මෛත්‍රීලෙශයෙන් රාගවර්ධනය දතයුතු.

මළවුන් විෂයෙහි වනාහි නිෂ්පයෝජනයෙන්ම රාග වෙෂ දෙදෙනාගේ උත්පත්ති දතයුතු. කි සේ ය? යත්:–

1. බුවරියේ

මළවුන්ගේ වර්ණශොභා ද, හස්තපාදාදී ශරීරසංස්ථානශොභා ද, මධුර වූ ශබ්ද ද, මෘදු වූ ශරීරස්පර්ශය ද, ඔවුන් විසින් තමහටවන අර්ථ ද, ස්මරණ කරනුවහට[1] බලවත්ව ගෘහාශ්‍රිතප්‍රෙම උපද්දී. ඉක්බිති "ඔවුන්ගේ මරණින් මෙතෙක්දෑ වැරැද්දූ"යි සිතනුවහට බලවත් දුක් දෙම්නස් උපද්දී. හදවත් පැළෙන පමණ ශොකපරිදෙව දුඃඛදෞර්මනස්‍යඋපායාසාදිදු උපද්දී. කාලක්‍රියා නොකළවුනුදුගේ වර්ණ ශොභා ද, හස්තපාදාදී සංස්ථානශොභා ද, මධුරවූ ශබ්බ ද, මෘදු වූ ශරීරස්පර්ශ ද, ඔවුන් විසින් තමහට වනතාක් අර්ථ ද, ස්මරණ කරනුවහට බලවත් ව ගෘහාශ්‍රිතප්‍රෙම උපද්දී. ඉක්බිති මෙ හැම උන්ගේ ,වියෝගයෙන් හෝ තමා කෙරෙහි ඔවුන් නො සිතිදු වීමෙන් හෝ වරදනා හොත්[2] මෙ හැම සිතා අයොනිසොමනසකාරයෙන් පැවත ප්‍රත්‍යවෙක්‍ෂාද අධිවාසනා ද නො කටහෙනුවහට බලවත් දුක් දෙම්නස් උපද්දී. හදවත් පැළෙන පමණට ශොකපරිදෙවදුඃඛ දෞර්මනස්‍යො'පායාසාදිදු උපද්දී. එයින් වදාළහ බුදුහු:- "පියජාතිකා හි බ්‍රාහ්මණ සොකපරිදෙවදුක්ඛදොමනස්සු'පායාසා පියප්පභුතිකා" යි -

"තණ්හාය ජායතී සොකො-තණ්හාය ජායතී භයං,
තණ්හාය විප්පමුත්තස්ස-නත්ථිසොකො කුතො භයං

රතියා ජායතී සොකො-රතියා ජායතී භයං,
රතියා විප්පමුත්තස්ස-නත්ථිසොකො කුතොභයං.

පෙමතො ජායතී සොකො-පෙමතො ජායතී භයං,
පෙමතො විප්පමුත්තස්ස-නත්ථි සොකො කුතොභයං"යි

බලවත් ශොක ව ,උපත මෙ පමණෙක් වෙයි. ඉදින් මෙයටද වඩා අධික වී නම්, මුඛයෙන් හුණුලේ නැඟෙයි. ඉතා බලවත් වී නම්, දවා හළු කෙරෙයි. එයින් වදාළහ. බුදුහු:-"තයො අග්ගී: රාගග්ගි, දොසග්ගි, මොහග්ගි"යි

---

1 කරන්නාහට 2. වරදහොත්

යම් සේ අනුකම්පායෙන් මෛත්‍රීභාවනා කරනුවන් මෛත්‍රී ලේශයෙන් රාගවශ්‍යවනය කෙරේ ද, එසෙයින් ම මරණයට සම්ප්‍රාප්තයන් කරා එළඹුණු අපරාධිතජනයන් කාරුණාලේශයෙන් ද්වේෂවශ්‍යවනය කෙරෙයි. ප්‍රාණවධ සිද්ධ කෙරෙයි. කි සේ ය? යත්:- අත්පා සිඳුනා ආදි කම්කටුල් දී දුක් දෙනු බලා කළකිරි "දුක් නො දී මරව"යි යමෙක් කී නම් ඔහු කිවා සේ මැරුවහොත් "දුක් නොදී මරව"යි කිවහුට ප්‍රාණවධය සිද්ධ වෙ.[1]

ගිලනුන් කරා එළඹ බලවත් දුක් විඳිනවුන් දැක මෙ දුක් විඳුනා බලාත් "මළ[2] මැනවැ" යි යමෙක් කී නම්, "මොහු කියනුයේ මැනවැ" යි. ගිලන් සිතින් ගෙන අහර නො වළඳනු ආදි අසැප තහමට කොටින් ගිනියෙහි බහාලූ මකුළුහුයක් කාළු වන් වන පමණ කලට ද තමා මළ මිනා වේලාවට පෙරට ව මෙළේ වි නම් මරණගුණ කිවහු විසින් ම මරණලද වෙයි.

බොහෝ කුසල් කළවුන් මියන්නට හොත් කළ "තෙපි බොහෝ කුසල් කළව. මේ ජන්මයෙන් තොපට ප්‍රයෝජන නැති. මැටිබඳනක් බිඳ පියා රන්බඳනක් ගන්නවුන් වැන්න ව. තෙපි මෙයින් චුතව දෙව්ලොව ඉපද දිව්‍ය සම්පත් අනුභව කරව"යි කී කල 'මොහු කියනු යෙදේ' යි අහර නො වළඳනු ආදි අසත්ප්‍රායෙන් පළමු කිවා සේ අල්පමාත්‍ර කලකට ද පෙරට ව මෙළේ වී නම් මරණ ගුණ කීවාහු විසින් ම මරණ ලදු වෙයි.

"බොහෝ කල් ගිලන්ව හෙව දුක් විඳ නො මියන්නේ ඉතා දුක් විඳියි. මෙලෙසින් මොහුට මනා නැති. එසේ වන බැවින් දුක් නෝ විඳ මෙළේ මැනවැ" යි මියන්නට නිසි ක්‍රියාවක් යමෙක් කළේ වී නම්, අපථ්‍ය වූ දෙයක්[3] වැළඳුයේ වි නම්, පළමු කිවා සේ ක්ෂණයකට ද පෙරට ව මෙළේ වී නම් මේ

1. වෙයි. 2. මෙළේ. 8. අපථ්‍යයක්.

ප්‍රයොග කළහු විසින් ම මරණලද වෙයි. යමෙක් ගිලනුන් කරා එළඹ බොහෝ අකුසල් කළවුන් ත්‍රාසව මියනු සඳහා නරකදුක් කියන්නේ වී නම්, බොහෝ කුසල් කළවුන් ආහාරෙ'පච්ඡෙදදි කොට මියනු සඳහා සවර්ගකථා කියන්නේ වී නම්, ඒ ප්‍රයොගයෙන් එව්හු පළමු කිවා සේ ක්ෂණයකට ද පෙරටව මියන්නාහු වූ නම් මෙසේ අනුශාසනා කළහු විසින් ම මරණලද වෙයි

සජ්ජනයන් විසින් යමක්හු මළ දන'යි යන සිත් නො ද කටයුත්තේය. එවැනි සිත් උපන් නම් ගිලනුන් හා යම් බසක් නො ද බිණිය යුතු මළ දන'යි යන සිත් ඇති වූ තැනින් මත්තේ පයනී-යෙනුදු කිව ප්‍රාණවධ සිඛ වන බැවින්.

## 61

ගිලනුන් කරා එළඹියන් විසින් "සිල්වත්නට අනුශාසනා කරන්. මෙසේ අනුශාසනා කටයුත්තේ යි: "සිල්වත්නට මාර්ගඵලප්‍රාප්ති කිසි ආශ්චර්යයෙක් නො වෙයි. එසේ වන බැවින් විහාරාදීය ආශක්ති නො උපයා බුද්ධානුස්මෘති ධර්මානුස්මෘති සංඝානුස්මෘති කායගතානුස්මෘති භාවනායෙහි අප්‍රමාද වනු මැනවැ"යි නො එසේ වූවානට ද් අනුශාසනා කරන් සිල්වත්නට මාර්ගඵලප්‍රාප්ති කිසි ආශ්චර්යයෙක් නො වෙයි. එසේ වන බැවින් මෙසේ නෙව ගිද සිට දවස් යවන කාලයෙහි "පන්සිල්, අටසිල්, දසසිල් දිවිහිමියෙන් අඛණ්ඩ කොට රක්මි" යි සිල් සමාදන් ව රැක්ක මැන ව. තුනුරුවන් මෙනෙහි කරනු මැන ව. ශරීරයෙහි ප්‍රතිකූලභාවය එක්වන් මනස්කාර කොට අශුභභාවනායෙහි යෙදී වාසය කරනු මැනව. ශරීරයෙහි උපන් දුකඛවේදනා ගෙන "නිත්‍ය

නො වන බැවින් අනිස. එක්වන් පෙළෙන බැවින් දුක තමා විසිය නො වැටෙන බැවින් අනාත්මය'' යනාදී විසින් එක්වත් විදර්ශනාභාවනා කරනු මැනව. තමා ගැනි තාක් සම්පත් පිළිවන් වුව දන් දුන මැනව. නො එසේ වුව ඉහි[1] ආලය ත්‍යාග කළ මැනව. පුත්‍රදාරාදි සවිඥනක අවිඥනකවස්තුදු සිතා සිතට දුක් නො එළවුව මැනව. ''ඔහු හැමදෙන තමතමන් කළ කර්මයෙන් උපන්නාහ. සුව විඳිනට නිසි කුශලකර්ම ඇත්තාහු වූහු නම් සුව විඳිති. නො එසේ වුව කනිවකුදු එයට කට හැකි නැති. ලාභ, අලාභ, අයශස්, යශස්, නින්දා, ප්‍රශංසා, සුඛ, දුඃඛ ලොකධර්ම ය'' යි සිතුව මැනව. අස්ථානයෙහි නො සිතුව මනා තාක් දෑ සිතන්නහු ශරීරය සුවයෙන් නො පවත්නී අනෙක අකුශලධර්මයන්ගේ උත්පත්ති වෙයි. යුක්තප්‍රාප්තස්ථානයෙහි එයට නිසි මනස්කාරයෙහි පවත්නා සඳහා සමාධාන ඇතිවන්නා හා[2] ශරීරය සුවයෙනුදු පවත්නී. කරනතාක් මනස්කාරයට ද ලැබෙයි. මෙසේ වන බැවින් සරණසිල් පිහිටා දන් ආදී පින්කිරියවන් පුරා යම් තැනෙක නො ඇලී නිවන් අධිගම කරනු මැනවැ'' යි 'මළදහ' යන සිත් නො උපයා අනුශාසනා කටයුතු.

''බොහෝ පවු කළම්හ. අපට සිල් නම් කිම? සමාධාන නම් කිම? අපට සවර්ග මාත්‍ර ද නො පිළිවන. නිවන් ම කොහි ලා ලැබෙ'' යි කියත් නම් ඔහු මෙසේ අනුශාසනා කටයුතු වෙති. ''එසේ නො කියව. තොප කළ අශුභයක් ඇත එ අනෙක් ම අවස්ථායෙකින් කරන ලද දූයක් බැවින් එ පියව. කළ තාක් ශුභ ස්මරණ කරව. දූත් තොප සිල් සමාදන්වූතැන් පටන් ගෙන සිල් නිර්මල බැවින් ''මාගේ සිල් සුපරිසුඩ ය'' යි සොම්නස් ඇතිව ප්‍රීතිප්‍රමොද්‍යයෙන් යෙදී තොප සම්‍යක්ප්‍රතිපත සිට

1. එහි. 2 ඇතිවෙයි.

සිල්සමාදන් වූ තැනින් මොබ ස්මරණ කරව'' යි කළ තාක් ගුණයෙහිදු, සමාදන් වූ සීලයෙහිදු, භාවනායෙහිදු, පිහිටවන පරිද්දෙන් අනුශාසනා කටයුතු.

62

ගිලනුන් විසිනුදු මෙසේ ප්‍රත්‍යවේක්ෂා කටයුතු: "කම්මස්සකාහි සත්තා අත්තනො කම්මානුරූපමෙව ගතිං ගච්ඡන්ති, නෙව පිතා පුත්තස්ස කම්මෙන ගච්ඡති, න පුත්තො පිතු කම්මෙන ගච්ඡති" යනාදි වදාළ බැවින් සත්හු තමතමන් කළ පින්-පවුකැමින් සුගති දුගතියට පැමිණෙති. පියා කළ කැමින් පුත් සුගති දුගතියට පැමිණෙන්නේ නො වෙයි. පුතු කළ කැමින් පියේ සුගති දුගතියට පැමිණෙන්නේ නො වෙයි. එසේ ම, බෑයා කළ කැමින් මලු කළ කැමින් නඟ කළ කැමින් බුහුන් සුගති දුගතියට පැමිණෙන්නී නො වෙයි. සියලු ම සත්හු කර්ම ම සම්පත් කොට ඇත්තාහ. කර්ම ම දායාද කොට ඇත්තාහ කර්ම ම යොනි කොට ඇත්තාහ. කර්ම ම නෑයන් කොට ඇත්තාහ. කර්ම ම සබඳුන් කොට ඇත්තාහ. කර්මම පිළිසරණ කොට ඇත්තාහ. කර්ම ම සතුන් හීනප්‍රණීතභාවයෙන් දෙකක් කොට බෙදයි. එබැවින් අප්‍රමාදව දත්පින්කිරියවත් පිරිය යුත්තේය. "පන්සිල්, අටසිල්, දසසිල් දිවිහිමියෙන් රක්මි'' යි සිල් සමාදන් විය යුත්තේය. තුනුරුවන් සඳහන් කරනු තුන්ලකුණු මෙනෙහි කරනු ආදි භාවනාමය පුණ්‍යක්‍රියායෙහි පැවැත්ත යුත්තේය. තමා ගැති තාක් හැම වස්තු පියා පරලොව යනු එකාන්තය. තමහට උපන් ජාතිජරාමරණාදි දුක නොබව.[1] "එ තොපට නො විය දෙම්හ'' යි වළකනුවෝ නැති. හැමසත්හු මරණයට යෙති. ධ්‍රැව වූ නිත්‍ය වූ එක්

1. දුක් නොබලව.

සතෙක් නැති. එ බැවින් ම "සියලු යොවුන් ජරා කෙලවර කොට ඇත්තේය. සියලු යොවුන් ජරා පර්‍ය්‍යවසාන කොට ඇත්තේය. සියලු නිරොගිබව් ව්‍යාධි පර්‍ය්‍යවසාන කොට ඇත්තේය. සියලු සම්පත් විපත්ති පර්‍ය්‍යවසාන කොට ඇත්තේය. සියලු ජීවිත මරණ පර්‍ය්‍යවසාන කොට ඇත්තේය" යි වදාළ බැවින් මේ අනිවාර්‍ය්‍ය ලොකයෙහි පැතෙයි[1]. මෙවෙනි තැන මා ජඩ නොවූව මැනව. "ජරාවට සම්ප්‍රාප්ත වීම්"යි ගිය යොවුන් පිණිස තාප නො ඉපයුව මැනව. "බලවත් ව්‍යාධියට සම්ප්‍රාප්ත විම්" යි ගිය නිරොගි බව් පිණිස තාප නො ඉපයුව මැනව. "අනාථ වීම්"යි විනාශයට ගිය සම්පත් පිණිස තාප නො ඉපයුව මැනව. ලොකයෙහි උපන් තාක් හැම සත්නට මරණ සාධාරණය. බුදුනට ද පවා වෙයි. මබඳහට නම් කුමට? නො වේද මෙසේ හැමසතුන් හා සාධාරණ, තමා හා හැම කල පුරුදු මරණ සිතා සිතට දුක් නො එලවනු මැනව. කර්මශක්ති ඇති තාක් කල් පවත්ති. නැති කල බුදුදහසුන් විසිනුදු කටහැකි නැති" යි මරණ පිණිස තාප නො ඉපයුව මැනව. "මිනිසත් බව් සුලභ නො වෙයි. කරනතාක් කුසලම පිහිටය. එබැවින් 'මරණ වුව දහ' යි පතනුදු නො යෙදෙයි. වුනමතා තාක් දුක් යම් තැනෙකදු උපන විඳුවයි. එසේ වන බැවින් මරණ සිතා සිතට දුක් නො එලවුව මැනව. කුසල් කළ මැනව. කළ තාක් කුසල් සඳහන් කළ මැනව. කයට සිතට දුක් නො වන පරිද්දෙන් තුනුරුවන් ස්මරණ කළ මැනව. ශරීරපීඩා උපන හොත් එගෙණ තුන්ලකුණු මෙනෙහි කළ මැනව. කිසි වනෙක නො ඇලුන මැන්වැ" යි මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කටයුතු. මරණාසන්නයෙහි කිසිතැනෙක ඇලුන හොත් ගති සුඛ නො වන්නේ ම ය.

1. පැමිණෙයි.

සැරියුත්මහතෙරුන් අනේපිඬු මහසිටුහු මියන්නට හොත් කල "කිම ගෘහපතිය! දුඃඛවෙදනා බලවත් නොවේ ද සිට සිටම තා වෙදනා නො වඩී ද"? යි පුළුවුත් කල වහන්සේ! දුක් සිට සිට බලවත් වෙයි. උනු නො වෙයි. මා හිස්මුදුන් පෙණමතින් විදුනා වැන්න. සියලු හිස සම්වරක් බැඳ එව පොලු ලා අඹරන්නා වැන්න. අතුනු කැපෙන සැතෙකින් කඩ කඩ කොට කපන්නා වැන්න. සියලු සිරුරු අඟුරුවළෙක පෙරළපෙරළා තවන්නා වැන්න" යනාදි විසින් තමා ශරීරයෙහි උපදනා තාක් දුක් කිය. එකල මහතෙරහු "තස්මා තිහ තෙ ගහපති එවං සික්ඛිතබ්බං: න චක්ඛුං උපාදිසිස්සාමි, න ච මෙ චක්ඛුනිස්සිතං විඤ්ඤාණං භවිස්සතීති. එවං හි තෙ ගහපති සිකඛිතබ්බං. තස්මාතිහ තෙ ගහපති එවං සික්ඛිතබ්බං: න සොතං-පෙ-න ඝාණං-පෙ-න ජිව්හං-පෙ-න කායං-පෙ-න මනං-පෙ-න රූපං-න සද්දං-පෙ-න ගන්ධං-න රසං-පෙ-න ඵොට්ඨබ්බං-පෙ-න ධම්මං-පෙ-න ඉධලොකං-පෙ-න පරලොකං උපාදිසිස්සාමි, න ච මෙ පරලොක නිස්සිතං විඤ්ඤාණං භවිස්සතීති-පෙ-යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි න උපාදිසිස්සාමි, න ච මෙ තං නිස්සිතං විඤ්ඤාණං භවිස්සතීති" යනාදීන් බණ වදාළහ. මහසිටු මේ බණ අසා වලප්නට වන. එකල සැරියුත්මහතෙරුන් හා පසු මහණව වැඩි අප අනඳමහතෙරහු "මහසිට! බා ගියෙහි ද කුමට වලප්හි" යි වදාළහ. එකල මහසිටි "වහන්සේ! මම බා වලප්නෙම් නො වෙමි. බුදුන් කරා බොහෝ කල් එළඹියෙමි. මනොභාවනීය වූ සඟනුදු කරා බොහෝ කල් එළඹියෙමි. 'මෙ වැනි බණක් නො ඇසූ විරිමි. "මෙ වැනි බණ මට පළමු කුමට? නො වදළ දූ.යි රැහැණිව වලප්මි" යි කිය. එසද සැරයුත්මහතෙරහු

"මහසිට! මේසගුත් කොරෙහි වැටෙ" යි වදාළහ. එකල මහසිව් "වහන්සේ! මෙ බණ මෙතැන් පටන් ගෙන ගිහිමිනිස්නට ද වදාරන්නේ ය" යි ආරාධනා කෙළේ යි. වදාළ බණ සේ යම් වස්තුවෙක නො ඇලී උපන් තාක් ශරීරවෙදනායෙහි නො සාළකිරි මනස්කාරයෙහි පැවත දෙව්ලොව ගොස් උපනී. මෙසේ වන බැවින් රූපස්කන්ධයෙහි ද, වේදනාස්කන්ධයෙහි ද, සංඥස්කන්ධයෙහි ද, සංස්කාරස්කන්ධයෙහි ද, විඥනස්කන්ධයෙහි ද චක්ෂුසෙහි ද, ශ්‍රොත්‍රයෙහි ද, ඝ්‍රාණයෙහි ද, ජිහ්වායෙහි ද, කායයෙහි ද, රූපාලම්බනයෙහි ද, ශබ්දලම්බනයෙහි ද, ගන්ධාලම්බනයෙහි ද රසාලම්බන යෙහි ද, ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි ද, මෙලොව ද, පරලොව ද, තමා විසින් ප්‍රාප්ත තාක් විෂයෙහි ද, පයෙෂීෂණ කළ තාක් විෂයෙහි ද, සිතින් සිතූ තාක් විෂයෙහි ද නො ඇලී බුඩානුස්මෘති ආදිය පැවැත්ත යුතු.

## 63

මෙසේ යමෙක් අප්‍රමාදව කුසල් කොට කළ කුසල් සඳහන් කරන්නේ වී නම්, භාවනාකරන්නේ වී නම්, ඕහට මරණාසන්නයෙහි කර්මානුභාවයෙන් ඔහු දන් දෙනු ආදි කුසල් කරන කාලයෙහි ඔහු විසින් දුන් අන්න පාන වස්ත්‍ර මාලා ගන්ධ විලෙපනාදි දානවස්තුව වණ් හෝ මනසට පැනෙයි. බණ ඇසුවානට ශබ්ද ද, ගඳ පිදුවානට ගන්ධ ද, අන්නපානාදි දුන්නානට රස ද, තිලිකන්වයින් දුන්නහුට ප්‍රෂ්ටව්‍ය ද මනසට එළෙයි. ඒ කාලයෙහි ඕහට උපදනා තාක් සිත් මෙසේ එළුනු ආලම්බනයෙහි පවත්ති. මේසේ වූ කාලයෙහි කර්මනිමිත්ත සිතට එළුනා නම් වෙයි. යම් කලෙක උපදනා භවයෙහි කල්පවෘක්ෂ උද්‍යාන විමාන දිව්‍යාඞ්ගනාවෝ පැනෙද් ද, එසේ වූ කාලයෙහි ගතිනිමිත්ත පැනුනා නම් වේ. යම් කලෙක කර්මනිමිත්ත ද, ගතිනිමිත්ත ද නොපෑනී කුශලකර්

තෙමේ ම පැනෙන්නේ වී නම් ඝම් එළනා නම් වේ. මෙසේ එළනු තුන් ආලම්බනයෙන් එක් ආලම්බනයක් මනසට වටහන කල[1] ඕහට උපදනා තාක් සිත් ඒ ආලම්බනය ගෙන උපද්දී. ඉක්බිති සතත නො පැහී සිටි ලෝභ ඒ ආලම්බනයෙහි ආස්වාද උපයයි. සතත නො පැහී සිටි මෝහ උපදනා භවයෙහි ජාතිජරා-මරණාදි දුක් මුහුණ බඳ කඩක් සෙයින් මූවහ කෙරෙයි. නො දුක්ක දෙයි. මෙසේ අවිද්‍යාව විසින් ආදීනව මූවහ කරන ලද භවයෙහි තෘෂ්ණාව විසින් නමන ලද්දේ පරතීරයෙහි සිටි ගසෙක බඳ බාණෙක එල්බ තමා සිටි තීරයෙන් පරතෙරට පැන පරතීරයෙහි පිහිටා සිටිනක්හු සෙයින් මේ භවයෙන් චුතව අනික් භවයේහි පිළිසඳ විසින් ගොස් පිහිටයි. මෙතෙකින් සුගතිපිළිසඳ දක්වන ලදී.

## 64

බුභුක්‍ෂා පිපාසා බලවත්ව ශරීරයෙහි බලවත් දුක් පවත්නා කාලයෙහි මනස්කාරයක් නම් කටහැකි ද? මේ ඉතා නො පිළිවන් නො? යත්:- හැමකල අප්‍රමාද විහාරී වූ ශරීර වශග නොවූ මහාපුරුෂයන්ට නො පිළිවන් නො වන බැවින් කිසි භාරයෙක් නො වේ යමෙක් උපදනා ශරීරවේදනායෙහි කළකිරෙන්නේ වී නම්, තමහට අන්නපානභෛෂජ්‍යාදි නො එළවූවත් කෙරෙහි මෙනෙ නො කළවුත් කෙරෙහි සැටෙන්නේ වී නම් ඕහට ම භාරවන බැවින්; මෙකී තාක් නැන ක්‍ෂමා ඇත්තවුන්, කිසිවක්හු කෙරෙහි අපේක්‍ෂා නො කරන්නවුන් කාබූන් මරණීන් සුගතිය උපදනා බැවින්. කිංසේය? යත්:- රද හැරපියාදු ගියවුන් අරණ්‍ය යතනයෙහි සෘෂිපැවිද්ව හැම කල සමාධාන-යෙන් වාසය කොට මරණසම්ප්‍රාප්ත වූ කල ශරීරයෙහි

---

1. කලක්සේ.

උපන් දුඃඛවේදනායෙහි නො කළකිරී හුදකලා වන බැවින් ම අනුන් කෙරෙහි "අත්තපාන නුදුන්හ. මෙහෙ නො කළහ" යි නොසැරී එයින් චුතව සුගතිය උපදනා බැවින් ක්‍ෂමා ඇත්තානට මෙසිදු විස්මයෙක් නොවේ. කි සේය? යත්:-

එක් මහ තෙරකෙනෙක් රාත්‍රියැ සක්මන් කරන්නාහු මනස්කාර යෙහි පැවත පය රුජා බෙහෙවින් දණින් සක්මන් කෙරෙති. මෙසේ සක්මන් කරන්නවුන් එක් වැද්දෙක් දැක මුවගොනෙකැ'යි සිතා විද්ද. එසඳ මහතෙරහු කවරෙක්ද? යි වදළහ. එසඳ වැදි සඟකෙනෙකුන් බව් දැන "වහන්සේ! මම වැද්දෙක්මි. මුව ගොනෙකැ" යි සිතා විද්දෙමි" කීය. මහතෙරහු "වැද්ද! නො බා අප කරා එ" යි කැඳවා ගෙණ විදිතැනින් ශ්වාස පවත්නෙන් භාවනාවට ශක්තිතැතිව "පුහුදුන්ව කාලක්‍රියා වුව නො යෙදෙ"යි සිතා ඔහුලවා විදිපහර පිදුරුකොළ ගන්වා විදිපහරින් ශ්වාස නො පැවැත්තදී "අප තා වෙරැ වතුරුවා ගෙණ හිඳැ" යි වදරා ඔහු එසේ කළ විද්දහු කෙරෙහි නො සැරී දුඃඛවේදනා තෘණලවයක් සේ ද නො ගෙන විදර්ශනා වඩා සතරමග සතර ඵලය උපයා නිරුපධිශෙෂනිර්වාණධාතුවින් පිරිනිවියහ.

එක් සඟ කෙනෙකුන් වගෙක් ගෙන සෙස්සන් තමා වළකන්නට නො පිළිවන් - තැනකට ගෙන ගොස් හොවා දෙපය පටින් ගෙන කන්නට ආරම්භ කෙළේයි.

යම් අහෙක පටන් ගෙන කන්නට ආරම්භ කළහොත් ඇටුදු නො තබා කනු වගුන්ගේ ධර්මතාය. මෙසේ කන කාලයෙහි පැවිද්දන් ගෙන යන්නන්[1]

1. සන්නේයි

වළකනු සඳහා වගුන් පස් පස් වැඩි සඟහු තමන් වළකන්නට නො පිළිවන් තැනෙක හොවා කන සේ දැක "මහාපුරුෂය! අප කට හැකි දෑ නැති. අප්‍රමාද වී මෙ වැනි තැන අධිගමයට වීර්‍ය කර" යි වදළහ. පැවිද්දෝ තමන් කන වගුකෙරෙහි භය ද, වෙෂ ද නො උපයා ඇට පටන් ගෙන කිලිල්කඩක් සේ බිඳැ කන කල බලවත් ව උපන් දුක් තෘණලව සේ ද නො හැඟ ශීලවිශුද්ධි ආදී වූ සප්තවිධශුද්ධිපරම්පරායෙන් ගොස් පිඩිමස් නො කන තුරු සෝවාන්මගඵල උපයා, කළවේ මස් නො කන තුරු සෙදගැමිමගඵල උපයා, නාභිමස් නො කන තුරු අනාගැමිමගඵල උපයා, හදමස්[1], නො කන තුරු අර්හත්මගඵල උපයා, හැමසසරදුකින් මිදී, තමන් රාත්වූ සේ කියා උදන් ඇනූහු.

මෙසේ මහාපුරුෂයෝ තමන් මෙ වැනි මහාව්‍යසනයට සම්ප්‍රාප්තවූ කල එහි නොකළ කිරී ලොකොත්තර ධර්මසමධිගම කෙරෙත්. මෙ වැනි වීර්‍ය්‍ය බලවත් ශරීරයෙහි උපන් දුක් අධිවාසනා කොට ත්‍රාස නොව මනස්කාරයෙහි පවත්නා පමණෙකින් ගන්නා ස්වර්ග කළ කුසල් ඇත්තහට කිසි විස්මයෙක් නො වෙයි.

65

කර්ම, කර්මනිමිත්ත, ගතිනිමිත්ත තුන් ආලම්බනය සමාධානයෙන් මියනුවනට එළෙයි[2]. පමාව සිටියත් යම් කලෙක නො දන්නා සේ එකාවට හිස් සිඳුනාහු නම් මෙ වැනි කල කර්ම නිමිත්තාදි එළෙනු එ ගෙන් සිත්, පවතිනු පසුව එහි ආග්‍රහ කරනු එක්බිති එසේ ගත් ආලම්බන ගෙන පිළිසඳසිත් උපදිනු[3] නො පිළිවන් නො? යත්:– මේ කිසි විස්මයෙක් නො වෙයි මෙහිදු ලස බෙහෙව යම් කලෙක කිණිහිරි–

1. හදවත්. 2. මියන්නට එළවයි. 3. උපදනේ·

මුදුනෙහි මැස්සක්[1] හුණහොත් කුළින් එකවට පැහැර මරාපියන කලුදු කම්, කම්නිමිත්ත, ගතිනිමිත්ත එළඹුනු කල එ ගෙණ පළමු කී ක්‍රමයෙන් ම මියන බැවින්.

මෙසේ මියනුවන්ගේ චක්ෂුරින්ද්‍රිය ද, ශ්‍රොත්‍රෙ'න්ද්‍රිය ද, ඝ්‍රාණෙන්ද්‍රිය ද, ජිහ්වෙන්ද්‍රිය ද, ප්‍රතිසන්ධි දුන් කම්යෙන් අන්‍ය කම්යකින් වූයේ නම් ඒ ඉන්ද්‍රියයෝ ද, ඒ ආශ්‍රය කොට පවත්නා චිත්තයෝ ද, පළමු විනාශයට යෙති. ඒ කාලයෙහි නො ද දක්ති. නො ද අසති. හැම අඟ මිය හදවත් මතු ආශ්‍රය කොට සිත් පවත්ති. ඉක්බිති මරණ වෙයි. කුමක් සේ ය යත්:- වියලෙන්නට අව්වෙහි කපා බහාලූ තල්පතක් හැමතැනින් වියලී පත්මුල මතු ආර්ද්‍රව තිබී පසුව එහිදු ආර්ද්‍රභාවය නැති වන්නාසේයි යම් කලෙක පිළිසිඳ දුන් කම්යෙන් චක්ෂුරින්ද්‍රියාදීහු උපන්නාහු වූහු නම් ඔවුන්ගේ පළමු විනාශ නැති.

තමන් බලා ප්‍රසාද උපයනු සඳහා වඩා තුබූ බුඩරූප දක බුදුගුණ ස්මරණ කරන්නාහු, පුදනු සඳහා එළවූ පුෂ්පාදි දක තුනුරුවන් පුදනු ආදි විසින් කුසල් පුරන්නාහු, තමන් අසනු සඳහා කියවන බණ අසා ප්‍රසාද උපයා කුසල් පුරන්නාහු තමන් පුදනු සඳහා එළවූ ගන්ධාඝ්‍රාණය කොට එ තුනුරුවන් පුද, කුසල් පුරන්නාහු, තමන් දන් දෙනු සඳහා එළවූ අන්නපානාදිය වළඳ බලා ඉතාම්ධුරයහ 'මෙවෙනි පිනක් සිඩ වන සේ ය' යි එ දන් දෙවා කුසල් පුරන්නාහු තමන් දන් දෙනු සඳහා එළවූ සිනින් පිළි ආදී අතින් පිරිමැද බලා "ඉතා ස්පර්ශ-සම්පන්නය, මෙ වැනි කුසල් සිඩවන සේ ය" යි එ දන් දෙවා කුසල් පුරන්නාහු ඉන්ද්‍රියවිකල නැති ව එකවට ම රූපජීවිතෙන්ද්‍රියයන්ගේ විනාශයෙන්

1. මැස්සක.

මරණට පැමිණෙත්. මෙසේ චුතවූවාහු ඉදින් මිනිස් අත්බැවෙක උපදනෝවූහු නම්, කම් කම්නිමිත්ත දෙක විශෙෂ නැති. ගතිනිමිත්ත වූ කල මවුකුස පැනෙයි. මෙසේ පැනුණු මවුකුස උපදනෝ කි තෙක් කාරණයෙන් උපදිති යත්:-

"මාතාපිතරො සන්නිපතිතා හොන්ති. මාතා ච උතුනී හොති. ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති. තිණ්ණං සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති" යි ආබැවින් මෛතුන් කාරණයෙන් ගබ පිළිසිඳ ගනී. මෙහි 'මාතාපිතරොසන්නිපතිතා හොන්ති,' යනු පිතෘහුගේ ශුක්‍ර සඳහා කීයේය. 'මාතා ච උතුනී හොති' යනු මවගේ උතුනීලේ සඳහා කියේය. උතුනීලේ කි සෙයින් වෙ' යි යත්:- මවුකුස ගැබ පිහිටන තැන කරඹපකක් සා ලේවත් පිළිකයෙක් පැනී සත්දවසකින් මහත්ව වැටකොලු පකක් සා ව පැනී සිල්ව තුන්දවසක් ශ්‍රව වෙයි. එ කල්හි ගැබ පිළිසඳ ගත ද, ශ්‍රවලේ හා ම යෙයි. සතරවන ද පටන් ගෙන ශුඩ වූ වස්තුව සතියක් හෝ දෙපෝවරක් හෝ පිළිසඳට පිහිට වෙයි. ගන්ධබ්බො ච' යනු 'ගන්තබ්බො'සි යේ යි. පිළිසඳට යනු යේ යි. මෙයින් පිළිසඳ ගන්නා සත්නු කියත් මෙසේ මෙ තුන් දෙනාගේ සන්නිපාතයෙන් ගබ පිළිසඳ ගනී. මෙසේ පළමු වූහුටු පිතෘහුගේ ශුක්‍ර සත්දවසකට ප්‍රත්‍යය වන්නේ යි. බුදුන්මෑණියන් පුරුෂසංගති නැති ව පෙහෙව හොත් කල බෝසතුන් පිළිසිඳ ගත්තෙන් ද, වෙහෙරළදෙවිබිසවුන් සහ අරම සිට රජගෙට එනු වත් අතරමගලා ගර්භිණී වූයෙන් ද පියාගේ ශුක්‍ර ප්‍රත්‍යය වනු භූයොවෘත්ති අපෙක්ෂායෙන් කීයේය.

උතුනීකාලයෙහි මවගේද ශුක්‍රයෙන් පිළිසඳ වෙයි. කි සේය යත්:- පුරුෂයන් හා සංරක්ත ව කායසංසර්ග සමවදනා වේලෙහිදු, රාගචිත්තයෙන් නාභිපරාමර්ශණ

අධිවාසනා කරන වේලෙහිදු, රාගචිත්තයෙන් පුරුෂයන් බැලීමෙනුදු, පුරුෂයන්ගේ ශබ්දයෙහි උපන් රාගයෙනුදු, ගන්ධාඝ්‍රාත කොට උපන් රාගයෙනුදු මවගේ ශුක්‍ර චලිත වෙයි. එසේ චලිත වූ ශුක්‍ර ද ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වන බැවින් මවගේ ශුක්‍ර ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙ' යි දතයුතු.

කී පමණ රූපයෙක පිළිසඳසිත් උපද්දී යත්:- පූර්වෝක්ත ක්‍රමයෙන් නිර්දිෂ්ට රුධිරශුක්‍ර දෙක පිහිට කොටින් හිමාලයෙහි ගබසලා පී පුපුලුපැටවකු රෝමයක් ගෙන පහන්තලතෙල ගලා සත්වටෙක සලා පි කල ලොම් අග සිටිනා චක්ෂුසට අවිෂය වූ තෛලබින්දුවක් පමණ කලලරූපයෙහි පිළිසඳසිත් උපද්දී. මෙ වැනි අවස්ථාවෙහි දී පිළිසඳසිතට ඉක්බිති ව තුදුස්භවාඞ්ගයක් උපන් කල පිළිසඳසිත් ඇසුළු කොට සොළොස්වනුව ජන්මලාභ පිණිස ආවර්ජන උපද්දී. සතළොස්වනුව භවනන්දනය කෙරෙමින් ආත්මග්‍රහණ උපයමින් හා "ජන්මලාභ ලදිමි"[1] ලොභසම්ප්‍රයුක්ත සිත් උපද්දී. මෙ නයින් ප්‍රතිසන්ධික්ෂණයෙහි උපන් රූප බිඳෙන කල ඒ හා එක් ව භවනිකාන්ති උපද බිඳෙ' යි දතයුතු. මෙසේ උපන් කලලරූප ක්‍රමයෙන් බොහෝ ව පහන්තලතෙලිත්තක් වැනි වෙයි. ඉක්බිති මස්දෙව්දියත්තක් වැනි වෙයි. ඉක්බිති බොල් කොට පක් ලත්තක් වැනි වෙයි. ඉක්බිති මේ කලල රූපය හැසී 'මුරුතමල්කැකුළක් වැනි වෙයි. ඉක්බිති මෙසේ වූ මාංසපිණ්ඩයෙහි තැනි පස්පොළක් වෙයි. දෙඅත් දෙපා හිස් කෙරෙයි. ඉක්බිති ක්‍රමයෙන් අතුල් පතුල් ඇඟිලි කන් නාසාදි ඇති වෙයි. මඩ අතුරෙන් යන තෙලුඹුදලි සේ ඇටදු නහරදු හට ගන්නී. දියෙහි ඔද සේ සමුදු හටගනී. දියෙහි හිඳුනා සෙවෙල් සේ වෙරළු ලොමුදු

1. ලදින්.

හටගනී. පිළඹුරු සේ හිසකෙසෙදු හටගනී. මෙසේ ක්‍රමයෙන් වැඩ පරිපූර්ණසතුත්වනු[1] එකළොස්සතියකින් වෙ' යි දතයුතු. මෙසේ උපනුයේ මව විසින් වළඳන ලද අන්නපානාදීන් යැපෙනුයේ මව වැළැඳූ අන්න-පානාදි සිටිනා ආමාශය හියින් උපුලනුයේ. ආමාශයෙහි සිටි අහර සැඩොල්ගමෙක ගවරවළෙක බක්මස මහ අව්වෙහි නානාකෘමිකුලාකුල ව පෙණ නැගී පැසෙන ඇටකඩ සම්කඩ අශුචිමූත්‍රාදිය ගඳැල් පැසෙන්නාසේ පැසී අතුනු නොස්සේ ගොස් නාභිය ගුදය හා දෙඅතුරෙහි අටඟුලක් පමණ තැන තළෙක පිරූ පඬුමැටියක් සෙයින් අශුචිව[2] සිටී මෙසේවූ අශුචි සිටිනා[3] පක්වාශය මත්තේ හිඳුනේයි. මව ඇල්අහර වැළැඳූ කල සිහිලෙන්, පෙළෙනුයේ හුණුඅහර වැළැඳූකල වෙයගඬක් සේ හිඳෙනුයේ, ඇඹුල් යුතු කුළු අහර වැළඳූ කල ඒ ඒ රසානුකූල දුක් විඳුනේ, දෙඅත් දෙපා වක් කොට දැලෙක තිරු වූ මසක්හු සෙයින් දළඹියෙන් වළඳනා ලදුව මව වසට දසාව බලා හිඳුනේ, මව ගමන් යන කල දෝලායෙක්හි හුන්නක්හු සෙයින් පාරණ කල අහසට නඟා බිමපහරණ ලදුවකු සෙයින් මෛථුනයෙහි පවත්නා කල්හි දියෙන් තගා හුණුවැල්ලෙහි බහාලූ මසක්හු සෙයින් මහදුක් විඳුනේ, අඳුරුසෙයට ලෝ ඇඳිරිමහානරකයක් වැනි, දුර්ගන්ධ-සෙයට සොළොස්හැවිරිදි මවක වූව හොත් සොළොස් හවුරුද්දක් නො දැගි කුටිගෙයක් වැනි, සතළිස් හැවිරිදි මවක වූවහොත් සතළිස් හවුරුද්දක් නො දැගි කුටිගෙයක් වැනි, නිරයට දහ ගෙයක් වැනි මවුකුස "මෙදුක්හින් කවර කලෙක මිදෙම් හෝ" යි සිතනුයේ, දසමසක් හෝ එයින් වඩා හෝ වාසය කොට ප්‍රසව කාලයෙහි කර්මජවාතයෙන් පැහැරු පෙරළා පියන කල මහත්පර්වතයෙකින් හෙලා පියන ලදුවකු සෙයින්

1. පරිපූර්ණායතනවනු. 2. පඬුමැටියේ 3. සිටුනා

ත්‍රාසව බලවත් දුක් දෙම්නස් විඳුනෝ, සරස් ව හුණ හොත් සැතින් කඩකඩ කොට කඩනු ආදි දුකට සම්ප්‍රාප්තව නො එසේ වුව හොත් කෙසිවිදකින් අදනා තහඹ ඇතක්හු සෙයින් සම්බාධස්ථානයෙහි මහදුක් විඳී යනාදි ගර්භමූල වූ නානාප්‍රකාර වූ මහදුක් විඳැ ප්‍රසවයෙන් මත්තේ වායුඋෂ්ණ ස්පර්ශාදීන් ක්ෂුරධාරායෙන් කඩන ලදුවකු සෙයින් දුක් විඳි යනාදී ප්‍රසවමූල වූ අනෙක දුක් විඳ ජිඝච්ඡිතානිජ්ජිතසම්විෂයෙහි ම රොදන මුත් සරණ නැති ව රාත්‍රිඤ්දිවයෙන් ශය්‍යා මුත් ඉරියව් පිරිවැටිලි නැති ව ස්වකීය මලමූත්‍රාදීන් ම්‍රක්ෂිතව නිෂද්‍යාවස්ථායෙහි පවත් ගෙන දශවසී දක්වා නිත්‍යසම්මූඪ ව එයින් මත්තේ කර්තව්‍යාකර්තව්‍ය බෙද දන්නට නිසි වෙයි. මෙතෙකින් මනුෂ්‍යලොකයෙහි ප්‍රතිසන්ධි දක්වනලදී.

මෙසේ වන බැවින් නරක, තිර්යක්, ප්‍රෙත, අරූප අසංඥ සත්ත්ව, ප්‍රත්‍යන්තදෙශ, ඉන්ද්‍රියවෛකල්‍ය, මිථ්‍යාදෘෂ්ටි යන අෂ්ටදුෂ්ටක්ෂණ වර්ජිත වූ නව වන බුද්ධොත්පාදක්ෂණයට සම්ප්‍රාප්ත වූ පණ්ඩිතජනයන් විසින් අන්ධබාලජඩදුර්මේධ චතීගාමී සංසාරස්ථාණුකාෂ්ඨාධ්‍යාශය ශඨ මායාවී මිථ්‍යාදෘෂ්ටික නාන පාපවශ්‍යක ආත්මාභිපරාභිපරාම්මුඛසද්ධර්මවිමුඛ ලොකොත්තර ප්‍රතිපක්ෂබාලජනයන් කෙරෙන් දුරුව, පරිශුද්ධශීලාචාර ඇති ශුචිශුභශුද්ධාජීව ආශයසංශුද්ධ සද්ධර්මාභිමුඛ ප්‍රාඥ සම්‍යග්දෘෂ්ටික ආත්මාභිපරාභිසමර්ථ පරමදුර්ලභ කල්‍යාණජනසෙවනයෙන් සර්ව ලෞකිකලොකොත්තරහිතසුඛදායක වූ සම්‍යක්ප්‍රතිපත පැවත සංසාරදුඃඛයෙන් ක්ත වියයුතු.

පවු කළ පුද්ගලයන්ට වනාහි ඒ ඒ පවුකරන කාලයෙහි උප කාරණ වූ හී දුනු තෙප් වරදල් ආදී පැනෙත්නේ වී නම් කර්මනිමිත්ත එළනා නම් වෙයි.

වලඋපදනානට වල්, දියෙහි උපදනානට දිය, නරකයෙහි උපදනානට නරකගිනි ආදි පැනෙන්නේ ඒ නම් **ගතිනිමිත්ත එළිනා** නම් වෙයි අකුශලකර්මයෝ තුමූහුම පැනෙන්නෝ වූහු නම් **කර්ම** තෙමේ ම එළිනා නම් වෙයි. මෙසේ එළිනු කර්මනිමිත්තාදි ගෙන දුර්ගති ප්‍රතිසන්ධි වෙයි. මෙහි අවශිෂ්ට සවරූප සුගතිප්‍රතිසන්ධිය උක්ත නයින් දතයුතු.

තිර්‍ය්‍යක් ප්‍රෙත අසුරකායෙහි උපනුවන්ගේ විතිස කරනුවෝ නැති. ආයුක්ෂය, කර්මක්ෂය, උභයක්ෂය වන තාක් සිටිති. බලවත් අකුශලකර්ම කොට ඇතුළු- නරකයෙහි උපනුවනුදුගේ විතිස කරනුවෝ නැති.

ඒ ඒ නරකයෙහි ආයු පමණින් පැසී කර්ම නො ගෙවුන හොත් නැවත මහානරකයෙහිම බහාලනු ලැබෙත්. දුර්වලවූ පාපකර්මයෙන් උපදනෝ වනාහි ඇතුළුනරකයෙහි නො උපද පිටත උපදිති. මෙසේ උපන්නන් යමපල්හු දැක "අභිනවසත්හු උපන්හ. පවුකළ සත්හු මෙහි උපදනාහ. එබැවින් මොවුන් යමමහරජහු කරා ඇර දක්වම්හ" යි සිතා සභාණ්ඩයෙහි ගත් සොරුන් සෙයින් තිරු කොට ම යම ර කරා ගෙන යෙත්.

**යමපල්හු නම් කි සේ?** වූහ[1] යත්:- සොරුන් මරණ කම්කටුල් දෙන දරුණු මිනිසුන් සෙයින් ම පාපබලයෙන් නරකයෙහි උපද පවු කළනාට කම්කටු දෙන සත්හු යම්පල්හු නම් වෙත්.

**යමරජ්හු නම් කිසේ වූහ යත්:-** ඔහු විමානප්‍රෙතයහ. කලෙක් පාපඵල අනුභව කෙරෙති. කලෙක් නරකයෙහි උපන් සතුන් විචාරා කුසල් කළ සතුන් සුගතියට පමුණුවති. එහු නරකයෙහි සතරදෙර

1. කෙසේ දු ව,හ.

සතරදෙනෙක් වෙති. ධර්මිෂ්ඨයහ. තමන් කරා (ඇරැ) දක් වූ නෙරිසතුන් පුළුවුසිත්. කී සේය? යත්:- මන්ද වූ උත්ථානසෙය්‍ය වූ ස්වකීයමලමූත්‍රාදීන් ම්‍රක්ෂිත ව මහදුක් විඳිනා ළදරුවන් දුටු ද නානාව්‍යාධින් උපහත ව[1] මහදුක් විඳුතන්, විනාශයට ගිය යොවුන් ඇති ව ජරාජීර්ණවූවන්, කාලක්‍රියා කළවුන් දුටු ද යනාදී විසින් දෙවදූතසූත්‍රයෙහි උක්තක්‍රමයෙන් පිළිවිස මෙකී නාක් විරාගකාරණවස්තු දැක කුසල් කළ නාක් දෙනාගේ කුසල් සඳහන් කරවති. එසේ සඳහන් කරවන කල කුසල් කළ සත්හු වූහු නම් තමන් කළ කුසල් සඳහන් කොට නරකයෙන් චුතව සුගතිය උපදිති. මෙසේ පුළුවුස්නා කල සඳහන් නො කටහෙත් නම් යමමහරජ තමා ඔවුන් කළ කුසල් දන්නේ හොත් තෙමේ ඔවුන් සඳහන් කරවා සුගතියට පමුණුවයි. එසේ සඳහන් කරවන්ට නිසි කුසල් නැත් නම් ''නරකයෙහි දුක් විඳින්ට නිසි මේ පවුකම් තොප මවුන් (නොදකෙළේය) තොප පියන් නො ද කෙළේය. බෑයන් නො ද කෙළේය. බුනුණන් නො ද කෙළේය. නඟුන් නො ද කෙළේය. නෑයන් නො ද කෙළේය. මිත්‍රයන් කෙළේය. නොද කෙළේ ය. ශ්‍රමණබ්‍රාහ්මණයන් නො ද තොප ම කළ පව තෙපි ම එහි විපාක විඳුව'' යි රැනැණිව හඬවා, කරබා ගනී. එකෑ වටා සිටි යමපල්හු ඔවුන් තිරැ කොට ගෙන නරකයෙහි බහා පියත්. මෙතයින් අපායොත්පත්ති දතයුතු.

66

මනුෂ්‍යයෝ ද, තිර්යග්ගතයෝ ද, අණ්ඩජ වෙත්මය. ජලාබුජ වෙත් ම ය. සංසේද ජ වෙත් ම ය. උපපාදුක වෙත් මැ යි. ප්‍රේතයන් කෙරෙහිදු ඇතැම්හු ජලාබුජ වෙති. ඇතැම්හු උපපාදුක වෙති. නිද්ධ්‍යාම තෘෂ්ණිකප්‍රේතයෝ වනාහි නිත්‍යයෙන් කුක්ෂිය

1. ගැටපතව.

දිලිහෙන අග්නින් දන කුස් ඇති වෙති. එබැවින්ම ඔහු ගර්භග්‍රහණ නො කෙරෙත්. නරකයෙහි වනාහි ඖපපාදුක ව උපදිත්.

67

මනුෂ්‍යාදීනට වාසස්ථාන වූ සක්වළ දිග හා පළල දොළොස්ලක්‍ෂතුන්දහස් සාරසියපණස්යොදුන්, වටා සතිස් ලක්‍ෂ දසදහස් තුන්සියපණස් යොදුන්, පස් පොළොව දෙලක්‍ෂසතළිස්දහසය. එ යට දිය පොළොව සාරලක්‍ෂ අසූදහසය. එ යට වාපොළොව නවලක්‍ෂ සැටදහසය. ඒ වාපොළොව අජටාකාශයෙහි පිහිටියේය. එහි 'ජටා' නම් සංස්කාරධර්මයහ. ඔවුන් නැත් හෙයින් හේ අජටාකාශ නම් වී. මෙසේ දක්වූ වාපොළොව මත්තෙහි දියපොළොව පිහිටියේය. දිය පොළොව මත්තෙහි පස්පොළොව පිහිටියේය. පස් පොළොව මැද සලපොළොවය. ඒ සලපොළොව මත්තෙහි ත්‍රිකූටය පිහිටියේය. ත්‍රිකූටය මත්තෙහි මෙර පිහිටියේය. මෙරයට ත්‍රිකූටමධ්‍යයෙහි දසදහසක් යොදුන් අසුරපුරය. මෙර උස එක් ලක්‍ෂඅටසැටදහ-සක් යොදුන. පළල සුවාසූදහසක් යොදුන. පැදුම් මුහුණ රිදීමුවාය. දකුණුමුහුණ මිණිමුවාය. පැළ මුහුණ සඵටික මුවාය. උතුරුමුහුණ රන්මුවාය. මෙරින් සුවාසූදහසක් යොදුනට දුරුව ගැඹුරෙහි සුවාසූ දහසක් යොදුන. පත්ලෙහි සත්රුවන් වැලි ඇති මොනරපිල් බහාලූව් ගැලෙන පමණ ප්‍රසන්න වූ සීදන්‍තා මහාසාගරය. එ වටා යුගන්ධරපර්වතය පිහිටියේය. යුගන්ධර පර්වතය වටා ඊශධරපර්වතය පිහිටියේය. ඊශධර්පර්වතය වටා කරවීකපර්වතය පිහිටියේය. කරවීක පර්වතය වටා සුදර්ශනපර්වතය පිහිටියේය. සුදර්ශන පර්වතය වටා නෙමින්ධරපර්වතය පිහිටියේය. නෙමින්ධර පර්වතය වටා විනතකපර්වතය පිහිටියේය. විනතක පර්වතය වටා අශ්වකර්ණපර්වතය පිහිටියේය. මේ සත්පර්වත .

යෙහි ආදිපර්වතය උස සුවාසූදහසක් යොදුන. දෙසාළිස් දහසක් යොදුන් දියෙහි ගැලී සිටියේය. එයින් අඩිය ඊෂධරපර්වතය. ඊශධරපර්වතයෙන් අඩිය කරවීකපර්වතය. මෙනයින් තුඹුපර්වතයෙහිදු අඩාඩහානි දතයුතු. මේ සප්තපර්වතයන් අතුරෙහි වූ මුහුදු සප්තසීදන්තසාගර නම්. හේ කුමැ'යි සීදන්ත නම් යත්:- මාතරපිලුදු පහාලුව සීදනය කරන්තෙනුදු දෙදෙපර්වත අතුරෙහි වූ යෙනුදු සීදන්ත නම්. මේ සප්තපර්වතයෙහි කෙළවර අශ්වකර්ණපර්වතයෙහි පටන් ගෙන සක්වළ ගල දක්වා මහමුහුදය. එ මහ මුහුද වටා උස සුවාසූ දහසක් යොදුන් සක්වළගලය. මේ සක්වළගලෙන් ඇතුළෙහි අශ්වකණ්ණ පර්වතයෙන් පිටත මෙරගලට පැදුම් දිසායෙහි පූර්වවිදෙහය ගෙ සත්දහසක් යොදුන දකුණුදිශාවෙහි මහමුහුද මධ්‍යයෙහි දසදහසක් යොදුන් දඹදිවය. එ වටා පන්සියක් ක්ෂුද්‍රද්වීපය. මෙරගලට පැළදිසායෙහි අපරගොයානය. හේ සත්දහසක් යොදුන. එයිදු වටා පන්සියක් කුදිවූ. උතුරු දිසායෙහි උතුරුකුරුදිවය. හේ අටදහසක් යොදුන. එයිදු වටා පන්සියක් කුදිව. "වියොගිතා ආපොත්‍රෙති ද්වීපම්"යි[1] කියනලද බැවින් වටා දිය ඇත්තෙන් ද්වීප නම් විය. මෙසේ මහදිව් සතරෙක. කුදිව් දෙදහසෙක. දඹදිව ගැලැන්නක් වැන්න. අපරගොයානය ආදශී තලයක් වැන්න. උතුරුකුරුදිවයින පුටුවක් වැන්න. පූර්ව විදෙහය අඩසඳක් වැන්න.

මෙහි දඹදිව හිමගල උස පන්සියක් යොදුන. පළල තුන් දහසක් යොදුන. වටා නවදහසක් යොදුන. මෙසේ වූ හිමගල කාඤ්චනපර්වතය, රජතපර්වතය, මණිපර්වතය, හිඟුල්පර්වතය, අඤ්ජනපර්වතය, සානුපර්වතය, ස්ඵටිකපර්වතය, නෙරුපර්වතය යනාදි පර්වත යෙනුදු, සුවාසූදහසක් පර්වතකූටයෙනුදු, කණ්ණමුණ්ඩ,

---

1 විධාගතො ආපො එත්ථාති ද්වීපං

රථකාර, සිංහප්‍රපාත[1], ඡද්දන්ත, මන්දාකිණී අනවතප්ත, කුණාල යන සත්මහජලාශයෙනුදු, අනවතප්තයෙන් නිෂ්ක්‍රාන්ත වූ ගඞ්ගා, සරස්වතී, සින්ධු, තරක්ෂු යන සතරමහාගංගාවන් විසිනුදු සැදුනේය.

මනුෂ්‍යවාසස්ථාන වූ තෙසැටදහසක් රාජනගරයෙනුදු, අනූ නවලක්ෂයක් ද්‍රෝණමුඛයෙනුදු, සසා ‘නූ කෙළලක්ෂයක් පටුන්ගම්නුදු, පණසක් රත්නාකරයෙනුදු සැදුනේය. මෙසේ වූ දඹදිව මිනිසුන්ගේ ආයුෂ පමණ නැති කල්ලාද්‍යවස්ථාවෙහි මියෙත්ම යැ. අසඞ්ඛ්‍යායුෂ්ක වෙත් ම යැ. හේ මහාමන්ධාතු රජහු විසින් දැනෙයි. අපරගොයානයෙහි මිනිස්නට ආයු දෙසියපණසෙක. උතුරුකුරුදිවයින මිනිස්නට ආයු දහසෙක. පූර්වවිදෙහයෙහි මිනිස්නට ආයු පන්සියෙක. මෙතෙකින් චතුර්විධඅපාය ද, අපායගාමී කර්ම ද, එහි උපන් සතුන් විඳිනා දුඃඛද, මනුෂ්‍යලෝක ද, එහි සිට සිද්ධ කරන කුශලා'කුශලකර්ම ද, සංක්ෂෙපයෙන් එක දේශයෙකින් දක්වන ලදී.

68

චතුර්විධ අපායෙහි උපද දුක් අනුභව කරන්නට නිසිව අවසර ලද පාපකර්මද, මිනිස්ලොව උපදනට නිසිව අවසර ලද කුශලකර්මද නැති නිරන්තරයෙන් සුව අනුභව කරන්නට නිසි කුසල් කළවුන් උපදනා දිව්‍යලෝක සයෙක. චාතුර්මහාරාජිකය, ත්‍රයස්ත්‍රිං–ශත්ය, යාමය, තුෂිතය, නිර්මාණරතිය, පරනිර්මිතවශවර්ති ය යි කියනු ලැබෙයි. මෙහි චාතුර්මහාරාජික දිව්‍යලෝකය පෘථිවියට දෙසාළිස්දහසක් යොදුනෙහි මෙරමැදටව යුගන්ධරපර්වතමුදුන හා සම වූයේ ය. හේ හිරිසඳ ඇති දෙව්ලොව යි. මෙහි මෙරගලට පූර්

1. හංසපාත, ධජ: 139

දිශාභාගයෙහි යුගඳුරුමුදුනෙහි ගන්ධර්වයනට ප්‍රධාන වූ **ධෘතරාෂ්ට්‍ර** නම් මහරජහුගේ නුවරය. දකුණුදිශාභාගයෙහි යුගඳුරුමුදුනෙහි කුම්භාණ්ඩයනට ප්‍රධාන වූ **විරූඪ** නම් මහරජහුගේ නුවරය. පශ්චිමදිශාභාගයෙහි යුගඳුරු මුදුනෙහි නාගයන්ට අධිපති වූ **විරූපාක්ෂ** නම් මහරජහුගේ නුවරය. උතුරුදිශාභාගයෙහි යුගඳුරු මුදුනෙහි යක්ෂයන්ට ප්‍රධාන වූ කුවේර නම් මහරජහුගේ නුවරය. කුවේර නම් මහරජ **විසාණ** නම් මහනුවර වාසය කෙරෙයි. එයින් ඕහට **වෛස්සවණ**[1] ය යි කියත් මැයි. චන්ද්‍රදිව්‍යපුත්‍රයාගේ **විමානය** ඇතුළෙන් ස්වර්ණමය ය. පිටතින් රජතමය යි උස ද පළල ද එකුන් පණස් යොදුනි. සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයාගේ විමානය ඇතුළෙන් ස්වර්ණමය ය. පිටතින් ස්ඵටිකමය යි. උස ද පළල ද පණස් යොදුනි. සෙසු දිව්‍යපුත්‍රයන්ගේ **විමාන** සත්රුවන්මුවා ය. උස ද, පළල ද සත් යොදුන් වේ ම ය. අට යොදුන් වේ ම ය. දස යොදුන් වේ ම ය. දොළොස් යොදුන් වේ මැ යි. මේ විමානයනට මිනිස්ලොව තරු ය යි ව්‍යවහෘතයි. සඳවිමන පාත ගෙන ඇවිද්දී. සූර්‍ය්‍යයාගේ විමානය යොදනක් පමණ තැනට උස්ව සඳවිමනට මතුව ඇවිද්දී. සඳ විමන[2] පත්ලෙන් හිරිවිමන මුදුනෙන් මැද සියක් යොදුනි. මේ විමානයන් පාර්ශ්වයෙහි නකත්තරු ඇවිද්දී. මෙතුණින් සඳ ඉතා අලසගමින් ඇත්තේය. සූර්‍ය්‍ය ඕහට වඩා ශීඝ්‍ර ගමන් ඇත්තේය. නක්ෂත්‍ර තාරකාවෝ වනාහී මොවුන් දෙදෙන හට වඩා ශීඝ්‍ර-ගමන් ඇත්තාහ. එ බැවින් චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනාහට නක්ෂත්‍ර තාරකාවෝ කලක් පෙරටව හැසිරෙනි. කලක් පසුව හැසිරෙත්. ත්‍රයස්ත්‍රිංශත් දෙව්ලොව මෙරමුදුනෙහි වූයේය. සත් රුවන්මුවා **විජයන්මහපා**, **සුදම්දෙව්සභා** ආදි විමාන ඇත්තේයි. එයින් මත්තේ දෙව්ලොව මිණිමුවා විමාන

1. වෛශ්‍රවණ. 2. සඳවිමනට.

ඇත්තේ යි. සදෙව්ලොව ම සුන්දු අග්‍ර වූ, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය, ආයු, වර්ණ, සුඛ, යශස්, ආධිපත්‍යයන දශධර්මයන් ඇතිවන බැවින් ස්වර්ග නම්. සදෙවුලොව සුව වදාරණ බුදුන් "මයිදු එහි සුව මෙබඳු"යි උපමා දක්වත් සුන්දුකර නො වෙයි. එසේ සුවය දෙවුලොව"යි වදළ බැවින් සදෙවු ලොවට පඤ්චකාමගුණසමෘද්ධිය අනන්ත ය යි දතයුතු. එයින් ම සදෙවුලොව දෙවියන් රාත් වුව එ ම විගස පිරිණිවිය මැනව. අනාගාමි වුව එයින් චුතව සුද්ධාවාස බඹලොව උපත වැනව. නිත්‍ය සෙන් ලලිතජනයනට ආවාස බැවින් කාමයෙහි වීතරාගයන් සිටිනට නො තිස්සැ'යි දතයුතු. නිත්‍ය යෙන් මඟුල්ගෙකුක් වැන්න. රඟමඩලක් වැනි මැ යි.

සදෙවුලොව ආයුෂ කිපමණෙක යත්:—මිනිස්නට පණස් අවුරුද්දෙක් චාතුර්මහාරාජිකායෙහි දෙවියන්ට එක්දවසෙක් වෙයි. ඒ නියා තිස්දවස් මස් කොට දෙළොස් මස් හවුරුදු කොට මේ නියා හවුරුද්දෙන් එදෙවුලොව දෙවියනට පන්සියක් හවුරුද්දට ආයුෂයි. හේ මිනිසුන්ගේ ගණනින් අනුලක්ෂයක් හවුරුදු වෙයි. මිනිස්නට සියක්හවුරුදු ත්‍රයස්ත්‍රිංශත් දෙවුලොව දෙවියන්ට එක්දවසෙක් වෙයි. මේ නියා දවසෙන් එදෙවුලොව දෙවියනට දහසක් අවුරුද්දට ආයුෂයි. හේ මිනිසුන්ගේ ආයුගණනින් තුන්කෙළ සැටලක්ෂයකි. මිනිස්නට දෙසියක් හවුරුදු යාම දෙවුලොව දෙවියනට එක්දවසෙක් වෙයි.. මේ නියා දවසෙන් එ දෙවුලොව දෙවියනට දෙදහසක් හවුරුද්දට ආයුෂයි. හේ මිනිසුන්ගේ ආයුගණනින් තුදුස්කෙළ සතළිස්ලක්ෂයෙකි. මිනිස්නට සාරසියක් හවුරුදු තුසිපුරයෙහි දෙවියනට එක්දවසෙක් වෙයි. මේ නියා දවසින් එදෙවුලොව දෙවියනට සාරදහසක් හවුරුද්දට ආයුෂයි. හේ මිනිසුන්ගේ ආයු ගණනින් සත්පණස්කෙළසැටලක්ෂයෙකි. මිනිස්නට අටසියක් හවුරුදු නිර්මාණරති දෙව්ලොව දෙවියනට එක්දවසෙක් වෙයි. මේ නියා දවසින් ඒ

දෙව්ලොව දෙවියනට අටදහසක් හවුරුද්දට ආයුෂයි. හේ මිනිසුන්ගේ ආයුගණනින් දෙසියසතිස්කෙළසතළිස්ලක්‍ෂයෙකි. මිනිස්නට එක්දහස්සසියක් හවුරුදු පරනිර්මිත වසවර්ති දෙව්ලොව දෙවියනට එක්දවසෙක් වෙයි. ඒ නිසා දවසින් එ දෙව්ලොව දෙවියනට සොළොස්දහසක් හවුරුද්දට ආයුෂයි. හේ මිනිසුන්ගේ ආයුගණනින් නවසියඑක්විසිකෙළ සැටලක්‍ෂයෙකි. මෙසේ සදෙව්ලොව ක්‍රමයෙන් එයට එයට මතු මතු වූයේ යයි දතයුතු.

## 69

මේ කාමාවචරදෙව්ලොවින් මතු රූපාවචරකුසල් කළවුන් උපදනා රූබඹලෝ සොළොසෙක. ප්‍රථමද්ධ්‍යාන හැව්වෝ බ්‍රහ්මපාරිෂද්‍යය, බ්‍රහ්මපුරොහිතය, මහාබ්‍රහ්මය යන තුන්තලයෙහි උපදිති. මෙතුන්තලය සම්බිමෙක වූ තුන්රටක්සේ සම වූයේයි. ද්විතීය ධ්‍යාන හැව්වෝ ප්‍රථමධ්‍යානතුන්තලයට මතුමතුයෙහි පරිත්තාභය, අප්‍රමාණාභය, ආභාස්වරය යන තුන්තලයෙහි උපදිත්. මේ තුන්තලය ද පළමු කී තුන්තලය සේ ම සම්තලයි. තෘතීයද්ධ්‍යාන හැව්වෝ ද්විතීයද්ධ්‍යාන තුන්තලයට මතුයෙහි පරිත්තශුභය, අප්‍රමාණශුභය, ශුභකෘත්ස්න යන තුන්තලයෙහි උපදිත්. මෙතුන්තලය ද පළමු කීවා සේ සමතල යි. චතුර්ථධ්‍යාන හැවූවෝ මේ නවතලයෙන් මතුයෙහි බෘහත්ඵල ආදි කොට ඇති සත්තලයෙහි උපදිත්. මේ සත්තලයෙහි ආදි වූ බෘහත්ඵල අසංඥසත්ත්වදෙතලය පළමු කීවාසේ ම සමානව වූයේ ය. මේ දෙතලයෙන් මත්තේ අවිහය, අතප්පය, සුදර්ශීය, සුදර්ශිය, අකනිෂ්ඨය යන පන් සුධාවාසය එයට එයට මතු මතු වූයේය. පඤ්චසුධාවාසයෙන් මතුයෙහි අරූපධ්‍යාන හැව්වන් උපදනා ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤා 'නාසඤ්ඤා යතනය යන

සතර අරූපතලයද එයට එයට මතු මතු ව වූයේ ය. මේ සතර අරූපතලයෙන් මතුයෙහි සත්ත්වාවාස නැති හෙයින් අජටාකාශ නම් වේ. ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන, භාවිතින් තුන්තුන් තලයෙහි[1] උපදනට හෙතු කවරද? යත්:- චතුර්ථධ්‍යාන භාවිතන් සත්තලයක උපදනට හෙතු කවරද? යත්:-

ආදි තුන්ධ්‍යානය හීන මධ්‍යම ප්‍රණීත විසින් තුන් තුන් ව නවතලයෙහි උත්පත්තියට කාරණ වෙයි. උත්පන්නමාත්‍ර වී නම් හීන වෙයි. එකක් දෙකක් වශිතාප්‍රාප්ත කළ හොත් මධ්‍යම නම් වෙයි. පඤ්ච වශිතා ප්‍රාප්ත කළ හොත් ප්‍රණීත වෙයි. සතරවන ධ්‍යානය සංඥාවිරාගභාවනා විසින්, පෘථග්ජනයනට උත්පත්තිස්ථාන විසින්, ශ්‍රද්ධෙන්ද්‍රියාදි ඉන්ද්‍රියයන්ගේ භෙද විසින් සත්තලයෙහි උත්පත්තියට කාරණ වෙයි. කිසේය යත්:- ප්‍රථමධ්‍යාන භාවා වශිතාප්‍රාප්ත නො කළාහු බ්‍රහ්මපාරිෂද්‍ය නම් තලයෙහි උපදිති. එකක් දෙකක් වශිතාප්‍රාප්ත[2] කළාහු බ්‍රහ්මපුරෝහිත නම් තලයෙහි උපදිති. පඤ්චවශිතාප්‍රාප්ත කළාහු මහාබ්‍රහ්ම නම් තලයෙහි උපදිති. තෘතීයධ්‍යාන භාවා වශිතාප්‍රාප්ත නො කළාහු පරිත්තශුභ නම් තලයෙහි උපදිත්. එකක් දෙකක් වශිතාප්‍රාප්තකළාහු අප්‍රමාණශුභ නම් තලයෙහි උපදිති. පඤ්චවශිතාප්‍රාප්ත කළාහු ශුභකෘත්ස්න නම් තලයෙහි උපදිති. "චතුර්ථධ්‍යාන භාවා සිත් නැති වනු මැනවැ"යි සංඥාවිරාගභාවනා කළාහු අසංඥසත්ත උපදිති. ඔවුනට සිත් නො උපද්දී. මිනිස් ලොව හෙව කාලක්‍රියා කළාහු නම් අසංඥසත්ත උපද හොවිති[3]. හිඳ කාලක්‍රියාකළාහු නම් හිඳිති. සිට කාල ක්‍රියාකළාහු නම්සිටිති. එබඳලොව පිළිම ගෙනක් වැනි. එහි උපදනෝ කර්මවාදි ක්‍රියාවාදී තීර්ථකායහ. වරදවා ගෙණ මෙසේ උපදිති. නාස්තිකා "හෙතුක අක්‍රියදෘෂ්ටික

1. තුන්තලයෙහි. 2. එකක් දෙවශිතාප්‍රාප්ත. 3. හොති

තික්ෂ්ණ වූ කල අපායේ මිසැ නූපදිති. චතුර්ථධ්‍යාන හැව් ශෛක්ෂයෝ බෘහත්ඵලයෙහි උපදිති. එම චතුර්ථ ධ්‍යාන හැව් අනාගාමියෝ වූ කල ශ්‍රද්ධෙන්ද්‍රිය අධික වුවහොත් අවිහ නම් තලයෙහි උපදිති. වීර්යෙන්ද්‍රිය අධික වුවහොත් අතප්ප නම් තලයෙහි උපදිති. සතීන්ද්‍රිය අධික වුවහොත් සුදශී නම් තලයෙහි උපදිති. සමාධීන්ද්‍රිය අධික වුවහොත් සුදර්ශී නම් තලෙහි උපදිති. ප්‍රඥෙන්ද්‍රිය අධික වුව හොත් අකනිෂ්ඨ නම් තලයෙහි උපදිත්. අරූපධ්‍යානසතර ආකාසානඤ්චායතන ධ්‍යාන හැව්වෝ ආකාසානඤ්චායතන තලයෙහි උපදිති. විඥානඤ්චායතන ධ්‍යාන හැව්වෝ විඤ්ඤාණඤ්චායතන තලයෙහි උපදිති. ආකිඤ්චඤ්ඤායතනධ්‍යාන හැව්වෝ ආකිඤ්චඤ්ඤායතන තලයෙහි උපදිති. නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යාන හැව්වෝ නෙවසඤ්ඤානාසඤ්ඤායතන තලයෙහි උපදිති. අසඤ්ඤ සත උපන් බඹනට රූපස්කන්ධ මතු උපද්දි. තුබූ සතර අරූකඳ නො උපද්දි. සතර අරූතලයෙහි උපන් බඹනට රූකඳ නො උපද්දී. තුබූ සතරකඳ උපද්දී මෙතෙකින් පිටත් සත්නට පඤ්චස්කන්ධය ම උපද්දී. මේ විසිබඹලොව ස්ත්‍රිහි ධ්‍යාන හවා උපදිත් ම ය. පුරුෂයෝ ධ්‍යාන හවා උපදිත් මැයි. කාමාවචරභවයෙහිලා ස්ත්‍රිනට ස්ත්‍රීන්ද්‍රිය උපද්දී. පුරුෂයනට පුරුෂෙන්ද්‍රිය උපද්දී. බඹ ලොව උපන් කල වනාහි ඉන්ද්‍රියවය ම නො උපද්දී. එ බැවින් බඹලොව ස්ත්‍රිහ පුරුෂයන යනු නැති. හැමදෙන ම එකාකාර වෙත්. එයින් චුතව කාමාවචරභවයෙහි උපන් කල ස්ත්‍රීත්ව ස්ත්‍රින්ද්‍රිය වෙයි. පුරුෂයනට පුරුෂෙන්ද්‍රිය වෙයි. අසඤ්ඤසත උපන් සත්හු වස්ත්‍රාභරණයෙන් සැදුනු රූපකාය ඇති වෙත්. ආයුෂයෙනුදු අධික වෙත්. තුබූ පසළොස්රූබඹලොව උපන් බඹහු වස්ත්‍රා'භරණයෙන් සැදුනු රූපකාය ද ඇති වෙති. උද්‍යානවිමානආයුවර්ණසුඛයශස්ආධිපත්‍යාදීනුදු අධිකවෙත්

අරූතලයෙහි උපන් බඹහු ආයුර්වර්ණයශස් ආධිපත්‍යාදීන් අධිකවෙත්. රූප බඹතලයෙහි චක්ෂුරින්ද්‍රිය ඇති වෙයි. තදාශ්‍රයවිඥානය ඇති වෙයි. දර්ශනානුත්තරිය වූ බුද්ධරූප දක්නා සඳහා ශ්‍රොත්‍රෙන්ද්‍රිය ඇති වෙයි. තදාශ්‍රයවූ විඥානය ද ඇති වෙයි. ශ්‍රවණානුත්තරිය වූ ධර්මශ්‍රවණ සඳහා අවශිෂ්ට වූ ඝ්‍රාණනිමිත්තාදීහු ද ඇති වෙති. ඝ්‍රාණෙන්ද්‍රිය, ජිහ්වෙන්ද්‍රිය, කායෙන්ද්‍රිය නො උපදී. ඉන්ද්‍රියාභාවයෙන් ම තදාශ්‍රයවිඥාන නො උපදී. එසේ වූහු බුදුන් ඇති කල අවුදු බුදුන් දක්නි. බණ අසති. නො එසේ වුව හොත් ධ්‍යාන සමාපත්තීන් සමන්විත තපස්වින් සෙයින් වාසය කෙරෙත්. රූතලයෙහි උපන් පුහුදුනෝ වූහු නම් රූපාරූපඅෂ්ටසමාපත්ති උපයති. ආර්‍ය්‍යයෝ වූහු නම් මතුමතුයෙහි මගඵල උපයති. අරූතලයෙහි උපන් බඹහු පුහුදුනෝ වූහු නම් මතුමතුයෙහි අරූපද්ධ්‍යාන උපයති. ආර්‍ය්‍යයෝ වූහු නම් මතුමතුයෙහි මග ඵල උපයත්.

එකුන්විසි බඹතලයෙහි උපන් ආර්‍ය්‍යයෝ යට යට නො උපදිති. මතු මතුයෙහි උපදිති. බෘහත්ඵල අකනිෂ්ට නෛවසංඥානාසංඥායතන සංඛ්‍යාත භවශිඛයෙහි උපන් ආර්‍ය්‍යයෝ එයින් බැහැර නො උපදිති. එහි ම සිට නිරුපධිශෙෂනිර්වාණ ධාතුවින්[1] පිරිනිවෙත්. පුහුදුනෝ පඤ්චශුද්ධාවාස විනා තුබූ සවිසිතලයෙහි උපදිත්. උම්මත්තකයෝ තමන් ගත් පැස අශුචි ලද එ ගෙන බහාලත් මැ යි. සතුරුවත් ලද එ ගෙන බහාලත් මැ යි. එසේ ම උම්මත්තකයන් ගත් පැසක් වැනි පුහුදුනෝ කලක සතර අපාහි උපදනට නිසි අශුචි තුල්‍ය වූ අකුශලකර්ම සිඩ කෙරෙති. කලක් සුගතිය උපදනට නිසි සතුරුවින් තුල්‍ය වූ කුශලකර්ම සිඩ කෙරෙති.

70

බඹලොව ආයුෂ කිපමණෙක යත්:- විසිබඹතලයෙහි ආදි වූ ප්‍රථමද්ධ්‍යානතලතුන බ්‍රහ්මපාරිෂද්‍යයෙහි

1. ධාතුවිසින්

කැපින් තුනින් එකකට ආයුෂය. බ්‍රහ්මපුරෝහිත තලයෙහි කැපින් භාගයකට ආයුෂය. මහාබ්‍රහ්මතලයෙහි කපකට ආයුෂය. විතීයද්ධ්‍යානතලතුණ ආදි පරිත්තාභ නම් තලයෙහි දෙකපකට ආයුෂය. දෙවන අප්‍රමාණාභ නම් තලයෙහි සතරකපකට ආයුෂය. තුන්වන ආභාස්වර තලයෙහි අටකපකට ආයුෂය. තෘතීයධ්‍යානතලතුණ ආදි පරිත්තශුභ නම් තලයෙහි සොළොස්කපකට ආයුෂය. දෙවන අප්‍රමාණශුභ නම් තලයෙහි දෙතිස්කපකට ආයුෂය. තුන්වන ශුභකෘත්ස්න නම් තලයෙහි සුසැටකපකට ආයුෂය. චතුර්ථධ්‍යාන තලසත ආදිෂ වෘහත්ඵලයෙහි ද, අසංඥතලයෙහි ද පන්සියයක් කපකට ආයුෂය. සුද්ධාවාසපස අවිහතලයෙහි දහසක් කපකට ආයුෂය. දෙවන අතප්ප නම් තලයෙහි දෙදහසක් කපකට ආයුෂය. තුන්වන සුදශී නම් තලයෙහි සාරදහසක් කපකට ආයුෂය. සතරවන සුදර්ශී නම් තලයෙහි අටදහසක් කපකට ආයුෂය. පස්වන අකනිෂ්ට තලයෙහි සොළොස්දහසක් කපකට ආයුෂය. ආකාශානන්ත්‍යායතනයෙහි විසිදහසක් කපකට ආයුෂය. විඥානානන්ත්‍යායතනයෙහි සතළිස්දහසක් කපකට ආයුෂය. ආකිඤ්චන්‍යායතනයෙහි සැටදහසක් කපකට ආයුෂය. නෛවසංඥානාසංඥායතනයෙහි සුවාසූදහසක් කපකට ආයුෂයි.

71

මේ එක්තිස්තලය භව, යොනි, ගති, විඥනස්ථිති, සත්වාවාස විසින් දක්වත්:- සතරඅපා හා මිනිස්ලොව හා දෙව්ලොව කාමභව නම්. සොළොස්රූපතලය රූපභව නම්. සතර අරූපතලය අරූපභව නම්. නොහොත් සංඥීභව, අසංඥීභව, නෛවසංඥීනාසංඥීභව විසින් කියත්:—අසංඥසත්ත අසංඥභව නම් වෙයි. නෛවසංඥානාසංඥායතනය නෛවසංඥානාසංඥභව නම් වෙයි. තුබු එකුන්තිස්තලය සංඥභව නම් වෙයි. නොහොත් එක

වොකාරභව, චතුවොකාරභව පඤ්චවොකාරභව විසින් කියත්. වොකිරියන්තිති, වොකාරායි, කර්මක්ලෙශාදීන් විසින් කරනු ලබන පඤ්චස්කන්ධය වොකාර නම් වෙයි. එබැවින් රූපස්කන්ධ විසින් එකස්කන්ධයක් ඇති අසංඥසත්ත එකවොකාරභව නම් වෙයි. රූකද විනා තුබූ සතරකද ඇති සතර අරූපලොක චතුවොකාරභව නම් වෙයි. තුබූ සවිසිතැනය පඤ්චවොකාරභව නම් වෙයි.

72

චතුර්විධයොනි නම් කවර? යත්:—බිජුකබල්හි[1] උපදනෝ අණ්ඩජ නම වෙති. දලබියෙහි උපදනෝ ජලාබුජ නම වෙති. සොළොස් හැවිරිදි දරුවන් සේ පෙනීයන්නෝ උපපාදුක නම් වෙති. පූතිමත්ස්‍යාදිය උපදනෝ සංසෙදජ නම් වෙති. මේ සතර යොනිය තිර්යග්ගතයන්ගේ ද, ප්‍රේතයන්ගේ ද, මනුෂ්‍යයන්ගේ ද[2]යි යවකි සෙසින් ම සම්භරුන්ගේ උත්පත්ති වෙයි. නරකයෙහිද්, චාතුර්මහාරාජිකාදි දෙව්ලොවද උපපාදුකව මිසැ නො උපදින්. එසේ වුව සදෙව්ලොව පුත්‍රදාරාදි-ව්‍යවහාර කිසෙසින් වේ'යි යත්:— දිව්‍යපුත්‍රයන් ඇක යෙහි උපපාදුකව පැනීගියාහු දරුවෝ නම් වෙති. සයනයෙහි පැනීගියාහු භාර්‍යාවෝ නම් වෙති මේදෙතෙ තින් පිටත දිව්‍යපුත්‍රයන්ගේ විමානොපචාරයන්හිද් සයනාසනයෙහිද් පැනීගියාහු පරිචාරිකා නම් වෙත්.

73

**පඤ්චගති** නම් කවර? යත්:— නරකගතිය, තිර්‍යග්ගතිය, ප්‍රේතගතිය, මනුෂ්‍යගතිය, දිව්‍යගතිය යන පසයි. එසේ හොත් අසුරකාය කොහි ගැණේ'යි? යත්:—දුඃඛිතයෝ ප්‍රේතයන් කෙරෙහි ගන්නා ලැබෙති. පිනැත්තෝ දිව්‍යයන් කෙරෙහි ගන්නා ලැබෙති. මෙයට නය පළමු දක්වන ලදී.

1. බුජුකබල්ලෙයි 2. මනුෂ්‍යයන්ගේද.

74

**සප්තවිඥානස්ථිති** නම් කවර යත්:— **නානත්තකායා නානත්තසඤ්ඤිනො, නානත්තකායා එකත්තසඤ්ඤිනො, එකත්තකායා නානත්තසඤ්ඤිනො, එකත්තකායා එකත්තසඤ්ඤිනො** යන සතර හා පාත අරූපතල තුන හා **සප්ත විඥානස්ථිති** නම් වේ. කිසේ ය යත්:—මිනිස්හු ද සදෙව්ලොව දෙවියෝ ද ශරීරයෙනු ද නානාප්‍රකාරයහ. ඔහට ප්‍රතිසන්ධි චිත්ත ද නවසෙත. මෙසේ වන බැවින් මේ දෙතැන සත්හු **නානත්තකායා නානත්තසඤ්ඤිනො**' යි කියනු ලැබෙත්. සතරඅපාහි සත්හු ශරීරයෙන් නානාප්‍රකාරයහ. ඔවුන් හැම දෙනහට ප්‍රතිසන්ධිචිත්ත එකෙක. ප්‍රථමධ්‍යානතලයෙහි බඹහුදු ශරීරයෙන් නානාප්‍රකාරයහ. ඕහට ප්‍රතිසන්ධිචිත්ත එකෙක. මෙසේ වන බැවින් මේ දෙතැන සත්හු **නානත්තකායා එකත්තසඤ්ඤිනො**'යි කියනු ලැබෙත්. **සූත්‍රනයින්** ද්විතීයධ්‍යාන හැම්වෝ ද, **අභිධර්මනයින්** ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන හැම්වෝ ද ද්විතීයධ්‍යානතලයෙහි උපදිති. ඔවුන් ශරීර එකාකාරය. ප්‍රතිසන්ධි විඥාන දෙකෙක. එසේ වන එ බඹලොව බඹහු **එකත්තකායා නානත්තසඤ්ඤිනො**යි කියනු ලැබෙත්. තෘතීයධ්‍යාන තලයෙහි ද, චතුර්ථධ්‍යානතලයෙහිද බඹහු ශරීරයෙනුදු එකාකාරයහ. ප්‍රතිසන්ධිවිඥාන ද එකෙක එසේ වන බැවින් එ දෙතැන සත්හු **එකත්තකායා එකත්තසඤ්ඤිනො**'යි කියනු ලැබෙත්. මෙසේ පළමු කී සෙයින් ම යටඅරූපතලතුන හා **සප්තවිඥානස්ථිති** වෙයි. මේ සප්තවිඥානස්ථිතියැ අසංඥසත්ත හා නෛවසංඥා'නාසංඥායතන දෙතලය ඔකහා **නවසත්තවාස** නම් වේ. සප්ත විඥානස්ථිතිය **විඤ්ඤාණං තිට්ඨති එත්ථාති විඤ්ඤාණට්ඨිති** නම් වෙයි. අසංඥසත්ත විඤ්ඤාණ නැත්තෙන් නො ගන්නා ලැබෙයි. නෛවසංඥා'නාසංඥායතන සංඥා ඇතැයි

කියන්නට ද, නැතැයි කියන්නට ද නො නිසි වන බැවින් නො ගන්නා ලැබෙයි.

නවසත්ත්වාවාස කියන තැන වූ කල එ දෙතලයෙහි වූවෝ සත්ත්වයහ'යි කියන්නට නිසිවෙත්නො යි ගන්නා ලැබෙති. එසේ වින්ම පළමු කී සප්තවිඥානස්ථිතිය මෙදෙතලය හා සමග නවසත්ත්වාවාස නම් වෙයි.

75.

මේ එක්නිස්තලයෙහි නිරය කියේ නම් ලද යත්[1]:—අය ශබ්දය ආස්වාදයෙහි වෘත්තය. නිර්ශබ්දය නිර්ගමණයෙහි වෘත්තය. එබැවින් ආස්වාදයෙන් නිර්ගත වූයේ නිරය නම් වේ. එකාන්තයෙන් දුක්වන බැවින්, පවුකළවුන් විසින් ගන්තව්‍යවන බැවින් ගති නමුදු වෙයි. හැම තැන ගතිශබ්දයෙහි වචනාර්ථයෙදෙන යෙදෙනයේ මෙ නයින් දතයුතු. භූයොවෘත්තින් තිර්යක්අයනත්වය, ගතිය අභිවෘද්ධිය ඇති වන බැවින් තිර්යග්ගති නම් වෙයි. නොහොත් සුගතියට තිර්යක් වන බැවින්, සරස් ව බාධක වන බැවින් තිර්යග්ගති නම් වේ ම ය. ප්‍රකෘෂ්ටයෙන් අත්‍යර්ථයෙන් සුඛයෙන් ඉතයහ, ගතයහ යි ප්‍රේත නම් වෙත්.[2] ඓශ්වර්ය ක්‍රීඩාව නැති වන බැවින් න සුරන්තීත්‍යසුරා, යි කියනු ලැබෙත්. මනස උත්සන්න වන බැවින් මනුෂ්‍යයහ,යි කියනු ලැබෙත්. මනු නම් ආදිපුරුෂ යි. ඔහු දරු වන බැවින් මනුෂ්‍යයහ යි යෙත්. ලෞකිකයෝ සවුවහරජයෙහි පටන් ගෙන නෛවසංඥානාසංඥායතන දෙවුලොව දක්වා හැමතැන දෙවියෝ "දිව්‍යන්තීති දේවාඃ" යි කියනු ලැබෙත්. සතරවරම්මහරජ්ජුන් ඇති දෙවුලොව චාතුර්මහාරාජිකය නම් වෙයි. සමග පින් කළ තෙතිස්දෙනා උපන්නෙන් ඔවුන් විසින් නම්ලද

1. වෙයි. 2 වේ.

දෙවන දෙව්ලොව ත්‍රයස්ත්‍රිංශත් නම් වෙයි. දුක්ඛයෙන් යාතයහ, අපයාතයහ, යි තුන්වන දෙව්ලොව දෙවියෝ යාම නම් වෙත්. තුසං පීතා ගතා'යි සතරවන දෙව්ලොව දෙවියෝ තුසිත නම් වෙත්. නිර්මාණයෙහි රති මොවුනට ඇතැ'යි පස්වන දෙව්ලොව දෙවියෝ නිර්මාණරති නම් වෙත්. පරයන් විසින් නිර්මිත වූ භොගයෙහි තමන් විසිබව් පමුණුවති, යි සවනදෙව්ලොව දෙවියෝ පරනිර්මිතවසවර්ති නම් වෙත්. ආදි බඹලොව දෙවියෝ මහාබ්‍රහ්මයන්ගේ පරිවාරක වන බැවින් ඔවුන්ගේ පිරිස වූහ යි බ්‍රහ්මපාරිෂද්‍ය නම් වෙත්. දෙවන බඹලොව බඹහු මහාබ්‍රහ්මයන්ගේ පුරොහිතස්ථානයෙහි සිටියාහ, යි බ්‍රහ්මපුරොහිත නම් වෙත්. තුන් වන බඹලොව බඹහු පාන බඹලොව බඹනට ආයුවර්ණාදීන් මහත් වන බැවින් මහබ්‍රහ්ම නම් වෙත්. සතරවන බඹලොව බඹහු මත්තෝ තලයේ බඹනට පරිත්ත වූ ආභා ඇත්තාහ යි පරිත්තාභ නම් වෙති. පස් වන බඹලොව බඹහු පානබඹලොව බඹනට අධික වූ ආභා ඇත්තාහ, යි අප්‍රමාණාභ නම් වෙති. සවන බඹලොව බඹහු සප්‍රීතිකධ්‍යානයෙන් නිඃසෘතස්කන්ධසන්තාන ඇති වන බැවින් අභ්‍රපටලයෙන් නිෂ්ක්‍රාන්ත වන විදිලි සේ තන් තන් දිශාභාගයට නිස්සුවන්[1] වන ආභා ඇත්තාහ, යි ආභාස්වරයහ, යි කියනු ලැබෙත්. නොහොත් එබඳු ම වූ ප්‍රභායෙන් භාසුර වන ශීලයහ, යි ආභාස්වර නම් වෙත්. සත් වන බඹලොව බඹහු මත්තෙහි බඹලොව බඹුන්ගේ ශරීරප්‍රභාවට පරිත්ත වූ ශුභ ය,යි කියන ලද එකඝනවූ අචල වූ ශරරප්‍රභා ඇත්තා හ යි පරිත්තශුභ නම් වෙත්. අට වන බඹලොව බඹහු පාන බඹලොව බඹනට අධිකවූ ශරීරප්‍රභා ඇත්තාහ,යි අප්‍රමාණශුභ නම් වෙත්. නවවන බඹලොව බඹහු ප්‍රභාසමුදය සඞ්ඛ්‍යාත ශුභයෙන් ආකීර්ණයහ යි

1. නිශ්චරන්

ශුභකෘත්ස්න යයි කියනු ලැබෙත්. දසවන බඹලොව බඹහු ධ්‍යානප්‍රභාවයෙන් නිර්වෘත්ත වූ බෘහත්ඵල ඇත්තාහ, යි බෘහත්ඵල නම් වෙත්. එකොළොස් වන බඹලොව බඹහු සංඥාවිරාග භාවනායෙන් නිපීතන වූ රූපස්කන්ධසන්තාන මාත්‍රයක් ඇත්තාහ,යි අසංඥ, යි කියනු ලැබෙත්. මෙයින් මත්තේ පස් රූබඹතල බඹහු අනුනයප්‍රතිඝාභාවයෙන් 'ශුද්ධආවාස මෝ්හට ඇත්තු'යි ශුද්ධාවාස යයි කියනු ලැබෙත්. මෙහි පළමු වන ශුද්ධාවාසයෙහි බඹහු අල්ප වූ කාලයකින් ආත්මීය ස්ථාන විජහනය නො කෙරෙති, යි අවිහ නම් වෙත්. දෙවන ශුද්ධාවාසයෙහි බඹහු කිසිවෙකින් නො තැවෙති,යි අතප්ප නම් වෙත්. තුන්වන ශුද්ධාවාසයෙහි බඹහු මනොහර රූප ඇති වන බැවින් අකෘච්ඡ්‍රයෙන් සුවසේ පැණෙති,යි සුදස්සී යි කියනු ලැබෙති. සතර වන ශුද්ධාවාසයෙහි බඹහු සුපරිශුද්ධ වූ දර්ශන ඇති වන බැවින් මනාකොට දක්ති,යි සුදර්ශී යි කියනු ලැබෙත්. පස් වන ශුද්ධාවාසයෙහි බඹහු උත්කෘෂ්ටසම්පත් ඇති වන බැවින් මෝ්හට කනිෂ්ටත්ව නැතැයි අකනිෂ්ඨයි කියනු ලැබෙත්. අරූපතලයෙහි ආදිබඹලොව උත්පාදනන ව්‍යයාන්ත නැතිවන බැවිනුදු ධ්‍යාන භවනුවත් එක දෙසයක් නො ගෙන සියලු ආකාශය ආලම්බන කරන බැවිනු දු අනන්තය යි කියන ලද ආකාශයෙහි පැවැති විඥාන ආකාශානන්ත්‍යායතන නම් වෙයි. එසේ ම වූ ධ්‍යානචිත්තයෙන් පිළිසඳ ගත් භවය ද එම නම් ලැබෙයි. නිරුද්ධ වූ ප්‍රථමාරූප්‍ය ද උත්පාදනන ව්‍යයානන ඇත ද භාවනාවගේ අනන්තස්ඵරණ නැති වන බැවින් අනන්ත විඥාන නම් වෙයි. එසේ වූ ධ්‍යානචිත්තය ආලම්බන කොට උපන් ද්විතීයාරූප්‍යය විඥානානන්ත්‍යායතන නම් වෙයි. නිරුද්ධවූ ප්‍රථමාරූප්‍යයාගේ අභාවය කිසිවක් නොවන බැවින් අකිඤ්චන නම් වෙයි. ඒ ආලම්බන කළ තුන්වන ආරූප්‍යය ආකිඤ්චඤ්ඤායතන නම් වෙයි. සංඥා ඇතැ'යි කියන්නට ද නැතැ,යි කියන්නට ද

නො තිබූ සතරවන ආරූප්‍යය නෛවසංඥානාසංඥායතන නම් වෙයි. පළමු ධ්‍යානයෙහි කිවා සේ තුන්ධ්‍යානයෙන් උපන් බඹලොව් ද ඒ ඒ ධ්‍යානයෙන් නම් ලැබෙත්.

76.

මේ එක්තිස්තලයෙහි හැමියෙන් මතු වූ අරූතල සතර හැම කල නො නස්සී. එයින් පාත ශුද්ධාවාස වූ කල රජ්ජුරුවන් තැවති තුන් සඳවුරක් වැත්ත. බුදුන් ඇතිකල වෙයි. බුදුන නැතිකල එහි උපන්තාක් බඹුන් පිරිනිවුණා හාම උත්තරයෙහි නැති වෙයි. එයින් පාත බෘහත්ඵල-අසංඥසත්ත්ව දෙක ද හැමකල නො නස්සී. එයට ද යම් කාලෙක විනාශ නැති. එයින් පාත තෘතීයධ්‍යානතල තුන ඇතුල් කොට යට වා පොළොව දක්වා පළල කෙළලක්‍ෂයක් සක්වළ වයින් නැසී පසුව හටගන්නී. එසේ ම තෘතීයධ්‍යාන තලයෙන් පාත විතීයධ්‍යාන තලතුණ ඇතුළු කොට යට වාපොළොව දක්වා පළල කෙළලක්‍ෂයක් සක්වල උදකායෙන් නැසී පසුව හටගන්නී. විතීයධ්‍යාන තලතුණින් පාත ප්‍රථමධ්‍යාන තල තුන ඇතුළු කොට යට වාපොළොව දක්වා පළල කෙළලක්‍ෂයක් සක්වළ අග්නින් නැසී පසුව හටගන්නී. අග්නීන් නැසී පසුව කිසෙයින් හටගන්නී යත්:—

කප නස්නට හවුරුදු ලක්‍ෂයක් ඇතිකල ලොකාව්‍යුහ නම් දෙවියෝ විරූපවෙස් ගෙන රත්පිළි හැඳ හිසකෙහෙ මුදා[1] ඇස කඳුලු පිස්මින්[2] මිනිස්ලොව ඇවිදුතෞ "නිදුක්නි! නිදුක්නි!! අසවු අවුරුදු ලක්‍ෂයක් ගියකල මේ ලොකය විනාශයට යෙයි[3]. එබැවින් මෛත්‍රීභාවනා, කරුණාභාවනා, මුදිතාභාවනා, උපෙක්‍ෂා භාවනා කරව. මාවටන්ධැම් පියවටන්ධැම් පවත්වව කුලෙහි දෙටුවන් පුදව" යනාදි විසින් කියති.

1. උනා 2. පුස්මින්, පිසමින්. 3. විනාශවෙයි

ඒ අසා මිනිස්හු බලවත් සංවේග උපයා පුණ්‍ය කර්මයෙහි පවතිත්. ඉක්බිති ක්‍රමයෙන් හවුරුදුලක්‍ෂයක් ගිය කල කෙළලක්‍ෂයක් සක්වළ එක පැහැර විපත්ති-කාරමහාමේඝ නම් වැස්සක් වස්සී. මනුෂ්‍යයෝ මෙ දැක "දුර්භික්‍ෂය නිවෘත්ත විය. මත්තෝ රට මනා වේ"යි සිතා සහවා රැකි තාක් බිජුවට ගෙන වපුරති. ඉක්බිති එ ගොවිකම් නැහැ[1] ගෙරි කන වර වූ තැන් පටන් ගෙන වැසි නැති වෙයි. ගොවිකමුදු මිනිස්හුදු ගස් කොළ තුරැලියදු[2] විනාශයට යෙති. සතර අවාගි සත්හුදු මිනිස්ලොව සත්හුදු අවසර ලත් අපරාපර්‍යායී වේද්‍යකර්මයෙන් සදෙව්ලොව උපද ඔහු ඇමදෙන ධර්මතා විසින් ම වායොකසිණයෙහි ධ්‍යාන භාවනා බඹලොව ගොස් උපදිති.

ක්‍රමයෙන්. සත්හිරු පාළ වේ. කි සේ ද යත්:- එක් හිරක් බට කල දෙවන හිර නැඟෙයි. මෙසේ බොහෝ කලක්[3] ගිය කල එක් හිරක් මුදුන්වත් ම එක් හිරක් බස්නා කල තුන්වනහිර නැඟෙයි. මෙසේ ද බොහෝ වූ කලක් ගිය කල එක් හිරක් මුදුන්වත් ම එක්හිරක් මුදුනෙන් පහවත් එක් හිරක් බස්නා කල සතරවන හිර නැඟෙයි. මෙසේ ද බොහෝ කලක් ගිය කල එක් හිරක් මුදුන්වත් ම එක් හිරක් මුදුනෙන් පහවත් ම එක්හිරක් බස්නා කල පස්වැනි හිර[4] නැඟෙයි. මෙසේ ක්‍රමයෙන් සවන හිර ද සත්වන හිර ද සඳවපලා වැල්පන්තියක් සෙයින් නැඟෙයි. මෙහි දෙවන හිර පටන් ගෙන වැව් පොකුණු ගඟ හොය දිය සිඳී, ක්‍රමයෙන් සත්දහනෙළෙහි දිය සිඳී, සුවාසුදහසක් යොදුන් මුහුද දිය සිඳී, මහපොළෝ මෙරවුදුරු ආදී එකපැහැර දුමා සත්වන හිරු නැඟිකල තෙල හනා සමකොට ඇවිල වූ කබඹිලියක් සෙයින් ඇවිලගෙන එකපැහැර දිලී, සවුමනරජයෙහි පටන් ගෙන සදෙව්ලොව රුවන්විමන්

1. ගොයම්නැගී. 2 ලියතුරුළු, තුරුල්යදු. 3. කල් 4. හිරු

ඇ ඇවිල, එයින් නැඟී ප්‍රථමධ්‍යානතලයෙහි ඇවිල, රජෝරේණුවක් පමණ ද සංස්කාරධර්මකෙනෙක් ඇත් නම් ඒ තාක් කල් නො නිවී ඇතිතාක් සංස්කාර-ධර්මයන් දවා, නිරුපාදනව සන්හිඳෙයි. විපත්තිකර මහාමේඝයෙහි පටන්ගෙන ජ්වාලොපච්ඡෙද දක්වා විසිඅනන්තඃකල්පයක් පමණ කලින් වෙයි. මේ ය සංවර්ත නම් ඉක්බිති එ පමණ කල් නො සැදූ බෙරක බෙරබුහුරක් සෙයින් කෙළලක්ෂයක් සක්වළ නො සැදී සිටී. මේ ය සංවර්ත ස්ථායී නම්වේ.

ඉක්බිති හැමසතුන්ගේ පිනින් මේ කෙළලක්ෂයක් සක්වළ එකපැහැර සම්පත්තිකාරමහාමේඝ නැඟ හිඳිකටු පමණ ධාරා ඇතිව ක්‍රමයෙන් ධාරා දළුවෙමින් හීදඬු පමණ ධාරා ඇති ව, හුණ්දඬු පමණ ධාරා ඇතිව, පුවක්කඳ පමණ ධාරා ඇතිව, තල්කඳ පමණ ධාරා ඇතිව, වාපොළොව පටන් ගෙන ප්‍රථමධ්‍යානතල දක්වා කෙළලක්ෂයක් සක්වළපුරා වැස නිවෘත්තවෙයි. ඉක්බිති සංවර්තශිඛියෙහි වායුවෙක් හටගෙන උදකය ක්‍රමයෙන් විසලා බොල් කෙරෙමින් බසයි. බට බට තැන බඹලෝද්දු සදෙව්ලෝද්දු හටගන්නී. ඉක්බිති ක්‍රමයෙන් දිය හැසී මිනිස්ලොව වුවමනා තැනට සම්ප්‍රාප්ත වූ කල, දෙලක්ෂසතළිස් දහස් යොදුන් මහපොළොව තබා, එයින් අධිකය ගෙන වයින් පැහැර, මුහුදු වුවමනා තැන් ගැඹුරු කොට, සතර මහදිව්, දෙදහසක් කුදිව්, වුවමනා තැන් ගොඩ කොට, ත්‍රිකූට මෙරගල් සත්කුලපවු සක්වළගල් ඈ ලොකවින්‍යාස හා හැමසතුන්ගේ කර්මප්‍රත්‍යය ඍතුවිසින් කරනු ලැබෙයි. ඉක්බිති බඹලොවින් බඹහු චුතව මිනිස්ලොව උපද ශරීරප්‍රභායෙන් මිනිස්ලොව එකාලොක කොට ප්‍රීති ම ආහාර කොට අහස්හි ඇවිදුනෝ අසංඛ්‍යායුෂ්කව 'ස්ත්‍රීහ, පුරුෂයහ' යනු නැති ව අභාවක ව බඹුන් සෙයින්

දීර්ඝරාත්‍රිය සිටිති. ඒ කාලයෙහි සියලු පෘථිවිය දඹුවෙල්බැම්මක් සෙයින් මධුර වෙයි. ඉක්බිති ඔවුන් කෙරෙන් එක්ලොල ජාතික වූ සත්ත්වයෙක්හු ඇඟිල්ලෙහි රසපොළොවින් මඳ දෑයක් පහරවා ගෙන දිව පහරවා බලා ඉතා "මධුරය මේ පෘථිවිය"යි කන්නට වද්දී ඔහු බලා සෙස්සෝ ද කති. ඔවුන්ගේ සිත ලොභබලයෙන් ඒ රස අන්තරහිත ව ගිය කල වැළිදු ඔවුන්ගේ පුණ්‍යප්‍රභාවයෙන් හියඅතු කැකුළු වැනි වූ භූමිපප්පටක හටගන්නී. එයිදු පරිභොග කොට බොහෝ කලක් සිටිති. ඉක්බිති එයිත් අන්තරහිත වෙයි. ඉක්බිති බදාලතා නම් ලිය හටගන්නී. එයිදු පරිභොග කොට බොහෝ කලක් සිටිති. එයිදු අන්තරහිත වූ කල කණ තොහො නැති ව සඩයංජාතහැල් හටගන්නී. එයිදු පරිභොග කොට බොහෝ කලක් සිටිති. මෙසේ මොවුන් අහර පරිභොග කරන්නට වදනා හා ම ශරීරයෙහි විවර්ණ්ණිතාදු ඇතිවෙයි. ස්වයම්ප්‍රභා නැති ව යෙයි. අහසින් යන ගමන් නැති ව බිම ගෙණ ඇවිදිති. එකල හැම දෙන එක්ව අනුශෝචනය කෙරෙති. "පෙසු කල අපගේ ශරීරප්‍රභායෙන් මුළුලෝ එකාලොකය. ප්‍රීතිභක්ෂයම්හ. අහසින් ඇවිද්දම්හ. දැන් අප සිත උපන් ලොභයෙන් මෙ හැම වැරද්ද[1]. අපට ආලොකයෙක් උපහොත් මැනවැ"යි සිතති. ඔවුන්ගේ සිත් හා සමගම ඔවුන්ගේ පුණ්‍යප්‍රභාවයෙන් පණස්යොදුන් හිරුවිමන පහළව ආලොක කෙරෙයි. එකල හැමදෙන[2] "අප ශෝකිව ලීන වූවානට සූරභාවය උපයමින් උපන. එබැවින් මෙයට 'සූර්‍යයී'යි නම් තබම්හ"යි හිරුවිමනට 'සූර්‍යයී'යි නම් තබති.

ඉක්බිති හිරුවිමන බැසගිය කල "යම් ආලොකයෙක් අපට වීද, හේ විනාශයට ගිය. අනික් ආලොකයෙක් වූවදහ"යි සිතති. එකල සඳවිමන පහළවෙයි. එ බලා "මේ අපගේ ඡන්දානුකූල ව උපන්නේය. එබැවින් මෙයට 'සඳ'යි නම් තබම්හ"යි සිතා සඳ

1. වරද. 2. හැමදෙනන්.

විමනට චන්ද්‍ර නම් තබා වාසය කෙරෙත්. මෙතෙකින් සම්පත්නිකර මහාමේඝයෙහි පටන්ගෙන හිරසඳ පාළුවූ තැන් දක්වා විවට්ටි නම් වෙයි. මෙයිදු විසි අන්තඃ- කල්පයක් පමණ කලින් සිඩවෙයි. මෙසේ සත්ත්වයන් අහර පරිභොග කොට වාසය කරන කාලයෙහි ඔවුන් විසින් වළඳනාලද ආහාර ඖදරිකයෙන් කරල ඇතිවෙයි. එබැවින් ම මූත්‍රපුරීෂ ඇතිවෙයි. එ නික්මෙනු සඳහා මුත්‍රමාර්ග පුරීෂමාර්ග ඇතිවෙයි. මෙ දෙක්හි මූත්‍රමාර්ගය උපදනේ ස්ත්‍රිනට ස්ත්‍රිනිමිත්ත ඇති වෙයි. පුරුෂයනට පුරුෂනිමිත්ත ඇතිවෙයි. එකල ස්ත්‍රිහි පුරුෂ නිමිත්ත එක්වන් බලති. පුරුෂයෝ ස්ත්‍රී නිමිත්ත එක්වන් බලති. මෙසේ වත් ම සතත නොපැහී සිටි කෙලෙස් නිද පුබුදු[1] නයකු පැණ කොට නැගෙන කලක් සේ සතත උපද්දී. ඉක්බිති එ කෙලෙස් වශයෙන් අළුත වැදූ සතුන් උගැන්වූවන් තැන ද මවුන් තන ගෙන කිරි බොන්නා සේ අනාදි- මත් සසර වූ අභ්‍යාස වශයෙන් ස්ත්‍රී පුරුෂයෝ ඔවු'නොවුන් හා මෛථුනයෙහි පවතිත්. මෙසේ විත්‍රියා දුටුවෝ "මෙ: නො මැනව. නොප වැනි සත්ත්වයෝ කි සේ නම් එක්සතක්හට[2] මෙ වැනි විත්‍රියාවක් කෙරෙත්?[3]"යි කැවිත් දඬියෙන් සිපා ලුහුබදිති. එකල ඔහු මිතිසුන් නො දක්කදී වල්වැද ඇවිදුනාහු තමන් කැමති මෛථුනයෙහි පැවත එයින් විරමණය නොකට හෙනුමෝ "අපඤාවත් මෙසේ කැවිව ඇවිදිනට නොපිළිවන. එබැවින් ඔවුන් හා කැටිව වාසය කරම්හ: අප කරන නො මැනව නො පැනෙනයේ අභස අවුරා වුවන කොට, ගන්මහ"යි සිතා ගෙකොට ගත්ති. ඉක්බිති මෙසේ තමන් කැමැති අසද්ධර්මයෙහි පැවැත සවයඤ්ජාතහැල් පරිභොග කෙරෙති. ඉක්බිති ඔවුන් සිත ලොභ වඩුත් වඩුත් කණ හවගත්නී. නොහො ද

1. කෙලෙස්නු නිද පුබුදු වත් 2. එක්සතෙක් එක්සතෙක්හට
3. කෙරෙ

හටගන්නී ඉක්බිති වපුල මිසැ නො නැගෙයි. එකල ක්ෂෙත්‍ර වත් කොට ගෙන ගොවිකම් කෙරෙත්.

ඉක්බිති සොරා ගත්තාහු ඇතිවන්නාහ. මෙසේ ද කොටගෙන දඬුමුගුරු ආදී ආවුධ ගෙන කොටා ගනිති. මෙසේ කොටාදුගෙන තමන් විසින් සොරුන් නො වැළකෙන කල හැමදෙන කැටි ව බැණ ගෙන එනැකු නායක කෙරෙත්. "අප හැමදෙනමෝ අප කළ ශස්‍යයෙන් තට භාගයක් දෙම්හ. එ ගෙන තා වැටී වරද කළනාක් දෙනා පටවව"යි[1] සම්මත කෙරෙති. හේ මහජනයා විසින් සම්මත කරනු ලදුයෙන් මහා සම්මත නමුදු වෙයි. ක්ෂෙත්‍රට නායකයෙන් ක්ෂත්‍රිය නමුදු වෙයි. ධැමින් සෙමින් ජනයන් රඤ්ජනය කරන්නෙන් රාජා'යි දු කියනු ලැබේ. මෙසේ පාපධර්‍මයන් ලොකයෙහි උත්පන්න වන සේ බලා එ පියා ආරණ්‍යායතනයට වැද මහාබ්‍රහ්මයන් විසින් මනුෂ්‍ය ලොකයට අවුදු දෙසන ලද ත්‍රිවෙදයෙහි උක්තක්‍රමයෙන් රූපාරූපඅෂ්ටසමාපත්ති උපයා වාසය කරනුවෝ බාහිතපාපය හ'යි ලොකයෙහි ප්‍රසිද්ධ බ්‍රාහ්මණයහ යන නම් ලැබෙති. මෙසේ වාසයට නොහැකි ව මනුෂ්‍යවාසයට අවුදු කසි[2]වණිජ්ජාදි කොට වාසය කරන්නෝ වෛශ්‍යයහ යි කියනු ලැබෙති. හැමයෙන් නිකෘෂ්ට වූ කම් කොට වංසය කරන්නාහු ක්ෂුද්‍රයහයි යන නම් ලැබෙති. මෙසේ හිරු සඳු පහළවූ තැන් පටන් ගෙන විඅනනඃකල්පයක් සිට විපත්තිකරමහාමේඝයට සම්ප්‍රාප්ත වන නාක්[3] විවර්‍තස්ථායි නම් වෙයි. මෙසේ වන සංවර්‍තීය තෙජස්සංවර්‍ත නම් වෙයි.

ආපස්සංවර්‍ත වායුසංවර්‍ත කිසෙයින් වේ'යි. යත්:- මේ න්‍යායෙන් සත් වරෙක ගිනින් නටකල විනීය-

1. පටවායි 2. ගබ 3. වනතැන් දක්වා.

ධ්‍යානතල ඇතුළු කොට දියෙන් එක් වරෙක නස්සී. එයින් ම ද්විතීයධ්‍යානතලයෙහි පරමායුෂ අටකපෙක් වන්නේ ය. මෙසේ ගිනින් සත්වරක් බැගින් දියෙන් එක්වරක් බැගින් සත්වරෙක කප නට කල සපණස් කපෙක් වෙයි. ඉක්බිති වැළිදු ගිනින් සත්වරෙක නට කල තෙසැට කපෙක් වෙයි. සුසැට වන කප වයින් නස්සී. එයින් ම ය වයින් නස්නා තෘතීයධ්‍යාන තලයෙහි පරමායුෂ සුසැටකපක් වනු. මේ දෙක දියෙන් නස්නා කල පළමු කීවාසේ විපත්තිකරමහාමේඝයෙහි පටන් ගෙන සත්හිරු නො නැඟෙයි. ක්ෂාරෝදක වැස සැඩ දියෙහි බහාලූ ලුණුපිඩක් සේ වා පොළොව පටන්ගෙන ද්විතීයධ්‍යානතල දක්වා කෙලලක්ෂයක් සක්වළ ඇනිත්‍යාක් සංස්කාරධර්මයන් විනාශ කොට සත්හිදී වයින් නස්නා කල විපත්තිකර මහාමේඝයෙන් මත්තේ වායු හටගෙන දියපොළෝ පස්පොළෝ මෙර මදුරු සක්වළගල් ඈ සියලු වස්තු කඩ කඩ කොට කඩා අහසට නඟා ගෙන එහි එහි පැහැර චූර්ණවිචූර්ණ කෙරෙමින් කෙලලක්ෂයක් සක්වළ තෘතීයධ්‍යානතල දක්වා පළමු කීවා සේ කිසි සංස්කාරධර්මලවයක් නැති කොට විනාශ කෙරෙයි. මෙ දෙසංහීයෙහි අවශිෂ්ටසර්වරූප පළමු කීවා සේ ම දතයුතු. මෙතෙකින් තුන්සංවර්තය දක්වන ලදී.

මේ නියායෙන් කෙලලක්ෂයක් සක්වළ නස්මින් සිටී. කෙළ ලක්ෂයක් සක්වළ නැසී සිටී. කෙළලක්ෂයක් සක්වළ හටගන්මින් සිටී. මෙසේ බොල දෙයොදුන් සුවහස් සතරනුනුවක්, පළල කෙළලක්ෂයක් සක්වළ ව්‍යාප්ත ව සිටි පෘථිවිධාතු විනාශයට යෙයි. පෘථිවිය පටන් ගෙන ශුභකෘත්ස්න බඹලොව දක්වා උද්ගත කල්ප විනාශක අබ්ධාතු[1] විනාශයට යෙයි. පෘථිවිය පටන් ගෙන ආභස්සර බඹලොව දක්වා උද්ගතකල්ප විනාශකතෙජෝධාතු විනාශයට යෙයි. පෘථිවිය පටන්

1. අජ්ධාතු - විසින්

ගෙන බෘහත්ඵල බඹලොව දක්වා උද්ගතකල්පවිනාශක වායොධාතුවින් විනාශයට යෙයි.

77

මේ ශරීරයෙහි තෘෂ්ණාඋපාදන කාරණ කොට ඇති අනිත්‍ය වූ ක්‍ෂණභඞ්ගුර වූ ඔදනකුල්මාෂොපචය වූ උත්සාදන පරිමර්දන භෙදන විධ්වංසන ධර්ම වූ සතර මහාභූතයෝ කෙ සෙයින් නම් සිටිනාහ නො සිටින්නෝ[1] විනාශයට යන්නෝ[2] ඔවුන් විනාශයට යන කල ඔවුන් ආශ්‍රය කළ උපාදය රූපයෝද උපාදයරූපයන් ආශ්‍රය කළ නාමධර්මයෝ ද මෙසෙයින් ම විනාශයට යන්නෝ. මෙසේ සර්වධර්මයන් අනිත්‍යයෙන් කුසල් කළ මනා සේ, බ්‍රමසරවස් පිරූ ව මනා සේ, මරණ නියත සේ වදාළහ. "කත්තබ්බං කුසලං චරිතබ්බං බ්‍රහ්මචරියං නත්ථි ජාතස්ස අමරණං" යි මෙසේ අනුන් මතු සඳහා වදාරන්නාහු නො වෙති. තමනටද වන මරණ නො වැළකිය හෙත්. එයින් වදාළහ තමන් පිරිනිවණෑ වහස්නා අප අනඳමහතෙරනට: නනු එතං ආනන්ද! මයා පටිගච්චෙව අක්ඛාතං සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො, තං කුතෙත්ථ ආනන්ද! ලබ්භා, යං තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං තං වත මා පලුජ්ජීති නෙතං ඨානං විජ්ජති" යි. මෙසේ සර්වධර්මයන් අනිත්‍ය වන බැවින් දුඃඛ වන බැවින් අනාත්ම වන බැවින් අෂ්ටදුෂ්ටක්‍ෂණ වර්ජිතවූ නවවන බුද්ධොත්පාදක්‍ෂණයට සම්ප්‍රාප්ත පණ්ඩිතජනයක් විසින් දෙසූ නෛර්‍යාණිකදහම්හි සේ පිළිවෙත් කොට තමන්ගේ අභිමුක්ති තුබූ පරිද්දෙන් ත්‍රිවිධ බොධීන් එක්තරා බොධියක් සමධිගම කටයුතු.

78

රූපාරූපබ්‍රහ්මලොකයෙහි උපද්නට තිසි ධ්‍යාන ද, සතර මග සතරඵල ද කි සේ වූයෙක්[3]

1. නොසිටින්නො 2 යෙත් නො 3. කිසේ වූයෙත්

උපයන්නට තිස්ස කිවැති පිළිවෙතෙකින් සිද්ධ වේයි යත්:— ජරාපාරිජුඤ්ඤය ව්‍යාධිපාරිජුඤ්ඤය, භොගපාරිජුඤ්ඤය, ඤාතිපාරිජුඤ්ඤය යන චතුර්විධ පාරිජුඤ්ඤයෙන් පරික්ෂීණභාවයෙන් උපහත ව, "මම මෙසේ ජරාදුර්ලභාවයට ව්‍යාධියට අනාථභාවයට ඥාති විනාශයට සම්ප්‍රාප්ත වූ බැවින් අනධිගතභොගයක් අධිගම කරන්නට අධිගත භොගයක් වෘද්ධියට පමුණුවන්නට නො හැක්කෙමි. එ බැවින් සසුන් වැද මහණ ව දිවිපෙවෙත් වටමි" යන මෙවෙනි අද්ධ්‍යාශය නැති ව, සම්‍යානුමූලක වූ මායාසඨාදිභාවයෙන් දුරු වූ කෙවලශ්‍රද්ධායෙන් "සම්‍යක්ප්‍රතිපත පැවැත ලෞකික ලොකොත්තර සම්පත් දුයාද වෙමියි"යි සිතා සසුන් වැද මහණ වූ ත්‍රිහෙතුකප්‍රතිසන්ධික වූ ශ්‍රද්ධාබුද්ධි සම්පන්න වූ කුලදරුවහු විසින් හවන්නට තිස්ස. මෙසේ වූවනුදු විසින් සිල් පිහිටා හැව්ව මනා බැවින්–

"සංසාරසමාචාරෙ – දුස්සීලෙ සීලවජ්ජිතෙ,
නත්ථි ඨානං කුතො මග්ගො –
තස්මා සීලං විසොධයෙ"යි

කී වන බැවිනුදු සෞශීල්‍ය වශයෙන් කායවාක්කර්ම අවිප්‍රකීර්ණකර වූ සමාධානාර්ථයෙනුදු, මහද්ගතානුත්තර කුශලධර්මයනට ප්‍රතිෂ්ඨාභාවසාධක වූ උපධාරණාර්ථයෙනුදු එකාකාර වූ, චාරිත්‍ර වාරිත්‍ර විසින් ද්විවිධ වූ, පඤ්චාදෙදශපර්‍යාපන්න වූ, ස්කන්ධ විසින් සප්තාපත්තිස්කන්ධපර්‍යාපන්න වූ, ශික්ෂාපදගණනායෙන් අධිකපඤ්චසතපරිමාණ වූ, විභාගවශයෙන්–

"නවකොටිසහස්සානි – අසීතිං සතකොටියො
පඤ්ඤාසං සතසහස්සානි–ඡත්තිංසා ච පුනා පරෙ

එතෙ සංවරවිනයා-සම්බුද්ධෙන පකාසිතා
පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා-සික්ඛා විනයසංවරෙ"යි

පෙය්‍යාලමුඛයෙන් නවදහස්එක්සිය අසූකෙළ ප ණ ස් ල ක්ෂ ස ති ස් සිඛයෙකැ, යි *කියනලද ප්‍රාතිමොක්ෂසංවරශීල ද, මෙසේම අනෙකාකාරයෙන් විභාගකරනලද ඉන්ද්‍රියසංවරශීල ද, කුහනා ලපනාදි එක්විසිඅනෙසනයෙන් දුරු වූ ආජීවපාරිශුද්ධිශීල ද, අෂ්ටාඞ්ගසමුපෙත වූ ප්‍රත්‍යවෙක්ෂායෙන් පුත්‍රමාංසොපම කොට දක්වන ලද ප්‍රත්‍යය උත්තමබ්‍රාහ්මචය්‍යී සඳහා පරිභොග කරන විසින් සුපරිශුද්ධ වූ ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීල ද'යි මෙසේ දක්වනලද චතුර්විධශීල ඛණ්ඩඡිද්දසබලාදිභාවයට නො පමුණුවා අඛණ්ඩ, අච්ඡිද්ද, අසබල, අකම්මාස, භුජිස්ස, විඤ්ඤුප්පසත්ථ, අපරාමට්ඨ, සමාධිසංවත්තනික යන අෂ්ටාඞ්ගයෙන් යුක්ත කොට පුරා අතිපරිශුද්ධශීලවිශුද්ධියට සම්ප්‍රාප්ත වූ ශුද්ධශීලයෙහි සිටි මහද්ගතලොකොත්තර භාවනා කර්මයෙහි යුඤ්ජනය[1] කරුනුයෙන් යොගී ය යි කියනලද සිල්වත්හු විසින් පිටකත්‍රය පස්හවුරුද්දක් හදරා දසහවුරුද්දක් පරිප්‍රශ්න කොට, නොහොත් දස හවුරුද්දක් හදරා විසිහවුරුද්දත් පරිප්‍රශ්න කොට, නෛය්‍යාණිකධර්මයෙහි ශූරව එ පමණකට නොතිසි වුව හොත්:—

**පියො ච ගරු භාවනීයො-වත්තා ච වචනක්ඛමො,**
**ගම්භීරඤ්ච කථං කත්තා -**
**නො චට්ඨානෙ නියොජයෙ''යි**

දක්වනලද සප්තාඞ්ගයෙන් යුත් තථාගත ශ්‍රාවක ආචාය්‍යීන්හු කරා එළඹ, තමාගේ චය්‍යීනුකූල වූ සමථවිදර්ශනාකර්මස්ථාන ග්‍රන්ථ අර්ථ විසින් පාළි විසින් යම් තැනෙක ආශංකා නූපදනා පරිද්දෙන් උගෙන කෙශච්ඡෙදන පාත්‍රපචන චීවරරඤ්ජනාදි ක්ෂුද්‍රක පරිරොධ නිමවා:—

* පූජාවලිය 182 – 558 බලනු.   1. යුඤ්ජනයොග

“ආවාසො ච කුලං ලාභො -
ගණො කම්මඤ්ච පඤ්චමං,
අද්ධානං ඤාති ආබාධො-ගන්ථො ඉද්ධීතිතෙ දසා”ති

යන දසවිධ මහාපරිරොධො'පච්ඡෙද කොට:—

“මහාවාසං නවාවාසං-ජරාවාසඤ්ච පන්ථනිං,
සොණ්ඩිං පණ්ණඤ්ච පුප්ඵඤ්ච-ඵලං පත්ථිතමෙව ච

නගරං දරුණාඛෙත්තං - විසභාගෙන පට්ටනං,
පච්චන්තසීමා සප්පායං-යත්ථ මිත්තො න ලබ්භති”යි

දක්වන ලද අෂ්ටාදශවිහාරදෙෂවර්ජිත වූ “ඉධ භික්ඛවෙ සෙනාසනං නාතිදූරං හොති නාච්චාසන්නං ගමනාගමනසම්පන්නං, දිවා අප්පකිණ්ණං රත්තිං අප්පසද්දං අප්පනිග්ඝොසං, අප්පඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සං ඛො පන හොති, තස්මිං ඛො පන සෙනාසනෙ විහරන්තස්ස අප්පකසිරෙනෙව උප්පජ්ජන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, තස්මිං ඛො පන සෙනාසනෙ ථෙරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා” යනාදිවිසින් දක්වනලද පඤ්චාඞ්ගයෙන්යුත් සෙනස්නෙහි වාසය කරනුවහු විසින් පිණ්ඩපාතයෙන් ප්‍රතිනිවෘත්තව භාවනායොගානුකූල වූ ඍතුසම්පන්න වූ විවික්ත අවකාශයෙක්හි අෂ්ටාදශපෘෂ්ඨකණ්ටක ඍජු කොට පයඞ්ක බැඳ හිඳ “පළමුව මම නෛර්‍යාණික වූ තථාගතශාසනයෙහි පැවිජි වූයෙම් ය”යි ප්‍රීති උපයා, ඉක්බිති “මාගේ සීලයට කලඞ්ක නැති හෝ?”යි සිල් සොයා නිර්මලවූ සිල් වී නම් එයින් බලවත් ප්‍රීති උපයා, ඉක්බිති නිරන්තරානුස්මරණයෙන් සියලු නාමකාය රූපකාය සනහා, ඉක්බිති ආචාර්‍යයා කෙරෙන් නමා යොදවාගත් – “පඨවිකසිණං, ආපොකසිණං, තෙජොකසිණං, වායොකසිණං, නීලකසිණං, පීතකසිණං, ලොහිතකසිණං, ඔදාතකසිණං, ආකාසකසිණං,

ආලෝකකසිණං" යන දසකසිණයෙන් එකකසිණක් හෝ,- උද්ධුමාතකං, විනීලකං, විපුබ්බකං, විච්ඡිද්දකං, වික්ඛාසිතකං විකඛිත්තකං, හතවිකඛිත්තකං, ලොහිතකං, පුළවකං, අට්ඨිකං" යන දසඅසුභයෙන් එකක් හෝ, බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දේවතානුස්සති, උපසමානුස්සති, මරණානුස්සති, කායගතානුස්සති, ආනාපානසති"යි කියන ලද දශානුස්මෘති විසින් හෝ,- මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්මවිහාර විසින් හෝ, චතුර්විධ ආරූප්‍ය විසින් හෝ, ආහාරයෙහි ප්‍රතිකූල සඤ්ඤා, චතුර්ධාතු ව්‍යවස්ථා විසින් හෝ එක් කර්මස්ථානයක් ගෙන භාවනායෙහි පැවත පරිකර්මසමාධි උපයා ඉක්බිති නීවරණ ධර්මයන් කෙරෙන් විනිර්මුක්ත වූ උපචාරසමාධි උපයා, ඉක්බිති අර්පණාසමාධි උපයා, "ආවජ්ජන, සමාපජ්ජන, අධිට්ඨාන, වුට්ඨාන, පච්චවෙක්ඛණ"යයි කියන ලද පඤ්චවශිතාප්‍රාප්ත කොට 'රූපා රූප අෂ්ටසමාපත්ති උපයන ප්‍රකාර ද, ඉදින් අභිඥා උපවියැටි වුව හොත්,—"කසිණානුලොමතො, කසිනපටිලොමතො, කසිණානුලොමපටිලොමතො, ඣානානුලොමතො, ඣානපටිලොමතො, ඣානානුලොමපටිලොමතො, ඣානුක්කන්තිකතො, කසිණුක්කන්තිකතො, ඣානකසිණුක්කන්තිකතො, අඞ්ගසඞ්කන්තිතො, ආරම්මණසඞ්කන්තිතො, අඞ්ගාරම්මණසඞ්කන්තිතො, අඞ්ගවවත්ථාපනතො, අරම්මණවවත්ථාපනතො" යන චතුර්දශාකාරයෙන් ආදි අට කිසුණෙහි චිත්තපරිදමනය කොට,—

"ඉද්ධිවිධං දිබ්බසොතං-පරචිත්තවිජානනං,
පුබ්බෙනිවාසානුස්සති - දිබ්බචක්ඛු ති පඤ්චධා"යි
දක්වන ලද පඤ්චාභිඥා උපයන ප්‍රකාර ද,

"අනාගතංසඤාණස්ස – යථාකම්මූපගස්සච,
පරක්කමං විසුං නත්ථි – ඉජ්ඣන්ති දිබ්බචක්ඛුනා"යි.

දක්වන ලද දිව්‍යචක්ෂුරභිඥානයෙහි පරිබන්ධරූපයෙන් සිද්ධවන යථාකර්මෝපගඥානය හා අනාගතාංශඥානය උපයන ප්‍රකාරද මෙ පමණෙකින් නිවෘත්ත කොට මෙසේ උපයු[1] රූපාරූප අෂ්ටසමාපත්ති පාදක කොට ලෝකෝත්තරසමධිගම කැටැවි යෝගාවචරයහට ප්‍රාතිමෝක්ෂශීල ම ශීලවිශුද්ධි වන බැවින් උක්තප්‍රකාරයෙන් සිද්ධකරන ලද උපචාරසමාධි අර්පණාසමාධි ම චිත්තවිශුද්ධි වන බැවින් මෙසේ සිද්ධ වූ විශුද්ධිද්වයෙහි පිහිටා භූමියෙහි උගත් නාමරූපධර්මයන් ස්කන්ධධාත්වායතනෙන්ද්‍රියප්‍රතීත්‍යසමුත්පාදදී විසින් ව්‍යවස්ථා කොට නාමරූපධර්මයන් විනා ඔවුන් කෙරෙන් පිටත් පරපරිකල්පිත ආත්මජීවපුද්ගලාදීන්ගේ අභාව දක්මෙන් දෘෂ්ටිවිශුද්ධි උපයා, ඉක්බිති ඒ නාමරූපධර්මයන් සහේතුසප්‍රත්‍යය සේ දක්මෙන් කාඞ්ක්ෂාවිතරණවිශුද්ධි උපයා, ඉක්බිති සර්වනාමරූපධර්මයන් ලක්ෂණත්‍රයාරෝපණය කොට කලාප විසින්, යමක විසින්, ක්ෂණිකාදි විසින් ලක්ෂණ සම්මර්ශනය කොට:-

"ඔභාසෝචෙව ඤාණං ච – පීතියාච විකම්පති,
පස්සද්ධියා සුඛෙ චෙව – යෙහි චිත්තං පවෙධති.

අධිමොක්ඛෙ ච පග්ගහෙ – උපට්ඨානෙච කම්පති,
උපෙක්ඛාවජ්ජනායං ච – උපෙක්ඛාය නිකන්තියං"යි.

දක්වන ලද දශවිධ විදර්ශනෝපක්ලේශ උපන් කල එසේ උපන් උපක්ලේශධර්මයන් නිර්වාණයට මග නො වන සේ දැන, ත්‍රිලක්ෂණමනස්කාර ම මග සේ දැන, සර්වධර්මයන් ලක්ෂණත්‍රයාරෝපණය කොට මනස්කාර කෙරෙමින් මාර්ගාමාර්ගඥානදර්ශනවිශුද්ධි උපයා ඉක්බිති, ප්‍රතිපත්ඥානදර්ශනවිශුද්ධි ය යි කියන උදයව්‍යය භඞ්ග භය ආදීනව නිර්වේද විමෝක්තුකාමතා ප්‍රතිසඞ්ඛ්‍යාන

1. උපයු

සංස්කාරොපෙක්‍ෂා අනුලෝමසඞ්ඛ්‍යාත නවවිධ විදර්ශන ඥාන පරම්පරායෙන් ගොස්, ඥානදර්ශනවිශුද්ධිසඞ්ඛ්‍යාත සතර මග ද, ඔවුන්ගේ ම සතරඵලද උපයන ප්‍රකාර ද පිටකත්‍රයෙන් උද්ධරණය කොට තුදුස් දහස් පන්සිය ග්‍රන්ථයෙන් දක්වන ලද විසුද්ධිමාර්ගයෙන් දතයුතු.

79

එක් කපෙක බුදුහු එක්කෙනෙක් හෝ උපදිති. දෙදෙනෙක් හෝ උපදිති. තුන්දෙනෙක් හෝ උපදිති. සතර දෙනෙක් හෝ උපදිති. පස්දෙනෙක් හෝ උපදිති. මෙහි එක්කෙනෙකුන් උපදනා කප සාරකල්ප නම් වෙයි. දෙදෙනෙකුන් උපදනා කප මණ්ඩකල්ප නම් වෙයි. තුන්දෙනෙකුන් උපදනා කප වරකල්ප නම් වෙයි. සතර දෙනෙකුන් උපදනා කප සාර-මණ්ඩකල්ප නම් වෙයි. පස්දෙනෙකුන් උපදනා කප භද්‍රකල්ප නම් වෙයි. මෙහි මේ නම් කි සෙයින් වේ'යි යත්:-

ගුණසාර රහිත ලොකයෙහි සාරොත්පාද විසින් එක් සම්‍යක්සම්බුද්ධ කෙනෙකුන් උපන් කප 'සාරකල්ප' නම් වෙයි. උත්පන්න වූ ගුණ පහයමින් මණ්ඩභාවයට පමුණුවමින් විතීයසම්‍යක් සම්බුද්ධයන් උපන් කප 'මණ්ඩකල්ප' නම් වෙයි. පළමු උපන් බුදුහු දෙවන බුදුන් ව්‍යාකරණ කෙරෙති දෙවන බුදුහු තුන්වන බුදුන් ව්‍යාකරණ කෙරෙති එකල සත්හු "මත්තේ බුදුහු උපදිති"යි ලබ්ධාශ්වාස ව තමන්ගේ ප්‍රණිධි වශයෙන්ං රුස්වන් නොයි තුන්දෙනෙකුන් උපදනා කප 'වරකල්ප' නම් වෙයි. සතරදෙනෙකුන් උපදනා කප සාරභාවය ද මණ්ඩභාවය ද ඇතිවන බැවින් 'සාරමණ්ඩ කල්ප' නම් වෙයි පස්දෙනෙකුන් උපදනා කප එය වඩා සුන්දරයක් භද්‍රයක් ලොකයෙහි [illegible] භද්‍රකල්ප නම් වෙයි.

"සතරඅසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් පෙරුම්පුරා බුදුවෙති" යනාදි තන්හි අසඞ්ඛ්‍යගණනායෙන් අවධි කී සේසින් ගත්තේය යත්:- මෙසේ බුදුන් උපන් කප තො ගැන අතුරෙහි එක් කපෙක නො උපද දෙවන කප බුදුන් උපන එ කපුදු ගණනට නො ගෙන, මෙසේ ම තුන්වන කප උපන ද සතරවන කප උපන ද යාවත් දසවන විසි වන තිස් වන සියක් වන ලක්‍ෂයක් වන කපුදු බුදුන් උපන එ කපුදු ගණනට නො ගෙන, යම් කාලෙක බුදුන් නැති කප් පෙරළා කප්සඞ්ඛ්‍යා නැතිව ගිය නම් එයින් උත්තරයෙහි යම් කපෙක බුදුන් උපන් කල මෙ දෙ අතුර එක් අසඞ්ඛ්‍යයක් කොට ගෙන මේ නියායෙන් සතර අසඞ්ඛ්‍යකල්පලක්‍ෂ අවධි දතයුතු. මෙසේ වූ සාරාසඞ්ඛ්‍යකල්පලක්‍ෂාදී පෙරුම් පුරා බුදුහු උපදිත් නම් මෙ සක්වළ උපදිති. මෙයින් බැහැර සක්වළ නො උපදිත්. මේ සක්වළත් මෙරින් දකුණු මුහුණ උපදති. එහිදු දඹදිව උපදති දඹදිවත් මධ්‍යදෙශයෙහි උපදිත්. බුදුහු යම්සේ මෙහි මිසැ නො උපදිත් ද, එසේ ම බුදුන් මවු ද, පියෝ ද, අගසවුවෝ ද, පසේ බුදුහු ද, සක්විත්තෝ ද, මෙ සකවල දඹදිව මධ්‍යදෙශයෙහි මිසැ බැහැර නො උපදිත්. මෙසේ මෙ සක්වළ උපදනා බුදුන්ගේ දසදහසක් සක්වල ජන්මක්‍ෂෙත්‍රය වේ. එ බැවින් බුදුවන බෝසතුන්ගේ ප්‍රතිසන්ධියෙහි ද, මහාභිනිෂ්ක්‍රමණයෙහි ද, සම්‍යක් සම්බොධිසම්ධිගමයෙහිද ධම්වක්‍රප්‍රවර්තනයෙහි ද, ආයුර්විසර්ජනයෙහි ද කම්පිත වේ.

කෙළලක්‍ෂයක් සක්වල ආඥාක්‍ෂෙත්‍රය වේ. එබැවින් ම එහි බුදුන් විසින් දෙසූ ආටානාපියසුත්, ඉසිගිලිසුත්, ධජග්ගපිරිත්, බොජ්ඣඞ්ගපිරිත්, ඛන්ධපිරිත්, මොරපිරිත්, ආදි සූත්‍රයන්ගේ ආඥාපැතිර සිටී. මෙසේ දක්වන ලද ජන්මක්‍ෂෙත්‍ර හා ආඥාක්‍ෂෙත්‍ර දෙකින් පිටත මේ සක්වළ උපන් බුදුන්ගේ විෂයක්‍ෂෙත්‍ර වේ.

බුදුහු මෙසේ සිටි ත්‍රිවිධක්ෂෙත්‍රයෙහි සත්තට අවවාද කෙරෙත්. එයින් අටුවා[1] කීහ. සෙලසූත්‍රයෙහි[2]: "යංමං ත්වං සෙල! "රාජා අරහසි භවිතුන්තිවදෙසි එත්ථ අප්පොස්සුක්කො හොහි. රාජාහමස්මි සතිව රාජනෙන යථා අඤ්ඤරාජානො යොජනසතං වා අනුසාසන්තියො ජනසගස්සං වා. චක්ක වත්තිහුත්වාපි චතුදීපපරියන්තමත්තං වා නාහමෙවං පරිච්ඡින්නවිසයො. අහංහි ධම්මරාජා අනුත්තරො භවග්ගතො අවීචිපරියන්තං කත්වා තිරියං අප්පමාණලොකධාතුයො අනුසාසාමි. යාවතා හි අපදද්විපදාදිභෙද සත්තා අහං තෙසං අග්ගො. නහි මෙ කොචි සීලෙන වා සමාධිනා වා පඤ්ඤාය වා විමුත්තියා වා, විමුත්තිඤාණදස්සනෙනවා පටිභාගො අත්ථි ස්වාහං එවං ධම්මරාජා අනුත්තරො*"යි. මෙසේ සිටි ත්‍රිවිධක්ෂෙත්‍රයෙහි විෂයක්ෂෙත්‍රයෙහි ආඥාක්ෂෙත්‍රයෙහි දෙතැන සත්තට බුදුන්ගේ දෙසනාවාසනා-සන්තානයට[4] හෙතු වෙයි. ඒ ක්ෂෙත්‍රවයෙහි සත්හු අධිගම යොග්‍ය නො වෙත්; කාමාවචර කුසල් කොට සප්තකාම ස්වර්ගයෙහි උපදිති. මහද්ගත කුසල් කොට රූපා'රූපබ්‍රහ්මලොකයෙහි උපදිත්. යම්සේ බුදුන් උපදනා ජන්මක්ෂෙත්‍රයෙහි සත්හු නොයෙක් අසංඛ්‍යයෙහි බුදුන් නො උපන් කල මාවටන්ධම් ආදි පුණ්‍යක්‍රියායෙහි පැවත කාමස්වර්ගයෙහි උපදිද්ද, සක්වළ හටගත් කල බඹලොවින් බවුත් අවුදු කියන ලද වෙද ග්‍රන්ථයෙහි සෙයින් මිනිස්සු රූපා'රූප අෂ්ටසමාපත්ති උපයා බඹලොව උපදිද්ද, යම්සේ කපතන්තා පෙරට කාලරත්නාදි පිපිලිකාවන් පවත්ගෙන සර්වප්‍රාණීයෝ අනාදිමත් සංසාරයෙහි සිඩ වූ අපරාපර්‍ය වෙද්‍යපුණ්‍ය-කර්මයෙන් කාමස්වර්ගයෙහි උපද එති. සිට ධ්‍යාන්හවා ගෙන බ්‍රහ්මලොකයෙහි උපදිද්ද, එසේම ලොකධාතුව සත්හු බුදුහු බුදුන් ඇති කල බුදුන්ගේ අනන්තාපරිමාණ

1. එයින් වදාළහ බුදුහු 2. සෙලසූත්‍රයෙහි * මජ්ඣිම නිකායඨ කථා - 277. 4. වාසනා ධානයට, වසන ස්ථානයට

අනුශාසනා වශයෙන් බුදුන් නැති කල ධර්මතාවශයෙන් මවුපිය නැදමයිල් ආදීන් කෙරෙහි, ගරසර උපයා, ඔවුන් විෂයෙහි දානාදිය පවත්වන්නෝ මාවටන්ධම් පියවටන්ධම් ආදිය දශකුශලකර්මපථ ආදිය පැවත, කාමාවචර දෙව්ලොව උපදිති. කප හට්ගත් කල ඒ ඒ බඹලොව බඹුන් විසින් දෙසන ලද වෙදයෙහි. සෙයින් ධ්‍යාන්භාවා බඹලොව උපදිත්. ජන්මක්ෂේත්‍රයෙහි උපන් කල්‍යාණ පෘථග්ජනයෝ වනාහි බුදුන් උපන් කල බුදුන්ගේ දෙශනානුසාරයෙන් ප්‍රතිපත පවත්නාහු අධිගම කෙරෙත්. මේ ලෝකධාතුවින්[1] පිටත් අනන්තාපරිමාන ලොකධාතුව බුදුහු නැත. එහි වූවානට අධිගම් කි සෙයින් වේ'යි. යත්: බුදුන් මෙ සක්වළ උපන් කල බුදුන්ගේ රශ්මිස්පර්ශී දර්ශනස්පර්ශී ලද අනුශාසනා ලද සත්හු සසර විරාග ඇති වූහු නම් විෂයක්ෂේත්‍ර ආඥක්ෂේත්‍ර දෙකින් අවුදු නමන් ප්‍රණිධි තිබූ සෙයින් ජන්මක්ෂේත්‍රයෙහි උපද අධිගම කෙරෙත්. සසර නිර්විද නැති, සසරින් නො යැපි, නිවන් අධිගම කරන්නට නිසි කුසල් නො කළ නාස් දෙතනට වනාහි ජන්මක්ෂේත්‍රයෙහිදු උපන් බුදුන් හා එක නුවරැදු වාස කෙරෙත්. බුදුන් වසන විහාරයෙහිදු වසත් අධිගම නැත්. එ බැවින් බුදුහු අධිගම කරන්නට නිසි කුසල් කළාහට ම වෙති. නො එසේ වූවානට බුදුහු නම් නැත්. එයින් විදළහ බුදුහු:

"අත්තා හි අත්තනො නාථො–කො හි නාථො පරොසියා
අත්තනාව සුදන්තෙන – නාථං ලභති දුල්ලභං යි".

81

බුදුන්ගේ මහාකරුණා හැම සතුන් කෙරෙහි ම සමව පවත්නා බැවින් හැම සත්නට අධිගම වූවමනා නො ද යත්:- යම්සේ ජංඝාව දක්වා අශුචිය ගැලී සිටියක්හු එයින් තමා සනහවා සුපරිසුඬ කට හැකි ද, එසේම කටීප්‍රදේශය දක්වා ගැලී සිටියක්හු, මුඛය දක්වා ගැලී සිටියක්හු

1. විසින්

ගිය පවත්ගෙන ගැලී සිටියක්හු, අහසට නැගූ අත මණිබන්ධය දක්වා ගැලීසිටියක්හු, එ පැනුන අත අත්ලා අශුචිත් නහා සනහවා සුධකරන්ට හැකි ද, එ පමණකුදු නො පැනී එක ඇඟිල්ලකුදු පැනෙත් හොත් එ ඇඟිල්ල හොත් සේ අත්ලා නහා ගෙන හිතකාමීන් විසින් සනහවා සුපරිසුධ කට හැකි ද, එසේ ම බුදුහු අශුචිය ජංඝාව දක්වා ගැලුනු පුරුෂයන් වැනි මන්ද ක්ලෙශ වූ අල්පපාප වූ, සසරින් ගොඩ නැඟෙන්නට නිසි බොහෝ කුසල් කළ ජනයන් සසරින් නඟත් ම ය. එසේ ම කටිප්‍රදේශය දක්වා මුඛය දක්වා, අහසට නැගූ අත මණිබන්ධය දක්වා, නොහොත් එක ඇඟිල්ලකුදු පැනෙන සේ අශුචියෙහි ගැලී ගිය පුරුෂයන් වැනි බහල ක්ලෙශ වූ බොහෝ පවු කළ අල්පමාත්‍ර වූ සසරින් නැගෙන්නට නිසි කුසල් කළවුන් සසරින් නඟත් මැ යි. ඇඟිල්ලකුදු නො පැනෙන සේ අශුචිය ගැලීගිය පුරුෂයන් "මෙහි ගැලුණු කෙනෙක් ඇති"යි දක්නට නිසි චිහ්න නැත්තෙන් කිසිවකුදු විසින් නඟන්නට යම් සේ එ සත්හු නො නිස්සෝ ද, එසේ ම සසරින් මිදෙන්නට නිසි අල්පමාත්‍ර ද, පුණ්‍යලව නැති සත්‍වන් තථාගතයෝ සසරින් නඟන්නට අසමර්ථයෝ. අලුයම "අද මා විසින් කහට අර්ථක්‍රියාවෙක් වෙයි දෝ හෝ?"යි මහා කරුණා සමාපත්තීන් ලොව බලන වේලෙහි අභව්‍යසත්ත්වයෝ ඥාන ජාලයෙහි ඇතුළු නො වෙත්. එයින් වදාළහ බුදුහු:-

"දූරෙ සන්තො පකාසෙන්ති-හිමවන්තොව පබ්බතො,
අසන්තෙත්ථ න දිස්සන්ති-රත්තිඛිත්තා යථා සරා" යි

පූර්වෝක්ත ක්‍රමයෙන් නිර්දිෂ්ටත්‍රිවිධක්ෂෙත්‍රයෙහි අනන්තාපරිමාණසතුන් අතුරෙහි "සම්‍යක්ප්‍රතිපත පැවැත නිරුපධිශෙෂ නිර්වාණධාතුවින් පිරිනිවියහ" යි පවත්නාසත්හු දුලීභයහ. එසේ වූවත් සම්‍යක්ප්‍රතිපත

පවත්වා[1] සසරදුකින් මුදන්නට නිසි, ශුක්ලාද්ධ්‍යාශය ඇති යම් මහාපුරුෂයෙක් සත්පුරුෂසංසර්ගය ලදින් ශුභාභ්‍යාසයෙහි පවත්මින්, සම්‍යග්දෘෂ්ටියෙහි පිහිටා, ධාර්මිකශ්‍රමණබ්‍රාහ්මණයන් කෙරෙහි සම්‍යක්ප්‍රතිපත්ති පවත්මින්, බුද්ධොත්පාදයට සම්ප්‍රාප්තව බුදුන් මහත් වූ බුද්ධානුභාවයෙන් සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කරනු බලාද, බුදුන්ගේ ගුණපණ්ඩිතජනයන් කියනු අසා ද, දසබලසමන්නාගතො භික්ඛවෙ! තථාගතො" යනාදි විසින් බුදුගුණ වදරණ තථාගතයන්ගේ ධර්මදෙශනා අසා ද, සිද්ධ වන තාක් අර්ථක්‍රියා දක්නා ද, ඍජු වූ අද්ධ්‍යාශය ඇති ව, කල්‍යාණාධිමුක්තික වැ, "මමදු මේ බුද්ධවංශය බුද්ධ ප්‍රවේණිය, බුද්ධධර්මය පරිපාලනය කෙරෙමි" යි බුද්ධත්වයෙහි බලවත් ඡන්ද උපයා, ප්‍රකෘතීන් ම කල්‍යාණාධිමුක්තික ව සකල සංසාරදුඃඛයෙහිදු සත්ත්වහිතාර්ථී වූ දුෂ්කරක්‍රියායෙහි දීර්ඝරාත්‍රිය ව්‍යායාම කිරීමෙහිදු උද්විග්න උත්‍රස්ත නො ව කල්‍යාණමිත්‍ර සන්නිශ්‍රිත ව, යම් තැනෙක අලග්න ව, එකාන්තයෙන් සම්බොධි නිම්නප්‍රවණප්‍රාග්භාර වූ සිත්සතන් ඇති ව, සත්ත්වයනට හිතචර්‍ය්‍යා සඳහා උපන් බුදුන් කෙරෙහි 'බුදු වෙම්ව' යි ප්‍රාර්ථනා කොට, විශද වූ ඉන්ද්‍රියයන් ඇති ව, විදග්ධඥත ඇති ව, හුදක් පරහිත සඳහා පැවැත, ආත්මහිතයෙහි නිරපෙක්ෂ ව, ප්‍රකෘතීන් දානාද්ධ්‍යාශය ඇති ව, විද්‍යමාන දෙය ධර්මයෙහි සංකොචභාවයට නො පැමිණ, නිත්‍යයෙන් සංවිභාග සීලී ව, දානයෙහි නිත්‍යයෙන් ප්‍රමුදිතහෘදය ඇති ව, උදාසීන භාවයට නො පැමිණ, මහදන් දීදු එයින් තුෂ්ට නො ව, දන් දෙනු සඳහා අන්නට උත්සාහ උපයන විසින් දානයෙහි වර්ණවාදී ව, ජනයනට දානප්‍රතිසංයුක්තධර්මකථා කොට දන් දෙනුවන් බලා තුෂ්ට ව, භය උපන් සත්ත්වයනට අභය දී ප්‍රාණාති-

1. පැවැතා

පාතාදිපාපකර්මයෙහි හ්‍රීධර්මයෙන් අපත්‍රපාධර්මයෙන් අවියුක්තව, සත්ත්වයනට අවිහිංසාස්වභාව ව, ශුභයෙහි රති ව, සුඛසමාචාර ඇති ව, අසඨඅමායාවී ව, ඍජුස්වභාව ඇති ව, ලෝකයහට අවිසංවාදක ව, සුවච ව, මෘදුස්වභාව ඇති ව, මානාදීන් ස්තබ්ධ නො ව, අතිමානි නො ව, පරස්වහරණයෙහි නො පැවැත, පරාගෙන් ගත් ඍණයෙහි විසංවාදී නො ව, විස්මෘත වූ ඍණයෙහි ස්මරණ උපයා දක්වා දී ඍණයෙන් මිදී, ලෝභාද්ධ්‍යාශය නැති ව, දනාඅයත පවිටු වූ සිත් නො උපයා ස්ත්‍රීව්‍යසනයෙන් දුරු ව, සත්‍යවාදී ව, භින්නයන් සන්ධාන කොට, සහිතයනට අනුබලප්‍රදාන උපයා, ප්‍රියවාදී ව, ස්මෘති පූර්ඞ්ගම වූ කථායෙන් යුක්ත ව, පූර්භාෂී ව, අර්ථවාදී ව, ධර්මවාදී ව, අභිධ්‍යා බහුල නො ව, ව්‍යාපන්න සිත් නැති ව. අවිපරීතදර්ශීන ව, කර්මස්වකෘතඥානයෙන් සත්‍යානුලෝමඥානයෙන් සමන්විත ව, කෘතඥ ව, කෘතවේදී ව, වෘද්ධයන් පිදීමෙන් යුක්ත ව, සුද්ධාජීව ව, ධර්මකාමී ව, පරයන් ධර්මයෙහි සමාදන් කරනසුලු ව, සර්වප්‍රකාරයෙන් සත්ත්වයන් අකෘත්‍යයෙන් නිවාකරව, කෘත්‍යයෙහි නියෝජක ව, තමාද විසින් එහි ව්‍යවසායට පැමිණ, අකර්තව්‍යයක් කළ කල වහා ම එයින් විරමණය කරන සුලු ව, මන්ද ක්ලේශ ව, මන්දනීවරණ ව, ප්‍රවිවේකාද්ධ්‍යාශය ඇති ව, අවික්ෂේප බහුල ව, පවිටු වූ විතර්කයෙන් දුරු ව, විවික්ත වූ කල වහා ම සමාහිතයට යන සිත් ඇති ව, සතුරන් කෙරෙහිත් වහා ම පිහිටන මෛත්‍රී ඇති ව, බලවත් ස්මෘතිසම්ප්‍රඥානයෙන් යුක්ත ව, ඉතිකර්තව්‍යයෙහි නිපුණ ව, සත්ත්වහිතාර්ථක්‍රියායෙහි ආරබ්ධ වීර්ය ව, ක්ෂාන්තිබලයෙන් සමන්විත ව, සර්වසහිෂ්ණුව, අචලාධිෂ්ඨාන-දෘඪසමාදාන ඇති ව, ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා වීර්ය ස්මෘති සමාධිසම්පන්න කල්‍යාණ-

මිත්‍රසන්නිශ්‍රිත ව, ආත්මීය උපනිශ්‍රයසම්පත් පර්‍යාවදාත කොට, හීනවීර්‍ය ඇති අනේක සත්ත්වයන් ශ්‍රාවකභාවයට පැමිණ නිවන් අධිගම කොට සසර දුකින් මුක්ත වනු දක්නුදු ශ්‍රාවකභාවයට නො පැමිණ, "බුද්ධොත්පාදයට සම්ප්‍රාප්ත වූ කල්‍ය සසුන් වැද" මහණව බුද්ධකාරක ධර්මයන් උගෙන එ පුරා බුදුවෙමි" යන අභිප්‍රායයෙහි නිමග්න වූ සිත් ඇතිව, සප්තත්‍රිංශත්-බොධිපාක්ෂිකධර්මයන් පිරිපස්වමින්, බුදුන් නැති කාලයෙහි දශකුශලකර්මපථ සතර සංග්‍රහ වස්තු ආදී බොධිසම්භාරයෙහි පවත්වමින්, ප්‍රඥා ශ්‍රද්ධා වීර්‍ය්‍යයෙනුදු කාරුණ්‍යයෙනුදු අසදෘශ ව, ප්‍රඥායෙන් සර්වසත්වයන් කෙරෙහි අනුපලිප්ත ව, ආත්මස්නෙහ පියමින් කාරුණ්‍යයෙන් ප්‍රියපුත්‍රයන් කෙරෙහි සෙයින් ස්නෙහ වඩමින්, තමා විසින් රැස්කරන ලද කුශලධර්මයන් හැමසතුන් ලද හොත් චක්‍රවර්ති වන පමණ අපරිමිත කුශලධර්මයන් රැස්කොට, අතුරෙහි සිට නො පෙරළී සම්‍යක් සම්බුද්ධව මිසැ නො නවත්වා අවස්ථාවට සම්ප්‍රාප්ත ව, පරොපදෙශ විරහිත ව සවඥතින් පිරිසිදු කරන ව්‍යවස්ථාවක් සෙයින් සමතිස්පැරුම් ව්‍යවස්ථා කරන්නට නිසි ව, ධර්මගෞරවයෙනුදු, පරදුඃඛාපනයන සඳහාදු, උපනිශ්‍රයබලයෙනුදු තීක්ෂ්ණෙන්ද්‍රිය විදර්ශනාඥාන බලයෙනුදු, මහාබොධිය අභරති උපයා, සර්වසත්ත්වයන් ඖරසපුත්‍රයන් සෙයින් ගෙණ ඒ ස්නෙහයෙන් සංක්ලිෂ්ට භාවයට නො පැමිණ, එක්සක්වළක් උදකයෙන් හෝ ශස්ත්‍රයෙන් හෝ අඞ්ගාරයෙන් හෝ පිරුව හොත් "මෙ තරා පරතෙර ගියක් හට බුදුබව ලැබෙ"යි කිවහොත් මෙ කිසි ස්මයක් නො කොට මෙ හැම "තරා පරතෙරට ගොස් බුදුබව ගන්මි"යි බලවත් ඡන්ද ඇති ව, නොහොත් "සාරාසඞ්ඛ්‍යකල්පලක්ෂයක් නරකයෙහි පැසුනක්හට බුදුබව ලැබෙ" යි කිවහොත් "එහි පැසීදු බුදුබව ගන්මි" යන කර්තුකාමතාලක්ෂණ ඡන්දයට

සම්ප්‍රාප්ත ව, ප්‍රඥාධික වුව හොත් සතරාසංඛ්‍යකල්පලක්‍ෂයක් පැරුම් පුරා බුදුවන්නට නිසි ව, ශ්‍රද්ධාධික වුව හොත් අටාසංඛ්‍යකල්පලක්‍ෂයක් පැරුම් පුරා බුදුවන්නට නිසි ව, වීර්‍ය්‍යාධික වුව හොත් සොළොසාසංඛ්‍ය කල්පලක්‍ෂයක් පැරුම් පුරා බුදුවන්නට නිසි ව, ව්‍යාකරණ ලබන ජන්මයෙහි මනුෂ්‍යාත්ම, ලිඞ්ගසම්පත්, හෙතු, ශාස්තෘදර්‍ශන, ප්‍රව්‍රජ්‍යා, ගුණසම්පත්, අධිකක්‍රියා, ඡන්දය යන අෂ්ටධර්‍මසමවධාන කොට, ව්‍යාකරණ දෙන බුදුකෙනෙකුන් කෙරෙහි චතුෂ්පදිකගාථාමාත්‍රයක් අසා, ෂඩභිඥප්‍රාප්තමහාක්‍ෂීණාශ්‍රව වන්නට නිසි ව පරිපාකයට ගිය ඥාන ඇති ව, ජාතිජරාව්‍යාධිමරණාදී අනෙක දුඃඛයෙන් සම්භග්නවිභග්නව භවාභවයෙහි විපරිවර්‍තමාන ලොකය දැක කරුණායෙන් කම්පිත හෘදය ඇති ව, සර්‍වසත්ත්වයන් ජාතිජරාමරණාදිසර්‍වදුඃඛයෙන් මුදා, අමෘත මහානිර්‍වාණ පුරප්‍රවෙශ කට හෙම්ව" යි සිතා, ව්‍යාකරණ දෙන බුදුන් පෙරට– "**තිණ්ණො තාරෙය්‍යං, මුත්තො මොචෙය්‍යං, දන්තො දමෙය්‍යං, සන්තො සමෙය්‍යං, අස්සත්ථො අස්සාසෙය්‍යං, පරිනිබ්බුතො පරිනිබ්බාපෙය්‍යං, සුද්ධො සොධෙය්‍යං, බුද්ධො බොධෙය්‍යං**"යි බුද්ධත්වයට අභිනීහාර කළ කල ඒ බුදුන් විසින් "මේ කිමෙක? ප්‍රාර්‍ථනා ඇත්තේ හෝ?" යි බලා බුද්ධත්වයෙහි ප්‍රාර්‍ථනා ඇතිසේ දැක, "මොහුගේ ප්‍රාර්‍ථනා සිද්ධ වෙයි හෝ?" යි බලා සිද්ධවනු දුටුහොත් "කෙතෙක් කලින් බුදුවෙයි හෝ?" යි බලා, ප්‍රඥා ශ්‍රද්ධා වීර්‍ය්‍ය තුන් ධර්‍මයන්ගේ ආධික්‍යවශයෙන් සතරාසංඛ්‍යකල්පලක්‍ෂයක්, අටාසංඛ්‍යකල්පලක්‍ෂයක්, සොළොසාසංඛ්‍යකල්පලක්‍ෂයක් ගිය කල බුදුවෙ'යි දැන, ඒ කාලයෙහි සන්නිහිත පිරිස් මැද "මෙ තෙම එකාන්තයෙන් මෙතෙක් අසංඛ්‍ය ගිය කල බුදු වෙයි. බුදු වූ කල මෙ නම් වෙයි. මොහු උපදනා නුවර මෙ නම් වෙයි මොහු මවු මෙ නම් වෙයි. පියේ මෙ නම් වෙයි. මෙතෙක් කල් ගිහිගෙයි වාසය කෙරෙයි. මෙතෙක්

කල් ප්‍රබන්ධියක් කෙරෙයි. මොහුගේ මහාබොධිය මෙ නම් වෙයි. අග්‍රශ්‍රාවකයෝ මෙ නම් වෙත්'' යනාදි විසින් ව්‍යාකරණ කොට බුදුන් වැඩි කල, පසඞ්ඛක බැඳ හිඳ, "බුදුහු මා බුදු වෙති' යි වදළහ. බුදුන්ගේ වචනය සත්‍යය. එ බැවින් මම එකාන්තයෙන් බුදු වෙමි. මෙවෙනි පිළිවෙතකින් බුදුවෙති''සි නො වදළහ. ඒ බුද්ධකාරකධර්මයෝ මා කරා කවරදිග්භාගයකින් එති හෝ?'' යි දශ දිග්විලොකන කොට, යම් දිග්භාගයකින් එනු නො දැන තමා සිත්සතන් ම දනාදිසම්භාරයෙන් ක්‍රමයෙන් පරිපාකයට ගිය කල බුද්ධත්වය සිද්ධ වන සේ දැක, එසේ සිද්ධ වන බුද්ධත්වයට උපකාරකධර්මයෝ කවර හෝ?'' යි නිශ්චය කෙරෙමින් ක්‍රමයෙන් දනාදිදසපාරමිතා දැක, එකෙකි පාරමිතා ව්‍යවස්ථා කරන කල දියපොළොව දක්වා මහපොළොව එකපැහැර කම්පිත කෙරෙමින් දසපාරමිතා ව්‍යවස්ථා කොට, දනපාරමිතා සමිපාරමිතාවන්ට ආදිය, ඒ ඉක්බිති සිලපාරමිතාය, ඒ ඉක්බිති නෛෂ්කර්ම්‍යපාරමිතාය යනාදි විසින් ඝර්මවිභාග නිශ්චය කොට, දසපාරම්තාවන්ගේ ලක්‍ෂණ රස; ප්‍රත්‍යුපස්ථාන නිශ්චය කොට, "දසපාරමිතාවෙ මෙතෙකින් සංක්ලිෂ්ට වෙති'' යි ඔහට සංක්ලෙශ ධර්ම නිශ්චය කොට, "දසපාරමිතාවෝ මෙතෙකින් ව්‍යවදන වෙති'' යි ඔහට ව්‍යවදන කාරණා නිශ්චය කොට, බාහිරවස්තු පරිත්‍යාග දනපාරමී ය, අඞ්ගපරිත්‍යාග උපපාරමී ය, ජීවිතපරිත්‍යාග පරමාර්ථපාරමී ය, යනාදී විසින් සමත්‍රිංශත්පාපමිතා ව්‍යවස්ථා කොට, මේ සමත්‍රිංශත්පාරමිතාවන් අනුලොම ප්‍රතිලොම විසින් නිශ්චය කෙරෙමින් "මෙයින් උනු නො ද ඇති. ඉතිරි නො ද ඇති. මෙයින් අනික් බුද්ධකාරක ධර්ම නො ද ඇති''යි නිෂ්ඨාවට ගොස්, මෙසේ සමත්‍රිංශත්පාරමිතා ව්‍යවස්ථා කරන කල ප්‍රාදුර්භූත වන ද්වාත්‍රිංශත්පූර්වනිමිත්ත දුටු දසදහසක්වළ දිව්‍ය–

බ්‍රහ්මයන් විසින් “මෙ එකාන්තයෙන් බුදු වේ”යි නිශ්චයට ගොස්, ගන්ධමාලාදීන් පුද, බුදුබවැ උත්සාහ උපයන විසින් පූජිනිමිත්තකි යන්නවුන් විසින් උත්සාහ කරවන ලදු ව මෙසෙයින් බුද්‍ධබව උත්සාහ උපයා, 'තමා විසින් දුටු බුද්ධකාරකධර්මයන් අපකම්පනීය කොට අධිෂ්ඨාන කරන්නේ තමහට ම අවවාද කොට, “මහාපුරුෂය! තෝ ඉදින් සම්‍යක්සම්බොධිසමධිගම කටැටි විහි නම් මෙ තැන පටන් ගෙන පරිපූර්ණ වූ උදක-කුම්භයක් අධොමුඛ කළ කල උදක වමනය කරත් මිසැ කිසිවක් නො රඳන්නා සේ නිරවශෙෂයෙන් හීන මද්ධ්‍යම උත්කෘෂ්ට ජනයන්ට ප්‍රීතින් විකසිත මුඛ ඇති ව, කරුණාපුරස්සර කොට දන් දෙන්නෙහි දන්පැරුම් පුරා සම්‍යක්සම්බොධිසමධිගම කරා” යි පළමු වනු කොට දානපාරමිතා අධිෂ්ඨාන කොට, “කිසිවෙක ඇවිලි වාලධිය කෙසයට විකොපන නො කොට මරණයට පැමිණෙන සෙමරක සෙයින් චාතුර්භූමික වූ ශීලසමාදන කොට එයට විකොපන නො කරන විසින් සිල්පැරුම් පුරා සම්‍යක්සම්බොධි සමධිගම කරා” යි දෙවන ශීලපාරමිතා අධිෂ්ඨාන-කොට, “නිරන්තරයෙන් උත්කණ්ඨා බොහෝ වූ දඟගෙකෙක්හි තිරළ වැ මහදුක් විඳ එයින් මුක්ත වන උපාය අන්වෙෂණය කරන පුරුෂයක්හු සෙයින් තුන්භවය දඟගෙකක් සේ දැක, එහි අභිරති නැත්තෙහි නෛෂ්කාම්‍යපාරමිතා පුරා සම්‍යක්සම්බොධි සමධිගම කරා” යි තුන් වන නෛෂ්කාම්‍යපාරමිතා අධිෂ්ඨාන කොට, “හීන මද්ධ්‍යම උත්කෘෂ්ට කුල විවර්ජනය නො කොට පිඬු සිඟා යැපෙන පමණ අහරක් ලබන සපදන්සැරිමහණක්හු සෙයින් උත්තමමධ්‍යමාධම පණ්ඩිතජනයන් කරා එළඹ කුසලාකුසල පිළිවිස එහි සේ පිළිවෙත් කොට පැණපැරුම් පුරා සම්‍යක් සම්බොධිසමධිගම කරා” යි සතර වන ප්‍රඥාපාරමිතා අධිෂ්ඨාන කොට, “යම්සෙයින් එක් සිංහරාජයෙක්

ශය්‍යානිෂද්‍යාස්ථාන චංක්‍රමණයෙහි අලීනවීර්‍ය්‍ය වූ හිවිමනස් ඇති වේ ද, එසේ ම සර්වභවයෙහි චතුර්විධ සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍ය දෘඪ කොට හුවා සම්‍යක් සම්බෝධි සමධිගම කරා" යි පස් වන වීර්‍ය්‍යපාරමිතා අධිෂ්ඨාන කොට, "ශුචි අශුචි නිඃක්ෂේපයෙන් නො හැකිළෙන පෘථිවියක් සෙයින් සර්වභවයෙහි හිතාහිතසත්ත්වයන් දක්වන ලද සම්මානාව මානයෙහි නො කළකිරී කෑත්පැරුම් පුරා සම්‍යක්සම්බෝධි සමධිගම කරා" යි සවන ක්‍ෂාන්තිපාරමිතා අධිෂ්ඨාන කොට, "හිමත් ගිමන් ආදි සර්වකාලයෙහි විපිත් නො පහවන ඖෂධි තාරකාවක් සෙයින්, මස්තකයෙහි අශනිපාත හෙනමුදු බොරු නො කියන පිසින් සත්‍යපාරමිතා පුරා සම්‍යක්සම්බෝධිසමධිගම කරා"යි සත්වන සත්‍යපාරමිතා අධිෂ්ඨාන කොට, "සර්වදිශාභාගොපගත මහාවාතයෙන් අකම්ප්‍ය වූ පර්වතරාජයක් සෙයින් තාගේ අධිෂ්ඨානයෙහි නිශ්චල ව සම්‍යක්සම්බෝධි සමධිගම කරා" යි අටවන අධිෂ්ඨානපාරමිතා අධිෂ්ඨාන කොට කල්‍යාණපාපජනයනට සම වූ සෘතු දෙන ශරීරමලජල්ලිකාදි දුරු කරන සීතෝදකයක් සෙයින් සියලු හිතාහිතසතුන් කෙරෙහි සම කොට මෙත් පවත්වා සම්‍යක්සම්බෝධිසමධිගම කරා" යි නවවන මෛත්‍රීපාරමිතා අධිෂ්ඨාන කොට, "යම් සෙයකින් එකෙක් තා එක් අඟක් ගදින් විලවුන් කෙරේද, එකෙක් එක් අඟක් වෑහැයෙන් සසිද, මෙසේ පැවිති මොවුන් දෙදෙනා කෙරෙහි අනුනය ප්‍රතිඝ නො කරන්නෙහි සුවදුක මැදහත් ව සම්‍යක්සම්බෝධි සමධිගම කරා"යි දසවන උපේක්‍ෂාපාරමිතා අධිෂ්ඨාන කොට, මෙසේ දසපාරමිතාවන් අධිෂ්ඨාන කරන දසතැන දසවටෙක මහාපෘථිවිය කම්පා කොට "මහාපුරුෂය! තෝ මෙතැන පටන් ගෙන මෙසේ තා විසින් අධිෂ්ඨාන කළ දසපාරමිතාවන් පුරා, මහබෝධිපර්‍ය්‍යඞ්කාරූඪ ව දසදහසක්සක්වළ කම්පිත කොට ලොවුතුරාසම්මා-

සම්බුද්ධ වා''යි දෘඪ කොට මෙහෙහි පිහිටුවා, මහා වාතයෙන් චලිත නො වන විදුරුගලක් සෙයින් මරදහස් සුවහසුනුදු විසින් අකම්පනීය කොට ඉටා, පඤ්චඛක්ෂයෙන් නැඟී, සසරවැද පැරුම් පුරන්නේ මෙසේ සම්බොධගසම්පන්න මහබොධිසත්ත්වා වසථාවට සම්ප්‍රාප්ත වූ තැන් පටන් ගෙන බුදුවන ජන්ම දක්වා අවීචියෙහි නො උපද, ලෝ ඇඳිරි නරකයෙහි නො උපද, ක්‍ෂුත්පිපාසා බලවත් වූ නිධ්‍යාමතෘෂ්ණික ප්‍රේතව නො උපද, කාලකඤ්ජක අසුර යොනිය නො උපද; දුර්ගතක්‍ෂුද්‍රප්‍රාණී ව නො උපද, මිනිස් අත්බැව් උපදුත් ජම්බුද්වීපයෙන් බැහැර නො උපද, එහිදු උපදනා කල ජාත්‍යන්ධ ව නො උපද, ශ්‍රොත්‍රෙන්ද්‍රිය විකල ව නො උපද, පිළු ව නො උපද, ගොළු ව නො උපද, ස්ත්‍රී ව නො උපද; උභතොව්‍යඤ්ජනක ව නො උපද, පණ්ඩක ව නො උපද, ආනන්තර්‍ය්‍යකර්මයක් කලෙකත් සිද්ධ නො කොට, මිථ්‍යාදෘෂ්ටි නො ගෙන, අසංඥසත්ත නො උපද, කුද්‍රමහත්භවයෙහි නො ඇලී, ප්‍රඥයෙන් බුද්ධභාවය සිද්ධකෙරෙමින්, කරුණායෙන් බුද්ධකාරක ධර්‍ම සිද්ධකෙරෙමින්, ප්‍රඥයෙන් සංසාරව්‍යසන දුරු කෙරෙමින්, කරුණායෙන් මෙරමා තරවමින්, ප්‍රඥයෙන් පරදුඃඛ දක්වමින් සංසාරව්‍යසන දුරු කෙරෙමින්, කරුණායෙන් මෙරමා තරවමින්, ප්‍රඥයෙන් පරදුඃඛ දක්මින්, කරුණායෙන් පරදුඃඛප්‍රතිකාරයට ආරම්භ කෙරෙමින්, ප්‍රඥයෙන් දුඃඛයෙහි නිර්වේද උපයමින්, කරුණායෙන් දුඃඛසම්ප්‍රතිග්‍රහණ කෙරෙමින්, ප්‍රඥයෙන් නිර්වාණාභිමුඛවෙමින් කරුණායෙන් එයට නො පැමිණෙමින්, කරුණායෙන් සංසාරාභිමුඛවෙමින්, ප්‍රඥයෙන් එහි අභිරති නො උපයමින්, ප්‍රඥයෙන් හැමතැන විරාග උපයමින්, කරුණායෙන් එයට නො පැමිණෙමින්, ප්‍රඥයෙන් අහංකාර මමංකාර පියමින්, කරුණායෙන් අලසදීනභාව පියමින්, ප්‍රඥයෙන් තමහට පිහිට වෙමින්, කරුණා-

සෙන් පරහට පිහිට වෙමින්, ප්‍රඥයෙන් ධීරභාවයට පැමිණෙමින්, කරුණායෙන් වීරභාවයට පැමිණෙමින්, ප්‍රඥයෙන් ආත්මපරිතාපයෙන් දුරු ව, කරුණායෙන් පරපරිතාපයෙන් දුරුව, ප්‍රඥයෙන් ආත්මහිත නිශ්චය කෙරෙමින්, කරුණායෙන් පරහිත නිශ්චය කෙරෙමින් ප්‍රඥයෙන් නිර්භයභාවයට පැමිණ, කරුණායෙන් පරහට භය හිංසනක නොව, ප්‍රඥයෙන් ධර්මාධිපතිව, කරුණායෙන් ලෝකාධිපති ව, ප්‍රඥයෙන් කෘතඥ ව, කරුණායෙන් පූර්වකාරී ව, ප්‍රඥයෙන් අඥාන දුරු කෙරෙමින්, කරුණායෙන් තෘෂ්ණා දුරු කෙරෙමින්, ප්‍රඥයෙන් විද්‍යාසම්පත් පුරමින්, කරුණායෙන් චරණසම්පත් පුරමින්, අෂ්ටලෝකධර්මයෙන් අභිභූත නො ව, හැමතැන ඒකාකාරව, අචින්ත්‍ය වූ ආනුභාව ඇති ව, හැමතැන සද්ධර්මගොචර ව, ශුචිසල්ලෙඛවෘත්ති ඇති ව, බලවත් ව්‍යසනයට ද සම්ප්‍රාප්ත වූ කල බොධිසත්ත්වධර්ම නො දුහැ, දියෙහි උපද දියෙහි වැඩ දිය හා හැණුම් නැති නෙලුම් සෙයින් ලොකයෙහි උපද ලොකයෙහි වැඩැ ලොකධර්මයෙන් අනුපලිප්ත ව, ආත්මානුරාග පියමින්, සත්ත්වානු රාග වඩමින්, චිත්තවශග කාමවශග,[1] නො ව, චිත්තවශවර්ති කාමවශවර්තිභාවයට සම්ප්‍රාප්ත නො ව, රාගමෙෂාදිඅකුශලධර්මයන් විසින් අනභිභවනීය ව, තමන් කෙරෙහි චිත්තප්‍රසාද උපදු තාක් දෙනහට ස්වර්ගමොක්ෂ දායක ව, අනන්තාපරිමාණ සත්ත්ව සන්තානයෙහි ලෞකිකලොකොත්තර සම්පත් දායක වූ කුසලබීජ පිහිටුවා, පණ්ඩිතජනයන් කරා සම්ප්‍රාප්ත ව සත්පුරුෂසංසර්ග සද්ධර්මශ්‍රවණ යොනිසොමනස්කාර ධර්මානුධර්මප්‍රතිපත් පුරා, නෛෂ්කර්ම්‍යාද්ධ්‍යාශයෙන් සර්වකාලයෙහි කාමයෙහි දෙෂදර්ශි ව, ප්‍රවිවෙකාධ්‍යාශයෙන් ගණසඞ්ගනිකායෙහි දෙෂදර්ශි ව, අලොභාද්ධ්‍යාශයෙන් ලොභයෙහි දෙෂදර්ශි ව,

1. කර්ම වශග

අවේෂාඛ්‍යානයෙන් වේෂයෙහි දෝෂදර්ශී ව, අමෝහාඛ්‍යානයෙන් මෝහයෙහි දෝෂ දර්ශී ව, නිශ්ශරණාඛ්‍යානයෙන් සම්භවයෙහි දෝෂදර්ශී ව, සතරසංග්‍රහවස්තු විසින් අනවතීර්ණසත්ත්වයන් අවතීර්ණ කොට නිර්වාණමාර්ගයෙහි පවත්වමින්, අපරිපක්වඉන්ද්‍රියයන් ඇති සත්ත්වයන්ගේ ඉන්ද්‍රියයන් පිරිපස්වමින්, බුදුන් නො උපන් කාලයෙහි කර්මවාදී ක්‍රියාවාදී තාපසප්‍රව්‍රජ්‍යායෙහි පැවිජි ව රූපාරූප අෂ්ටසමාපත්ති උපයා අභිඥායෙහි කෙළ පැමිණ, බුද්ධොත්පාදයට සම්ප්‍රාප්ත වූ කල බුදුන් සසුන් වැද මහණ ව, ප්‍රාතිමෝක්ෂසංවරශීල, ඉන්ද්‍රියසංවරශීල, ආජීවපාරිශුද්ධිශීල, ප්‍රත්‍යයසන්නිශ්‍රිතශීල, සුපරිශුද්ධ කොට පුරා, ත්‍රයෝදශධුතාඞ්ගයෙහි උත්කෘෂ්ට ව, දශකෘත්ස්න, දශාශුභ, දශානුස්මෘති, චතුර්විධබ්‍රහ්මවිහාර, චතුර්විධආරූප්‍ය, චතුර්ධාතුව්‍යවස්ථා ආහාරයෙහි ප්‍රතිකූලසංඥා යන චත්වාරිංශත්කර්මස්ථානයෙහි උපචාර අර්පණාධ්‍යාන උපයා නවානුපූර්වවිහාර සමාපත්ති පඤ්චාභිඥානයෙහි කෙළ පැමිණ, විදර්ශනා භාවනායෙහි පවත්මින් "පඤ්චක්ඛන්ධා, ඡ ද්වාරානි, ඡ ආරම්මණානි, ඡ විඤ්ඤාණානි, ඡ ඵස්සා, ඡ වේදනා, ඡ සඤ්ඤා, ඡ චේතනා, ඡ තණ්හා, ඡ විතක්කා, ඡ විචාරා, ඡ ධාතුයො, දස කසිණානි, ද්වත්තිංසකොට්ඨාසා, ද්වාදසායතනානි, අට්ඨාරසධාතුයො, බාවීසතින්ද්‍රියානි, තිස්සොධාතුයො, තයො භවා, අපරෙ නයෙභාවා, චත්තාරි ඣානානි, චතස්සො අප්පමඤ්ඤා, චතස්සො සමාපත්තියො, ද්වාදස පටිච්චසමුප්පාදඞ්ගානි" යන පඤ්චවිංශති නිර්යාණමුඛයෙන් වැද විදර්ශනා කොට සප්තවිශුද්ධි අනුලෝම දක්වා උපයා, මාර්ගයට සම්ප්‍රාප්ත නො ව, විදර්ශනාභාවනායෙහි පැවැත, අධිකුශලධර්මයෙහි අනභිරතීන්, අලසභාවයෙන්, ගණසඞ්ගනිකායෙන්, නිද්‍රාශීලතායෙන්, අතිවචසීලතායෙන්, ඥානයෙහි අකුතුහලභාවයෙන්, මිථ්‍යාභිමානයෙන්, අපරිප්‍රශ්නයෙන්, කායයාගේ අසම්‍යක් පරිහාරයෙන්, අසමාහිත-

චිත්තතායෙන්, දුෂ්ප්‍රාඥපුද්ගල සේවායෙන්, ප්‍රාඥපුද්ගල අසේවායෙන්, ආත්මපරිභවයෙන්, මිථ්‍යාවිකල්පයෙන්, විපරීතාභිනිවේශයෙන්, කායජඩභාවයෙන්, අසංවේගසීලතායෙන්, පඤ්චනීවරණ සේවායෙන් දුරුව, පඤ්චස්කන්ධ ද්වාදසායතනෙන්ද්‍රිය බල බොද්ධ්‍යඞ්ග ප්‍රතීත්‍යසමුත්පාදදී ප්‍රතිසංයුක්ත කථායෙන් අවියුක්ත ව, යම්තාක් පුණ්‍යකර්ම සිද්ධ කළ කල තමාගේ දුර්ගති පරික්ලේශවිනිර්මුක්තිය නො පතා, සුගතිසම්පත් රාජසම්පත් චක්‍රවර්තිසම්පත් බ්‍රාහ්මණසම්පත් නො පතා, ත්‍රිවිද්‍යාෂඩභිඥදිසම්පත් නො පතා, යම්තාක් පුණ්‍යකර්ම කළ කල "අනුත්තර සම්‍යක්සම්බොධිසමධිගම කටහෙම්ව" යි පතා, "සර්වසත්ත්වයන් අනුත්තරසීලාලඞ්කාරයෙන් අලංකෘත කටහෙම්ව" යි පතා, දම් පැරුම් ආදී දසපැරුම් අනෙකජන්මකොටිශතසහස්‍රයෙහි පුරා බුදු වේ ද, එසේ වූ මහාබොධිසත්ත්වයන් විසින් පිරියයුතු බුද්ධකාරකධර්මයන් ඇස් ඇත්තානට විද්‍යමානතාක් වස්තු පාළ කොට පානා සූර්‍ය්‍යයා සේ සිව් නුවණැස් ඇති පිනැති පණ්ඩිත ජනයනට ත්‍රිවිධබොධියට මාර්ග පිටකත්‍රය විභාග කොට දතයුතු. එහි කෙවල මහාබොධිසත්ත්වප්‍රතිපත් බුද්ධවංශචර්‍ය්‍යාපිටකයෙහි කී සෙයින් දතයුතු.

මහාබොධිසත්ත්වයන් බොධිසම්භාර පූරණ ප්‍රකාර විනය ජනානුකූල කොට බොධිසම්භාර පුරා බුදු වන මහාපුරුෂයන්ට නයදන කෙරෙමින් දෙසූ ජාතකදෙශනායෙන් දතයුතු. මහාබොධිසත්ත්වයන්ගේ අනුභාවය ආශ්චර්‍ය්‍යාද්භුතධර්ම සූත්‍රාදීන් දතයුතු. "මෙ වැනි කුසල් කළ කල මහාබොධිසත්ත්වයනට මෙ නම් මහාපුරුෂලක්ෂණ වෙයි" යනාදි විභාග ලක්ෂණසූත්‍රාදීන් දතයුතු. අවිශෙෂයෙන් වනාහි මහාබොධිසත්ත්වයන් විනා තුබූ යම් කවර කල්‍යාණ පෘථග්ජනයන් විසින් පුරන්නට නො පිළිවන් වූ

දානපාරමිතාවිභාග සියලු පිටකත්‍රයෙහි තන්හි තන්හි සිට කළ දානවිභාගවශයෙන් දතයුතු. එසේ ම මහාබොධිසත්ත්වයන් විනා තුබූ යම් කල්‍යාණපෘථග්ජනයන් විසින් පුරන්නට දුෂ්කර වූ ශීලපාරමිතාදිවිභාග ද සියලු පිටකත්‍රයෙහි තන්හි තන්හි සිට කළ සීලාදිය විභාග වශයෙන් දතයුතු. මෙසේ වන බැවින් පිටකත්‍රය සම්ලෞකික ලොකොත්තරප්‍රතිපත්ති විභාග කොට දතයුතු. එහි විනයපිටකයෙහි පාළි එක්ලක්‍ෂ දෙසාළිස්දහස් එක් බණවරෙක. විනයපිටකයෙහි අටුවා සත්විසිදහසෙක. සූත්‍රපිටකයෙහි පාළි එක්ලක්‍ෂදෙසාළිස්දහස් දෙබණවරෙක. සූත්‍රපිටකයෙහි අටුවා දෙලක්‍ෂ්සූපණස්දහස් දෙබණවරෙක. අභිධර්‍ම-පිටකයෙහි පාළි අනූදහස් එක් බණවරෙක. අභිධර්‍ම පිටකයෙහි අටුවා තිස්දහසෙක. මෙසේ සියලු පිටකත්‍රයෙහි පෙය්‍යාලවශයෙන් සංගෘහීතග්‍රන්ථ පුඤ්ජ ව පස්ලක්‍ෂ සයානූදහස් දෙබණවරෙක් වෙයි. විස්තර වශයෙන් අනන්තනය වෙයි.

මහොසධොව ඤාණෙන - ජොතිසෙට්ඨිව භොගිනා
වෙස්සන්තරොව දානෙන - හොතුමය්හං භවෙ භවෙ

කර්මවිභාගය නිමි.

# කර්මවිභාග පිටපත

---

**අකවටුගන්වා** 116, සිවුරු ආදී යමකින් උකුළත් සමඟ දෙදන බැඳගැනීම හෝ දෙ අතින් දෙදන බැඳගැනීම අකවටු ගැන්වීමනම්. **අක** යන්නෙන් උකුළත් වටු යන්නෙන් පාසයත් ගැණේ. ඇඟිලි වලින් එකට සම්බන්ධකරගනු ලැබූ දෙඅත මෙන්ම සිවුරු ආදියෙන් සාදගනු ලැබූ වලල්ලත් පාසයක් වැනි හෙයින් වටු නාමය ලබයි. ඒ වටුයෙහි අකය ප්‍රවේශ කිරීම අකවටු ගැන්වීම නමින් අදහස් කරනු ලැබේ. වස්පලක හෝ තමා වසන විහාරයෙහි ආසනාදියක අකවටු ගන්වා ගෙන සිටීම සදෙස් නොවේ. දෙරවටු ගැටවටු යනාදිය සමගත් සසඳ බලනු.

**අකර්ණ්‍ය** .........කණට නුසුදුසු.

**අඩයටි** 15, අඩියෂ්ටිය. එකඋලක් ඇති අතින ආයුධ විශෙෂයක්. කුන්තය යනුත් එයටම නම්.

**අතුරුවෙය** 73, අන්තරවීථිය. වීථියමැද (වීථි>වෙයි>වෙය)

**අඳුරුසෙයට** 139, අන්ධකාරය පිළිබඳ ආකාරයට, අඳුරුසේ ශබ්දය සපදත් විබත් ගත්තැනි.

**අධිවාසනා නොඛමහි** 10, 16, 81, ඉවසනු නොහැකිවූ, මෙහි "හි" යනු හෙ (හැකිවීමෙහි) දයින් සිද්ධ පූර්ව ක්‍රියාය.

**අන්න** 85, මැණියනි. දෙමළ අන්නෙ ශබ්දයෙන් ආයේය.

**අනාදෙය්‍යවූ** 50, නොගත යුතු වූ.

**අනුමෙවියද** 19, අනුමෝදන්වූවත්, තමා විසින් හෝ අනුන් විසින් සිදුකළ කර්මයට අනුව සතුටුවීම අනුමෝදනා නම්.

**අනුමෝවැ** 19, 20, 27, අනුමෝදන්වැ.

**අපකාරයෙහි බද්දන්** 56, අපකාර කිරීමෙහි බැඳුනවුන්.

**අපකොරේ බද්දේ වේනොයි** 103, 104, අපකෙරෙහි බැඳුනේ නොවේ දැයි.

**අපත්‍රපා** 45, බිය.

**අපනයනාකාරයෙන්** 68, බැහැර කිරීම් ආකාරයෙන්.

**අපියරු** 24, නුසුදුසු, (අප්පතිරූප> අපිසිරු>) අපියරු.

**අපිසුන් කොරෙහි** 91, අප්පිච්ඡතා ගුණයෙන් යුක්තවූවන් අතුරෙහි (අපිස් + උන්=අපිසුන්)

**අභිසංගි** 64, ආක්‍රොශ කිරීම් ඇති.

**අයතක්** 86, ධනයක්, යමකුට අයත් දෙයක්.

**අසිලොම් 14**, කඩුබවට පැමිණි ලොම්, කඩුමෙන් ක්‍රියා කරන ලොම්.

**අස්වසෙක්** 8, සැනසිල්ලක්.

**අළුවෙසා** 102, රෙදිවියන යන්ත්‍රයෙහි හරස්නූල තදකරන උපකරණයකි. අළුව නූල් කැපීම සඳහාත් උපකාර වේ. අළුගේ, අල්පිළ, අල්වල, අල්වල රෙද්ද යනාදිය සමගත් සසඳ බලනු.

**ආග්‍රහ** 135, දැඩිව ගැනීම.

**ඇටමුල්** 8, ඇටමිදුලු.

**ඇතවස** 89, (අනොතාවසස) වස්හාරමාසය ඇතුළත.

**ඇවිස්සහ** 89-90, පිළිගැන්වූහ. දුන්නහ.

**ඉනයහ** 115, ගියහ.

**ඉදෙදුදු** 110, පල්ලැක්කිය

**උකටලී** 43, කලකිරිලි (උක්කණ්ඨතා>උකටනී>උකටලී)

**උකා** 9, ඔසවාගෙන (උග්ගණ්හා>උගාහය>උකාහය> උකාහා>උකා)

**උගහටේක්** 57, අමාරුවක්.

**උඩුමුවාත්වැ** 7, උඩුකුරුවූ මූවහත් ඇතිව.

**උඩුහුරු** 50, 119, ගොඩර්ම. (උඩුකුරු>උඩුහුරු)

**උද්වර්තින** ......ඉලීම.

**උපකාරවියට** 86, උපකාරවූ තැනැත්තියට. උපකාරවූ යන්න සත්‍රී ලිඞගයෙහිදී උපකාරවී, යි සිටී.

**උපයා** 59, 76, 112, 134, 135, 136, 177, 178, 181, සම්භ කොට. (උප්පාදෙත්වා>උපයය>උපයය්>උපයා)

**උපවියැපි** 169, උපදවනු කැමැති. (උපසියැපි>උපවියැපි)

**උභතොභාගවිමචිච** 40–102, දෙපැත්තම මට්ටම්කරනලද.

**උරසක්මල්** 19,' ක්‍ෂුරවක්‍රමාලාව. දූලිපිහියා වැනි සිරුර කැපෙන ආයුධවලින් රවුම්වැ සාදනු ලබන චෞරාදීන්ට වධදෙන උපකරණයක්.

**එක්හොරුනැව්** 10, මෙහි හොරු නැව් යන දෙශබ්දයම ඒකාර්ථවත්ය. එහෙයින් එක්හොරුසඞ්ඛ්‍යාත. නැව යන අර්ථය සුදුසුය.

**එළුණු** 133, 135, 136, 141, වැටුණු. හෙළුණු>එළුණු

**එළෙයි** 132, 135, පතිත වෙයි.

**ඔද** 138, (දිහියෙ ඔදසේ) යොදය මෙන් සැදෙන කබොල්ල. (ඕජා>ඔජ>ඔද)

**ඔකහා** 154 බස්වා, දමා (ඔගාහෙතවා>ඔගහය>ඔකහය> ඔකහය්>ඔකහා) ශුඩපාඨය බහා යන්න දැයි සොයා බලනුත් සුදුසුය.

**ඔති** 9-12, බහාලති. (ඔවති>ඕති>ඔති)

**ඔසධිතාරකා** 182, ධම්පියා අටුවා ගැටපදය 315 පිට බලනු.

**කටුමතිගායෙන්** 23, එම 316 ,,

**කඩම්ලියක්** 159, පරණවස්ත්‍රකැබෙල්ලක්. (මාලු>මලු>මිලි)

**කඩිසිනි** 25, කඩිසඞ්ඛ්‍යාත සිත්නො.

**කණේ රොපෝ** 161, 162, කුඩු සහ දහයියා "කණෝති කුණ්ඩකො" යනු දික්සඟි අටුවාපාඨයි.

**කන්වසින්** 102, 109, කොටවා.

**කම් ගිනොගියෙහොත්** 13, කම්යක්ෂයවැනොගියහොත්.

**කරකයෙහි** 58, හිමෙහි.

**කරකැට** 17, කාරම්කැට

**කරමුවහතක් වැනි** 8, දෑලිපිහියා මුවාතක් වැනි.

**කරල** 162, යුෂය මිරිකාගත් පසු ඉතිරිවන රොඩු, ශබ්දය කසළ වියයුතු දැයි සොයනු,

**කම්ජවාතයෙන්** 1, 139, කම්යෙන්හට ගන්නා වාතයෙන් ධම්පියා අටුවා ගැටපදය 321 පිටුවත් බලනු.

**කලවර ගෙණ** 114, කාලය සහ වාරය ගණන්බලා. පසු කාලයකදී ගැණ කියා සිටියේත් ගෙණ යන්න මැයි,

**කල්** 66, කෘන්ත (කන්ත>කත>කල>කල්)

**කවුළුදොරබායෙන් යුත්** 73, දොර සහ ද්වාරබන්ධනයෙන් යුත්.

**කඟිවකු** 69, 91, 92, 175, කිසිවකු.

**කලහමවත්හසි** 80; නිත්දුකළ තැනැත්තහුට විපත්ති කරත්තට සමර්ථයයි

**කැණිමඩල** 118, කණ්ණිකාමණ්ඩලය. කුරුපාතොදී තතනු ලබන පියසි මතුයෙහි මූලප්පරාල වද්දන දූවමය රවුම් අවයවය.

**කැපසිළි** 81, බිත්තිය සඳහා තබන මුල් ගඬොළුව හෝ ප්‍රථමයෙන් සිදුවන කණුවට හෝ අත තබාගෙන "කප්පිය කුටිං කරෙම කප්පියකුටිං කරෙම" යන වාක්‍යය තොවරක් කියා සාදනු ලබන කුටිය.

**කියදිඑව** 23, කෝදි දමා, යමක් කොටස්වලට බෙදෙනයේ ඉරි ඇඳීම කෝදිවීම නම්. පොල්කෙඳි යනාදිය සමගත් සමකර බලනු.

**කිළිල්** 135, (කලත්) උණබට ආදියෙහි මොටෙය්යො (කලීර>කිලිළ්)

**කිළිපැලකුඳු** 80, කුටි සඞ්ඛ්‍යාත පැලකුත්.

**කුටිගෙකක්** 139, කුටි සඞ්ඛ්‍යාත ගෙයක්.

**කුඩිනට** 15, අධිපතියන් යටතේ ඔවුන්ගේ නිඳගම් වල වසන ගොවීන්ට. කුඩිනාමයෙන් සාමාන්‍ය ගම්වැසි යෝත් ගැණෙති.

**කුළුදෙස්** 11, බොරුසාක්ෂි.

**කුළුඝටන්** .11, බොරුතඩු.

**කොක්ණාහු** 11, වෘකයො.

**ගඩපොළක්** 26, ගඩුසඞ්ඛ්‍යාතපොළක්.

**ගතයහ** 153, ගියහ.

**ගඳුල්** 139, සුවඳුල්.

**ගම්ලදුවන්** 29, ගමේ ප්‍රධාන මූලාදෑනීහු.

**ගල්වල** 86, කැලෑවෙන් යුත් කඳුකර පෙදෙස. කඳුකැලෑව. මලයරට

**ගවරවල** 139, හාත්පසින් කුණුමිශ්‍ර ජලය අවුත් පල්වෙමින් පවත්නාවල. ඉන්දියාවේ ගම්වල ගවරවළවල් සුලභය.

**ගැහැ** 85, සම්ණයෙන් ගෙවී ගොස්. (සංඝිත්වා>ගැහැ)

**ගුණුකැමින්** 15, 17, 48, විපාකදී ඉතිරි වූණු කම්යෙන්, අප්‍රධාන කම්යෙන් (ගෞණ>ගුණු).

**ඝොවර** 60, අප්‍රිය අවිශදය. මණ්ඩපදූසි සොයනු. නිශ්ශඞ්ක ශිලාලිපිවල එන ගෙහිල යන්න සමගත් සසඳනු.

**ගෙහිඳ** 96, ගෙහි වැඩුණු.

**ගෙවා** 97, 99, 100, 101, 102, මර්දනය කොට යටපත් කොට.(බෙජෙත්වා>ගෙවය, ගෙවය්>ගෙවා)

**ගොනෑස්සක්** 98, 118, පරාලයක්.

**ගෝසි සඳුන්** 100, 118, මලය පර්වතයාගේම කොටසක්රේ සැලකෙන ගොශීෂ පර්වතයෙහි හට ගන්නා සඳුන්. ජලය මෙන් සීතල සඳුනුත් (ගොසීත) ගෝසී සඳුන් වන්නට පුළුවන.

**තන්කොට ගන්මි** 86, සොයා තැන්පත් කරගනිමි.

**තිඹිරිගෙය** 26, සූතිකාගාරය. (තිමිර>තිමිරි>තිම්බිරි තිඹිරි)

**තිරකොට** 8, 9, 10, 12, 23, 27, 96, 139, 141, 142, 181, ඛන්දනය කොට.

**තිරුකරනලද්දිය** තිරම (ස්ථිර) කරනලද්දිය.

**තිලි** 102, 109, ඇතිරිලි.

**තුබරොබ** 20, ථූපාරාමය. (ථූපාරාම>තුබරබ>තුබරොබ)

**තෙජ්** 140, මිටසහිත අතින යකඩ උල් විශෙෂයක්.

**තෙල්දූලියක්** 42, තෙලින් හැනූ දූලියක්.

**තොලබෝවිත** 102, තොලබෝමලේ (මිණිය) කොපුව.

**දඬියෙන්** 51, 162, දඬුවෙන් (දඬු>දඬි)

**දන්වැට** 22, 59, 60, 61, 85, 90, නිතර දෙන දනය.

**දසරියෙන්** 15, තරින්. (ජතෘ>දතරු>දසරු>දසරි)

**දහටහොත්** 80, සැපුවොත් (දෂ්ට>දහට)

**දහනද** 93, කෝප කිරීම.

**දහසි** 19, 30, 31, 39, 72, 112, 127, 128, 130, යහපතැයි.

**දළඹියෙන්** 139, 153, දළඹුවෙන්, වැදූමසින් (දළඹු>දළඹි)

**දෘකැට** 59, කුඩා ධාතු කැබැලි.

**දෘහුවැලයකුත්** 27, 31, රෙද්දක නූල් පොටක්වත්. දෘ යනුව දසා ශබ්දයෙන් ආහැකිය.

**දූල්හෙලාදූවූ** 67, ගිනි දමා පිච්චූ, (ජාලා>දූල්)

**දූහැ** දුරුකොට

**දියපය** 28, දියබඳුන (පතන>පත>පය)

**දියපහයන** 66, ජලය පැහැදිලි කරන

**දුන්නාමහ** 72, දුන්නෙමු. මෙවැනි තැන්වල යෙදෙන මහ යනුව සංස්කෘත සම යන්නෙන් එන්නට පුළුවන. එය පාළියෙහි මහ කියාත් හෙළයෙහි මහ (මිහ) කියාත් සිටී.

**දුනමනානට** 52, දියයුත්තන්ට.

**දුනුනැනින්** 29, ජයගත් ස්ථානයෙන්.

**දුඹුල්** 22, 60, 103, 104, දුර්වල. (දුබ්බල>දුබුල්>දුම්බුල්> දුඹුල්)

**දුපින් අලියේ** 41, දුරසිට ගෙන එන ලද්දේ.

**දුර්වලයෙන්** 35, දුර්වලහෙයින්.

**දුහුරුබිම** 114, පැලැටිවලින් ගහණ මඩසහිත සාරබිම.

**දෙනි** 1, ජීවත් වෙති.

**දෙපලේලන්** 15, (දෙපතුලෙන්>දෙපත්ලෙන්>දෙපල්ලෙන්

**දෙයොදුන් සුවහස් සතර තුහුවක්** 164, යොදුන් දෙලක්ෂ හතළිස් දහසක් 143-160 බලනු.

**දෙව්දසි** 16 දෙවියන්ට පූජා පිණිස කෝවිල්වල නටන ස්ත්‍රීහු.

**දෙවාඞග** 101, දෙවියන් විසින් දෙනලද වස්ත්‍ර-කෝවිල්වල තිබෙන දේවරූප ඇඳි වස්ත්‍ර

**දෙර දෙන්නවුන්,** 97, විසිකරන්නවුන්

**ද්‍රොණමුඛ** 145, කුඩා නගර ගම් 400, කට ප්‍රධාන ගම කොළත් ද්‍රොණ මුඛයකි.

**නහම්** 31, ප්‍රතිෂේධාර්ථයෙහි නිපාතයක්.

**නාඞ** 11, තරුණ 140, බලනු.

**නියදවළු** 98, නියදපට්ටා, නියදවැහැරි, නියදපිනි මඬේ දමා තම්බා සේදීමෙන් ලබාගන්නා සුදු පට්ටා වර්ග. "වරුතැහැරි" (දම්පියා අටුවා ගැටපද 197 පිට) යන තැනවරු, යි සිටියේත් වළු ශබ්දය වන්නට පුළුවන.

**නියබඩු** 21, නියපොතු මේ බඩු යන්න සෙවිය යුතුයි.

**නිවිසතන්** .........නිවුණු චිත්ත සන්තානය

**නිසුවානව** 41, ඇසුරුකළවුන්ට (නිස්සිත>නිසිය> නිසුය>නිසු)

**නුහුවක්** 164, නහුතයක්. දසදහසක්.

**නිෂ්ඹුර** 85, රළු.

**නෙළුවන්** 96, වස්සන් (නෙලක>නෙළු)

**නොදවන්නටනිසියහ**...... ප්‍රවිශ්ටවන්නට නුසුදුසු සඬසයා.

**නොනැහැමිය දි** 92, දකින්නට නොදී.

**නොබදනාරවුවර** 15, දෙන්නට බැඳීනැති අයබදු.

**නොසැමිනියැයුත්තේය** 82, පරීක්ෂානොකට යුත්තේය.

**නොසෙගැන්මෙන්** 44, යෝග්‍ය විධියට නොගැන්මෙන්.

**පඩක්** 137, ගෙඩියක්.

**පක්බත්** 36, පිසුබත්.

**පටවලසි** 163, සත්සිඳුවයි.

**පටවැරැලි** 101, පට්ට වස්ත්‍ර (කරලු>වැරැලි)

**පත්‍රපුට** 62, කොළගොටුව.

**පත්මුලමතු** 136, පත්‍රයේ මූල පමණක්.

**පරවිපිලිවූහ** 87, පරලොව ගියහ.

**පරස්වහරණය** 35……අනුන්ගේ ධනය පැහැර ගැනීම.

**පරිතෘෂ්ණා** 57, දුක් තැවුල්

**පස් පියුම්** 95, ජාතක අටුවා ගැටපදය 9–31 බලනු.

**පස් විකත්** ප්‍රත්‍යවෙක්ෂා කෙරෙත්.

**පලගබිලිදක්හු** 26, පලුහැටි පැටියකු.

**පැවිසාරන** 43, යටපත් කරන.

**පැලමුගුණ** 143, බස්නාහිර පැත්ත.

**පැගි** 162, පහවැ.

**පැමුවන්** 11, හැඩිමාදියෙන් වන මුවන් තමා වෙතට ගෙන්වා ගැනීම පිණිස වැද්දන් විසින් හික්මවනු ලැබූ මුවෝ පැමුවෝ නම් වෙති. වැද්දට වන මුවන් පෙන්වන හෙයින් ඒ නම යෙදුනේය. පෑ යන්න වෙනුවට යෙදුණු පාලි වචනය දිපක යනුයි. දීපකතිත්තිර යනාදිය සම ගත් සසඳනු.

**පැලිහිණියන්** 11, පැමුවන්සේම හික්මවනු ලැබූ පක්ෂීන් තමා සිටින බව අනෙක් ලිහිණියන්ට දන්වන බැවින් හෝ හැඩිමාදී ලකුණුවලින් අනෙක් ලිහිණියන් තමා වෙතට ගෙන්වා ඔවුන් ලිහිණි වැද්දට පෙන්වන හෙයින් හෝ එකී නම යෙදුනේය.

**පිටිපැණියක්** 43, පිටුපාත්තියක්.

**පිඩිමස්** 135, ඇස්වටිය. මේනාමය යෙදී ඇත්තේ පාලි ගොප්ඵක ශබ්දය යනුවෙති.

**පිණිස සුමු පන් දහම්හු** 25, පටිච්ච සමුප්පන්න ධම්මයෝ

**පිරිකැපුණු** 29, පරිකල්පිත. කල්පනා කරන ලද.

**පිරිහුන්** 114, පරිපූර්ණ. (පරිපුණ්ණ>පිරිපුන්>පිරිහුන්)

**පිරිපස්වමින්** 118-178, මෝරවමින්.

**පිරිවහනු** 78-93, කටපාඩම් කිරීම.

**පිරිවැටිලි** 140, වෙනස්වීම. (පරිවත්තන>පරිවැත්ති> පිරිවැටිලි)

**පිසඹුරු** 139, ළිං, කුඹුරු ආදියෙහි දියයට සැදී උඩට මතු වන සෙවෙල් වැනි සියුම් වැල් විශෙෂයක්.

**පිශියෙයි** 4, පියැවී යයි.

**පුපුළු පැටවකු** 138, උණහපුළු පැටවකුගේ.

**පුණ්ඵල පැණියක** 98, මෙත් පැටලිලි සහිත තැනකි. පුණ්ඵල 'පැමිණියක පුණණඵල පැණියක. පුණ්‍යඵල පැමිණියක යනුත් පාඨාන්තරයෝය. පුණ්‍යඵල ලැබූ තැනැත්තියක් යන අර්ථය සුදුසුදැයි සොයනු.

**පෙණමතින්** 141, බුරුමයකින්

**පෙත්** 19 – 20, මළගියවුන් උදෙසා දෙන පිත

**පෙරෙළ** 54, පාපිෂ්ට (වටර > වෙරළ > පෙරළ) ශුඩ පාඨය වෙරළ වන්නටත් පුළුවන. එක්තරා ගොත්‍රයක මිනිසුන්ටත් වෙරළ නාමය යෙදේ.

**පෙවෙන්නහු** 12, පිම්බෙන්නහු ධ: ප්‍රදීපිකා 72 පිටත් බලනු

**පෙළාබද්දේ** 41, තදකොට බදනා ලද්දේ.

**පෝවර** 137, උපෝෂථවාරය සතියට නමකි.

**ඵලාසායෙන්** 56 පුණ්‍යඵලයට කැමැත්තෙන්.

**බඳුලතා** '161, කල්පය මුලදී පොළොංවෙහි හටගත්තා වැල් වර්ගයක්.

**බෑයා** 27, 28, 88 113 – 129, 142, වැඩිමහලු සහෝදරයා. භාතා > බැහැයා > බෑයා)

බිජුමලක් 66, බිජුවටක්. බීජසඞ්ඛ්‍යාත ඇටයක්.

බින්ඛඩෙක 85, බිත්ති කැබෙල්ලක.

බුහුණන් 10, 27, 28, 52, 142, වැඩිමහලු සොහොයුරිය. (භගිනී > බුහුන)

බුහුරු 42, බෙනයක.

බෙරබුහුරක් 160, බෙරකඳක සිදුරක්.

බොල්හකුරුපස් 9, බොල්වී ගල්කැටපස්.

හෙණ්ඩිවාල 7 – 8, "හෙණ්ඩිවාල නම් රියන් දිග ඇති අග යකෝල් ඇති වටා සිටි මොණරපිල්දඬු ඇති මූල යවටක් ඇති දමාලා අන්නා ආයුධයකි" යනු විනය සන්නයි.

මඩහුණු පහණක්සේ 24, මඩ වැටුණු ගලක්සේ.

මනානැති 126, යහපතක් නැත්තේය.

මසිඳු 13 – 86, 147, මාත්.

මලදිය 97, කුණුවතුර

මල්තුඹු 2, සුදුර්යම්.

මළවනහ 88, "මපුතනුවෝ මළවනහ" යනු සම්පූර්ණ පාඨයි. මළානුවන්නාහ යනු අර්ථයි. "වනහ" යන්න යෙදුනේ "භවිස්සන්ති" යන අනාගත ක්‍රියාව මෙනු වෙනි. එය සඞ්කාර්ථයෙහි යෙදෙනුත් සිටිති. මෙහිත් සඞ්කාර්ථය දෙයි.

යපට 17, යකඩ වස්ත්‍ර. (අය > ය)

යබුහු 10, යමුවා බොල්වි

යවට 23, 47, යකඩ ගුලි.

යහඩියෙන් 12, යකඩ අඬුවෙන්.

**සුත්වියත්** 78 – 79, ගුණ නුවණ ඇති.

**සුත්සල** 85, අනුභවයට සකස්කළ.

**සොන්නුවද** 36, සොත්ජාතිකාසත්වද (සොත්හට > සොත්තට)

**රත්පුජ්ඇතිරි** 109, රතුපාට මල් ඇති ඇතිරිලි.

**රන්පිඩැල්ලක්** 67, සවර්ණ පිණ්ඩයක් යනු අර්ථයි.

**රසසිනක්** 68 රසායනයක් (රසායන > රසයන > රසසින)

**රුක්පයට** 17, ගසමුලට (පාද > පය)

**රුස්වන්නොසි** '171, රුචිකෙරෙත්නුසි.

**ලලිතජනයා** 149, මිත්වලුහු-නෘත්‍යගීතාදී ලලිත ක්‍රියාවන්හි නියුක්ත ජනයා.

**ලෝකායත ශාස්ත්‍රය** ලෝකනිර්මාණාදියත් ඇතැම් දේවලට නම් ලැබුණු සැටිත් ප්‍රකාශකරන මිථ්‍යා තර්කන් ගැප්වුණු නුගතුන් අතර පැවති ශාස්ත්‍රයක්.

**ලොහොපැස** 12, ලෝහයෙන් කළ කුඹය.

**වටන** 24, පවත්වන (වත්තන > වතන > වටන)

**වඩාඇරැ** 60, වඩාගෙන අවුත් (හරිත් > හැරය > ඇරය > ඇරැ)

**වහල්හ** 83, උපකාර වෙති. (උපකාර > උවහර > වහර වහල > වහල්)

**වටාගත්මත්නූන** වටහාගත් මාත්‍රයක් නොවේද

**වටාතිරකොට** 9, හැත්පසින් බන්ධනය කො .

**වතුරුවාගෙන** 134, හේත්තු කරගෙන,

**වන්** 13, වාසයකරන කල්හි.

**වත් පොරෝනන් සඳහාවූයේ** 36, වස්ත්‍රය පොරෝ වත්තවුන් සඳහා වූයේය.

**වඳුරු ලහවක්** 42, වඳුරන් අල්වනු පිණිස ඔවුන් වැසි වශයෙන් වසන තැන්වල ගා තබන ලාටු විශෙෂයක් (ලාබා > ලහ)

**වරා** 102, තබා, හැර

**වසට** 139, තුනපිය. වංසටසීය කොළ ඇටය

**වහල්කල්** 77, උපකාරයට සුදුසු කාලය.

**වහස්නා** 165, හඬන. හැඬීම් අර්ථයෙහි යෙදෙන වස් (පා වස්ස) දසින් නිපන් කෘතනත ක්‍රියාය. හකාරය ආගමයකි.

**වැන්නා** 84, වාතීා.

**වැම්හෙන** 99, වැගිරීවැටෙන වැම් පූජ් හෙ (පතිතවීමෙහි) ධාතුයි. (වැම් + හෙන = වැම්හෙන)

**විකිරෙන** 100, විසිරෙන

**වික්‍රියා** 162, වැරැදි ක්‍රියා

**විද්ද** 134, විද්දේය. විදිය > විද්ය > විද්ද)

**වියමැහැය** 14, වියගසේ සිදුරේ දමන සම්මිය හෙවත් විය ඇණ කාඉන් කර වියගසෙන් ඉවත්වීම වළක්වනු සඳහා ගසන හෙයින් කර ඇණය යනුත් එයටම නමි. මැහැය යනු හැවැය කියා සිටිය යුතුය. සම්ම සබ්දයෙන් ආහෙයිනි. සම්මා (සැම > හැම)

**විරෙන** 12 – 21, දියවන.

**විසිය නොවැටෙනසේ** 121 – 128, වසගයෙහි නොපවත්නා සේ (වසක > විසිය > විසිය)

**විහිදුවාගන්මි** 86, මුදවාගනිමි. හැරගනිමි. (විසජ්ජා- පෙත්වා විහිදුවය > විහිදුවයි > විහිදුවා)

**වෘශ්චික** 110, (පාළි. විච්ඡික): ගෝනුස්සා.

**වොලෝගන්නේ** 39 – 98, සොරකම් කොට ගන්නේ (විලෝප > වොලොව් වොලෝ)

**සකුරුහල් බුහුරුව** 20, සකුරුහල් යනු දනශාලාවක යයි සිතේ සකුරුහලක් (සත්කාරශාලාවක්) තිබුණු බුහුරුව සකුරුහල් බුහුරුව වන්නට ඇත. බුහුරුව යන්නෙහි ප්‍රසිඬ තේරුම සිදුර, වළ යනුයි· කුම්භකාර ආවාටකං, කුඹල් බොහො රුවව යනු මහා බොධිවංස ගැටපදයයි. කඹුරු බොරුවෙහි ඉදිකටු වික්කාසේ යනු. පූජාවලී පාඨයි. මේ බොරු (බොහොරු) ශබ්දයෙන් වීපි අර්ථය ගත හැකිය. මිහසෙන් විසින් කරවනලද සකුරුබොරු නම් වැවකුත් විය. මේවෙනුවට (සකුරුහල් බුහුරුව) සකුළුදැයි සූත්‍ර අටුවාහි පෙනෙන්නේ කෙවට්ටවිපි නාමයයි. සංඥපතයත් බලනු.

**සක්මැඩිලි** 23, චක්‍රමණ්ඩලය, කරත්තරෝදයකට බඳු රවුම.

**සගෙණ** ......, සංග්‍රහ කොට.

**සතයාග** සතුන් සිය දෙනෙකුන් මරා සිදුකරන යාගය.

**සත්වහන්** 116, කුඹ සහ සෙරෙප්පු.

**සනහවා** 174 – 175, ස්නානය කරවා.

**සන්නිහිතවැ** 15, ළංවැ.

**සම්කාස්සක්** 98, සම් පසුම්බියක්. (කසුවක් > කස්සක්)

**සම්වරක්** 131, සම්වලින් ඇඹරූ කඹයක්.

**සමක්‍ෂයෙහි** 73, 103, 104, ඉදිරියෙහි.

**සමවාය** 86, ආශ්‍රය.

**සලගල** 57, ශෛසලඛ්‍යාත පර්වතය.

**සවට පලාවැල් පන්තියක්** 159, වට සහිත පත්‍රාවැල් චිත්‍ර පඞ්ක්තියක්

**සහස්‍රයාග** සතුන් දහසක් දෙනා මරා කරනු ලබන යාගය.

**සාඹි** 12, 71, 72, බඩ ගිනි ඇත්තෙම්.

**සැම්වැම්ලි** 54, රාජසේවය.

**සැම්වට** 96, 9, රාජසේවයෙහි නියුක්ත.

**සැහැසෙන්නවුන් වැන්නෝ** 103 – 104, ඉක්මන්වැ ක්‍රියා කරන්නවුන් වැන්නෝය.

**සිපා** 9 – 11, 15, 51, පහරදී

**සියලු දහම්හු පිණිස උපදිති** හෝ සියලුම ධර්මයෝ හේතු ප්‍රත්‍යයන් නිසා උපදිද්දෙ.

**සුනිවිෂ්ටයහ** 110 මනාකොට පිහිටුවන ලදහ.

**සුඹුළුඹනවාපියා** 28 වතුර කළ ගෙනයනු පිණිස හිසේ තැබූ දරණු (හුම්මැඩි) ඉවත්කරවා හැර.

**සෙමුවන්** 11, හික්මවන ලද මුවන්. වන මුවන් තමාවෙත ගෙන්වා ගැනීම පිණිස හැඩිම් ආදී උපක්‍රම මුවන්ට පුරුදු කරනු වැද්දන්ගේ සිරිති. එසේ හේ කරනු ලැබූ හෙවත් හික්මවනු ලැබූ මුවෝ සේමුවෝ නම් වෙති. පැමුව යනුත් මොවුන්ටම නම්.

**සේලිහිණි** 11, මුවන්සේම හික්මවනු ලැබූ පක්ෂිහු.

**සෙල්වියන්** 104, රෙදිවලින් බඳනාලද වියන්.

**සෙවෙතුන්** 94, එක ස්වාමියකුට භාර්‍ය්‍යාවන් කීපදෙනෙකුන් සිටින විට ඔවුහු එකිනෙකාට සපත්නීහු (සෙවෙතුන්) වෙති. ඔවුනොවුන් විරුද්ධ හෙයිනි.

**සේපිළිපදිනා** යෝග්‍යපරිදි පිළිපදිනා

හන් 100, හැන්ද.

හඹා 104, ලුහුබැඳ,

හරනා ,ගෙනත පැහැර ගන්නා

හළුවාසේ 4, හැරියාක් මෙන්.

හැනුම්නැති 114, මිශ්‍රවීමක් නැති.

හැසී 138, 160, සතවී. සම්බන්ධවී.

හිස්මුල් 11, හිස් මොලේ.

හිනඟගල 72, ඉනට අදින වස්ත්‍ර දෙක.

හියසතු 161, තිසිහතු

හිව් 43 – 182, උස්.

හූ 1 – 27, 31 – 41, නූල් (සූත්ත, හුය > හුය් > හූ)

හෙයොපාදෙය 83, හැරිය යුත්ත සහ ගත යුත්ත.

හසුන්කන් 121, සිවුරු කොන

# අකාරාදිය


අ

අකවටු 116
අඞයටි 15
අතුරුවෙය 73
අත්-ගලා 28,
අත්-ලි ා 88
අත් හි කරා, යි 88,
අදුරු සෙයට 139,
අධිවාසනා නොකට හී 10, 16, 81,
අනාදෙය්‍යවූ 50,
අනුමෙව්ය 19,
අනුමොවුනා 121,
අනුමෙර් 19-20-27,
අත්න 85,
අත්හු 49,
අපකාරයෙහි බද්දත් 56,
අපකෙරේ බද්දේ වේ තො, යි 103-104,
අපත්‍රපා ධම්යොගයෙන් 45,
අපනයනාකාරයෙන් 68,
අපියරු 24,
අපිහුත් කෙරෙහි 91,
අභිසඞග 64,
අමාරසයිතක් 68,
අමිත් 54,
අයතක් 86,
අයති 28-31, 32, 33, 34, 35, 70, 77, 86, 88. 95,
අයිතාදතිත් 27, 31, 48,
අයුණු 73-107,
අවනොත් දුත්තාමහ, යි 72,
අවාහි 124-151, 152, 154
අහිමියක්වැන්න 69,
අසිලොම් 14,
අස්වසක් ඇති හෝයි 8- (17 බලනු)
අළුවෙක 102,

ඇ

ඇක්ම 54,
ඇක්මෙන 8,
ඇක්මුණු 17,
ඇගිකොට 91,
ඇටමුල් 8,
ඇතවස 89,
ඇරු 25,
ඇවිත්නට 73,
ඇවිස්සහ 89-90,
ඉනයහ 155,
ඉදෙළු 110,
උකටලී 43,
උකා 9,
උගහටෙක් 57,
උඩුමුවාත්වැ 7,
උඩුහුරු 50-119,
උතුනි ලේ 114-137,
උතුත් කෙරේ බුත්නා හුත් 11,

උන්මැරූයෙහි 34,
උපපා දුක 143, 153,
උපයන 31, 119,
120, 121, 122, 181,
උපයනු 109-112-136,
උපයමින් 33,
උපයා 59-76-112, 134-
135-136, 177-178-181
උපසු 41-54-117-120-184
උපවිය 59,
උපවියැටි 169,
උපහත 49-98-115-142,
උපාදෙයාංශ 83,
උරසකින් 18,
උරසක් මල්දම 19,
උරෙහි 90,
එක්වටගොස් 41,
එක්වන් 1-70-
122-123-128,
එක්හොරූනැවි 10,
එළනා 132-133-140-141,
එළනු 133-135-136-141,
එළෙයි 132-135,
ඔහි 9-12,
ඔත් 61,
ඔද 138,
ඔජස් 115,
ඖෂධිතාරකා 182,

ක

කටුමතිගායෙන් 23,
කටු ලැහැල්ලේ 105,
කඩක් 133,
කඩකඩකොට 1-140,
කඩනුලැබෙත් 18-140,
කඩමිල්ලක් 159,
කඩි සිනි 25,
කණ කැසුප් 14,
කණ තොහො 161-162,
කත්වයින් 102-109,
කම්කටුල් 21-22,
23, 24, 97, 104,
කම්බැඳ 22,
කම් ගී නොගියහොත් 13,
කඹුරූ උදුනෙක 12,
කරනැට 17,
කරමුවහත් 8,
කරල 162,
කර්මජ වාතයෙන් 1-139,
කල් 66,
කලත්‍ර 75,
කලවරගෙන 114,
කවුළු දොරබායෙන් 73,
කහවණුවක් 23, 85-86,
කහිවකු 69-91, 92,
කළහටවත්හයි 80,
කළුවැල් කලල් 97,
කළුහුගසා 1,
කාබානුදු පසිදු 18,
කාබුත් 31-32, 133,
කාසාවකණ්ඨවූ 82,
කැටිත් 51, 162,
කැණිමඩල 118,

කැත් කුලෙහි 32,
කැත් පැරැම් පුරා 182,
කැපකිළි 81,
කැමින් 48-51, 129,
කැළි 98,
කිණිහිරි 135,
කිම්කුලන් 13,
කියදිඑව 23,
කිලිල් 135,
කිව, කිදුහ 85,
කිස 72, 74, 75, 77, 92,
කිළිපැලකුදු 80,
කුකුස් 57,
කුකුළුබිජක් 26,
කුටි ගෙකක් 139,
කුඹිතට 15,
කුදිව 124, 144,
කුමක්‍ෂ රැස්වහි 12,
කුල අඹගාරවූ 117,
කුළින් 136,
කු ළ ඹු ඞැ .
කුළු සටන් 11,
කෙසිවිදකින් 40,
කෙසෙල්මුවසම් 102,
කෛවතීකාදීන්ගේ 45,
කොක්ණාහු 11,
ක්‍ෂාර-ධූමයෙන් 1,
ක්‍ෂාරොදකයෙහි 21,
ක්‍ෂුරධාරායෙහි 8,

ග

ගජපියවරෙක්හි 26,
ගඩපොළක් 26,
ගතසහ 153,
ගදුල් 139,
ගම්ලදුවන් 29,
ගම්ලද්දෙයි 15,
ගවරවළෙක 139,
ගල්මැද 21,
ගල්වල් 86,
ගහන 20,
ගැඹහුල් 25,
ගැතිතාක් 35, 122,
ගැහැ 58,
ගිමන් 182,
ගිවිස ගෙන 79,
ගුගුරා පත්තා 1
ගුණුකැමින් 15-17-48,
ගුලුකල 40,
ගෙකක් 60, 120, 139, 181,
ගෙවර 60,
ගෙවා 97-99-100, 101, 102,
ගෙහිද 96,
ගොතැස්සක් 98-118,
ගෝසීසඳුන් 100-118,
ටැඹක් 23,
ඞහක් 36-108,

ත

තිඹිරිගෙය 26,
තිලි 102, 109,
තිරළ 8-9-12-23, 27, 96,
139, 141, 142, 181,
තුඹුරොඹ 20,

තෙජ 140,
තෙලිත්තක් 139,
තෙල් දලි 42,
තොලබෝවිත 102,

ද

දක්ති 136,
දක්වා දුන්හ 88,
දගගෙකෙක්හි තිරුව 139,
දඩිශෙන් 51, 162,
දනම්ශෙහි 124,
දන්ති 53,
දන්වැට 22,
59, 60, 61, 85-90,
දනා අයත 177,
දනා අයත්ද
දසරු 23-70, 115, 116,
දසවටෙක 182,
දහන්ද 93,
දහයි 19-20, 31, 39, 72,
112, 127, 128, 130,
දලඹ 139-153,
දකැට 59,
දුල් 67,
දියපය 28,
දියපහයත මිණියක් 66,
දිවකිඳුරුවෙණ රුවිබඳු 99,
දිවිපෙවෙත්වටන 24-166,
දුටුවන්ට කල්වෙනි 38,
දුන්නා තොගත
පුත්තේය 42,
දුන්නාමහ 72,
දුන්සේමිසැ 77,
දුනමනාතට 52,
දුනුතැතින් 28,
දුඹුල් 22-66-103,
දුරින් අලියේ 41,
දුර්වලසෙන් 6,
දුහුරු බිම 114,
දෙකපොල 99,
දෙනි 1,
දෙපල්ලෙන් 15,
දෙව් දුසි 16,
දෙවාහ 10,
දෙරටුගොවුවකු 66,
දෙරදෙත 97
දෙරපිහිශෙහි 21,
දෙහොතින් 48,
ධැමින් ̣සෙමෙන් 25-56,
ධ්‍යානහැව්වාහු 121,

න

නවයොවුන් වයස
99-100, 101, 102,
නවාම් 54,
නලවා 16,
නහඹ 140, නාඹ 11,
නයාම් වෙත්වෙයි 31,
නාභිමස් 135,
නාමනා 46,
නැඳි 27-35-36-52-56,
නියත වෙවයි 25-32,

නියඳවලු 98,
නිශබ්ඩු 21,
නියා 2-3-4-5-22,
නිරුහූ මෙ 3,
නිසුවානවද 41
නිෂ්ඨුර 85,
නිහරසර 10-18-76-77-116,
නුඹ කුස්හි පහළ 25,
තෙරිසත්හු 26,
නෙලුඹුදැළි 138,
නෙලුවත් 96,
නොකුප්පවා 56,
නොදූහැ 184,
නොතැහැම්යදී 92,
නොබඳ කරවූවරගෙන 15,
නොබිඳදී 25,
නොසැම්නිය යුත්තෝය 82,
නොසෙගැන්මෙන් 44,
නොසෙල්වියහුතහ 87,
නොවැටෙන්නේ 54-55,
නොහැනී 133,

ප

පකක් 137,
පක් බත් 36,
පටච්ච,යි 162,
පටවැරුළි 101,
පතුපුට 47,
පත්මූල 136,
පත 89-90-136,
පතාකා 61,
පරවිටිලි 87,
පරා 27-31,
පරිතෘෂ්ණා නොයිපැද්දදී 57,
පවිට්කම් 73, 79,
පවු 9,
පසඹමස 53-71,
පස්පියුම් 95,
පස්පොළක් 138,
පස්වණක් 8,
පස්විකත්
පත්ති 9-16,
පළග 26- (පලගැටි)
පළග 87- (පුටුව)
පළදනාවක් 67,
පහණ 24-43-50,
පහන 30-31, 32,
පහකුළු 73,
පහන් 24-35-51, 57-138,
පාත්‍රා 116,
පැටි 43,
පැණපැරුම් 182,
පැදුම් 143,
පැල 90,
පැස 9, 15
පැසෙන්නීය 10,
පැහී 162,
පැළ 4-143-144,
පැ මුවත් 11,
පැ ලිහිණියන් 11,
පිට්පැණියක් 43,

පිඩැල්ලක් 67,
පිඩිමස් 135,
පිණිස පුමු පත් දහම්හු 25,
පියල්ලක් 66,
පියවිලි 60,
පියුම්පතඹත් 61,
පිරිකැපුණු 29,
පිරිපස්වමින් 118-178,
පිරිවටලීමෙන් 26,
පිරිවහනු 78-93,
පිරිවැටිලි 140,
පිරිසුත් 114,
පිසඹුරු 139,
පිහි-යෙයි 4,
පිළිඹහා 92,
පිළිසඳවහඹා 104,
පිළු 183,
පුත් කළස් 60,
පුපුළු පැටවකු 138,
පුණ්ඩලපැණියක 97,
පුළුවුත් 131-142,
පෙණමතින් 131,
පෙත් 19-20,
පෙරඬමස 53,
පෙරදෙපය 8,
පෙරළෙ 58
පෙවෙත්තනු 12,
පෙහෙව 137,
පෙළාබද්දේ 41,
පොකුරුපත් 8,
පොහොතා 52-60,
පෝවරක් 137,

බ

බද්දේවේ 103-104
බදලතා 161,
බැයා 27-28, 88, 113, 129, 142
බිජුවට 119
බිජුවලක් 66,
බිත්කඩෙක 85,
බිදක් 21
බුදක් 85
බුහු 10
බුහුරු 42, 160
බොරුකියෙහි 37
බොල් 21, 99 (බහල)
බොල් 9
බ්‍රම්සරවස් 93-107
හෙණ්ඩිවාල 7, 8

ම

මඩ 24-50
මතා තැති 126
මලවත හ 88
මයිදු 13-86
මයිල් 27, 35, 36, 52, 56
මළක් හු 113
මලු 129
මල දිය 97
මල් තුඹු පිටි 2
මවුන් පියන් 5
මාවටත් ධැමි 158-174
මස්ගඩුවක් 42

මහදිවි 144
මිරිකුසදුත් 97
මිරිඟු 26
මුකුණු 21
මෙරමෝ 32, 183
මුවගොනකු 23, 134
මෙ පෙමෙන් 25, 26, 121
මුහුණ 143
මුරුතමල් කැකුළක් 131
මේ මූල ගත්නේය 20
ම්‍රක්ෂිත 47, 62, 99, 140, 149

ය

ය 1, 2, 7, 8, 9, 10, 11, 12, 17, 23, 41
ය පට 17
ය බුහු 10
ය වට 23
ය හඩියෙන් 12
ය කළ 6
යා වත් 13
යුගත්ගිනි 18, 22
යුත්කළ 85
යුත් වියත් 78, 79,
යොත් 36,

ර

රජ 133,
රත්පුජ 109
රසයිතක් 68,
රුහැණි 33, 74, 131, 142
රැක්පය l. 7
රැස්වත් 70, 171

ල

ලත්තක් 138
ලලිතජන 194
ලඟ 25
ලොමිකා 10–12
ලොකායත 111

ව

වගෙක් 134–135
වටා ගත් මත්ත 34
වටා 9–10
වඩා ඇරැ 60
වතුරුවාගෙන 134
වත් 13
වත් පොරෝනවුත් 36
වත්හයි 80
වදුරුලගවක් 42
වයින් 43–164
වර 43
වර දළු 140
වරා 102
වසට 139
වහත් 110, 115, 116
වලි 98
වහල්කල් 77
වහල්න 83

වහස්තා 165
වාකර 63
වාදහස් 8-9-10-12-14-15 16-21-50
වායු තැනක 11
වායුවිසිත් 11, 114
වාහය 5
වැටි 75-163
වැටුප් 76
වැටෙනු 88
වැත්තා 84
වැඳුමස් 12
වැම්හෙන 99
වැරැද්දහු 2
වැහැරි 23, 41,
විකිරෙන 100
වික්‍රියා 83
විතණ්ඩ 111
විද්ද 134
විදුරුගලක් 183
විශහැමැය 14
විරෙන 12
විවස්නේ 19
විසිය නොවැටෙනසේ 121, 128
විස්වස් 26
විහිදුවාගත්මි 86
වුහුවු 137
වෙයගබඩක් 139
වෙරළ 23, 134
වෘශ්චික 34
වොලොගත්තේ 39-98

ස

සක්මැඩිලි 23
සගණ්ද 72
සණ 41
සත් 116
සත් වෙණ දහමෙන් 25
සතහස්නවුත් 36
සතහවා 174, 175
සපදන්සැරි 181
සබඳුන් 129
සබාතොපුල් 29
සමකසස්ක් 98
සම්වරක් 131
සමක්‍ෂයෙහි 73, 76, 77, 103, 104
සමවාය 80
සලගල 57, 58
සල්හු 66
සසඳ 41
සහසා 71
සා 9, 11, 12, 15, 21, 58, 137
සාදුක් 18, 19, 22, 81
සා බිලිඳ 50
සාමි 71, 72
සැතින් 10, 11, 131,
සැතිරි 94
සැම්වට 54, 96
සැහැසි 24, 103, 104
සැහෙනු නැති 84
සිද 14
සිතාපු 29

සිපා 9, 11, 51, 55
සිවිකාව 87, 88
සිහින් කකුළ 15
සුදුපුජ 109
සුතිවිෂටයක 110
සුත්බත් 86
සුත් සුත් 1, 9, 23
සුඹුළු 23, 28
සුහිතයෙම් 71
සුගෘත්මිත්‍ර 74
සුහුරුත් 10
සෙමරක 181
සෙමුවත් 11
සෙල්වියත් 104
සෙවාද 72
සෙවාද 72
සෙවෙතුත් 94
සෙවෙල් 138
සේසත් 116
සොස්සි 70

හ

හකුරු 9
හඹා 104
හත් මල් උහසිත 100
හරසර 45, 46, 47, 50, 56, 113
හවත 40
හවත්නී 19
හවනු 29, 37, 38, 39
හවා 9, 17
හසුත් කණ 121
හළුවාසේ 4
හැනුම් තැති 184
හැවීමෙහි 37
හැවුයෙහි 37
හැවුවත් 39
හැවුවාහු 49
හැවුවෝ 5
හැසී 138, 160
හිතසහළ 74
හිමත් 105, 182
හියසතු 161
හිවි 43, 182
හිස් මුල් 11
හුවා 182
හෙව 126
හොවා 134, 135
හොවනු 99
හොත් 118
හෝතා 105
හෙයාංශ 83
හෙයෝපදෙස 83

ළ

ළැමැඩි 8, 15
ළැමැද 12
ළිවිත් 12

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු